272 වන කාණ්ඩය - 5 වන කලාපය
தொகுதி 272 - இல. 5
Volume 272 - No. 5

2019 ජුනි 27වන බ්‍රහස්පතින්දා
2019 யூன் 27, வியாழக்கிழமை
Thursday, 27th June, 2019

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය**
මහජන ආරක්ෂක ප්‍රකාශනය

**නිවේදන:**
ඌව පළාත් සභාවේ සංචාරක සංවර්ධන කාර්යාංශ කෙටුම්පත් ප්‍රඥප්තිය

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
විදුලිය පිළිබඳව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවට ඇති බලය පවරා ගැනීම

**මහජන ආරක්ෂක ආඥා පනත:**
යෝජනාව

---

# பிரதான உள்ளடக்கம்

**சனாதிபதியிடமிருந்து வந்த செய்தி:**
பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்

**அறிவிப்புக்கள்:**
ஊவா மாகாண சபையின் சுற்றுலாப்பயணத்துறை அபிவிருத்திப் பணியகம் வரைவு நியதிச்சட்டம்

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்**

**தனி அறிவித்தல் மூல வினா**:
இலங்கைப் பொதுப் பயன்பாடுகள் ஆணைக்குழுவின் மின்சாரம் தொடர்பான அதிகாரத்தைக் கையேற்றல்

**பொதுமக்கள் பாதுகாப்புக் கட்டளைச் சட்டம்:**
தீர்மானம்

---

# PRINCIPAL CONTENTS

MESSAGE FROM THE PRESIDENT:
Public Security Proclamation

ANNOUNCEMENTS:
Draft Statute of Tourism Development Bureau of Uva Provincial Council

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

QUESTION BY PRIVATE NOTICE:
Takeover of Powers Vested in Public Utilities Commission of Sri Lanka Relating to Electricity

PUBLIC SECURITY ORDINANCE:
Resolution

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

**2019 ජුනි 27වන බ්‍රහස්පතින්දා**
2019 யூன் 27, வியாழக்கிழமை
Thursday, 27th June, 2019

**පූ. භා. 10.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப.10.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

## ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය
## சனாதிபதியிடமிருந்து வந்த செய்தி
## MESSAGE FROM THE PRESIDENT

### මහජන ආරක්ෂක ප්‍රකාශනය
### பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
### PUBLIC SECURITY PROCLAMATION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පහත සඳහන් සන්දේශය අතිගරු ජනාධිපතිතුමාගෙන් මා වෙත ලැබී ඇත.

**ශ්‍රී ලංකා ජනාධිපති**
**இலங்கை சனாதிபதி**
**President of Sri Lanka**

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/12/6

2019 ජුනි මස 22 වන දින

**ගරු කථානායකතුමා**
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**මහජන ආරක්ෂක ආඥා පනත**

මහජන ආරක්ෂක ආඥා පනතේ 2 වැනි වගන්තිය යටතේ 2019.06.22 දාතමින් කරනු ලබන ප්‍රකාශනය මගින් ඉහත කී ආඥා පනතේ II වන කොටසේ විධිවිධාන ශ්‍රී ලංකාව මුළුල්ලේම වර්ෂ 2019 ක් වූ ජුනි මස 22 වන දින සිට ක්‍රියාත්මක විය යුතු බව ම විසින් ප්‍රකාශ කරන ලදී.

ඉහත කී ප්‍රකාශනය කිරීමට හේතුව මහජන සාමය ආරක්ෂා කිරීම හා මහජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවා පවත්වා ගෙන යාම සඳහා බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 වන ව්‍යවස්ථාවේ (4) වන අනු ව්‍යවස්ථාව අනුව ක්‍රියා කරමින් පාර්ලිමේන්තුව වෙත දැනුම් දෙනු ලැබේ.

මෙයට - විශ්වාසී,

**මෛත්‍රීපාල සිරිසේන**

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

## I

### ඌව පළාත් සභාවේ සංචාරක සංවර්ධන කාර්යාංශ කෙටුම්පත් ප්‍රඥප්තිය
### ஊவா மாகாண சபையின் சுற்றுலாப்பயணத்துறை அபிவிருத்திப் பணியகம் வரைவு நியதிச்சட்டம்
### DRAFT STATUTE OF TOURISM DEVELOPMENT BUREAU OF UVA PROVINCIAL COUNCIL

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

"ඌව පළාත් සභාවේ සංචාරක සංවර්ධන කාර්යාංශ කෙටුම්පත් ප්‍රඥප්තිය" සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ අදහස් විමසමින් ඌව පළාත් සභාවෙන් දැනුම්දීමක් ලැබී ඇති බව ස්ථාවර නියෝග 51(3)(අ) ප්‍රකාරව නිවේදනය කරනු කැමැත්තෙමි.

මෙම දැනුම්දීම ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව වෙත යොමු කරනු ලැබේ.

මෙම කෙටුම්පත් ප්‍රඥප්තියේ පිටපත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සපයා ඇත.

## II

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2019 ජුනි මස 27වන බ්‍රහස්පතින්දා, එනම් අද අපර භාග 1.30ට මාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගි වන ලෙස සියලු ගරු සභික මන්ත්‍රීවරුන් වෙත දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා හා ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

මම 2016 වර්ෂය සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව තිරසර සංවර්ධනය සහ පරිසර සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් පහත සඳහන් වර්තා මම ඉදිරිපත් කරමි.

(i) 2018 වර්ෂය සඳහා බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2018 වර්ෂය සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව

එම වාර්තා තරුණ, ක්‍රීඩා, කලා හා උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් 2018 වර්ෂය සඳහා අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම් මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් 2018 වර්ෂය සඳහා මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2016 වර්ෂය සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව තරුණ, ක්‍රීඩා, කලා හා උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2015 වර්ෂය සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2017 වර්ෂය සඳහා ගොඩනැඟිලි දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

එම වාර්තා සෞඛ්‍ය සහ මානව සුබසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2018 වර්ෂය සඳහා තැපැල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් නියෝග ඉදිරිපත් කරමි.

(i) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(2) වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 05 දිනැති අංක 2113/3 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය; සහ

(ii) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 05 දිනැති අංක 2113/4 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය.

එම නියෝග ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ භෞතික විද්‍යා අධ්‍යයන අංශයේ නාමය භෞතික විද්‍යා හා ඉලෙක්ට්‍රොනික විද්‍යා අධ්‍යයන අංශය ලෙසත්, උද්භිද විද්‍යා අධ්‍යයන අංශයේ නාමය ශාක හා අණුක ජීව විද්‍යා අධ්‍යයන අංශය ලෙසත් සංශෝධනය කරමින්,

(i) 2019 මාර්තු 27 දිනැති අංක 2116/45 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(ii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, රුහුණු විශ්වවිද්‍යාලයේ පීඨ හා අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින් 2008 සැප්තැම්බර් 19 දිනැති අංක 1567/23 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන නියමය සංශෝධනය කරමින් 2019 පෙබරවාරි 18 දිනැති අංක 2111/12 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මම ඉදිරිපත් කරමි.

එම නියම අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම, 2018.02.23 සිට 2018.10.12 දක්වා කාලයට අදාළව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.04.04 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ දෙවැනි වාර්තාවේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

ගරු කථානායකතුමනි, අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ අධ්‍යාපනය පිළිබඳ අනු කාරක සභාව විසින් සකස් කරන ලද, "පළමුවැනි ශ්‍රේණියට ළමුන් ඇතුළත් කරගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය නිකුත් කරන ලද චක්‍රලේඛය පිළිබඳ වාර්තාව" මම ඉදිරිපත් කරමි.

ගරු කථානායකතුමනි, මෙම වාර්තාව, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියගේ සභාපතිත්වයෙන් පැවැත්වුණු අධ්‍යාපනය පිළිබඳ අනු කාරක සභාවේදී වර්ෂ එකහමාරක් තිස්සේ සාකච්ඡා කරලා, විශේෂයෙන් පළමු වසරට ළමුන් ඇතුළත් කිරීමේදී තිබුණු ප්‍රශ්න රාශියක් address කරලා හදපු වාර්තාවක්. මෙම වාර්තාව සෑදීමේ අරමුණ වුණේ, සෑම දරුවෙකුටම වඩාත් හොඳ පාසලක් ලබා ගැනීම හා ළමුන් ඇතුළත් කරගැනීමේ ක්‍රියාවලිය සුමටව සිදු කිරීමයි. ගරු කථානායකතුමනි, ළමුන් ඇතුළත් කර ගැනීමේදී විදුහල්පතිවරු සහ අනෙක් අධ්‍යයන කාර්ය මණ්ඩල මුහුණ දෙන ගැටලු අප සාකච්ඡා කළා. ඒ ගැටලු අවම කරලා විශේෂයෙන් දුෂ්කර පාසල්වලට වැඩි-වැඩියෙන් ළමුන් ඇතුළත් කරන්න, ඒ කියන්නේ "ළඟම පාසල-හොඳම පාසල" ව්‍යාපෘතිය හරහා පාසල් තව-තවත් දියුණු කිරීමේ අරමුණින් තමයි අප මේ යෝජනා ඉදිරිපත් කළේ.

මෙම යෝජනා පිළිබඳව සාකච්ඡා කිරීමට අපි අමාත්‍යාංශවල, රජයේ ආයතනවල නිලධාරීන් වාගේම, විශේෂයෙන් බස්නාහිර, මධ්‍යම, වයඹ හා දකුණු පළාත්වල පාසල් 23ක විදුහල්පතිවරුන් කැඳෙව්වා; අධ්‍යාපන නිලධාරීන් කැඳෙව්වා; සමහර පාසල්වල ආදි ශිෂ්‍ය සංගම් කැඳෙව්වා. මේ සියලුදෙනාම එකතු වෙලා කළ සාකච්ඡාවේදී එක වසරට ළමුන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛයේ පැවැති දුර්වලතා නිසා, අපි යෝජනා 21ක් පිළිබඳව සාකච්ඡා කළා.

මේ යෝජනා 21 පිළිබඳවම අපි දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා. මේ යෝජනා 21 පිළිබඳවම සාකච්ඡා කළාට පස්සේ

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

අධ්‍යාපන අමාත්‍යාංශය ඒ යෝජනාවලින් 18කටම එකඟ වුණා. එය අපට සතුටට කරුණක්. හැම අවුරුද්දේම ජුනි මාසයේ 30 වෙනි දා මේ චක්‍රලේඛය අලුතින් නිකුත්වනවා. මේ චක්‍රලේඛය අලුතින් නිකුත් වන්න කලින් අපේ වාර්තාව ලබා දෙන්න අපි ගිය අවුරුද්දේත් උත්සාහ කළා. නමුත්, කාරක සභාවේ තිබුණු අඩු පාඩු නිසා අපට ඒක කර ගන්න බැරි වුණා. නමුත් මේ අවුරුද්දේ චක්‍රලේඛය ඉදිරිපත් කරන්න කලින් අපේ කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන්න අපට හැකියාව ලැබුණා. එම යෝජනා 21න්, 18කටම අධ්‍යාපන අමාත්‍යාංශයේ අවසර ලැබුණා. අපි කල්පනා කරනවා, ආංශික අධීක්ෂණ කාරක සභාව හැටියට මෙම කටයුත්ත අපි කරපු ඉතා වටිනා වැඩක් කියලා. ඒ සම්බන්ධයෙන් ඒ අනු කමිටුවේ සභාපතිතුමියට ස්තුතිවන්ත වනවා.

ගරු කථානායකතුමනි, මම ඔබතුමාට තව කාරණයක් මතක් කරන්න කැමැතියි. ඒ තමයි, ආංශික අධීක්ෂණ කාරක සභාවල කාර්ය මණ්ඩලයේ තිබෙන අඩු පාඩු. මම මීට කලින් ගරු නියෝජ්‍ය කථානායකතුමාටත් මේ සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කළා. මේ කාර්ය මණ්ඩලය දිවා රෑ නොබලා ඉතා දක්ෂ විධියට වැඩ කරනවා. මේ වාර්තාව හදනකොට ඒ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් දවස් තුනක් විතර එක දිගටම රාත්‍රිය පහන් වනතුරු වැඩ කළා. ගරු කථානායකතුමනි, එම නිසා ආංශික අධීක්ෂණ කාරක සභාවල කාර්ය මණ්ඩලය වැඩි කළ යුතුයි කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද, දැනට තිබෙන සීමිත සම්පත්වලින් අපට වැඩ කරන්න බැහැ ගරු කථානායකතුමනි. මේ ආංශික අධීක්ෂණ කාරක සභාවලට අවශ්‍ය සම්පත් ලබා දුන්නොත්, මේ තුළින් මීට වඩා කාර්යක්ෂම විධියට පාර්ලිමේන්තුවට විවිධ යෝජනා ඉදිරිපත් වන්න පුළුවන්. අපට දැනට තිබෙන අඩු පාඩුව කාර්ය මණ්ඩලය අඩු වීමයි. සමහර විට එක නිලධාරි මහත්මයෙකු හෝ මහත්මියක් ආංශික අධීක්ෂණ කාරක සභා කීපයකම කටයුතු අධීක්ෂණය කරනවා. මේ තත්ත්වය වෙනස් කර අපට ඒ අඩු පාඩු හදා දෙන්න. අපි යෝජනා කරනවා, ලෝකයේ අනික් රටවල වාගේ එක ආංශික අධීක්ෂණ කාරක සභාවකට අඩුම තරමින් කාර්ය මණ්ඩලය පස්දෙනෙකුවත් සිටිය යුතුයි කියලා. එහෙම වුණොත් අපට ඉතාම කාර්යක්ෂමව වැඩ කරන්න පුළුවන්. ඒකට මේ පාර්ලිමේන්තුවේදී අපි අවස්ථාව හදා ගත යුතුයි. ගරු කථානායකතුමනි, ඒ අවශ්‍ය නිලධාරීන් බඳවා ගෙන ඒ කටයුතු තවතවත් ශක්තිමත් කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා කියපු කාරණයට මම සහයෝගය පළ කරනවා. අවශ්‍ය නිලධාරීන් ප්‍රමාණය ඇතුළු ආංශික අධීක්ෂණ කාරක සභාවලට තිබෙන අඩු පාඩු අපි සම්පූර්ණ කළ යුතුයි. අපට ඒ කරුණු ඒ සභාවේදී සාකච්ඡා කරන්න බැහැ.

නමුත්, එක එක කාරක සභාවට විශේෂයෙන් බඳවාගෙන, ඒ සඳහා විශේෂ පුහුණුවක් දීලා කටයුතු කළොත් පාර්ලිමේන්තුවේ අනාගතය වෙනුවෙන් විශාල සේවාවක් වෙනවා. ජ්‍යෙෂ්ඨත්වය අනුව, ලිපිගොනු ගොඩක් අරගෙන කටයුතු කරන්න එක්කෙනෙකුට භාර දීලා නම් මේ කටයුතු සාර්ථක කරගන්න බැරි වෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, මට පැහැදිලි කරගැනීමක් අවශ්‍යයි. පළමුවැනි ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේ දී ඔවුන්ගේ පදිංචිය, ඔවුන්ට දේපොළ අයිතිද කියන ප්‍රශ්නය බරපතළ ගැටලුවක්ව තිබුණා. පළමුව ප්‍රශ්නයක්ව තිබුණේ, ඒ නියමිත දුර ප්‍රමාණය තුළ යම් කෙනෙකුගේ පදිංචිය තිබෙනවාද කියන එක පිළිබඳවයි. පසුව ඒක, දේපොළ අයිතිය ඇති පදිංචිය කියන තැනට වෙනස් වෙලා අකටයුතු අර්ථකථනයක් සිදු වුණා. ඒක එසේම තිබෙනවාද, එහෙම නැත්නම් ඒක වෙනස් වෙලාද?

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණය අපි සාකච්ඡා කළා. විශේෂයෙන් පදිංචිය කියන එක තමයි මූලිකත්වය ගත යුතු වුයේ. ඒ පදිංචිය සඳහා ගන්න තිබෙන නිර්ණායක විධියට උදාහරණයක් ගත්තොත්, බිම්සවිය ඔප්පුවලට නීත්‍යානුකූල පදිංචිය තහවුරු කරන ලේඛනයක් ලෙස මෙතෙක් කාලයක් පිළිගැනීමක් ලබා දීලා තිබුණේ නැහැ. පදිංචිය තහවුරු කරන්න අවශ්‍ය ඒ සහතිකය මේකෙන් ලබා දීලා තිබෙනවා. ඒක තමයි ප්‍රධාන කාරණයක් හැටියට ගත්තේ.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

ගරු කථානායකතුමනි, ඇත්තවශයෙන්ම මෙහිදී ප්‍රායෝගික ප්‍රශ්නයක් පැනනඟිනවා. විශේෂයෙන්ම, ආසන්න පදිංචිය තිබුණා වුණත්, සමහරවිට ඒ ඉඩම් තිබෙන්නේ දෙමව්පියන්ගේ නමට. ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමනි, ඔබතුමා මෙහිදී ඒ කාරණය සලකා නැහැ, ලකුණු ප්‍රමාණයක් අඩු කර තිබෙනවා කියා මට පෙනෙනවා. නමුත්, ඇත්තටම දෙමවුපියන් සමඟ පාසල ආසන්නයේ පදිංචිව හිටියත්, ඒ අයගේ දරුවන්ට පාසලට ඇතුළුවීම ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. සමහරවිට පාසලේ ගේට්ටුවෙන් එහා පැත්තේ ඉන්නේ. ඒවා අපට හැම දාම වෙනවා. ඒ පිළිබඳ වැඩ පිළිවෙළක් සකස් කරන්නත් උත්සාහයක් දරලා නැහැ වාගේයි මට පෙනෙන්නේ.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

දේපොළ හිමිකම්වල වර්තමාන තත්ත්වය ඔබතුමාට බලන්න පුළුවන්. 7වැනි කාරණය යටතේ ඒක දැම්මා. ඔය කියන කාරණයත් අපි සලකා බලනවා. අදාළ කාලසීමාව තුළ ඒ ප්‍රදේශයේ දේපොළක් තිබෙනවා නම්, ඒවාට ලැබෙන ලකුණුත් ඇතුළත් කරන්න සලකා බලනවා. අපි මේ සෑම දේම සලකා බලනවා. ගරු කථානායකතුමනි, මේ පිළිබඳව විවාදයක් ගන්න පුළුවන් නම් හොඳයි. මොකද, මේක එච්චරට වටිනා කාරණයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභානායකතුමාට පුළුවන් ඒ සඳහා දිනයක් දෙන්න. සභානායකතුමනි, විවාදයක් දෙන්න පුළුවන්ද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள், மலைநாட்டு மரபுரிமைகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise, Kandyan Heritage and Kandy Development and Leader of the House)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය අපටත් බලපානවා. මොකද, මහනුවර මහාමායා විදුහල සහ ධර්මරාජ විදුහල අවට තිබෙන්නේ ඔක්කෝම නගර සභා ඉඩම්. ඒ අය අවුරුදු 50ක්

තිස්සේ ඒ නගර සහා ඉඩම්වල පදිංචිව සිටිනවා. එක අවුරුද්දක් මහාමායා විද්‍යාලයට සහ ධර්මරාජ විද්‍යාලයට ළමයින් ඇතුළත් කිරීමේ දී, ඒ නගර සහා ඉඩම්වල පදිංචි අයට ලකුණු දුන්නා. ගිය අවුරුද්දේ ඒ ලකුණු දුන්නේම නැහැ. පසුව, මේ අවුරුද්දේ අපි ඉල්ලීමක් කරලා ලකුණු 5ක් දීලා තිබෙනවා, ඒ පදිංචියට. නමුත් ඒක ප්‍රමාණවත් නැහැ. ඒ නිසා මේ සම්බන්ධයෙන් විවාදයක් ගත්තොත් හොඳයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. අපට අද ඒ ගැන සාකච්ඡා කරන්න පුළුවන්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු අනුර ප්‍රියදර්ශන යාපා මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලා විවාදයක් ඉල්ලනවා නම් හෙට දවසේ ඒක ගන්න පුළුවන්. ඒ සඳහා හෙට දවස දෙන්න පුළුවන්. මොකද, හෙට දිනයේ අපේ වැඩසටහන්වල පොඩි වෙනසක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒ ගැන පක්ෂ නායක රැස්වීමේ දී කථා කරමු.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාගෙන් පසුව ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඇත්තෙන්ම විපක්ෂයේ බොහෝ දෙනා මේ පිළිබඳව කථා කරනවා. හැබැයි, මේ සිදුවීම වුණේ, මේ අලුත් නිර්ණායක ආවේ මට මතක විධියට පසුගිය වකවානුව තුළයි. මේ පටලැවිල්ල දිග හැර ගන්න බැරිවයි අපි දඟලන්නේ. ගරු කථානායකතුමනි, එදා කැබිනට් එකට මේ කරුණු ගෙනෙන විට "මේක කරන්න එපා, මේ විධියට කරන්න" කියලා එතුමන්ලාට කියන්න තිබුණා. නමුත්, අපේ ගරු මන්ත්‍රීවරු කණ්ඩායම අද මේ ප්‍රශ්නය විසඳන්න උත්සාහයක් ගන්නවා. ඒ වාගේම, "පෝෂිත පාසල්" නිර්මාණය වුණා. ඒ දරුවන් පෝෂිත පාසල්වලට දාලා සුපිරි පාසල්වලට ඇතුළු කර ගන්න ක්‍රමවේදය. අද ඒ ක්‍රමය සහමුලින්ම අසාර්ථක වෙලා තිබෙනවා. එම දරුවන්ට පෝෂිත පාසලේ අධ්‍යාපනය ලැබීමෙන් පසු යන්න තිබෙන පාසල අද අහිමි වන තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

ඔය කියන නිර්ණායක තිබුණත්, අවසානයේදී පෝෂිත පාසල් සංකල්පය සහ සුපිරි පාසල් සංකල්පය කියන සංකල්ප දෙකම අද අසාර්ථක තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. එහිදී අසරණ වෙලා සිටින්නේ අධ්‍යාපනය ලබන අහිංසක පුංචි දරුවන්. ගරු මන්ත්‍රීතුමනි, ඒකත් පසුගිය කාලයේ ක්‍රියාත්මක කරපු වැඩ පිළිවෙළක්. මේ ආංශික අධීක්ෂණ කාරක සභාව මඟින් ගෙන යන වැඩ පිළිවෙළ තුළින් පසුගිය කාලයේ සිදුවුණු වැරදි දේවල් සියල්ල නිවැරදි තැනට ගෙන යන්න පුළුවන් වෙයි කියලා මා විශ්වාස කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මහින්ද අමරවීර මන්ත්‍රීතුමා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු කථානායකතුමනි, මේ සඳහා විවාදයක් වාගේම හොඳ සාකච්ඡාවකුත් අවශ්‍ය වෙනවා. පාර්ලිමේන්තු විවාදය පමණක් ප්‍රමාණවත් වන්නේ නැහැ. කොහොම කළත් අපි දැක්ක දේ තමයි, පාසලට ළමයින් ඇතුළත් කර ගැනීමේ දී බලන්නේ ආසන්න පදිංචියයි කියන එක. හැබැයි පාසලට ඇතුළත් වූ දවසේ ඉඳලා කිලෝමීටර් 20ක්, කිලෝමීටර් 30ක්, කිලෝමීටර් 40ක් එහායින් පදිංචිව සිටින අය තමයි වාහනවලින් එන්නේ. පාසල් වාහන සංස්කෘතිය ඇතිවෙලා තිබෙන්නේ මේ පාසල්වලට බඳවා ගැනීමේ ක්‍රමවේදයේ තිබෙන වැරැද්ද නිසායි. පාසලක අල්ලපු වැටේ පදිංචිවෙලා ඉන්න ළමයාට ඒ පාසලට එන්න පුළුවන්කමක් නැහැ. කොහොම කළත්, වත්කම් තිබෙන අය ඔප්පු තිරප්පු සියල්ලම හදාගන්නවා. ඒවාට දක්ෂ අය ඉන්නවා. ඒ සඳහා ව්‍යාජ ලේඛන හදන කට්ටියත් ඉන්නවා. ඒ වාගේම, ඒවාට අනුබල දෙන නිලධාරිනුත් ඉන්නවා. ඒ නිසා මේ සඳහා බොහොම පුළුල් සාකච්ඡාවක් අවශ්‍යයි. මේ කමිටුවේ සාමාජිකයන් සියලුදෙනාටම මා ප්‍රශංසා කරනවා. මේ කටයුතු තවත් පුළුල් කරලා, තවත් විමර්ශනය කරලා, හොරුන්ට, සල්ලිකාරයන්ට කියලා විශේෂත්වයක් දක්වන්නේ නැතුව, සාධාරණ විධියට ළමයින්ට පාසලක් ලබාදෙන වැඩ පිළිවෙළකට ප්‍රවේශ වන මට්ටමට නීති සකස් කරන්නය කියලා මා ඉල්ලා සිටිනවා.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
සියලු මන්ත්‍රීවරුන්ට මා ස්තුතිවන්ත වෙනවා, මේ යෝජනා පිළිබඳව සැලකිලිමත්වීම ගැන. විශේෂයෙන්ම මහින්ද අමරවීර මන්ත්‍රීතුමා සඳහන් කළ කාරණයත් අපි මෙහිදී address කර තිබෙනවා. මෙහි කාරණා 21ක් සඳහන් කර තිබෙනවා. මන්ත්‍රීවරුන් සියලුදෙනාගෙන්ම මා ඉල්ලා සිටිනවා, මේ කාරණා 21 අධ්‍යයනය කරන්නය කියලා. මේ කාරණා 21 අධ්‍යයනය කරලා, මේ සම්බන්ධයෙන් පුළුල් සාකච්ඡාවක් කළොත්, මීටත් වඩා හොඳට මේ පිළිබඳව සමාජය දැනුවත් කරන්න පුළුවන්. මෙහිදී විවිධ අසාධාරණවලට ලක් වූ ළමයින්ට, විශේෂයෙන් දුප්පත්, බලපුළුවන්කාරකමක් නැති ළමයින්ට සිදු වී තිබෙන අසාධාරණය අපි දැක්කා.

ඒක තමයි, මෙතැන තිබෙන ප්‍රශ්නය. මොකද, පාසල ආසන්නයේම පදිංචි වෙලා සිටින, ඇත්තටම ඒ පාසලට යා යුතු ළමයින්ට ඒ පාසලට යන්න බැරි තත්ත්වයක් උදා වෙලා

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

තිබෙනවා. ඒ කාරණා සියල්ලටම අපි මේ තුළින් උත්තර ලබා දී තිබෙනවා. අපට නැවතත් මේ ගැන සාකච්ඡා කරන්න තිබෙනවා නම් හොඳයි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ආංශික අධීක්ෂණ කාරක සභා මේ පාර්ලිමේන්තුවට අලුත් දෙයක් බව මා මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. නමුත් ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත වුණු රටවල මේ කටයුතු සාමාන්‍ය දෙයක්. ඒ රටවල ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම සඳහා මේ කමිටුවලින් විශාල සේවාවක් කරනවා. මේ ආංශික අධීක්ෂණ කාරක සභා අපි ළඟදී ආරම්භ කළා වුණත්, ඒවා මඟින් අතිවිශාල සේවාවක් ඉටු කර තිබෙන බවත් මා මේ අවස්ථාවේදී මතක් කළ යුතුයි. මෙතෙක් විසඳා ගත නොහැකිව තිබුණු සමාජයේ වැදගත් කරුණු රාශියකට මේ අවුරුදු තුන තුළ විසඳුම් ලබා දීමට කටයුතු කිරීම පිළිබඳව එතුමන්ලාට මගේ ස්තුතිය හා ප්‍රණාමය පුද කරනවා.

එහි සිටින කාර්ය මණ්ඩලයත් හොඳ කැපවීමකින් යුතුව කටයුතු කරන බව අපි දන්නවා. පැය අටක් නොව, සමහර දවස්වල රාත්‍රියේ පවා නිදි වරලා, ඒ නිලධාරින් මේ වාර්තා සකස් කරන්න ක්‍රියා කළ බව මා දන්නවා. ඒ අවශ්‍ය නිලධාරින් ඉතා ඉක්මනින් මේ ආංශික අධීක්ෂණ කාරක සභාවලට ලබා දෙන්න කටයුතු කරන්නය කියා මා දැනටමත් මහ ලේකම්වරයාට උපදෙස් ලබා දී තිබෙනවා. ඒ වාගේම, සියලු ආංශික අධීක්ෂණ කාරක සභාවල ප්‍රධානීන්ට ස්තුති කරන්නත් මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

ලෝකයේ හැම රටකම විපක්ෂයට මේ කාරක සභාවල සභාපතිත්වය දෙන්නේ නැහැ. ඇමෙරිකාවේත් ආංශික අධීක්ෂණ කාරක සභාවල සභාපතිත්වය ලබා දී තිබෙන්නේ ආණ්ඩු පක්ෂයට පමණයි. ලංකාවේ පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභාවලින් කොටසක සභාපතිත්වය ආණ්ඩුවටත්, තවත් කොටසක සභාපතිත්වය විපක්ෂයටත් බාර දී තිබෙනවා. මේක තමයි "power sharing" කියන concept එක. ඒ සියලුදෙනාගේම කැපවීම ලැබුණොත් මේ කටයුතු තවත් සාර්ථක කර ගන්න පුළුවන්. මොකද, දැනට මේ ගැන තිබෙන උනන්දුව අඩුයි. බොහෝ රැස්වීම්වලට සාමාජිකයන් එන්නේ නැහැ; සමහර අවස්ථාවල සභාපතිවරු එන්නේත් නැහැ. නමුත් අද ඒ ගැන කොයි තරම් උනන්දුවක් තිබුණාද කියලා මා දැක්කා. අධ්‍යාපනය වාගේ වැදගත් දෙයක් කෙරෙහි අවධානය යොමු කිරීම මා අගය කරනවා. අපේ සභානායකතුමා යෝජනා කළ පරිදි, අද පක්ෂ නායක රැස්වීමේදී මේ ගැන සාකච්ඡා කරලා, දවසක විවාදයක් පවත්වලා, අපට මේ ප්‍රශ්න විසඳා ගන්න පුළුවන්.

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

මීළඟට, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, හැම දාම ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න පෙර, කලින් කරන ලද ප්‍රකාශවල පිළිතුරුවලට මොකද වුණේ කියලා අහන්න වෙලා තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි,-

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු සභානායකතුමනි, ඔබතුමා කලබල වෙන්නේ නැතිව පොඩ්ඩක් ඉන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා අහන්නේ මොකක්ද කියලා මම දන්නවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
රුපියල් ලක්ෂ 3,000කට ආසන්න මුදල් නාස්තියක් පිළිබඳව, දයා ගමගේ අමාත්‍යවරයාගෙන් මම ඉතා පැහැදිලිව ප්‍රශ්නයක් විමසා සිටියා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම ඒක දන්නවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අද ඒකට පිළිතුරක් දෙනවාද ගරු සභානායකතුමනි?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමාගේ අද ප්‍රශ්නය අහන්නකෝ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මේ පිළිබඳව මම අවස්ථා ගණනාවකදී මේ පාර්ලිමේන්තුවේදී විමසා තිබෙනවා. එසේ විමසා සිටියාට පසුවත් එතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම, සාගල රත්නායක අමාත්‍යවරයාගෙනුත් මා ප්‍රශ්නයක් විමසා තිබෙනවා. සාගල රත්නායක අමාත්‍යවරයා විදෙස්ගතවෙලා ඉන්න නිසා, එතුමා ලංකාවට ආ විගස ඒකට පිළිතුරක් ලබා දෙනවාය කියා ඒ වෙලාවේත් සභානායකවරයා කිව්වා. හැබැයි, එතුමා විදෙස්ගත වෙලා ඉඳලා, ලංකාවටත් ආවා. ලංකාවට ඇවිල්ලා පාර්ලිමේන්තුවටත් ආවා. නමුත් ඒ ප්‍රශ්නයට පිළිතුරු ලබා දුන්නේ නැහැ. ගරු සභානායකතුමනි, ඊට පසුව මා ඔබතුමාගෙන් මේ ප්‍රශ්නය ගැන ඇහුවාට පස්සේ, ඔබතුමා පසුගිය රැස්වීම් සතියේ අවසන් දිනයේදී නියෝජ්‍ය කථානායකතුමා මුලසුන දරද්දී එතුමාගෙන් ඉල්ලා සිටියා, මේ අමාත්‍යවරුන්ට දෝෂාරෝපණයක් ගොනු කරන්න කියලා. ගරු කථානායකතුමනි, කරන්න පුළුවන්

ඒ සියලු දේවල් කළත් මේ අමාත්‍යවරු පාර්ලිමේන්තුවට ඇවිල්ලා පිළිතුරු ලබා දෙන්නේ නැහැ.

දයා ගමගේ අමාත්‍යවරයා, අලුතින් සමෘද්ධි සහනාධාරය දෙන ලක්ෂ 6කගෙන් රුපියල් 500 ගණනේ අරගෙන, රුපියල් මිලියන 300ක් -ලක්ෂ 3,000ක්- එතුමාගේ ප්‍රචාරක වැඩ කටයුතු සඳහා යොදවමින් සිටිනවා. මා ඉතා වගකීමෙන් මේ කාරණය කියන්නේ. ඒ සඳහා t-shirts මුද්‍රණය කර තිබෙනවා; posters මුද්‍රණය කර තිබෙනවා. ජනතාවගේ සල්ලි අරගෙන මේ සඳහා විශාල මුදල් කන්දරාවක් වියදම් කර තිබෙනවා. ඒ පිළිබඳව මේ පාර්ලිමේන්තුවේදී පිළිතුරු ලබා නොදීමෙන් පෙන්නුම් කරන්නේ මොකක්ද ගරු කථානායකතුමනි? අපට ඒ පිළිබඳව ඉතාම සාධාරණ සැකයක් ඇතිවී තිබෙනවා. මුද්‍රණය කරන ලද එම t-shirts ඇණවුම ලබා දුන්නේ කවර garment factory එකටද කියා මම ඒ වෙලාවෙත් ඇහුවා. නමුත් ඒක මේ පාර්ලිමේන්තුවට කියන්න ඕනෑ.

ඒකයි, ඇත්ත කථාව. ගරු කථානායකතුමනි, මහජනයාගේ ධනය තමන්ගේ අතට අරගෙන, ඒවා තමන්ගේ garment factories කරා යවන මේ ජාතියේ අමාත්‍යවරුන්ට මේ පාර්ලිමේන්තුවට මුහුණ දෙන්න බැරි තත්ත්වයක් තමයි දැන් උදා වෙලා තබෙන්නේ. ඒ නිසා සභානායකතුමාට මා නැවත නැවත කියන්නේ, ගෙදර ගොස් හෝ එතුමා කැඳවාගෙන ඇවිල්ලා මේ පාර්ලිමේන්තුවට පිළිතුරු ලබා දෙන්න කියායි. දැන් සති කීයක්ද? මාස කීයක්ද? මේ පාර්ලිමේන්තුව විගඩමක් බවට පත් කරන්න එපා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, සභානායකවරයා හැටියට මට කරන්න පුළුවන් වන්නේ ඒ අයට දැනුම්දීම පමණයි. ඊයේ කැබිනට් මණ්ඩල රැස්වීමේදීත් මම දයා ගමගේ ඇමතිතුමාට දැනුම් දුන්නා, මේ ප්‍රශ්නයට උත්තර දෙන්න ඕනෑ බව. අපේ කාර්යාලයෙන් එතුමාට ලියලා තිබෙනවා; telephone calls දීලා තිබෙනවා; ලේකම්වරුන්ට කථා කර තිබෙනවා. නමුත් එතුමන්ලා උත්තර දෙන්නේ නැත්නම්, ඔබතුමාට පුළුවන් ඒ අය සම්බන්ධයෙන් ප්‍රකාශයක් කරන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. මම ඒක කියන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා ඒ පිළිබඳව මට ලිඛිතව දැන්නුවා. මම ඒ සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යතුමා දැනුවත් කර තිබෙනවා. [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, under the Standing Orders I can only request them. I can inform them, but I cannot penalize them. So, as Speaker, you are the one who can do that. ඔබතුමා තමයි මේ ගරු සභාව මෙහෙයවන්නේ. ඔබතුමාට පුළුවන්, උත්තර දෙන්නේ නැති ඇමතිවරු සම්බන්ධයෙන් ප්‍රකාශයක් කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ප්‍රකාශයක් කරලා, ඊට පස්සේ මොකක්ද කරන්නේ?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු කථානායකතුමනි, මේ චෝදනා ඉතාම බරපතළයි. මේ කරුණු පළමුවෙන්ම හෙළිදරව් කරගෙන, මාත් ඒවා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. ගරු කථානායකතුමනි, රුපියල් මිලියන 300 විතරක් නොවෙයි, ඒකට එකතු වෙන්න ඕනෑ තව ගණන් ප්‍රමාණයක් තිබෙනවා. මේ කාරණයේදී සමෘද්ධි බැංකුවලට උපදෙස් දුන්නා, වෙනම සල්ලි දමලා cut-outs දමන්න කියලා. ඊළඟට, සෙනඟ අරගෙන එන්න වාහනවලට වෙනම සල්ලි වියදම් කරන්නය කිව්වා. අතිවිශාල මුදලක් මෙතැන නාස්ති වෙනවා. මේ කාරණය පිළිබඳව ප්‍රකාශයක් කරන්න තරම් කැබිනට් අමාත්‍යවරු නිහතමානි වෙන්නේ නැත්නම් ඒක බරපතළ තත්ත්වයක්. ගරු කථානායකතුමනි, මේ සඳහා ඔබතුමා පූර්ණව මැදිහත් වෙන්න. එහෙම නොකර, දවස ගණනේ මේ පාර්ලිමේන්තුව රැස් කරලා කෝටි ගණන් වියදම් කළාට වැඩක් වෙන්නේ නැහැ. අපි මේ සභාවට ඇවිල්ලා ප්‍රශ්නයක් ඇහුවාම, ඒ ප්‍රශ්නයට උත්තර දෙන්න බැරි නම්, එතුමන්ලාට අමාත්‍ය ධුර දරන්න අයිතියක් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අදත් දැනුවත් කරන්නම්.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය අහනවාද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මම ප්‍රශ්නය අහනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, ගරු දයා ගමගේ ඇමතිතුමා අද ගම් මට්ටමින් ක්‍රියාත්මක කරන වැඩසටහන පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව සිද්ධ වනවා. හොරකම් සිද්ධ වෙලා තිබෙනවා නම්, FCID එකට පැමිණිලි කරන්න පුළුවන්. ඒ ගැන අපට ගැටලුවක් නැහැ.

පසුගිය ආණ්ඩුව කාලයේ සමෘද්ධි බැංකුවල තිබුණු මුදල් කොයි කොයි ආකාරයටද වියදම් කළේ කියලා අපි දැක්කා. එදා, ඔරලෝසුත් දුන්නා, සිල් රෙදිත් බෙදුවා. හැබැයි, දැන් විපක්ෂයේ සිටින අපේ හිටපු ඇමතිතුමා ඒ කාලයේ නිහඬව සිටියා. අපි අනුර දිසානායක මන්ත්‍රීතුමාට විශේෂයෙන්ම ස්තුතිවන්ත වනවා. මොකද, එතුමා මෙවැනි දේවල් පිළිබඳව හැම දාමත් ප්‍රශ්න කරන නිසා. ඒක කරන්න. හැබැයි, මේ කරන වැඩ අල්ලාගෙන මඩ ගහන්න විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු උත්සාහ දරනවා. ඒකට නම් ඉඩ දෙන්න බැහැ. වැරදි කර තිබෙනවා නම්, හොරකම් කර තිබෙනවා නම් දඬුවම් දෙන්න. ගරු කථානායකතුමනි, අපි ඒකට එකඟයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මම දිගින් දිගටම පැටලෙන්න යන්නේ නැහැ. මේක තමයි අපේ රටට වෙලා තිබෙන විපත්තිය. මෙහෙ හොරු, මේ පැත්තේ අය රකිනවා. එහෙ හොරු, ඒ පැත්තේ අය රකිනවා. හැබැයි එහෙද, මෙහෙද නොබලා මේ හැම හොරාටම විරුද්ධ වෙන්න අපට පුළුවන් නම් තමයි අපේ රටට හොඳ වන්නේ. මෙය මඩ ප්‍රහාරයක් නොවෙයි. දයා ගමගේ අමාත්‍යවරයාගෙන් මම නිශ්චිත ලෙස පාර්ලිමේන්තුවේ ප්‍රශ්නයක්

[ගරු අනුර දිසානායක මහතා]

විමසා තිබෙනවා. එතුමාට ඇවිල්ලා ඒකට පිළිතුර දෙන්නයි තිබෙන්නේ. එතුමා දිගින් දිගටම පිළිතුරු ලබා නොදී සිටීම නිසා තමයි මේ ප්‍රශ්නය මතු වෙලා තිබෙන්නේ. ඒ නිසා තමයි අපට ඉතා සාධාරණ සැකයක් මතු වන්නේ. එතුමා පිළිතුරු ලබා නොදීමෙන් පෙන්නුම් කරන්නේ, එතුමා මෙම වංචාවට ඍජු ලෙස හවුල් වී තිබෙන බවත්, පාර්ලිමේන්තුවට ඇවිල්ලා එතුමාට පිළිතුරු ලබා දීමට නොහැකි බවත් තමයි. ඒ නිසා එතුමා පාර්ලිමේන්තුව මඟ හරිමින් විවිධ දේවල් කරන බවයි පෙනෙන්නේ. ඒ නිසා තමයි අපට සාධාරණ සැකයක් මතු වන්නේ. මා නැවත නැවත කියන්නේ, මේ ගරු සභාවට උත්තරයක් දෙන්න කියලායි. එතුමා දෙන උත්තරය වැරැදියි නම් ඒ අනුව අපි ඊළඟට විවාදයක් කරමු. ඒ ගනුදෙනු සිද්ධ වෙලා තිබෙන්නේ කොහොමද කියලා අපට ඔප්පු කරන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, මම අද එතුමා දැනුවත් කරන්නම්. මම අගමැතිතුමාත් දැනුවත් කර තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අගමැතිතුමාට කිව්වාට වැඩක් නැහැ, ගරු කථානායකතුමනි. අගමැතිතුමා කල්පනා කරන්නේ, සිරිකොතේ විදුලිය බිල ගෙව්වේ කවුද කියලා. ඒවා ගැන කල්පනා කළාම ඔක්කෝම අමතක වනවා. සිරිකොතේ විදුලිය බිල ගෙවා ගන්න බැරිව සිටි කාලයේ, එතුමා සිරිකොතේ විදුලිය බිල ගෙව්වා. ඒවාට වන්දි ගෙවන්න සෙවනගල ෆැක්ටරිය එතුමාට දෙන්නත් ඕනෑ; වන්දි මුදල් ගෙවන්නත් ඕනෑ; මහ ජනයාගේ ධනය නාස්ති කරන්නත් දෙන්න ඕනෑ. සිරිකොතේ විදුලිය බිල ගෙවන ප්‍රශ්නය ඒ ගොල්ලෝ බේරා ගන්න ඕනෑ. ඒක එතුමන්ලාගේ දේපළවල ප්‍රශ්නයක්. ඒ සඳහා මහ ජනයාගේ ධනය නාස්ති කරන්න එපා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### විදුලිය පිළිබඳව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවට ඇති බලය පවරා ගැනීම
### இலங்கைப் பொதுப் பயன்பாடுகள் ஆணைக்குழுவின் மின்சாரம் தொடர்பான அதிகாரத்தை கையேற்றல்
### TAKEOVER OF POWERS VESTED IN PUBLIC UTILITIES COMMISSION OF SRI LANKA RELATING TO ELECTRICITY

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම ස්ථාවර නියෝග 27(2) යටත් මෙම ප්‍රශ්නය අහන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

රවි කරුණානායක අමාත්‍යවරයා හා අපි අතර දේශපාලන සහ එවැනි වෙනත් ප්‍රශ්න බොහෝ ප්‍රමාණයක් තිබුණත් මම අවස්ථා කිහිපයකදී එතුමාගෙන් ප්‍රශ්න විමසුවා. එතුමා එදාම පාර්ලිමේන්තුවට ඇවිල්ලා පිළිතුරු ලබා දීගා තිබෙනවා. ලබා දුන් ඒ පිළිතුරු හරිද, වැරදිද කියන කාරණය වෙනම එකක්. [බාධා කිරීමක්] මා අද ත් එතුමාගෙන් තමයි මේ ප්‍රශ්නය විමසා සිටින්නේ, ගරු කථානායකතුමනි.

විදුලිය මිලට ගැනීම අනුමත කිරීමේ බලය සහ විදුලි ගාස්තු තීරණය කිරීමේ බලය ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවෙන් ඉවත්කොට විදුලිබල අමාත්‍යවරයා වෙත පවරා ගැනීමට උත්සාහ දරන බවට වන පුවත් හේතුවෙන් පැන නැඟී ඇති ගැටලුව පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

ශ්‍රී ලංකා විදුලිබල පනතේ 30වැනි වගන්තියට අනුව විදුලිය ගාස්තු අනුමත කිරීමේ බලය ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවට පැවරී තිබුණා. 2010 වසරේදී විදුලිය ගාස්තු සකස් කිරීම සඳහා විනිවිදභාවයකින් යුත් ක්‍රමවේදයක් හඳුන්වා දී 2011 වසරේ සිට ගාස්තු සංශෝධනය සඳහා එම ක්‍රමය පදනම් කරගනු ලැබුවා.

ඒ කියන්නේ, මහජන උපයෝගිතා කොමිසමෙන් සකස් කර දී තිබුණු ක්‍රමයකට අනුව තමයි විදුලිය බිල තීරණය වුණේ.

එම ක්‍රමය අනුව ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිය සැපයීමට වැය වන වියදම් පමණක් ගාස්තු මඟින් මහ ජනතාවගෙන් අය කර ගැනීම සඳහා ප්‍රතිපාදන සපයා තිබුණා. එම ක්‍රමවේදයට අනුව ලංකා විදුලිබල මණ්ඩලය විසින් කරනු ලබන අනවශ්‍ය හා අසාධාරණ වියදම් විදුලි පාරිභෝගිකයාගෙන් අය කර ගැනීමට ඉඩක් ලැබුණේ නැහැ. එතකොට, මහජන උපයෝගිතා කොමිසම එම සැබෑ වියදම් පිළිබඳ ඉතාම නිවැරදි දත්ත මත තමයි මිල තීරණය කරනු ලැබුවේ. එය පාරිභෝගිකයන්ට විශාල සහනයක් බවට පත් වුණා. එබඳු විවිධ ගාස්තු යෝජනා ඉදිරිපත් කළ විට එම අනවශ්‍ය වියදම් කපා හැර, ඒවා විදුලිය ගාස්තුවට එකතුවීම වැළැක්වීමට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව ක්‍රියා කර තිබුණා. පසු ගිය කාලයේදී එලෙස විදුලි පාරිභෝගිකයාගෙන් අය කර ගැනීමට උත්සාහ කළ රුපියල් බිලියන 150ක මුදලක් කපා දමා මහජනතාවගේ විදුලිය ගාස්තු ඉහළ යෑමට තිබූ අවස්ථා මඟ හැරවීමට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පියවර ගනු ලැබුවා. එය ඉතාම වැදගත් පියවරක්. අසාධාරණ ලෙස වියදම් කිරීම පිළිබඳව, අයථා ගනුදෙනු පිළිබඳව ලංකා විදුලිබල මණ්ඩලයට හැම දාමත් චෝදනාවක් තිබුණා. ඒ වියදම් කිසිසේත්ම පාරිභෝගිකයා මත පටවන්නේ නැතිවන්නට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව ක්‍රියාත්මක වුණා.

එසේම ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩල පනතේ 43 වන වගන්තිය යටතේ විදුලිය මිලදී ගැනීම් සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අනුමතිය ලබා ගත යුතුයි. එක පැත්තකින් මිල තීරණය කරන්නට ඒ සභාවේ අනුමතිය ගන්නට ඕනෑ. අනෙක් පැත්තෙන් විදුලිය මිලදී ගැනීම සඳහා ඒ සභාවේ අනුමතිය ගත යුතුයි. විනිවිදභාවයකින් හා තරගකාරී ටෙන්ඩර් ක්‍රමය අනුගමනය කරමින් විදුලිය මිලදී ගැනීමට ලංකා විදුලිබල මණ්ඩලය කටයුතු කළ යුතු අතර, ඒ සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අනුමතිය ලබා ගත යුතුව තිබෙනවා. කෙසේ වුවද, ලංකා විදුලිබල මණ්ඩලය 2016 වසරේ සිට විදුලිය මිලදී ගැනීම්වලදී ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩල පනත උල්ලංඝනය කරමින් කටයුතු කර තිබෙනවා. එවැනි විදුලිය මිලදී ගැනීම්වලදී පාඩු සිදු වී තිබෙනවා. ලංකා විදුලිබල මණ්ඩලය 2015 වසරේ බිලියන 20ක් ලාභ ලැබූ ආයතනයක් බව ද මෙහිදී මතක් කළ යුතුව තිබෙනවා.

ගරු කථානායකතුමනි, විදුලි ක්ෂේත්‍රය පාරිභෝගිකයන්ට ඉතාම සමීප ක්ෂේත්‍රයක්. එම නිසා තමයි ලංකා විදුලිබල මණ්ඩලය විදුලිය මිලදී ගැනීමේදීත්, විදුලිය පිළිබඳ මිල තීරණය කිරීමේදීත්, ඊට උඩින් සිට, ඊට පරිබාහිරව, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව මේ මැදිහත් වීම කරන්නේ.

ගරු කථානායකතුමනි, පාරිභෝගිකයාගේ පැත්තෙන් එනම් විදුලිය පරිභෝජනය කරන්නන්ගේ පැත්තෙන් ප්‍රශ්නය දකින්නේ, මහජන උපයෝගිතා කොමිසමයි. කොමිසම විදුලිය මිලදී ගැනීමේ නිර්ණායක සම්බන්ධවත් මැදිහත් වෙනවා; විදුලි බිල තීරණය කිරීමේදීත් මැදිහත් වෙනවා. මම හිතනවා, එය මුළුමනින්ම ලංකා විදුලිබල මණ්ඩලය මත තිබෙනවා වෙනුවට එවැනි ස්වාධීන ආයතනයක පරීක්ෂාවට භාජන වන එක හොඳයි කියා. ගරු ඇමතිතුමනි, මට මතක විධියට 2002දී පමණ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේත් ඔබතුමායි.

**ගරු රවි කරුණානායක මහතා (විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரவி கருணாநாயக்க - மின்வலு, எரிசக்தி மற்றும் தொழில் துறை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Ravi Karunanayake - Minister of Power, Energy and Business Development)
මම නොවෙයි, ගරු කරු ජයසූරිය මැතිතුමායි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, එහෙම නම්, ඒ ඔබතුමායි. ඔබතුමායි විදුලිබල අමාත්‍යවරයා හැටියට 2002 වසරේදී එය ඉදිරිපත් කළේ. ඔබතුමා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත් කෙටුම්පත ඉදිරිපත් කරන කොට අපේක්ෂා කරන්නේ අන් කවරක්වත් නොවෙයි, විදුලිය මිලදී ගැනීමත්, මිල තීරණය කිරීමත් විදුලිබල මණ්ඩලය විසින්ම නොකළ යුතු බවයි. පාරිභෝගිකයාගේ පැත්තේ සිට මේ ප්‍රශ්නය දැකීම සඳහා ස්වාධීන ආයතනයක අවශ්‍යතාව තමයි එදාත් පැන නැඟුණේ. ඒ අනුව තමයි මහජන උපයෝගිතා කොමිසමට විදුලිය මිලදී ගැනීමේ විනිවිදභාවය පිළිබඳවත්, විදුලිය මිල තීරණය කිරීමේ විනිවිදභාවය පිළිබඳවත් මැදිහත් වීම සඳහා අවස්ථාව ලබා දී තිබෙන්නේ. එය ඉතාම හොඳ කාර්යයක් කියා අපි සලකනවා.

ලංකා විදුලිබල මණ්ඩලය 2016 වසරේදී මෙගාවොට් 155ක් ද, 2017 වසරේදී මෙගාවොට් 180ක් ද, 2018 වසරේදී මෙගාවොට් 320ක් ද, 2019 වසරේදී මෙගාවොට් 720ක් ද වශයෙන් පෞද්ගලික අංශයෙන් විදුලිය මිලට ගෙන තිබෙනවා. මේ තත්ත්වයට අනුරූපීව විදුලිබල මණ්ඩලය ලබන පාඩුව ද ක්‍රමයෙන් ඉහළ ගොස් තිබෙනවා. පෞද්ගලික අංශයෙන් විදුලිය මිලදී ගන්නා ප්‍රමාණයටම පාඩුවත් ඉහළ ගොස් තිබෙනවා. 2016 වසරේදී බිලියන 13ක් ද, 2017 වසරේදී බිලියන 21ක් ද, 2018 වසරේදී බිලියන 50ක් ද, 2019 වසරේදී බිලියන 100ක් ද වශයෙන් විදුලිබල මණ්ඩලයේ පාඩුව හඳුනා ගැනීමට පුළුවන් වී තිබෙනවා. දැන ගන්නට ලැබෙන අන්දමට මෙම නීති විරෝධී විදුලිය මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව අවසර දී නැහැ. දිගින් දිගටම නීති විරෝධී ආකාරයට විදුලිය මිල දී ගැනීමේ ක්‍රියාවලියට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව බාධකයක් බව විදුලිබල අමාත්‍යාංශයේ අද අදහස බව පෙනෙනවා.

ගරු කථානායකතුමනි, සැබවින්ම කළ යුතුව තිබුණේ මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් පෙන්වා දෙනු ලබන අඩු පාඩුකම් මඟ හරවා විනිවිදභාවයෙන් යුතුව විදුලිය මිලදී ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමයි. හැබැයි, ගරු අමාත්‍යවරයා කටයුතු කරන්න උත්සාහ කරමින් තිබෙන්නේ විදුලිය මිලදී ගැනීමේදීත්, මිල තීරණය කිරීමේදීත් යම් යම් අවස්ථා සඳහා මහජන උපයෝගිතා කොමිසමට මැදිහත් වීමට තිබෙන අයිතිය බැහැර කිරීමටයි. ගරු ඇමතිතුමනි, ඒ සඳහා තමයි ඔබතුමා කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ තත්ත්වය තුළ විදුලිය මිලදී ගැනීම අනුමත කිරීමේ බලය මෙන්ම විදුලිය ගාස්තු තීරණය කිරීමේ බලය සූක්ෂ්ම ලෙස විදුලිබල අමාත්‍යවරයා වෙත පවරා ගැනීමට උත්සාහ දරමින් ඇති බවට චෝදනා නැඟෙමින් තිබෙනවා.

ගරු කථානායකතුමනි, එය චෝදනාවක් පමණක් නොවෙයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා විසින් 2019 අප්‍රේල් මාසයේ 5වන දින ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාව මා ළඟ තිබෙනවා.

ගරු කථානායකතුමනි, 2019 අප්‍රේල් මාසයේ 5වෙනි දින ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාවේ ඉතා පැහැදිලිව කියනවා, විදුලිබල කර්මාන්තයේ සමස්ත නියාමකය වශයෙන් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙතින් අපේක්ෂිත ප්‍රතිඵල ඉටු කර ගැනීමට නොහැකි වී ඇති බව මේ වන විට පැහැදිලිව වී ඇති අතර, රටේ අපේක්ෂිත ආර්ථික ඉලක්ක කරා ළඟාවීම සඳහා තවදුරටත් සංකූලතා ඇති වීම වැළැක්වීම සහ කිසිදු අනිසි බලපෑමකින් තොරව... යනුවෙන්.

අනිසි බලපෑමක් නොවෙයි. ඒක පාරිභෝගිකයාට වන බලපෑමක්. පාරිභෝගිකයන්ගේ අයිතීන් වෙනුවෙන් තමයි කොමිසම පෙනී සිටියේ. නමුත්, ඔබතුමා කියනවා, අනිසි බලපෑමකින් තොරව කියලා. විදුලි ක්ෂේත්‍රය නැවතත් නිවැරදි මාර්ගයේ පිහිටුවීම සඳහා රජය විසින් නොපමාව නිවැරදි ක්‍රියාමාර්ග ගත යුතුයි කියලා ඔබතුමා කියනවා.

ඒ සඳහා ඔබතුමා කියනවා, "විදුලිබල කර්මාන්තයේ තාක්ෂණික සහ ආර්ථික නියාමන බලතල විදුලිබල හා බලශක්ති විෂය භාර අමාත්‍යවරයා මඟින් අමාත්‍ය මණ්ඩලය වෙත පවරමින් 2019 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 2013 අංක 31 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත සංශෝධනය කරන්න" කියලා. මේ කොමිෂන් සභාව සතුව තිබෙන මැදිහත්වීමේ බලය ඉවත් කරන්න, මේ පනත සංශෝධනය කරන්න කියලා ඔබතුමා කැබිනට් මණ්ඩලයෙන් ඉල්ලා සිටිනවා. විදුලිය මිල තීරණය කිරීමේ බලයත්, තීන්දු කිරීමේ බලයත් කැබිනට් මණ්ඩලයට දෙන්න කියලා ඔබතුමා කියනවා. ඔබතුමා දන්නවා, පසුගිය කාලයේ මේ පාර්ලිමේන්තුවේත්, පාර්ලිමේන්තුවෙන් පිටතදීත් මහජනයාගේ දේපොළ වංචා කිරීම, හොරකම් කිරීම පිළිබඳව ඉදිරිපත් වෙන සෑම මතයකදීම, සෑම අවස්ථාවකදීම කැබිනට් තීරණ ගෙන තිබෙනවා කියලා. මේ කැබිනට් තීරණවලට තමයි මුවා වුණේ. SriLankan Airlines එකට ගුවන් යානා මිලදී ගැනුණේ කැබිනට් තීරණයකින් කියනවා. SriLankan Airlines එකට ගන්නා ලද ගුවන් යානා පිළිබඳ ගිවිසුම කැන්සල් කළේත් කැබිනට් තීරණයකින් කියනවා. හැබැයි, ඒ නිසා ඉතාම හොඳ අත්දැකීම් අපට තිබෙනවා. මේ කැබිනට් මණ්ඩලය ජනතාවගේ පැත්තේ සිට ප්‍රශ්න දෙස බලනවා වෙනුවට තමන්ට ලැබෙන කොමිෂන්, ප්‍රතිලාභ ගැන කල්පනා කරමින් තීන්දු ගත් ඉතිහාසයකට තමයි හිමිකම් කියන්නේ. ඒ නිසා මේ කැබිනට් මණ්ඩලය පාරිභෝගිකයා වෙනුවෙන් පෙනී සිටින්නේ නැහැ. ඔබතුමා කියනවා මහජන උපයෝගිතා කොමිෂන් සභාවට තිබෙන බලය, අමාත්‍යවරයාට සහ කැබිනට් මණ්ඩලයට පවරන්න කියලා. ඊළඟට කියනවා, 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා සංශෝධන පනතට අවශ්‍ය සංශෝධන සිදු කර, 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා පනත මඟින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන්

[ගරු අනුර දිසානායක මහතා]

සභාව, විදුලිබල කර්මාන්තය සඳහා වන සුරක්ෂිතතා නියාමකය සහ රාජ්‍ය විමර්ශන ආයතන බවට පත් කරන්නලු. මෙච්චරයි ඔබතුමා කියන්නේ.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසම විදුලි බලය මිලදී ගැනීමේදීත්, විදුලි මිල තීරණය කිරීමේදීත් මහජනතාවගේ පැත්තෙන් කල්පනා කරමින් නිර්දේශ ලබා දුන්නා. ඒ බලය මුළුමනින්ම ඉවත් කොට ඒ මුළු බලයම නැවතත් අමාත්‍යවරයාට සහ කැබිනට් මණ්ඩලයට ලබාගැනීම සඳහා දරන උත්සාහයක් තමයි මේ තිබෙන්නේ. විශේෂයෙන් රුපියල් බිලියන ගණනක වටිනාකම් ඇති ගනුදෙනු මේ වගන්ති පිටුපස ඇති නිසා මේ පිළිබඳ ගරු සභාවේ අවධානය යොමු කළ යුතුව තිබෙනවා. මෙම තත්ත්වය තුළ ගරු අමාත්‍යතුමා පහත ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙනු ඇතැයි බලාපොරොත්තු වෙනවා.

1. ශ්‍රී ලංකා විදුලිබල පනත අනුව විදුලිය ගාස්තු තීරණය කිරීමේදී - තීරණය කරනවාට වඩා අනුමත කිරීමේදී- නියාමන බලය හිමි වී ඇත්තේ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවටද? එසේ නොවේ නම් කවර ආයතනයකටද?
2. විදුලි ගාස්තු ඉහළ දැමීම සඳහා මීට පෙර ලංකා විදුලිබල මණ්ඩලය විසින් කරන ලද යෝජනා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කර තිබේද? එසේ නම් ඊට හේතු වශයෙන් කොමිෂන් සභාව කුමන කරුණු ඉදිරිපත් කර තිබේද?
3. විදුලිය මිලට ගැනීමේ ගිවිසුම් සඳහා ශ්‍රී ලකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අවසරය ලබාගත යුතුද? එසේ නම් එම ක්‍රියාවලිය කුමක්ද?
4. පසුගිය කාලයේදී විදුලිය මිලදී ගැනීමේ ඇතැම් ගිවිසුම් සඳහා අනුමැතිය ලබා දීම ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව ප්‍රතික්ෂේප කරනු ලැබ තිබේද? එම ගිවිසුම් මොනවාද? එසේ ප්‍රතික්ෂේප කිරීමට හේතු කවරේද?
5. විදුලිය මිලදී ගැනීම් අනුමත කිරීමේ බලය හා විදුලි ගාස්තු යෝජනා අනුමත කිරීමේ බලය විදුලිබල අමාත්‍යවරයාට පවරා ගැනීම සඳහා විදුලිබල පනත සංශෝධනය කිරීමට අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර තිබෙන කැබිනට් පත්‍රිකාව අනුමත වී තිබේද?

මෙම ප්‍රශ්න සඳහා පිළිතුරු ගරු ඇමතිතුමාගෙන් දැන ගැනීමට කැමතියි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, බොහොම -[බාධා කිරීමක්]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් ඇමතිතුමාගෙන් අහන්න ප්‍රශ්නයක් තිබෙනවා. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාගේ පිළිතුර කොහොමද කියලා බලලා කථා කරමු.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මෙවැනි ප්‍රශ්නයක් ඇසීම සම්බන්ධයෙන් මම අනුර දිසානායක මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා.

මම මේ අමාත්‍යාංශය භාර ගෙන දැනට දින 153ක් වෙනවා. මේ අමාත්‍යාංශයේ තිබෙන ප්‍රශ්න මට පෙනෙනවා. මෙහෙම කරලා තිබෙන්නේ ඇයි කියලා මම ඔබතුමාට ප්‍රායෝගික උත්තරයක් ලබා දෙන්නම්.

ගරු කථානායකතුමනි, ඔබතුමා තමයි එවකට ඇමතිවරයා වශයෙන් කටයුතු කළේ. ඔබතුමා විශේෂ වැඩ පිළිවෙළක් තුළින් මහජන උපයෝගිතා කොමිසමක් ගෙනාවා. නමුත් එහි සියලු කටයුතු අංග සම්පූර්ණ කරන්න බැරි වුණා. එසේ නොකිරීමේ ප්‍රතිවිපාකයක් වශයෙන් මේ ප්‍රශ්නය මෙතෙක් දුර ඇදගෙන ඇවිත් තිබෙනවා. අනුර දිසානායක මන්ත්‍රීතුමා නෛතික මට්ටමින් ඒ ගැන කථා කළාට, ප්‍රායෝගික මට්ටමින් තිබෙන්නේ සම්පූර්ණයෙන් වෙනස් කතන්දරයක්. අද මේ කියන දේ සනාථ කරන්න මහජන උපයෝගිතා කොමිසමේ වැඩ කරන අයත් අපට අදහස් ඉදිරිපත් කරලා තිබෙනවා. "කරුණාකරලා වෙනස් කරන්න. අපට අවශ්‍ය පාරිභෝගිකයා ආරක්ෂා කරන්නයි. අමාත්‍යාංශයක් වශයෙන් ඔබතුමන්ලා විදුලිය අඩුම මිලට ජනනය කරන්න" කියා තිබෙනවා. මතක තියා ගන්න, ලංකා විදුලිබල මණ්ඩලය මෙවැනි තීන්දු ගන්නවා. එතැන බොහොම දක්ෂ කණ්ඩායමක් සිටිනවා. එතැන සිටින හැමදෙනාම O/L pass වෙලා ඉන්නේ. ඒ අය නිකම් ඔහේ ඉන්න මැට්ටෝ නොවෙයි. ඒ නිසා -[බාධා කිරීමක්] ඒක ඔබතුමන්ලාට කියන්න පුළුවන්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අපේ පැත්තට අත දිගු කරන්න ඕනෑ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දිගු කරන එක ඕනෑ කෙනෙකුට දිගු කරනවා. භය නැතුව මම කියනවා. නමුත් ලංකා විදුලිබල මණ්ඩලයේ යම් කිසි ප්‍රමිතිකරණයක් තුළ දක්ෂයන් සිටිනවා. ඒ ගොල්ලන් වෙනම ලෝකයක ඉන්න පුළුවන්. නමුත් එතැන දක්ෂයන් ඉන්නවා. ඒක බොහොම අගය කරමින් පවසන්න අවශ්‍යයි. එහි තිබෙන දුර්වලතාත්, මහජන උපයෝගිතා කොමිසමේ තිබෙන ඇහිලි ගැසීම් නිසාත් අහිංසක පාරිභෝගිකයා තමයි තැලෙන්නේ. ඒ තැලීම නිවැරදි කරන්නේ කොහොමද කියන එක වෙනුවෙන් තමයි අපි කරුණු ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන දේ සැබෑයි. හැබැයි, එහෙම වෙලා තිබෙනවා නම්, ඔය කියන ප්‍රශ්නය තවමත් තිබෙන්නේ ඇයි? එච්චර මිලක් ගන්නවා නම් ලංකා විදුලිබල මණ්ඩලය මෙච්චර පාඩුවක් ලබන්නේ කොහොමද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මේ පිළිබඳව මහජන උපයෝගිතා කොමිසමෙන් දෙන ලද නිර්දේශ සැලකිල්ලට භාජන කළේ නැහැයි කියනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නැහැ, ඒක වැරදියි. ඒ ගොල්ලන්ම umpire කරනවා, ඒ ගොල්ලන්ම bowl කරනවා, bat කරනවා, ඒ ගොල්ලන්ම wicket keeping කරනවා. අන්තිමට ඔය ප්‍රශ්නය තමයි තිබෙන්නේ. ඒ ගොල්ලන්ගේ කාර්යය තිබෙන්නේ නිර්දේශ කිරීම. කථානායකතුමා අමාත්‍යාංශ පවත්වාගෙන යන්න ගියා නම් පාර්ලිමේන්තුවේ කටයුතු සිදුවෙන්නේ නැහැනේ. අන්න ඒ වාගේ වැඩක් තමයි මෙතැනදී මහජන උපයෝගිතා කොමිසම කරන්න හදන්නේ. එතැනින් ලැබෙන ප්‍රයෝගික අදහස් තුළින් මම යෝජනාවක් ඉදිරිපත් කළා, සියලුදෙනාගේම කැමැත්ත තුළින්. ඒගොල්ලන්ගේ බලතල එකක් දෙකක් අඩු වුණා කියලා කිසිම දූෂණයක් අඩු වෙන්නෙත් නැහැ, නැති වෙන්නෙත් නැහැ. කරන කෙනා ඒවා කරනවා. මම දවස් 152ක් තුළ ලබා ගත් අත්දැකීම් තුළින් unions 64 සමඟම කථා කරලා, ඒ ගොල්ලන්ගේ අදහසුත් අරගෙන තමයි මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ. මම බොහොම වගකීමකින් කියන්නේ, මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ පාරිභෝගිකයාගේ හොඳට මිසක් වෙනත් හේතුවක් නිසා නොවෙයි කියලා.

අද තිබෙනවා අවුරුදු 4ක් තිස්සේ ටෙන්ඩර් කරලා තිබෙන ඒවා. තවම ඒවා ගැන කටයුතු කරලා නැහැ. මහජන උපයෝගිතා කොමිසම එකක් කියනවා. ඊට හාත්පසින්ම වෙනස් එකක් අපේ අය කියනවා. මහජන උපයෝගිතා කොමිසම කියන්නේ renewable energy හොඳයි කියලා. අපේ engineersලා කියනවා ගල් අඟුරු ඕනෑ කියලා. එකක් රුපියල් 10යි, 11යි. අනෙක් එක රුපියල් 30යි. මේ දෙක අතරේ ඉඳලා කියනවා, මේක කරන්න කියලා. අන්තිමට විදුලිබල මණ්ඩලය පාඩු විඳිනවා. ඊට පස්සේ දේශපාලන අධිකාරිය මිල වැඩි කරන්නට ඉඩ දෙන්නේ නැහැ. මිල වැඩි වුණාම ප්‍රශ්න ඇති වෙනවා. එම නිසා තමයි ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, මේ වාගේ තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, උත්තරය දෙන්න ඉස්සෙල්ලා මම මේ ගැන ප්‍රායෝගිකව පැහැදිලි කරන්නම්. ගරු කථානායකතුමනි, CEB එකට යමක් ගන්න ඕනෑ නම් ඒ ගොල්ලන් order එකක් ඉදිරිපත් කරනවා. ඒ කියන්නේ අවශ්‍ය ඇනවුම. ඊට පස්සේ ඒ ගොල්ලන් මාස තුන හතරක් ඒක තක්සේරු කරලා, engineers' estimate එකක් දෙනවා. ඊට පස්සේ එනවා ටෙන්ඩර් එකට අවසර ගන්නට. ඊට පස්සේ Cabinet approval එක එනවා, දැන් ටෙන්ඩර් එකට යන්න කියලා. ඊට පස්සේ TEC එකක් පත් කරනවා. TEC එකක් පත් කළාට පසුව Cabinet Appointed Negotiating Committee එකක් එනවා. ඊට පස්සේ ඒ ගොල්ලන් Tender Committee එකක් පත් කරනවා. ඊට පස්සේ Appeal Board එකක් තිබෙනවා. ඊට පස්සේ Treasury එකේ comments එනවා. ඊට පස්සේ ආයෙත් එනවා කැබිනට් එකට. කැබිනට් එකට ආවාට පස්සේ තමයි ඒ කටයුත්තට අවසර දෙන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

හදිසි අවශ්‍යතාවක් වුණොත්?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම ඒකටත් උත්තර දෙන්නම්. ඒ අවස්ථාව තිබෙනවා. හෙට තිබෙනවා කියලා හිතමු හදිසි විදුලිය අවශ්‍යතාවක්. නමුත් මේ වාගේ වැඩ පිළිවෙළක් යටතේ නම් ඒක ගන්න අවුරුදු එකහමාරක් යනවා. එතකොට මේ අවුරුද්දේ විදුලි ප්‍රශ්නය විතරක් නොවෙයි ලබන අවුරුද්දේ විදුලි ප්‍රශ්නයත් විසඳන්න බැරි වෙනවා. ඉතින් කොහොමද ඒකට උත්තර දෙන්නේ? අන්තිමට ප්‍රශ්නය අහන්න තිබෙන්නේ ඇමතිවරයාගෙන් හෝ ඉන්න ලේකම්වරයාගෙන්. මේ ප්‍රශ්නයට උත්තරය මේ අවුරුද්දේ නොවෙයි ලබන අවුරුද්දේත් දෙන්න බැරි නම්, මොකක්ද මේ විහිළුව? මේ වාගේ ඒවා බොහොම හොඳයි ප්‍රශ්න ඇති කරන්නට, ප්‍රශ්න මවන්නට. නමුත් ප්‍රායෝගිකව කිසිසේත්ම ඒවාට උත්තර දෙන්නේ නැහැ. මම දැන් කිව්වේ ඒකයි. මේ ඔක්කෝම ක්‍රමවේද ඇති කළාම, මේ වැඩ කරන්න කාලයක් ගත වෙනවා. මේ රටට තිබෙන හෙණය මේකයි.

පෞද්ගලික අංශය අරගෙන බැලුවොත්, CEB එකට මේ කටයුතු කරන්න මාස 18ක් යනවා නම්, ඒ ගොල්ලන්ට මාස තුනෙන් කරන්න පුළුවන්. ඒ දෙක අතර තරගයකින් IPPsලා අද වැඩි වෙලා තිබෙන්නේ මේ නිසායි. IPPsලාගේ ඒවා ඊට වැඩිය ලාභයි; ඊට වැඩිය ඉක්මන්. මේ වාගේ ක්‍රමවේදයක් අනුගමනය කළාට පසු අපි නැවත එවන්න ඕනෑ මහජන උපයෝගිතා කොමිසමට. PUC එකට. ඒ ගොල්ලන් අවස්ථා හතරකදී ඇඟිලි ගහනවා. එකක් තමයි, approval ගන්නකොට. මේ ඔක්කෝම දේ කළාට පසුව ගිහිල්ලා ඒ ගොල්ලන්ගෙන් අවසර ගන්න ඕනෑ. ඊට පස්සේ කැබිනට් එකෙන් කරන සංශෝධන ඒ ගොල්ලන්ට යවන්න ඕනෑ. කැබිනට් එකේ approval එක ගත්තාට පස්සේ නැවතත් යවන්න ඕනෑ. ඊළඟට, PUC එක අත්සන් කරන කොටත් යන්න ඕනෑ. මොකක්ද මේ පිස්සුව? අපි මේ පිස්සුව නවත්වන්නයි කටයුතු කරන්නේ. මම බොහොම වගකීමකින් මේ කරුණු කියන්නේ. මොකද, දැන් මේ කටයුතු තිත්ත වෙලා තිබෙන්නේ. මට අවශ්‍ය වෙලා තිබෙනවා, රුපියල් 14ට, රුපියල් 18ට විදුලි ඒකකයක් ගන්න. හැබැයි, රුපියල් 72ට නිෂ්පාදනය කරනවා. මේක හෙණ ගහන අපරාධයක්.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා ඊළඟ දවසක පාර්ලිමේන්තුවේදී, "ඇයි, තවම මේ විදියට විදුලිය ගන්නේ" කියලා අපෙන් ඇසුවොත් අපට කියන්න වෙන්නේ, "මේ මහජන උපයෝගිතා කොමිසම එක පැත්තකින්, විදුලි බලය අනෙක් පැත්තෙන්. මේ දෙකෙන් තැලෙනවා. අපි රුපියල් 72 එක නිෂ්පාදනය කරනවා, ඒක තිබෙන නිසා. අලුතින් ගන්න බැහැ." කියන එකයි. මේක තමයි සැබෑ තත්ත්වය. මහජන උපයෝගිතා කොමිසමේ වැඩ කරන කට්ටිය, 43. (2) (1) යටතේ තිබෙන කරුණු ඉවත් කරලා. පාරිභෝගිකයා ආරක්ෂා කරන්නයි අපට තිබෙන්නේ. එතැනින් exploitation, ඒ කියන්නේ අනවශ්‍ය ලෙස ඒකාධිකාරය පාවිච්චි කරලා තලන්න හදනවා නම්, ඒක කරන්න, නැත්නම් ඒ තුළින් යම් විධියකින් මිල වැඩි කරන්න හදනවා නම් ඒක කරන්න, මේවා තමයි එතැනින් කරන්න අවශ්‍ය වෙන්නේ. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, මේ වෙනස තමයි මම ඉල්ලා තිබෙන්නේ.

දැන් CEB එකේ තිබෙනවා, ඒ ගොල්ලන්ගේ Vision statement එක, policy එක. මහජන උපයෝගිතා කොමිසම - PUCSL - සම්පූර්ණයෙන්, හාත්පසින්ම ඒවා වෙනත් පැත්තකට ගෙනයන්න හදනවා. මේ නිසා තමයි වගකීමකින් ඒක වෙනස් කරන්න ඉල්ලා තිබෙන්නේ. අපේ කථානායකතුමා තමයි ඒ කාලයේ මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ. පාරිභෝගිකයා ආරක්ෂා කරන්න තමයි අපි පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ඇති කළේ. ඒක තමයි අපි කළේ. ඒ දෙක තුළින් පාරිභෝගිකයා ආරක්ෂා වෙනවා. හැබැයි, සැබෑ මට්ටමින් එවැන්නක් වෙන්නේ නැහැ. තවත් තැලෙනවා විතරයි; තවත් අධිකාරියක් එකතු වෙනවා විතරයි. ඒ දෙක අතර හැප්පෙන එක විතරයි වෙන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා ඉතාම උද්‍යෝගයෙන් මේ පනතින් පාරිභෝගිකයා ආරක්ෂා වෙනවාය; මේක තමයි තිබෙන එකම දේ කියලා කිව්වා. නමුත් අද ඔබතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියනවා, ඒක අනෙක් පැත්තටයි වෙලා තිබෙන්නේ කියලා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු මන්ත්‍රීතුමා, බලන්න ස්වාධීන කොමිෂන් සභා ගැන. ඒවා පත් කළාට මොනවාද වෙලා තිබෙන්නේ? ස්වාධීන කොමිෂන් සභා ටික වචනෙට තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඔබතුමා කියන්නේ, දහනවවන සංශෝධනයත් අයින් කරන්න කියලාද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නැහැ, නැහැ. දහනවවන සංශෝධනය තවත් ස්ථාපිත කරන්න ඕනෑ. මම ඒ මතයේ සම්පූර්ණයෙන් ඉන්නවා. නමුත් වැඩ කරන්න පුළුවන් වන්නේ යම් මට්ටමකට. මේ ඔක්කෝම ටික කථානායකතුමාගේ ඔළුවට දමලා, ස්වාධීන කොමිෂන් සභා හරියට වැඩ කරන්නේ නැහැ කියලා, බැණලා හරියන්නේ නැහැ.

මේ ස්වාධීන කොමිෂන් සභා ඇති කරන්න ඕනෑ. මේ ආයතන තුළින් වැඩ කරන්න පුළුවන්. දැන් පොලීසියේ දක්ෂ IGP කෙනෙක් ඉන්නවා. කල්මුනේ ඉන්න කෙනෙක් මාරු කරන්න එතුමාට බැරි නම්, මොකක්ද තත්ත්වය? ඒකට මාස දෙකක් යනවා නම්, බෝම්බයක් දාලා මාස දෙකක් යනවා කියන්නේත් තව බෝම්බයක් දමන්න පුළුවන් කාලයක්. මේ දවස්වල දොස්තර නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමාත් එක්ක අපි විශේෂ කාරක සභාවේදී ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න අහනවා. එහිදී අපට පෙනෙනවා, ඒ අයට තිබෙන දුක. ඒ විශේෂ කාරක සභාවට පැමිණෙන සාක්ෂිකරුවන් කියනවා, "අපි මේවා කියනවා, අහන්නේ නැහැ, ඇහෙන්නේ නැහැ"යි කියලා. ඊට පස්සේ අපි තමයි වැඩ කරන්නේ නැති ආණ්ඩුවක් බවට පත්වන්නේ. අපි මේ තත්ත්වය නිවැරදි කරන්න අවශ්‍යයි.

ගරු කථානායකතුමනි, ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා අසන ලද ප්‍රශ්නවලට උත්තර මෙසේයි.

1. 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 5.(2) (1) (ඇ) වගන්තියේ දක්වා ඇති පරිදි තිරසාර ආර්ථික සංවර්ධනයක් සඳහා පහසුකම් සැලැස්වීමට විදුලිබලය සැපයීම සම්බන්ධයෙන් වන මිල ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ යුතුය. ඒ අනුව 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ ප්‍රතිපාදන පරිදි විදුලි ගාස්තු තීරණය කිරීමේ ප්‍රතිපත්තිමය තීරණය රජය විසින් ගනු ලබන අතර, යම් පාරිභෝගික කාණ්ඩයකට ලබා දෙන සහනාධාර තීරණය කිරීම ද රජයේ කාර්යයකි. එම ප්‍රතිපත්තිය මත පිහිටා 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 30 (2), (3) හා (4) වගන්ති අනුව විදුලි ගාස්තු සමාලෝචනය කිරීම, පාරිභෝගිකයන්ට සහන සැලසීම සඳහා යම් පාරිභෝගික කාණ්ඩයකට ලබා දෙන රජය විසින් අනුමත කරන ලද සහනාධාර සඳහා පිරිවැය දැරීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් සපයන ලද අරමුදල්වල ප්‍රමාණාත්මකභාවය පිළිබඳව සෑහීමකට පත් වීමෙන් පසු සහ ඒ විෂයෙහි නිශ්චය කරනු ලබන යම් පාරිභෝගික කණ්ඩායමක් වෙතින් නැවත අය කරනු ලැබිය හැකි යම් ප්‍රතිසහනාධාර සැපයීම සැලකිල්ලට ගැනීමෙන් පසු බලපත්‍රලාභියා විසින් අය කළ යුතු එවැනි සහනාධාර අය කිරීම සහ ගාස්තු නියම කළ හැක. මෙහිදී විදුලි සේවාව සැපයීමට ලංකා විදුලිබල මණ්ඩලය මඟින් යෝජනා කර ඇති වියදම සාධාරණද යන්න සොයා බැලීම මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ කාර්යභාරයකි.

කෙසේ නමුත්, සමස්ත විදුලි ගාස්තු පිළිබඳ නියමය සිදු කරනු ලබන්නේ රජය මඟින් වේ.

ගරු කථානායකතුමනි, ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා ඇසූ තවත් ප්‍රශ්නයකට මම උත්තර දෙන්නම්. ඒ, ලංකා විදුලිබල මණ්ඩලයේ connection ලබා දීම සම්බන්ධයෙන්. මෙහිදී බොහොම අධික මිලක් අය කරනවා. මේ තත්ත්වය ඇති කර තිබෙන්නේ මහජන උපයෝගිතා කොමිසමෙන්. ඇත්ත වශයෙන්ම මේ ගණන සියයට 60ක්, 70ක් වැඩියි. සමහර වෙලාවට එක ගෙදරකට three-phase අරගෙන, ඊට පසුව අනික් ගෙදරට විදුලිය ගන්නවා නම්, ඒ පොඩි දුරට රුපියල් ලක්ෂ 3ක්, 4ක් පමණ යනවා. ඒක three-phase කරනවා නම්, රුපියල් ලක්ෂ 10ක් විතර යනවා. හැබැයි, සාමාන්‍යයෙන් මේකට ලංකා විදුලිබල මණ්ඩලයෙන් යන වියදම ලක්ෂ දෙක තුනක්. [බාධා කිරීමක්] නිර්දේශ කරලා තිබෙනවා. දැන් ඒක කරන්න යනකොට තමයි ඔබතුමා මේ ගැන ප්‍රශ්න කරන්නේ. නෛතිකව එතැන තිබෙනවා. එක පැත්තකින් ආදායම අඩු වෙනකොට, අපි නිෂ්පාදන වියදම අඩු කරන එකත් කරන්න ඕනෑ නේ. ඒක කරන්න ඉඩ දෙන්නේ නැහැ. ලංකා විදුලිබල මණ්ඩලයේ අවුරුදු විස්සක්, විසිඑකක් පරණ මැෂින් තිබෙනවා. අපේ ගරු කථානායකතුමා ඒ කාලයේ ඒක නිවැරදි කරන්න ගියා. නමුත් තවම කරන්න බැරි වුණා. එහෙම කරන්න බැරි වුණු නිසා රුපියල් 54ක් රුපියල් 60ක්, රුපියල් 70ක් යනවා ඒකකයකට. අද රුපියල් 17ට, 18ට ගන්න පුළුවන්. එහෙම ගත්තේ නැහැයි කියන්න බැහැ. ඒක තමයි මම කියන්නේ. මෙන්න මේ වෙනස්කම් කළා නම් අපි විකුණන මිලයි, ජනනය කිරීමේ මිලයි අතර වෙනස අඩු වෙනවා.

2. මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබූ කිසිදු ගාස්තු යෝජනාවක් මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කර නොමැති අතර, එය අනුමත කර නොමැති බව ද පෙන්වා දෙමි.

ඒ වාගේම ගරු කථානායකතුමාට අපි මතක් කරන්න අවශ්‍යයි, Constitutional Council එකට නම් පහක් ඉදිරිපත් කරලා තිබෙන බව. අලුත් කොමිසමක් පත් වෙනවා. මම කිසිසේත්ම කියන්නේ නැහැ, මහජන උපයෝගිතා කොමිසමේ තිබෙන සියලු දේම වැරදියි කියලා. එතැන බොහොම හොඳ දේවල් තිබෙනවා. නමුත්, ඕනෑ නැති තැන්වලට ඇඟිලි ගැසූ නිසා විදුලිබල මණ්ඩලය සහ මහජන උපයෝගිතා කොමිසම අතර ලොකු සීතල යුද්ධයක් තියෙනවා. ඒ නිසා මේ කාරණය බොහොම ප්‍රසිද්ධියේ කියන්න වෙනවා. ඒ සීතල යුද්ධය නිසා, අපේ ඉංජිනේරුවෝ අවුරුදු හතරක් තිස්සේ ටෙන්ඩර් කොමිටිවලට ගිහිල්ලා නැහැ. ඒ නිසා, දෙපැත්තම වැරැදියි. නමුත් ඒකේ ආරම්භය බැලුවොත්, ඔය සීතල යුද්ධය තමයි හේතුව. ඒ එක්කෙනෙක් Engineer කෙනෙක්. එතැන ඉඳලා ලංකා විදුලිබල මණ්ඩලයේ තියෙන ඒවාට ඇඟිලි ගහනවා. මෙන්න මේ ප්‍රශ්නය තමයි අපි නිවැරදි කරන්න හදන්නේ.

3. ඔව්. 2013 අංක 31 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනතේ 13.(5), (6) හා (7) වගන්තිවල ප්‍රතිපාදන යටතේ මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අවශ්‍ය අනුමැතිය ලබා ගත යුතුය.

4. ඔව්. ලංකා විදුලිබල මණ්ඩලයේ දිගු කාලීන ජනන ව්‍යාපෘති සැලැස්ම යටතේ, හඳුනාගත් ජනන බලාගාර හඳුනාගත් කාල සීමාවන් තුළ කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය. කෙසේ නමුත්, බොහෝ අවස්ථාවල දිගු කාලීන ජනන ව්‍යාපෘති සැලැස්ම යටතේ හඳුනාගත් ජනන බලාගාර ක්‍රියාත්මක කිරීම විවිධ හේතු නිසා ප්‍රමාදයට ලක්වීම සිදු වේ. මෙම තත්ත්වය තුළ, ඉහළ යන විදුලි ඉල්ලුම සපුරාදීම සඳහා එම විදුලි බලාගාරවලින් ලබා ගත යුතු විදුලිය වෙනත් විකල්ප බලාගාරවලින් ලබා ගැනීම සඳහා අවධානය යොමු වේ. මෙහිදී 2015 වර්ෂයේදී විශ්‍රාම ගැන්වීම නිසා පද්ධතියෙන් ඉවත් වූ ඇඹිලිපිටිය විදුලි බලාගාරය වසරක කාලයකට දීර්ඝ කිරීම සඳහා මහජන උපයෝගිතා කොමිෂන් සභාව අනුමැතිය ඉල්ලා සිටි අතර, වසරක කාලයකට දීර්ඝ කිරීම සඳහා විරෝධය නොදක්වන බව 2016 අප්‍රේල් 16 වැනි දින දන්වා ඇත. කෙසේ නමුත්, දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම යටතේ හඳුනාගත් ජනන බලගාර ක්‍රියාත්මක කිරීම තවදුරටත් ප්‍රමාද වීමේ තත්ත්වය තුළ අවශ්‍ය විදුලි අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා මෙගාවොට් 100ක් ඇඹිලිපිටිය Ace Power බලාගාරයෙනුත්, මෙගාවොට් 20ක් මාතර Ace Power බලාගාරයෙනුත්, මෙගාවෙට් 51ක් සපුගස්කන්ද Asia Power බලගාරයෙනුත් ලබා ගැනීම දීර්ඝ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත්තද, මහජන උපයෝගිතා කොමිෂන් සභාව ඒ සඳහා 2018 වර්ෂයේදී අනුමැතිය ලබා දුන්නේ නැත.

නමුත්, අපි අවසර ගත්තා.

දකුණු පළාත සඳහා අඛණ්ඩව විදුලිය ලබා දීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගෙන මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අනුමැතිය නොමැතිව වුවද, පද්ධතියේ අවශ්‍යතාව හා අඛණ්ඩව විදුලිය සම්පාදනය නොකිරීමෙන් ඇති විය හැකි ආර්ථික බලපෑම සැලකිල්ලට ගෙන ඇඹිලිපිටිය Ace Power බලාගාරයෙන් විදුලිය ලබා ගැනීම 2018 මාර්තු මස සිට වසර 03ක කාලයකට අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත දීර්ඝ කරන ලදී.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
Ace Power එකෙන් මිලදී ගැනීමට එකඟද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, මම එකඟ නැහැ. මුදල් ඇමති හැටියට මම කලින් කිව්වේ මේ බලාගාරය ගන්න කියලායි. ගන්න ගියාම, බිලියන 1.2කට විකුණන්න හැදුවත්, රජයේ තක්සේරුව සහ Aitken Spence එකේ තක්සේරුවයි අතර මිලියන 243ක වෙනසක් තිබුණා. ඒ ගැන කේවල් කිරීම නිසා එකඟතාවකට එන්න බැරි වුණා. ඒ නිසා ගත්තේ නැහැ. ඒ අවස්ථාවේ රංජිත් සියඹලාපිටිය විදුලිබල අමාත්‍යතුමාට කරන්න දෙයක් තිබුණේ නැහැ. ඒක ගන්න බැරි වුණා. ඒක අරගෙන අනෙක් දෙකත් අරගන්න අවසර ලැබුණාට, ක්‍රියාත්මක කළේ නැහැ. හැබැයි, දැන් අරගෙන තිබෙන මිල අනුව බැලුවාම, අඩුම මිල තිබෙන්නේ ඇඹිලිපිටිය බලාගාරයේ. 1.99යි එහි තිබෙන capacity charge එක. ඒක අනෙක් ඒවාට වැඩිය හුඟක් අඩුයි. නමුත්, අවශ්‍යතාව තිබෙන නිසා ඒක ගන්න තිබුණා 2015.

ඉතිරි විදුලි අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා විසඳුම් ලබා දීමට හදිසි විදුලි මිලදී ගැනීම් සිදු කිරීමට ලංකා විදුලිබල මණ්ඩලයට සිදු වුණා. මෙම තත්ත්වය තුළ අතිරේක පිරිවැයක් ලංකා විදුලිබල මණ්ඩලයට දැරීමට සිදු වුණා. කොළඹ වරායේ ලංකා විදුලිබල මණ්ඩලයට අයත් බත්තලක් මත ස්ථාපිත මෙගාවොට් 60ක බලාගාරය සඳහාත්, චුන්නාකම් ප්‍රදේශයේ ඉදි කරන ලද මෙගාවොට් 24ක බලාගාරය සඳහාත් මෙතෙක් මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දී නැත. කෙසේ නමුත්, මෙම වර්ෂයේදී ඇති වූ විදුලි ඉල්ලුම ඉහළ යෑමේ තත්ත්වයට මුහුණ දීම සඳහා මෙගාවොට් 20ක් මාතර Ace Power බලාගාරයෙන් මෙගාවොට් 51ක් සහ සපුගස්කන්ද Asia Power බලාගාරයෙන් ගන්න අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව වසර දෙකක කාලයකට දීර්ඝ කර තිබෙනවා.

මහජන උපයෝගිතා කොමිසම හදිසි අවස්ථාවලදී විදුලි ඒකකය රුපියල් 32ට, 33ට ගන්න අවසර දීලා තිබෙනවා. දැනට ලාභයටම යන එකක් තමයි කොළඹ වරායේ barge එකේ තිබෙන මෙගාවොට් 60ක බලාගාරය. එහි විදුලි ඒකකයක් රුපියල් 19.21යි. නමුත් තවම ඒකට අවසර දීලා නැහැ. මේවා ගැන කාගෙන්ද අහන්න තිබෙන්නේ? අඩු මිලට ගන්න තිබුණත් හදිසි අවස්ථා කියලා වැඩිපුර වියදම් කරලා ගන්න අවසර දෙනවා.

දැන් ඔබතුමා ඇහුවා, හදිසි අවශ්‍යතාවක් වුණොත් විදුලිය මිලදී ගැනීම සම්බන්ධයෙන්. එහි සඳහන් කර තිබෙනවා, හදිසි අවශ්‍යතාවක් වුණොත් තියෙන නීති අනුව ඇමතිතුමාට ගන්න පුළුවන් කියලා. අපි ඒකට අකැමැතියි. නමුත් කරන්න දෙයක් නැහැ. ටෙන්ඩරයට මාස ගණනාවක් යනවාය කිව්වාම අපි හිර වෙනවා. විදුලිය නැතුව ඉන්නවාද? එහෙම නැත්නම් මේ කියන විධියට විදුලිය ගන්නවාද? හදිසි අවශ්‍යතාවලදී අපි විදුලිය මිලදීගෙන තිබෙන්නේ, අද ජනනය කරන මිලට වඩා අඩුවෙන්. හදිසි අවශ්‍යතාවලදී අපි කොම්පැනි තුනකින් මෙගාවොට් 100ක් මිලදීගෙන තිබෙනවා. අනිවාර්යයෙන්ම සැප්තැම්බර් මාසය අග වනකොට අපි ඒක අවසන් කරනවා. හැබැයි ලංකා විදුලිබල මණ්ඩලය තවම ටෙන්ඩර් කරලා නැහැ, මේ කටයුතු අවසන් කරන්න. සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාටත් මා මේ කරුණු කිව්වා. කෝප් එකටත් මා ආරාධනා කරනවා. දොස්තර නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමාටත් මා මේ කරුණු කිව්වා. සියලු පක්ෂවල අය කැඳවා මේ ප්‍රශ්නය විසඳන්න කියලා.

ඔබතුමා කිව්වා, ලංකා විදුලිබල මණ්ඩලය නිසා මේ අවුරුදු ගණනාවට රුපියල් බිලියන 100ක් අහිමි වුණාය කියලා. ඒක වැරැදියි. අවුරුදු 10කට විතර රුපියල් බිලියන 200ක් විතර අහිමි වුණා. මේ රුපියල් බිලියන 200 අපට ප්‍රාග්ධන වියදම් වශයෙන් පාවිච්චි කරන්න තිබෙන මුදලක්. එය අලාභයක්. මේ වාගේම තමයි Ceylon Petroleum Corporation එකේ තත්ත්වයත්. මේවා නිවැරදි කළා නම් රට හදන එක ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, කාල වේලාව ඉක්මවා ගොස් තිබෙන නිසා වෙලාව සම්බන්ධයෙනුත් ඔබතුමාගේ අවධානය යොමු කරනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ ගැන මා කනගාටු වෙනවා ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කමක් නැහැ, ඔබතුමා පැහැදිලි කරන්න. අවශ්‍ය දෙයක් නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

වසර ගණනාවක් පද්ධතියට සම්බන්ධ කර විදුලිය ලබා ගන්නා ලද විදුලි බලාගාරවලින් විදුලිය ලබා ගැනීම අනුමත නොකරන ලද අතර, හදිසි විදුලිය මිලදී ගැනීම සිදු කිරීම සඳහා යොමු වීමට සිදු වීමෙන් ලංකා විදුලිබල මණ්ඩලයට දැඩි ආර්ථික බලපෑමක් ඇති විය.

5. විදුලිබල ක්ෂේත්‍රය යනු මෙරට ආර්ථිකයේ පදනම වන අතර මෙම තත්ත්වය තුළ රජයේ ඍජු අධීක්ෂණයෙන් යුතු නියාමන ක්‍රියාවලියක් විදුලිබල ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පවත්වා ගෙන යෑමේ අවශ්‍යතාවෙහි වැදගත්කම අවධානයට යොමුව ඇත. මෙම තත්ත්වය තුළ විදුලිබල ක්ෂේත්‍රයේ ආර්ථිකමය කටයුතු, එනම් විදුලි බලාගාර ඉදිකිරීම වැනි තත්ත්ව සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට අමාත්‍ය මණ්ඩලයට බලය තිබිය යුතු බවට ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ඉදිරිපත් වූ අමාත්‍ය අනුකමිටුව මඟින් නිර්දේශ කර තිබූ අතර එය 2019.06.04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමත කර ඇත. එමෙන්ම 2019.06.04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇත්තේ, පාරිභෝගික අයිතීන් සුරැකීම, ආරක්ෂාව, නියාමනය කිරීම වැනි ක්ෂේත්‍ර නියාමනය කිරීමේ බලය මහජන උපයෝගිතා කොමිෂන් සභාවට ලබා දිය යුතු බවත්, ආර්ථිකමය කරුණු පිළිබඳ රජයේ ප්‍රතිපත්ති අනුව බලශක්ති ක්ෂේත්‍රය නියාමනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ ඍජු අධීක්ෂණයක් තිබිය යුතු බවත්ය. ඒ අනුව ඒ අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අවශ්‍ය අනුමැතිය ලබා දී තිබේ.

මේ සඳහා අවශ්‍ය සංශෝධන විදුලිබල පනතට ඇතුළත් කිරීමට අනුමත වී ඇති අතර, ඒ සඳහා වූ ඉල්ලීම නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට යොමු කර ඇත.

ගරු කථානායකතුමනි, මා බොහොම සද්භාවයෙන් මේ කරුණු කියන්නේ. මට වැඩිය කථානායකතුමා මේ කාරණය දන්නා නිසායි මම බය නැතිව මේ ගැන කියන්න වෙලාව ගත්තේ. මේ රට හදන්න විදුලිබල මණ්ඩලය අත්‍යවශ්‍ය සේවයක් ඉටු කරනවා. ඒ නිසා ඇඟිලි ගැසීම් නැතිව, දූෂණ නැතිව ඕනෑ දෙයක් කරන්න. නමුත් එක දෙයක් තිබෙනවා. නිවැරදිව කටයුතු කිරීමේ ප්‍රායෝගික පද්ධතියක් ඇති කළ යුතු වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. ඒ ගැන අද හුඟක් වාද විවාද කරන්න අමාරුයි. කාලය ඉක්මවා ගොස් තිබෙනවා. ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා, ප්‍රශ්න අසා අවසානද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගොඩක් විවාද කරන්න මා යන්නේ නැහැ, ගරු කථානායකතුමනි. මේ ගොඩක් දේවල් රටේ සිද්ධ වෙලා තිබෙන්නේ මහජන උපයෝගිතා කොමිෂන් සභාවට හෝ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට යටත්ව නොවෙයි. මේ රට විශාල ණය කන්දකටත්, විශාල ආර්ථික ප්‍රපාතයකටත් ගෙන ගියේ පැවැති කැබිනට් මණ්ඩල මිසක් වෙන කවුරුවත් නොවෙයි. ඉතිහාසයේ ඉඳලාම තිබුණු කැබිනට් මණ්ඩල තමයි. ඒ නිසා තමයි, කැබිනට් මණ්ඩලයට පමණක් නොදී පාරිභෝගිකයාගේ පැත්තෙන් සාධාරණව මේ ප්‍රශ්න දෙස බලන්න ආයතනයක අවශ්‍යතාව පිළිබඳව පෙන්වා දීලා තිබෙන්නේ. හැබැයි, කැබිනට් මණ්ඩලයේත්, අමාත්‍යවරුන්ගේත් ඉතිහාසයේ records ඒ තරම් හොඳ නැහැ. ඔබතුමාගේ වුණත් එහෙමයි. Records හොඳ නැති වුණාම සිද්ධ වන්නේ මොකක්ද? මහජන උපයෝගිතා කොමිෂන් සභා පසෙකට දමලා, මිලදී ගැනීමත්, මිල තීරණය කිරීමත් කියන සියල්ල අමාත්‍යවරයා සහ කැබිනට් මණ්ඩලය අතට ගන්නවා කියන කොටම අදහස් වන්නේ මොකක්ද? රවි කරුණානායක අමාත්‍යවරයා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සතුව තිබෙන බලතල පැත්තකින් තියලා, මිලදී ගැනීමට නිර්දේශ දෙන්න ඒ අයට තිබෙන ඉඩකඩ පැත්තකින් තියලා, ඇමතිතුමාගේ අතට ඒ බලය ගන්න හදනවා කියන කොට ජනතාවට හිතෙන්නේ මොකක්ද? මෙතැනත් ගේමක් දෙන්න තමයි හදන්නේ කියන එකයි ජනතාවට හිතෙන්නේ. මා අවංකවයි මේ කාරණය කියන්නේ. මෙතැනත් ගේමක් දෙන්න තමයි මේ හදන්නේ කියලා ජනතාවට හිතෙනවා. "එතැන සිටියදී මෙහෙම ගේමක් දුන්නා. ලංකා විදුලිබල මණ්ඩලයට ගිහිල්ලාත් ගේමක් දෙන්න හදනවා" කියලා තමයි මහජනයා තේරුම් ගන්නේ. එකයි මම මේ කියන්නේ. මහජනයාගේ පැත්තෙන් මේ ප්‍රශ්න දෙස බලලා, සාධාරණය ඉටු කිරීම සඳහා පිහිටුවා තිබෙන ආයතන තවත් බලවත් කිරීම තමයි මගේ නම් යෝජනාව, ගරු ඇමතිතුමා. මොකද, ඔබතුමන්ලාගේ records හොඳ නැති නිසා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, අපේ අනුර දිසානායක මන්ත්‍රීතුමාට හොඳ දක්ෂතාවක් තිබෙනවා ඔළුව අතගාලා හොඳ ටොක්කක් දෙන්න. Records ගැන කථා කළ නිසා මේ කාරණයත් මා කියන්නට ඕනෑ. තමුන්නාන්සේලාත් නීතිය අතට ගත්ත යුගයක් තිබුණා නේ. ඒවා නිවැරදි කරනවා නේ. මේ records කියන එක ඔබතුමන්ලානේ ඇති කරලා තිබෙන්නේ. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දැන් වේලාව පහුවෙලා තිබෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම කියන්නේ මේකයි. ඒ වාගේ පෙන්නුවාම හැම කෙනාම හොරු වාගේ පෙනෙනවා. අද සැබෑ හොරු අල්ලන්නේ නැතිව නිකම් බොරුකාරයන් පස්සේ දුවලා, ප්‍රශ්නයක් ඇති කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා පිළිතුරු ලබා දීලා අවසන්ද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒ නිසා මම වගකීමකින් කියන්නේ. ඔබතුමා කියනවා, මේ තත්ත්වය කැබිනට් මණ්ඩලයේ,- [බාධා කිරීමක්] එහෙම නම් ඔබතුමාත් කැබිනට් මණ්ඩලයක සිටියා නේ. ඇයි හිටියේ නැද්ද? ඒ කාලයේ ප්‍රශ්න ඇති වුණේ නැද්ද? ඒ records ඔක්කෝම තිබෙනවා. ඒක තමයි ජනතාව කියන්නේ, මේ 225දෙනාම එක වාගේ කියලා. මේක තමයි තිබෙන ප්‍රශ්නය. එක්කෙනෙක්, දෙදෙනෙක්, තුන්දෙනෙක් නොවෙයි, මේක උඩ ඉඳන් පහළටම තිබෙන බෝ වන රෝගයක්. ඒක අපි නිවැරදි කරන්න ඕනෑ. අපි

දැන්වත් එකතු වෙලා මේ වැරදි නිවැරදි කරන්න ඕනෑ. මට කථා කරන්න මේ අවස්ථාව ලැබීම මා අගය කරනවා. [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අපි ඊළඟ කාරණයට යමු. We will go to the next Item.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක තමයි, අපි මේ ප්‍රශ්නය ඉවර කරන්න ඕනෑ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මට පොඩි වෙලාවක් දෙන්න කාරණයක් අහන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේ ගැන debate එකක් කරන්න බැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුරක් දෙන්න ගරු රවි කරුණානායක ඇමතිතුමා කැමැතියි නම්, ඔබතුමාට ඒ ප්‍රශ්නය අහන්න පුළුවන්. නැත්නම්, අපි ප්‍රධාන වැඩ කටයුතුවලට යමු.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
උදේ පාන්දර ඕපා දූප කථා කරන්න එපා. -[බාධා කිරීම්]- I agree, but there is no time. Now it is 11.30.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
No, I just want to raise - [*Interruption.*]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
The Resolution under the Public Security Ordinance has to be debated and passed. -[*Interruption.*]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I cannot allow this. දැන් කීප දෙනෙක්ම කථා කරන්න අවස්ථාව ඉල්ලා සිටිනවා. අද ඒක කරන්න අමාරුයි. We have to move on to the next Item. We are already late.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, if they want a Debate on this, we will give it tomorrow.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Education සම්බන්ධ ප්‍රශ්නයටත් අවස්ථාවක් දෙන්න එහෙනම්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒකට Debate එකක් ඕනෑ ද? Hon. Ravi Karunanayake, shall we give a Debate on this tomorrow? Are you agreeable to it?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I am agreeable, but there are some other matters. Hon. Leader of the House, I would appreciate, if you could give us ten minutes to resolve this matter now itself, because this is a very critical moment. I think answering them would show that -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Leader of the House, we will give ten minutes. Then we can finish it off.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි lunch එකට නවත්වන්නේ නැතිව දිගටම සභාවේ වැඩ කටයුතු කරගෙන යමු.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි. ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය කෙටියෙන් අහන්න.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, ඉතා කෙටියෙන් මම ප්‍රශ්නය අහන්නම්. පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට මම පැමිණිල්ලක් කරලා තිබෙනවා, ලංකා විදුලිබල මණ්ඩලයට විරුද්ධව. ලංකා විදුලිබල මණ්ඩලයේ හදිසි මිලදී ගැනීම් මඟින් මේ රටේ මහජන මුදල් වංචා කරලා තිබෙනවා. ඒ වාගේම තවත් පැත්තකින් මහජන මුදල් අවභාවිත කර තිබෙනවා. අද පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය මේ පිළිබඳව පරීක්ෂණ කරගෙන යන බව ඔබතුමා දන්නවාද කියලායි මම අහන්නේ. දන්නවා නම්, එම පරීක්ෂණයෙන් කෙරීගෙන යන කරුණු හෙළිදරව්වීමත් ඔබතුමාගේ ඔය කාරණයට සැලකිල්ලට ගන්න. ඔබතුමා 'මැට්ටන්' ගැන කිව්වා. හොරුන් හා මැට්ටන් අතර නම් තීන්දු කරන්න තිබෙන්නේ, හොරුන්ට වඩා මැට්ටන් හොඳයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවි කරුණානායක ඇමතිතුමා එම ප්‍රශ්නයට පිළිතුරක් දෙනවාද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒක 2015 ඉඳන් 2016 දක්වා වූ කාලය තුළ වුණේ. Generators ප්‍රශ්නය නේද? Generators 50යි, Ace Power එකයි,-

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

Ace Power එක සහ generators 50ක් මිලදී ගැනීම හා ඒවා අකර්මණ්‍ය වී තිබීම.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒ සියලු දේ සම්බන්ධයෙන් කරුණු දන්නවා. ඒ generators 50 සම්බන්ධව ප්‍රශ්නයක් තිබෙනවා. ඒක නිවැරදි කිරීමේ වැඩ පිළිවෙළක් අපි දැන් ගෙනයනවා. ඔබතුමා ඒ කරුණ මතු කිරීම අපි අගය කරනවා. Ace Power Embilipitiya (Pvt) Ltd ගැන ප්‍රශ්නයක් අහලා තිබෙනවා. මම වගකීමෙන් කියනවා, එතැන ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ ඒ කාලය අනුවයි. අපි ඒ machines අරගෙන තිබෙන වියදම අඩුයි. නමුත් ඒක විදුලි බල මණ්ඩලයෙන් ගත්තාට වැඩිය හොඳයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අපි විනාඩි 10කින් මේ කාරණය අවසන් කරන්නට ඕනෑ. මීළඟට, ගරු නිමල් ලාන්සා මැතිතුමා. ඊට පසුව ගරු වමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. [බාධා කිරීමක්] ඔව්. ඊට පසුව අපේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු මහින්ද අමරවීර මැතිතුමා.

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)

ගරු කථානායකතුමනි, මා විදුලි පාරිභෝගිකයකු විධියටයි ගරු ඇමතිතුමාගෙන් මේ ප්‍රශ්නය අහන්නේ. ගර ඇමතිතුමනි, විදුලිය මිලදී ගැනීමේ දී මේ රටේ තිබෙන දූෂිතම ආයතනයක් විධියට තමයි ලංකා විදුලි බල මණ්ඩලය අපි එදා ඉඳලා දකින්නේ. හැබැයි, විදුලි පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා තමයි විශේෂයෙන් මහජන උපයෝගිතා කොමිසම පත් කරලා තිබෙන්නේ. විදුලි බල මණ්ඩලය කියන්නේ තනි monopoly එකක් තිබෙන ආයතනයක්. ඔබතුමා කරන්න යන මේ වැඩෙන් මිලදී ගත්තාට පසුව කාටවත් බැහැ, එය අඩු කරන්න. හැබැයි, මිලදී ගන්න පෙර ඒ පිළිබඳව හොයලා බලලා කටයුතු කරන එක තමයි මහජන උපයෝගිතා කොමිසමෙන් කළේ. ඒක අහෝසි කරපු ගමන් වෙන්නේ, ඕනෑ ගණනකට ඕනෑ කෙනෙකුට මිලදී ගන්න පුළුවන් වීමයි. ඊට පස්සේ විදුලි පාරිභෝගිකයන් වන අපට ඒ කියන ගණන ගෙවන්න වෙනවා. මේ monopoly එක පොඩ්ඩක් හරි පාලනය වුණේ මහජන උපයෝගිතා කොමිසම නිසා. ඇයි ඒ කොමිසමේ කටයුතු අවලංගු කරන්න යන්නේ?

ඊළඟට මම කියන්නේ මේකයි. ගරු කථානායකතුමාත් විදුලි බල අමාත්‍යවරයා විධියට කටයුතු කර තිබෙනවා. මෙහි සිටින ඇමතිවරු ගණනාවක් විදුලි බල ඇමතිවරු විධියට කටයුතු කර තිබෙනවා. ඒ කවුරුවත් මේ කොමිසමේ කටයුතු අවලංගු කරන්න කටයුතු කළේ නැහැ. ඒ නිසා විදුලිය පරිභෝජනය කරන පාරිභෝගිකයකු විධියට මම අහන්නේ,-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Yes, Hon. Leader of the House, what is your point of Order? I will allow only two Hon. Members and then finish this off.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මේ විධියට ස්ථාවර නියෝග 27(2) යටතේ විවාද තියන්න ගියොත් සවස 6.00 වෙනතුරු කථා කරන්න වෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Ten minutes දුන්නා, at the request of the Hon. Minister.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

This is all wrong.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

At the request of the Hon. Minister, I gave 10 minutes.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, this procedure is wrong. You cannot allow debates like this.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

I know that.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

You cannot allow it. According to the Standing Orders, a Question is asked and then you answer that. That is the end of it.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

With the permission of the Hon. Minister -

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මේක වැරදියි. මේ වැරදි ක්‍රමයක්. ස්ථාවර නියෝග අනුව 27 (2) යටතේ මෙහෙම විවාද දෙන්න බැහැ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
It was decided by the - [*Interruption.*]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
That is true, but-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු මන්ත්‍රීතුමා, මට බොහොම කෙටි උත්තරයක් දෙන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. Minister requested 10 minutes. So, I allowed the 10 minutes for him. -[*Interruption.*]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
This is not a debate.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I know. I know that but I allowed it with the concurrence. Let me proceed.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු මන්ත්‍රීතුමනි, ඔය ක්‍රමවේදය නැති වුණේ 2005 ඉඳලා 2015 දක්වා. කරුණාකරලා මැරිලා ඉපදුණා වාගේ කථා කරන්න එපා. ප්‍රශ්න තිබෙනවා. අපි ඔක්කෝම එකට එකතුවෙලා ඒවා නිවැරදි කර ගනිමු. ඒවා නිවැරදි කිරීම තමයි කරලා තිබෙන්නේ. විමර්ශනය කළොත් පෙනෙනවා, කොමිසමත් එක්ක තමයි ප්‍රශ්නය තිබෙන්නේ කියන එක. ඒක නැති වුණා නම්, මේ ප්‍රශ්න සම්පූර්ණයෙන් අඩු වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු චමින්ද විජේසිරි මැතිතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මට පොඩි ඉල්ලීමක් කරන්න තිබෙනවා.

ගරු ඇමතිතුමනි, මම අද බලංගොඩ පසුකරගෙන එද්දී, කිරිගොල්ල පන්සලට විදුලිය ලබාදීම පිළිබඳ අර්බුදයක් නිසා විශාල උද්ඝෝෂණයකට සූදානම් වෙලා ඉන්නවා. ඔබතුමා ඒ පිළිබඳව දන්නවා නම්, ඒ ගැන මේ සභාවේ පැහැදිලි කිරීමක් කරන්න. මොකද, එය වැදගත්.

**ගරු සුජීව සේනසිංහ මහතා (විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ කැබිනට් නොවන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க - விஞ்ஞான, தொழில்நுட்ப மற்றும் ஆராய்ச்சி அமைச்சரவை அந்தஸ்தற்ற அமைச்சர்)
(The Hon. Sujeewa Senasinghe - Non Cabinet Minister of Science, Technology and Research)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා සඳහන් කළ කාරණය සම්බන්ධයෙන් මම පැහැදිලි කිරීමක් කරන්නම්. කිරිගොල්ල පන්සලේ නායක ස්වාමීන් වහන්සේ දැනට මාස ගණනාවක සිට උත්සාහ දරා තිබෙනවා, විදුලිය ලබා ගන්න. නමුත් ඒකට අවසර ලැබී නැහැ. මම අමාත්‍යවරයා ලෙස පත් වුණ ගමන්ම ඒ සඳහා අවසරය ලබාදුන්නා. අවසර දුන්නේ, සුමානයකින් ඒ වැඩකටයුතු කරලා 30වන දා වන විට විවෘත කරන්නයි. නමුත්, අපේ නිලධාරින්ගෙන් යම් බාධා එල්ල වෙන බව පෙනෙනවා. නීතිය කඩන අයට මම බොහොම කාරුණිකව මෙන්න මේ කාරණය කියන්න ඕනෑ. 30වන දා වනකොට ඒ පන්සලට විදුලිය ලබා දෙන්න අපි ලෑස්තියි. ඒකට බාධා කරන්න එපා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සුජීව සේනසිංහ ඇමතිතුමනි, ඔබතුමා කියන්න හදන කාරණය මොකක්ද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීම්] මට අවස්ථාව දෙන්න. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවස්ථා ලබාදීලා ඉවරයි. We will now move on to the next Item.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු කථානායකතුමනි, අපට කථා කරන්න chance එකක් හම්බ වෙන්නේ නැහැ නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ විදුලිය ලබාදෙන එකට බාධා කරනවා. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ඒක නවත්වන්න හදනවා. [බාධා කිරීම්]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු ඇමතිතුමනි, මම එක ප්‍රශ්නයයි අහන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා යම් චෝදනාවක් කළා. එතුමාට මම ස්තුතිවන්ත වනවා. එතුමාගේ ඒ චෝදනාව

[ගරු සුජීව සේනසිංහ මහතා]

හොඳයි. ගරු ඇමතිතුමනි, ගෙනාපු generators 50 සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒ නිලධාරියා ඉල්ලා අස් වෙන්නේ නැද්ද? ගෙනාපු generators පාවිච්චි කරන්න බැරි නම්, ඒවා අකර්මණ්‍ය වෙලා තිබෙනවා නම් ඒ වැරදි අමතක කරලා යනවාද? ගරු කථානායකතුමනි, වෙනත් රටවල නම් එහෙම නොවෙයි සිද්ධ වෙන්නේ. පාවිච්චි කරන්න බැරි තත්ත්වයේ generators ගෙනැල්ලා තිබෙනවා නම්, ඒවා අකර්මණ්‍ය නම් ඒ අදාළ නිලධාරීන් ඉල්ලා අස් වෙන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Okay, the point is taken.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඒවා ගෙන්වනකොට හිටපු ඇමතිවරයාත්, - [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ කාරණය දැන් අවසානයි. Hon. Minister replied to everything.

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
අපි කිව්වා නේ, එළවපු හොරු ආයේ ගන්න එපාය කියලා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ සම්බන්ධයෙන් තවමත් පරීක්ෂණ, - [බාධා කිරීම්]

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට හතර-පස් වතාවක් අවස්ථාව දුන්නා නේ, ගරු මහින්ද අමරවීර මන්ත්‍රීතුමනි. දැන් අපි ඊළඟ වැඩකටයුතුවලට යමු. මට සහයෝගය දෙන්න.

ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී යෝජනා. ගරු සභානායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ඊට පෙර, ස්ථාවර නියෝග 27 (2) යටතේ ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා අසන ප්‍රශ්නය තිබෙනවා නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමා නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
Yes, I am sorry. Hon. Douglas Devananda is not there.

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That the proceedings on Item Nos. 1, 2 and 3 of Public Business appearing on the Order Paper be exempted at this day's sittings from the provisions of the Standing Order 27 of the Parliament."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## මහජන ආරක්ෂක ආඥාපනත: යෝජනාව
## பொதுமக்கள் பாதுகாப்புக் கட்டளைச் சட்டம்: தீர்மானம்
## PUBLIC SECURITY ORDINANCE: RESOLUTION

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1959 අංක 8 දරන පනතින් ද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2019 ජූනි 22 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය."

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විවාදය ආරම්භ කිරීම. ගරු නලින් බණ්ඩාර ජයමහ නියෝජ්‍ය අමාත්‍යතුමා.

[පූ.භා. 11.40]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා (සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ - அபிவிருத்தி உபாயமுறைகள் மற்றும் சர்வதேச வர்த்தக பிரதி அமைச்சர்)
(The Hon. Nalin Bandara Jayamaha - Deputy Minister of Development Strategies and International Trade)
ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබාදීම පිළිබඳව පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

විශේෂයෙන්ම අප්‍රේල් මාසයේ ඒ පාස්කු ඉරු දින සිදු වූ ප්‍රහාරයත් එක්ක තමයි අපට නැවත වතාවක් හදිසි නීතිය ගෙන එන්න සිද්ධ වුණේ. අප සියලුදෙනාම එම ප්‍රහාරය හෙළා දකිනවා. ඒ වාගේම එම සිදුවීමෙන් මරණයට පත් වූ අයට අපේ කනගාටුව නැවත නැවතත් පළ කරනවා. තුවාල ලැබූ තවත් විශාල පිරිසක් ඉන්නවා. ඒ අයටත් ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරන අතර, හදිසි නීතිය නැවත දීර්ඝ කිරීමේ අවශ්‍යතාව පිළිබඳව වචන කිහිපයක් කථා කරන්න මම කැමැතියි.

ගරු කථානායකතුමනි, හදිසි නීතිය ගෙන ඒමත් එක්කම ත්‍රිවිධ හමුදාවට විශේෂ වගකීම් රාශියක් පැවරෙනවා. මෙම සිදුවීමෙන් පසුව ත්‍රිවිධ හමුදාව ගන්නා ක්‍රියාමාර්ග, ඔවුන්ගේ කටයුතු ඉදිරියට කරගෙන යෑමේ අවශ්‍යතාව තිබෙනවා. ඒ නිසා මම හිතනවා,-

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද, ගරු මන්ත්‍රීතුමනි?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායක් තිබෙනවා. අපට ගරු නලින් බණ්ඩාර ජයමහ නියෝජ්‍ය අමාත්‍යතුමා පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. ආරක්ෂක අමාත්‍යවරයා වශයෙන් ඉන්නේ ජනාධිපතිතුමා නිසා, සාමාන්‍ය සම්ප්‍රදායට අනුව රාජ්‍ය අමාත්‍යවරයා තමයි හදිසි නීති විවාදයකදී යෝජනාව ඉදිරිපත් කරන්නේ. විවාදය සඳහා යෝජනාව ඉදිරිපත් කරලා, සභානායකවරයා, එහෙම නැත්නම් ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා, එහෙමත් නැත්නම් කැබිනට් අමාත්‍යවරයෙක් ඒ පිළිබඳව වග කීමෙන් ප්‍රකාශයක් කිරීම තමයි සාමාන්‍ය සම්ප්‍රදාය වන්නේ. එම සම්ප්‍රදායට පිටින් තමයි දැන් කටයුතු සිද්ධ වෙන්නේ. ගරු නලින් බණ්ඩාර ජයමහ නියෝජ්‍ය අමාත්‍යතුමාත් එක්ක තිබෙන ප්‍රශ්නයක් නිසා මම මේ කරුණ කියනවා නොවෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභානායකතුමා යෝජනාව ඉදිරිපත් කළා නේද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම යෝජනාව ඉදිරිපත් කළා. ආරක්ෂක ඇමතිතුමා හෝ රාජ්‍ය ඇමතිතුමා යෝජනාව ඉදිරිපත් කිරීම තමයි සම්ප්‍රදාය වන්නේ. අතිගරු ජනාධිපතිතුමා දැන් මේ ගරු සභාවේ නැහැ. ඇත්ත වශයෙන්ම රාජ්‍ය ඇමතිතුමා මේ සභාවේ ඉන්න ඕනෑ.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඒ දෙදෙනාම නැත්නම් වගකිව යුතු කැබිනට් අමාත්‍යවරයෙක් විසින් යෝජනාව ගේන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභානායකතුමා අද යෝජනාව ඉදිරිපත් කළ නිසා අපි ඒක පිළිගනිමු. ඔබතුමා කියන එක මට තේරෙනවා. Your point is taken. ඒක තමයි නියම ක්‍රමවේදය.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මම යෝජනාව ගෙනාවා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු කථානායකතුමනි, මේ පැවැත්වෙන්නේ හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳ විවාදයයි. මේ පාර්ලිමේන්තුව මේ තරම් බාල්දු වෙන්න ඉඩදෙන්න බැහැ. මීට පෙර මේ වාගේ තත්ත්වයක් ඇති වුණේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභානායකතුමා අද යෝජනාව ඉදිරිපත් කළා නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මොකක්ද බාල්දුව? මම යෝජනාව ඉදිරිපත් කළා නේ.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මේක අවාසනාවන්ත තත්ත්වයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභානායකතුමා යෝජනාව ඉදිරිපත් කළා නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම යෝජනාව ඉදිරිපත් කළා. දැන් විවාද කරන්න පුළුවන්.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
අඩු ගණනේ ඔබතුමාට ප්‍රකාශයක් කරන්න තිබුණා නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
"හදිසි නීතිය මාසයකින් දීර්ඝ කළ යුතුයි" කියන යෝජනාව මම ඉදිරිපත් කළා. ඉතින්, වෙන මොනවා කියන්නද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් අපි විවාදයට යමු. [බාධා කිරීමක්] ඔබතුමා කොච්චර කිව්වත් දැන් විවාදය පටන් ගන්න එපා යැ. ආරක්ෂක අමාත්‍යවරයා මෙතැන ඉන්න ඕනෑය කියන කාරණයට මම එකඟ වෙනවා. මම ඒක පිළිගන්නවා. ඒ වෙනුවට තමයි සභානායකතුමා විසින් යෝජනාව ඉදිරිපත් කළේ. ඔබතුමා කියපු point එක මම ගත්තා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මට මතකයි, ඒ කාලයේ අපි විපක්ෂයේ ඉන්නකොට රන්ජන් විජේරත්න මැතිතුමා ආරක්ෂක ඇමතිතුමා වෙනුවෙන් හැම දාම මේ සභාවේ හිටියා. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. මම ඒ points ගත්තා නේ.

ගරු නලින් බණ්ඩාර ජයමහ නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. [බාධා කිරීමක්]

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මින් ඉදිරියට මේ වාගේ දේවල් නොවෙන්න,- [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අද පස් වරු 1.30ට පවත්වන පක්ෂ නායක රැස්වීමේදී අපි ඒ ගැන කථා කරමු.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ශ්‍රී ලංකා පොලීසියට කටයුතු කරන්නට පුළුවන් වුණත්, ත්‍රිවිධ හමුදාවේ කටයුතු කිරීමේදී හදිසි නීතිය පැවතීම ඉතාම වැදගත් වෙනවා. එම නිසා, තවදුරටත් හදිසි නීතිය ක්‍රියාත්මක කිරීම ඉතා අවශ්‍යයි කියා අප හිතනවා.

පසුගිය අප්‍රේල් 21වන දා සිදුවීමෙන් පස්සේ, 2,389 දෙනෙක් අත්අඩංගුවට ගන්න කටයුතු කර තිබෙනවා. 236 දෙනෙක් දැනට රිමාන්ඩ් භාරයේ පසු වෙනවා. 189 දෙනෙක් රඳවා ගැනීමේ නියෝග මත තබාගෙන ප්‍රශ්න කරනවා. ඉන් තුන්දෙනෙක් හදිසි නීතිය යටතේත්, 186 දෙනෙක් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේත් අත්අඩංගුවට ගෙන තිබෙනවා. ඒ අනුව ඒ මුළු ගණන 425යි. එයින් 263 දෙනෙකුට නඩු දමන්නට පුළුවන් වටපිටාව නිර්මාණය වී තිබෙනවා. එයින් තවත් 94 දෙනෙකුගේ තොරතුරු උපදෙස් සඳහා නීතිපති වෙත යවා තිබෙනවා. තවත් හතළිස් දෙදෙනෙකුගේ තොරතුරු නීතිපතිතුමා වෙත යැවීම සඳහා අවශ්‍ය කටයුතු කර තිබෙනවා. හත්දෙනෙක් නිදහස් කර තිබෙනවා.

ඊළඟට, ප්‍රධාන වැරදිකරුවන් 79 දෙනෙක් CID භාරයේ ඉන්නවා. TID භාරයේ 29 දෙනෙක් ඉන්නවා. කොළඹ අපරාධ කොට්ඨාසය - CCD - භාරයේ 29 දෙනෙක් ඉන්නවා. අපි ලබා ගත් තොරතුරු අනුව, ප්‍රධාන සැකකරුවන් සියලුදෙනාම වාගේ අත් අඩංගුවට අරගෙනයි තිබෙන්නේ. විශේෂයෙන් ඒ වටපිටාව තුළ, රටේ ආරක්ෂාව පිළිබඳව අපට තහවුරුවක් දෙන්න පුළුවන්. නමුත් තවදුරටත් මේ පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම, මේ අයගේ තවත් තොරතුරු එකතු කිරීම ඉතාම වැදගත් වෙනවා.

පසුගිය කාලය තුළ සහරාන්ගේ දේශනවලට සහභාගිවෙලා අතරමඟදී ඒ දේශනවලට සහභාගි නොවී හැර ගිය පිරිසක් ඉන්නවා. ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය ඒ අය පිළිබඳවත් විපරම් කරමින් සිටිනවා. මේ අය ඒ දේශන හැර ගියේ ඇයි, තවදුරටත් මේ අයට ඒ සම්බන්ධතා තිබෙනවාද කියා සොයා බලා කටයුතු කරනවා.

සහරාන්ගේ දේශනවලට සම්බන්ධ වූ 51 දෙනෙක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඔවුන් වෙන කිසි දෙයකට සම්බන්ධ වෙලා නැහැ. නමුත්, ඔවුන්ට ඊළඟට මොකක්ද කරන්නේ කියන එක ගැනත් අප දැඩි අවධානයක් යොමු කර තිබෙනවා. ඔවුන්ට නඩුවක් ගොනු කරන්නට විධියක් නැහැ. ඔවුන් දේශනවලට සහභාගි වීම විතරයි කරලා තිබෙන්නේ. නමුත් ඔවුන් නිදහස් කිරීමේදී අපට දැඩි තීන්දු ගන්නට වෙනවා. ඔවුන් නිදහස් කරනවා නම්, ඒ මොන පදනම මතද කියන එක අපට හිතන්න වෙනවා. විශේෂයෙන් ඔවුන් පුනරුත්ථාපනය කිරීමට යම්කිසි ක්‍රමවේදයක් සකස් කරලා තමයි නිදහස් කරනවා නම් නිදහස් කරන්න වෙන්නේ. මෙවැනි වට පිටාවක් තමයි දැනට නිර්මාණය වී තිබෙන්නේ.

අපි ත්‍රිවිධ හමුදාවටත්, පොලීසියටත් ස්තුතිවන්ත වෙනවා. මොකද, පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව ඒ අය කටයුතු කළ ආකාරය ගැන අපට සතුටු වෙන්න පුළුවන්. ඒ පශ්චාත් සිදුවීම් සියල්ලම ඉතාම ඉක්මනින් අනාවරණ කර ගන්නට ඔවුන්ට පුළුවන් වුණා. ඉතාම කඩිනමින් ලද තොරතුරු ඔස්සේ ගිහින් ඔවුන් අත්අඩංගුවට ගන්න පුළුවන් වුණා. අපි ඒ සම්බන්ධයෙන් ඔවුන්ට නැවත ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, ඒ පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමේදී සමාජය තුළින් විශාල සහයෝගයක් ලැබුණා. විශේෂයෙන්ම, අත්අඩංගුවේ පසුවන අයගෙන් බහුතරයක් -සියලුදෙනාම වාගේ- මුස්ලිම් ජාතිකයෝයි. ඒ අය අත්අඩංගුවට ගන්න වැඩිම සහයෝගයක් දුන්නේත් මුස්ලිම් ජාතිකයෝයි. ඔවුන් අත්අඩංගුවට පත් කර ගැනීමේ අවශ්‍යතාව එම ජනතාව සමාජයක් විධියට අවබෝධ කර ගත්තා. ඒ සඳහා ත්‍රිවිධ හමුදාවට සහය දිය යුතුය කියන මතයේ ඉඳගෙන එම ජනතාව කටයුතු කළා. ඒ නිසා අපි ඒ සම්බන්ධව එම ජනතාවටත් ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

ඒ සිද්ධියෙන් පසුව ජාතිවාදී කෝලාහල කිහිපයක් ඇති වුණා. ඒ අවස්ථාවලදීත් 151දෙනෙක් අත්අඩංගුවට ගෙන තිබෙනවා. ඒ අය සම්බන්ධයෙනුත් නීතිය ක්‍රියාත්මක වෙමින් යනවා. අද ඒ සිදුවීම යොදාගෙන, ඒ මඟින් දේශපාලනය කරලා තමන්ගේ පටු අරමුණු වෙනුවෙන් කටයුතු කරන පිරිසකුත් සිටිනවා. අපි ඒක නොදන්නවා නොවෙයි. ඒ අය තවදුරටත් යම් අස්ථාවරභාවයක් ඇති කරන්න උත්සාහ කරනවා. විශේෂයෙන් මීට දින දෙකකට කලින් -පසුගිය අඟහරුවාදා- මගේ බිංගිරිය ආසනයේ උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය -එදා එතැන පොළ තිබුණු දවස- පිහිටි ඉඩමේ වැටෙන් ඇතුළත ජීව අත් බෝම්බයක් තිබුණා. අපට තවදුරටත් පෙනෙනවා, යම් යම් පුද්ගලයන් ඒ වාගේ සිදුවීම් ඇති කර සමාජය අස්ථාවර කරන්න, විශේෂයෙන්ම ජන ජීවිතය නැවත

වතාවක් අඩාළ කරන්න කටයුතු කරනවාය කියන කාරණය. ඒ නිසා මා විශ්වාස කරනවා සමාජයක් විධියටත්, රටක් විධියටත් හදිසි නීතිය ඉදිරියට පවත්වා ගෙන යෑමේ අවශ්‍යතාව තිබෙනවා කියලා. මොකද, විශේෂයෙන් පාසල් ආදියට ආරක්ෂාව සැපයීමේදී පොලීසියට ප්‍රමාණවත් පොලිස් නිලධාරින් පිරිසක් නැහැ. නමුත් හදිසි නීතිය යටතේ ක්‍රියාත්මක වීමේදී පොලීසියේ සහයට ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදා නිලධාරින් යොදවා අවශ්‍ය ආරක්ෂාව ලබා දෙන්න පුළුවන්; ආරක්ෂාව අවශ්‍ය තැන්වලට හමුදාව යොදවන්න පුළුවන්. ගරු කථානායකතුමනි, ඒ නිසා මා හිතනවා හදිසි නීතියේ අවශ්‍යතාව තවදුරටත් තිබෙනවා කියලා.

ඒ කෙසේ වෙතත්, පටු දේශපාලන අරමුණුවලින් කටයුතු කරන යම් යම් පුද්ගලයන්ට අප කියන්න ඕනෑ, රට, ජාතිය, ආගම උකස් කරලා, ජාතින් අතර, ආගම් අතර අසමඟිය ඇති කරලා තමන්ගේ පටු දේශපාලන ඉලක්ක කරා ගමන් කරන එක සුදුසු දෙයක් නොවෙයි කියලා. අප සියලුදෙනා එක්ව නැඟී සිටියොත් තමයි අපට ඉදිරියට යන්න පුළුවන්. අප 1983දී කර ගත් බරපතළ වැරැද්ද නිසා තමයි අපේ රටේ එල්ටීටීඊ සංවිධානය ශක්තිමත් වුණේ, ප්‍රබල වුණේ. ඒ නිසා තමයි එල්ටීටීඊ සංවිධානයට විදේශ ආධාර ලැබුණේ; අසල්වැසි ඉන්දියාව පවා උදව් කළේ. නමුත් මේ සිද්ධියෙන් පසුව ඇති වෙන්න ගිය ජාතිවාදී කෝලාහල නතර කර ගන්න පුළුවන් වීම රටක් විධියට ලබා ගත් ජයග්‍රහණයක් කියලා අපි සිතනවා. නමුත්, තවදුරටත් ඒ මත පදනම් වෙලා කටයුතු කරන, තවදුරටත් ජාතිවාදී කෝලාහල වෙනුවෙන් තමන්ගේ දේශපාලන ගෝලයන් යොදවන අයට කියන්න තිබෙන්නේ, 'ඒ දේ කරන්න එපා' කියායි. ගරු කථානායකතුමනි, ජාතිවාදී කෝලාහල වෙනුවෙන් තමන්ගේ දේශපාලන ගෝලයන් යෙදවීම මේ රට ආපස්සට යවන්න කරන කටයුත්තක්; ත්‍රස්තවාදීන් පෝෂණය කිරීමක්, ත්‍රස්තවාදය ශක්තිමත් කිරීමක්; නැවත සහරාන්ලා බිහි කරන්න, සහරාන්ලාගේ අනුගාමිකයන් බිහි කරන්න කරන කුමන්ත්‍රණයක්. ඒ කුමන්ත්‍රණවලට අපි ඉඩ දිය යුතු නැහැ. මේ සාමකාමී තත්ත්වය රට තුළ ස්ථාපිත කරන්න අවශ්‍ය කටයුතු කිරීම සම්බන්ධව අපි ත්‍රිවිධ හමුදාවටත්, පොලීසියටත් ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම බුද්ධි අංශවලට ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, මට කතා කරන්න මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

ඊට ප්‍රථම, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

[පූ.භා. 11.49]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හදිසි නීතිය යළිත් දිගු කර ගැනීමට ඉදිරිපත් කර තිබෙන යෝජනාව සම්බන්ධයෙන් හේතු සාධක ඉදිරිපත් කිරීමට රජය අපොහොසත් වීම ගැන මා කනගාටු වෙනවා. ගරු සභානායකතුමාත්, මාත් ඇතුළු අපි දන්නවා දීර්ඝ කාලයක සිට ආරක්ෂක අමාත්‍යවරයා හෝ ආණ්ඩුවේ ප්‍රධාන අමාත්‍යවරයකු හෝ හදිසි නීතිය දිගු කර ගැනීමට අවශ්‍ය කරුණු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබූ බව. නමුත්, අද දිනයේ ඒ ආකාරයට ආරක්ෂක වාර්තාවක් රජයේ කිසිවකු ඉදිරිපත් නොකිරීම, රජය වගකීම අත් හැර දමා තිබීම යළිත් ප්‍රදර්ශනය කිරීමක් ලෙස තමයි සලකන්න වෙන්නේ.

ගරු කථානායකතුමනි, එම සිද්ධි ඇති වන විටත් අපේ රටේ ආරක්ෂක අංශ සතුව එම සංවිධානය පිළිබඳව වාර්තාවක් තිබුණා. වසර ගණනාවක සිට ඒ සම්බන්ධ වාර්තාවක් තිබුණා. නමුත්, ඒ වාර්තාව ගැන කටයුතු කළේ නැහැ. ඒ ගැන කටයුතු කිරීම අත් හැරලා දමපු නිසා තමයි රටේ නීතිය හා සාමය කඩා වැටුණේ. රටේ නීතිය හා සාමය කඩා වැටීම ප්‍රයෝජනයට ගත් මෙම කණ්ඩායම පසුගිය පාස්කු ඉරිදා කළ ඒ මහා ප්‍රහාරය නිසා හදිසි නීතිය ප්‍රකාශයට පත් කරන්න සිදු වුණා. නැත්නම් හදිසි නීතිය පනවන්න අවශ්‍ය වෙන්නේ නැහැ. පැවැති තොරතුරු අනුව මේ අය පාලනය කරගෙන, මෙල්ල කරගෙන, අත්අඩංගුවට අරගෙන කටයුතු කළා නම් මේ විනාශය සිදු වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අපි දන්නවා, ඉන්දියානු ඔත්තු සේවය මේ පිළිබඳව අපේ රජයට දැනුම් දීලා තිබුණ බව. ඒ සම්බන්ධවත් කටයුතු කළේ නැහැ. ඒ කෙසේ වෙතත්, මේ සිද්ධියට සම්බන්ධ හරියාකාර වාර්තාවක්, විස්තරයක් ඉදිරිපත් කිරීමට රජය අදත් අපොහොසත් වෙලා තිබෙනවා. සභානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා, ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා හෝ අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධාන අමාත්‍යවරයෙක් ආරක්ෂක අමාත්‍යාංශය වෙනුවෙන් හදිසි නීතිය දීර්ඝ කර ගැනීමට අවසරය ලබා ගැනීම සඳහා පාර්ලිමේන්තුවේදී අනුගමනය කළ යුතු සම්ප්‍රදාය ගැන සමහර විට අද සිටින ඒ නිලධාරින් දන්නේ නැතිව ඇති. They are unaware that this procedure has been adopted right through out. Whether it is a UNP Government or a PA Government or a UPFA Government, we have to adopt this procedure. I am surprised that the Chair is allowing this type of an open Debate without a proper presentation of a report. ඒ වාගේ තත්ත්වයකට පාර්ලිමේන්තුව පත්වීම ගැන අපි කනගාටු වෙනවා. නමුත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව හදිසි නීතිය දිගු කර ගැනීමට අනිවාර්යයෙන් පාර්ලිමේන්තුවට යෝජනාවක් ගෙනෙන්න ඕනෑ නිසා තමයි අද පාර්ලිමේන්තුවට ඒ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ අවසරය පාර්ලිමේන්තුවෙන් ලබා නොගත්තොත් අද රාත්‍රියේදී හදිසි නීතිය අවසන් වෙනවා. එහෙම වුණොත් ඇති වෙන තත්ත්වය මොකක්ද? ඒ ගැන මම දීර්ඝව කථා කරන්න යන්නේ නැහැ. මේ ප්‍රශ්නය ගැන අපට යළිත් කියන්න තිබෙන්නේ මෙකයි. නීතිය හරියාකාරව ක්‍රියාත්මක වෙනවා නම්, නීතිය ක්‍රියාත්මක වීමට ඉඩ දෙනවා නම්, නීතිය භාර අයට ඒ කටයුතු කරන්න ඉඩ දෙනවා නම් පරීක්ෂණ පවත්වලා අදාළ අය නීතිය ඉදිරියට ගෙන ඒමේ වගකීම ඉෂ්ට විය යුතුයි. මේ ඛේදවාචකය න නිසා මුළු රටේම සිටින සිංහල, දෙමළ, මුස්ලිම් සියලුදෙනාට කනගාටු වීමට සිදු වුණා. නමුත් ඒ සම්බන්ධව අවශ්‍ය කටයුතු කිරීමට දෙමසක් - මාස දෙකක් - ගතවෙලා තිබෙනවා. අගමැතිතුමා කියා තිබෙනවා, "We have been able to bring everyone to book within two months." කියා. I do

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

not think he can make such a statement. Then, he should come to the House and make a statement; give all the details and close the inquiry. Let the Prime Minister not make another propaganda drive on this. We know, with difficulty, the Leader of the Opposition is extending support to the Government and therefore, we have been able, today, to win back the confidence of most of the countries that clamped on the tourist arrivals. ඒ ගැන අපි සතුටු වෙනවා. අපි ඒ රටවලට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අපේ රටට විශාල ලෙස පැමිණෙන චීන සංචාරකයන්ට හා යුරෝපා රටවලින් පැමිණෙන සංචාරකයන්ට පනවා තිබුණු travel advisory note has been removed.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මම කියන්න කැමතියි, අද ආණ්ඩුව අර්බුදයකට පත් වෙලා තිබෙන බව. අපි දන්නේ නැහැ ආණ්ඩුව මොනවා කරනවාද කියලා.

ඊයේ "Daily Mirror" පුවත් පතේ, “PSC on Easter attacks: A drama rehearsed at Temple Trees” කියන උපශීර්ෂය යටතේ පළ වූ ජනාධිපතිතුමාගේ ප්‍රකාශයේ මෙහෙම සඳහන් වෙනවා:

> “· Says he had not been summoned before it and would never go before it
>
> · 19A is an NGO conspiracy and a curse on the country
>
> · Totally against SOFA with US ”

Those are the main lines, the highlights of the President's statement yesterday.

Also, he has said that the Attorney-General had advised him that this inquiry is *sub judice* and he has informed that to the Hon. Speaker. The House does not know. The Hon. Speaker has not informed us whether he was informed by the President of the country -

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
We would also like to know.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Yes, we would like to know; both sides would like to know what is *sub judice.*

Today, the Hon. Leader of the House raised this. When we get up to raise a matter under Standing Order 27 (2), the Hon. Speaker says that we have no right to debate. But, today we spent one hour debating some other issue raised under the Standing Order 27(2). So, the Chair has also not been consistent. It is very sad to say that the Chair has not been consistent in following Parliamentary procedure and practice. I am sorry to criticize the Chair, but that will be a way - if Parliament collapses, there will be an anarchy in this country. So, let us not bring Parliament to a situation of collapse.

ඒ වාගේම, I want to quote from “The Island” which has also the same interview given by His Excellency the President on this subject. It is worthwhile for everyone to give attention to the President’s statement.

දැනට සතියකට කලින් අපි අගමැතිතුමාගේ කථාව ඇහුවා. එතුමා කියනවා, "එකම කාර් එකේ යන්න බැහැ, ඒ දෙන්නා අතර හරියට එකඟතාවක් නැහැ" කියලා. ජනාධිපතිතුමා කියලා තිබෙනවා, "මේ වාගේ අග්‍රාමාත්‍යවරයෙක් ඉස්සරහ අසුනේ තියාගෙන කාර් එක පදවන්න බැහැ" කියලා. මේ රටට වෙලා තිබෙන දේ බොහොම හාස්‍යයට ලක් වෙන දෙයක් වෙන්න පුළුවන්. අපේ රටේ රාජ්‍ය පාලනය මෙවැනි අවුල් ජාලාවක් බවට පත් වී තිබෙන මොහොතක මීට වඩා ගැඹුරින් කටයුතු කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා. අපේ රට දිහා බලනකොට එසේ කටයුතු කිරීම සිදුවිය යුතුයි කියලා අපි මුළු මහත් විපක්ෂය වෙනුවෙන් ප්‍රකාශ කරන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කෙටියෙන් මේ කාරණා දෙක, තුන ඉදිරිපත් කරලා මගේ කතාව අවසන් කරන්නම්. අද ජනාධිපතිතුමා හා අග්‍රාමාත්‍යතුමා අතර තිබෙන මේ ව්‍යවස්ථා අර්බුදය හමාර වෙන්නේ අපේ රට ආර්ථික අර්බුදයකට පරිවර්තනය කරලායි. අද සෑම ව්‍යාපාරයක්ම කඩා වැටී හෝ නැවතී තිබෙන තත්ත්වයක් රට පුරා ඇති වී තිබෙනවා. ආර්ථික අර්බුදයේ උත්සන්නභාවය අඩු කරන්න මැදිහත් වෙන්න මහ බැංකුව අසාර්ථක වෙලා තිබෙනවා. විරුද්ධ පක්ෂය, එනම් විපක්ෂ නායකතුමා සහ අපි අග්‍රමාත්‍යතුමා සමඟ සාකච්ඡා කරපු වේලාවේ මහ බැංකුවේ අධිපතිතුමා දුන් පොරොන්දු අද ක්‍රියාත්මක කර ගන්න බැරි තත්ත්වයකට පත්වෙලා ආර්ථිකය කඩා වැටී තිබෙනවා. Billions of unrecovered cheques are with the Colombo business community. They cannot encash these cheques because the banks are unable to pay. එක උදාහරණයක් පමණයි මම මේ කියන්නේ. ඒ නිසා මේ ප්‍රශ්නය බරපතළ ලෙස ගණන් ගන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කළුතර GMOA එකට පහර දීම සම්බන්ධව පොලීසියට පැමිණිලි කළා. අපේ රටේ ප්‍රසිද්ධ GMOA එක අද චෝදනා කරනවා, අපේ රටේ සෞඛ්‍ය ඇමතිතුමාගේ හිතවතුන් ඒ රෝහලට ඇවිත්, GMOA එකේ සාමකාමී පෙත්සමක් අත්සන් කිරීමේ ව්‍යාපාරයට පහර දීපු සිද්ධිය සම්බන්ධව මේ වන විට කිසිම දෙයක් කරලා නැහැ කියලා. මේවා සිදු වන්නේ හදිසි නීතිය යටතේයි. සාමකාමීව සිදු කළ, මහජන පෙත්සමක් අත්සන් කිරීමේ කටයුත්තට ප්‍රසිද්ධියේ ඇවිත් මැර ප්‍රහාර එල්ල කරන භයානක තත්ත්වයක් රටේ ඇති වී තිබෙනවා නම්, අපි හදිසි නීතිය ක්‍රියාත්මක කිරීම පොලීසියට පවරන්නේ කුමක් සඳහාද? මෙයට පිළිතුරක් ලබා දෙන්න කියලා මම රජයෙන් ඉල්ලනවා. මීට අදාළවව තිබෙන ලිපියක් මගේ කථාවට ඇතුළත් කරන ලෙස ඉල්ලමින් **සභාගත*** කරනවා.

කිලිනොච්චියේ අද ඇතිවී තිබෙන සිද්ධියක් පිළිබඳව හිටපු නියෝජ්‍ය කාරක සභාපති චන්ද්‍රකුමාර් මැතිතුමා ලිපියක් එවලා

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

තිබෙනවා. කිලිනොච්චියේ සියලු සමෘද්ධිලාභීන්ගෙන් රුපියල් 500 ගණනේ බලහත්කාරයෙන් කපා ගැනීමේ තීරණයට එරෙහිව කිලිනොච්චියේ සමෘද්ධිලාභීන් විරෝධතාවක් ගෙන යනවා. නීති විරෝධිව, මුදල් රෙගුලාසිවලට පටහැනිව ගෙන යන මේ ක්‍රියා මාර්ගයට උතුරු පළාතේ කිසිම මන්ත්‍රීවරයෙකුගේ මැදිහත්වීමක් නැහැ. උතුරු පළාතේ ජනතාව මෙවැනි තත්ත්වයකට, බලහත්කාර කොල්ලයකට මුහුණ දීලා තිබෙනවා. රජයට මේ ගැන කටයුතු කරන්න හැකියාවක් තිබෙනවා. ඒ නිසා රජය මැදිහත් වී මේ ගැන කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම, පසුගිය කාලයේ ආරක්ෂා සහිතව පැවැති, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පූනරීන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි එකම ස්වාභාවික සම්පත වන, කෞදාරිමුනෛ පස් කන්දෙන් අද බලහත්කාරයෙන් පස් කපාගෙන යන තත්ත්වයක් ඇති වී තිබෙනවා. එම ක්‍රියාව දෙස නොබලා අහක බලාගෙන ඉන්න කනගාටුදායක තත්ත්වයක් ඇති වී තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමා ඒ පළාතේ මන්ත්‍රීවරයෙක්. ඔබතුමා මේ ගැන දන්නවා. පස් කපාගෙන ගියාට පසුව, නැවත පස් ඇති වෙන්නේ නැහැ. මෙයින් ඇති වන ස්වාභාවික විනාශය වගේම, ඒ කොල්ලකරුවන්ට ඉඩදී බලා සිටින හදිසි නීතියක් බවට මෙම හදිසි නීතිය පත් කරන්න එපා. මෙවැනි අත්තනෝමතික ක්‍රියාමාර්ග දකුණේ වුණත්, උතුරේ වුණත් හදිසි නීතිය යටතේ නවතා දමන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is your point of Order?

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
கௌரவ உறுப்பினர் தினேஷ் குணவர்தன அவர்களால் சொல்லப்படுகின்ற இந்தக் கிளிநொச்சி கௌதாரிமுனை பற்றிய விடயம் தொடர்பில் நாங்கள் ஏற்கெனவே ஒத்திவைப் புவேளைப் பிரேரணையில் குறிப்பிட்டிருக்கின்றோம்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Hon. Shritharan also has raised this issue. I appreciate that he is also a Member who always raises this kind of issues and I hope the Government will give attention and follow up without being silent on all these issues where destruction to natural resources is taking place.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු සභානායකතුමා සභාවේ සිටින නිසා අවසාන වශයෙන් දැන ගත යුතු කාරණයක් තිබෙනවා. අපි දන්නා විධියට, අපට ආරංචි විධියට මැතිවරණ කොමසාරිස්තුමා රජයට දැනුම්දීලා තිබෙනවා දැන් පළාත් සභා මැතිවරණය පවත්වන්න පුළුවන් කියලා. මේ පළාත් සභා අවේ මැතිවරණ නොපැවැත්වීම නිසා ආණ්ඩුකාරවරුන් අතට සම්පූර්ණ බලතල අරගෙන තිබෙනවා. ලංකාවේ අය වැය ලේඛනයෙන් සම්මත කරන ලද දෙවෙනි විශාලතම වැය ශීර්ෂයට අයිති පළාත් සභා මුදල්, පළාත් සභා නැතිව ආණ්ඩුකාරවරුන් අට දෙනෙකු ප්‍රයෝජනයට ගන්නා, කළමනාකරණය කරන ක්‍රමය ප්‍රජාතන්ත්‍ර විරෝධී බවයි අප විශ්වාස කරන්නේ. උතුරු පළාතේ වේවා, දකුණු පළාතේ වේවා, මේ හැම පළාතක්ම අද මුහුණ දෙන මේ භයානක තත්ත්වය සමනය කිරීමට මැදිහත්වෙන ආකාරය පිළිබඳව පිළිතුරක් ලබා දෙන ලෙස මම ඉතාම ඕනෑකමින් හා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

අද රට පුරා ඇති වීගෙන යන කනගාටුදායක දරුණු වියළි තත්ත්වය ගැනත් මම යමක් කිව යුතුයි. වික්ටෝරියා ජලාශය අසල පවා, -ගරු සභානායකතුමාගේ මැතිවරණ කොට්ඨාසය නිසා එතුමාත් මේකට එකඟ වෙයි- අද විශාල ජල හිඟයක් තිබෙනවා. මහ ජනයාට බොන්න වතුර නැහැ. හදිසි නීතිය පාවිච්චි කරලා හෝ මේ ප්‍රදේශවලට වතුර යවන්න කියන එක තමයි අපි ඉල්ලන්නේ. මේ වාගේ ප්‍රදේශ රාශියක් රටේ තිබෙනවා. ජනතාවගේ එදිනෙදා ජීවිතය ගෙන යෑමට අවශ්‍ය වතුර ටික දීමට පවා රජය අපොහොසත්වෙලා තිබෙනවා.

මේ හදිසි නීතිය ත්‍රස්තවාදීන් මෙල්ල කිරීම සහ ඔවුන් අත්අඩංගුවට ගැනීම සඳහා උපයෝගී කර ගන්නවා මිස, වෙනත් කටයුතු සඳහා උපයෝගී කර නොගන්නා ලෙසත් ඉල්ලා සිටිනවා. ඒ වාගේම, මහජන අයිතිවාසිකම් යටපත් කිරීමට එරෙහිව මහ ජනයාගේ පැත්තෙන් නැඟෙන උද්ඝෝෂණ යටපත් කිරීම සඳහා හදිසි නීති රෙගුලාසි පාවිච්චි නොකරන ලෙස ඉතාම ඕනෑකමින් විපක්ෂය වෙනුවෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I would like to explain this. Please give me two minutes.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම පළාත් සභා ගැන කියපු දේට මම උත්තරයක් දෙන්න ඕනෑ. මොකද, පළාත් සභා ගැන නෛතික ප්‍රශ්න තිබෙන නිසා. ඉස්සෙල්ලාම අලුත් පළාත් සභා ක්‍රමය හඳුන්වා දීලා ඒ යෝජනාව පාර්ලිමේන්තුවට ගෙනාවා. ඒ පනතෙන් භාගයයි සම්මත වුණේ, ඉතුරු භාගය සම්මත වුණේ නැහැ. ඒ නිර්ණායක සම්මත වුණේ නැහැ. [බාධා කිරීමක්] Please let me explain. එතකොට, අලුත් පළාත් සභාවලට අදාළ නීතියෙන් භාගයක් සම්මතයි, භාගයක් සම්මත නැහැ. ඒ නිසා නැවත පරණ මැතිවරණ ක්‍රමයටම යන්න නම් පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන්නට ඕනෑ. මොකද, දැන් පරණ ක්‍රමය අහෝසි කරලා තිබෙන නිසා. [බාධා කිරීමක්] Sir, both sides can discuss and settle this. ඒ සඳහා අවශ්‍ය නීති ගේන්න ඕනෑ. The laws have to be passed by Parliament. එක්සත් ජාතික පක්ෂය හැම දාම කිව්වා, පරණ ක්‍රමයට මැතිවරණය තියමු කියලා. තමුන්නාන්සේලා තමයි කිව්වේ අලුත් ක්‍රමය ඕනෑ කියලා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න, Let me explain, please. අලුත් ක්‍රමය ඕනෑ කියලා, ඒ අලුත් ක්‍රමය සම්මත කර ගන්න පාර්ලිමේන්තුවට ගෙනාවාම, ඒකෙන් භාගයයි සම්මත කළේ, කොට්ඨාස කඩන එකට තමුන්නාන්සේලා විරුද්ධ වුණා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. කොට්ඨාස කඩන එකට පාර්ලිමේන්තුව විරුද්ධ වුණා. ඉතින්, දැන් ඒ පනත් කෙටුම්පතෙන් භාගයක් සම්මතයි; භාගයක් සම්මතවෙලා නැහැ. ඒකයි තිබෙන ප්‍රශ්නය.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is your point of Order?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට කියන්න තිබෙන්නේ මෙයයි. ගරු අග්‍රාමාත්‍යතුමාට බලය දුන්නා, මාස දෙකක් ඇතුළත අදාළ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න. නමුත් මේ වනතුරු ඒ වාර්තාව ඉදිරිපත් කළේ නැහැ, දැන් මාස ගණනාවක් ගතවෙලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, do not go into a debate.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට විනාඩියක් දෙන්න ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එහෙම නැත්නම් වැරැද්දක් වෙනවා. ඔබතුමන්ලා මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ නැති නිසා තමයි පළාත් සභා මැතිවරණය තියන්න බැරි. මම අහන්න කැමැතියි කවදාද ඔබතුමන්ලා එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ කියලා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Thank you very much. The next speaker is the Hon. Ameer Ali Shihabdeen.

[பி.ப. 12.06]

**ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා**
(மாண்புமிகு அமீர் அலி சிஹப்தீன்)
(The Hon. Ameer Ali Shihabdeen)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, பொதுமக்களைப் பாதுகாத்துக்கொள்ள வேண்டும் என்பதற்காக இன்று இந்தச் சபையிலே அவசரகாலச் சட்டத்தினை மேலும் ஒரு மாதத்திற்கு நீடித்துக் கொள்வதற்கான விவாதத்திலே நாங்கள் பேசிக்கொண்டிருக்கின்றோம். கடந்த காலங்களிலே இந்தச் சட்டத்தின்மூலம் இந்த நாட்டிலே தமிழ் மக்கள் அனுபவித்த வேதனைகளைத் தெளிவாகக் கண்டவர்கள், உணர்ந்தவர்கள் நாங்கள். அந்த அடிப்படையிலே இந்தச் சட்டத்தின் மூலமாக எந்தவொரு சமூகமும் தனிப்பட்ட முறையில் பாதிக்கப்பட்டுவிடக்கூடாது என்று இந்தச் சபையிலே நான் மிகவும் கண்ணியமாக வேண்டுகோள் விடுக்கின்றேன். இந்தச் சட்டத்தின் மூலமாக சாதாரண மக்களைக் கைதுசெய்கின்ற வேலைத்திட்டம் கடந்த காலத்தில் நடந்தேறியதையும் தொலைக்காட்சிகளினூடாக, சமூக வலைத் தளங்களினூடாக ஒரு சமூகத்தை மையப்படுத்தி நடவடிக்கைகள் முன்னெடுக்கப்பட்டதையும் இந்தச் சபைக்குத் தெளிவாகச் சொல்லவேண்டிய பொறுப்பு எனக்கு இருக்கின்றது.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நடந்து முடிந்த கலவரங்கள் முஸ்லிம் சமூகத்திற்கு எதிராகத் திட்டமிட்டு நடத்தப்பட்டதாகப் பேசப்பட்டது. முஸ்லிம் அரசியல் தலைவர்களை அல்லது றிஸாட் பதியுதீன் என்கின்ற ஒருவரை மையப்படுத்தியதாக இந்த வேலைத்திட்டத்தை மேற்கொண்டு, இந்த நாட்டிலே பாரியதொரு களேபரத்தை ஏற்படுத்திய எதிரணியினர்தான் இந்த அரவசகாலச் சட்டத்தை நீடிக்கும் நிலை ஏற்பட்டதற்குப் பொறுப்புக்கூற வேண்டியவர்கள் என்பதை நான் இந்த இடத்திலே சொல்லியாக வேண்டும். கடந்த நாட்களில் "றிஸாட் பதியுதீன் என்பவர் பயங்கரவாதி. அவருக்குச் சஹ்ரானோடு தொடர்பு இருக்கின்றது" என்று சொன்னார்கள்; "இப்ராஹீமோடு தொடர்பு இருக்கின்றது" என்று சொன்னார்கள். 'சதொச' வாகனத்திலே றிஸாட் பதியுதீன் அவர்களும் மன்னாரிலிருந்து, காத்தான்குடியிலிருந்து, மருதமுனையிலிருந்து சென்றார்கள் என்று பேசினார்கள். ஆனால், நேற்றைய தினம் பாராளுமன்றத் தெரிகுழுவிலே சாட்சியமளித்த இந்த நாட்டினுடைய இராணுவத் தளபதியாக இருக்கின்ற லெப்டினன்ட் ஜெனரல் மகேஷ் சேனாநாயக்க அவர்கள், றிஸாட் பதியுதீன் அவர்கள் தனக்கு எந்தவிதமான அழுத்தத்தையும் பிரயோகிக்கவில்லை என மிகவும் தெளிவாகச் சொன்னார். அதுமாத்திரமல்லாமல், சம்பந்தப்பட்ட அமைச்சின் செயலாளரான அசோக ரஞ்சித் அவர்கள் சாட்சியமளிக்கும்போது, கடந்த காலத்திலே றிஸாட் பதியுதீன் அவர்கள் எந்தப் பிழையான வழிகாட்டலையும் தனக்குச் செய்யவில்லை என்றும் குறித்த விடயங்களிலே அவர் தேவையற்ற முறையிலே இடையூறு செய்யவில்லை என்றும் இந்த நாட்டுக்குத் தெளிவாகச் சொல்லியிருக்கின்றார். எனவே, றிசாட் பதியுதீன் அவர்களுக்கு எதிராகக் குற்றம் சுமத்துபவர்கள், சுமத்தியவர்கள், சுமத்தவிருப்பவர்கள் எதிர்காலத்திலே வெட்கித் தலைகுனிந்து வேதனையோடுதான் இருக்கவேண்டியிருக்கும் என்று நான் எதிர்பார்க்கின்றேன்.

இந்தக் குற்றச்சாட்டுக்களை எல்லாம் இவர்கள் எதற்காகக் கூறினார்கள்? இது முஸ்லிம் சமூகத்திற்கு எதிராக, அரசியல் நோக்கத்துக்காகச் செய்யப்பட்ட ஒருவேலைத்திட்டம் என்பதை எங்களால் திட்டவட்டமாகச் சொல்ல முடியும். இது, எதிர்வருகின்ற தேர்தலிலே வெற்றிபெற்றுத் தாங்கள் ஆட்சிபீடம் ஏறவேண்டும் என்பதற்காக, சிறுபான்மைச் சமூகத்தினர் மத்தியிலே பிரச்சினையை ஏற்படுத்த வேண்டும் என்பதற்காக, சிறுபான்மைச் சமூகத்தினரான தமிழ் மக்களையும் முஸ்லிம் மக்களையும் கிறிஸ்தவ மக்களையும் பிரிக்க வேண்டும் என்பதற்காக மேற்கொள்ளப்பட்ட ஒரு acid test என்பதை இந்தச் சபைக்கு நான் சொல்லியாக வேண்டும். ஓர் அமிலப் பரிசோதனையாக, முஸ்லிம் சமூகத்தை இதற்குள் தள்ளி, மூன்று சிறுபான்மைச் சமூகங்களையும் வேறாக்கி, இவர்கள் குளிர்காய எத்தனிக்கின்ற முயற்சி இதுவென்பதை நாங்கள் தெளிவாகப் புரிந்து கொண்டிருக்கின்றோம்.

கிறிஸ்தவ மதப் பெரியார் கார்டினல் மெல்கம் ரஞ்சித் ஆண்டகை அவர்கள், அரசாங்கம் இந்த விடயத்தை மூடிமறைக்கக்கூடாதென்று தெளிவாகச் சொல்லுகின்றார். இது தொடர்பான விடயங்களை அரசாங்கம் தெளிவாக வெளியே கொண்டுவரவேண்டும் என்றும் கூறியுள்ளார். இதற்குப் பின்புலத்திலே இருந்தவர்கள் யார் என்பதை இந்தத் தேசியத்துக்குச் சொல்லவேண்டும் என்று அவர் இந்த நாட்டிலும் சொல்லுகின்றார்; சர்வதேசத்திலும் போய்ப் பேசுகின்றார். இதற்குரிய சூத்திரதாரிகளை வெளிப்படுத்த வேண்டுமென்றும் கூறுகின்றார். கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இதற்குரிய சூத்திரதாரிகள் யார் என்பதை இந்தச் சபையிலும் எதிர்காலத்திலே வெளிக்கொணர வேண்டும் என்று நானும் இந்தச் சபையிலே கேட்கின்றேன்.

அதற்கேற்றாற்போல் பாராளுமன்றத் தெரிகுழுவின் விசாரணைகள் நடைபெற்றுக் கொண்டிருக்கின்றன. அந்த விசாரணைகள் தொடர்ந்து நடத்தப்பட வேண்டும். மேதகு ஜனாதிபதி அவர்கள் கூறுவதுபோன்று இதை நிறுத்திவிட முடியாது. அவருடைய தனிப்பட்ட காரணத்துக்காக அல்லது அரசியல் இலாபத்துக்காக இந்தப் பாராளுமன்றத் தெரிகுழுவின் விசாரணைகள் நிறுத்தப்படக்கூடாது. இந்தத் தெரிகுழுவின் விசாரணைகளை இறுதிவரை தொடர்ந்தேர்ச்சி யாக நடத்தி, இதற்கு யார் காரணகர்த்தா? என்று சொல்லவேண்டிய பாரிய பொறுப்பு இந்தத் தெரிகுழுவுக்கு இருக்கின்றது. எனவே, தொடர்ந்தேர்ச்சியாக இந்த விசாரணைகள் நடத்தப்பட வேண்டுமென்று நான் இந்த இடத்திலே வேண்டுகோள் விடுக்கின்றேன்.

நடைபெற்ற சம்பவம் தொடர்பில் சந்தேக நபர்களாக இதுவரையிலே 2,389 முஸ்லிம்கள் கைது செய்யப் பட்டிருந்தார்கள். இப்பொழுது அவர்களிலே அதிகமானோர் விடுதலையாகியிருக்கின்றார்கள். ஏனையவர்களில் நூற்றுக் குட்பட்டவர்களைத் தடுப்புக் காவலில் வைத்திருக்கின்றார்கள். முந்நூறுக்குட்பட்டவர்களை remand இலே வைத்திருக்கின் றார்கள். இந்த remand இலே வைத்திருக்கும் 300 பேருக்கும் எதிராகச் சாட்டப்பட்டிருக்கும் குற்றச்சாட்டு என்னவென்றால், அவர்களுடைய வீடுகளிலே கத்தி, பழைய வாள், குர்-ஆன் போன்றவற்றை வைத்திருந்தார்கள் என்பதாகும். சஹ்ரானின் புகைப்படத்தைக் கையடக்கத் தொலைபேசியிலே வைத்திருந்த காரணத்துக்காகவும் சிலர் கைது செய்யப்பட்டிருக்கிறார்கள். இப்படிச் சாதாரணமாகக் கைது செய்யப்பட்டவர்களில் சஹ்ரானுடைய புகைப்படம் அடங்கிய பத்திரிகையை வைத்திருந்தமைக்காகக் கைது செய்யப்பட்டவர்களும் அடங்குகின்றார்கள். இவை அநியாயமான கைதுகள் என்பதை இந்தச் சபை தெளிவாக விளங்கிக்கொள்ள வேண்டும். இந்த நிலைமை இந்த நாட்டிலே மாற்றப்பட வேண்டும். முஸ்லிம்கள், தமிழர்கள், கிறிஸ்தவர்கள், சிங்களவர்கள் என அனைவரும் இந்த நாட்டுச் சட்டத்திலும் சட்டத்தை அமுல்படுத்துகின்ற அரச அதிகாரிகளிலும் நம்பிக்கையுள்ள சமூகமாக இருப்பதற்குப் பெரும்பான்மைச் சமூகத் தலைவர்கள், அரசியல் தலைவர்கள், அதிகாரிகள் மிகவும் தெளிவான பார்வையோடு செயற்பட வேண்டுமென்று நான் இந்த இடத்திலே வேண்டுகோள் விடுக்கிறேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
உங்களுக்கு இன்னும் இரண்டு நிமிடங்கள் உள்ளன.

**ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා**
(மாண்புமிகு அமீர் அலி சிஹப்தீன்)
(The Hon. Ameer Ali Shihabdeen)
கௌரவ பைசால் காசிம் அவர்களுடைய நான்கு நிமிடங்கள் எனக்குத் தரப்பட்டிருக்கின்றது.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
உங்களுக்கு ஒன்பது நிமிடங்கள்!

**ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා**
(மாண்புமிகு அமீர் அலி சிஹப்தீன்)
(The Hon. Ameer Ali Shihabdeen)
கௌரவ இஸ்மாயில் அவர்களின் நேரத்தையும் நான் எடுக்கிறேன்.

எனவே, இந்தப் பிரச்சினைக்கும் முஸ்லிம்களுக்கும் தொடர்பு கிடையாது என்பது இப்பொழுது இந்த நாட்டிலே மிகவும் தெளிவாக விளங்கிக் கொள்ளப்பட்டிருக்கின்ற விடயம் என்பதை நான் இந்த இடத்தில் சொல்ல வேண்டும். சஹ்ரானின் செயலுக்கும் முஸ்லிம்களுக்கும் சம்பந்தம் கிடையாது. முஸ்லிம்கள்தான் அவர்களைக் காட்டிக் கொடுத்தார்கள்.

මේ ගරු සභාවට මම වගකීමකින් කියන්න ඕනෑ, සහරාන්ට මේ ලංකාවේ ඉන්න මුස්ලිම් ජනයා කවදාවත් කැමැති වුණේ නැහැ, කැමැත්තක් ප්‍රකාශ කළේ නැහැ කියලා. මුස්ලිම් ජනයා තමයි මේ ඔක්කෝම තහවුරු කරගැනීමට ඔත්තු දුන්නේ. හැම මුස්ලිම් ප්‍රදේශවලම හිටපු අය ගැන, සහරාන් එක්ක සම්බන්ධ වෙච්ච හැම දෙනා ගැනම තොරතුරු දුන්නේ මුස්ලිම් ජනයා. නමුත් දේශපාලන වාසිගන්න, නැත්නම් අර දවස් 52 කාලයේදී ආණ්ඩුව පිහිටුවන්න උදවු කරන්න අපට බැරි වුණු හින්දා, අපි ඒ උත්සාහ දැරුවේ නැති හින්දා මෙතැන ඉන්න ඇමතිවරුන්ට, මන්ත්‍රීවරුන්ට විරුද්ධව චෝදනා කළා. රිසාඩ් බදියුදීන් අන්තවාදියි, ත්‍රස්තවාදියි, එතුමා සහරාන් එක්ක ගමන් කළා, සතොස වාහන පාවිච්චි කළා කිව්වා. විමල් වීරවංශ මන්ත්‍රීවරයා මගේ අතේ තිබෙන මෙන්න මේ වාගේ කොළයක් පෙන්නලා කිව්වා, අර bubble gum වාගේ තිබෙන ඔක්කෝම පෙන්වලා කිව්වා, "මෙන්න, සතොස වාහන ගිය තැන්" කියලා. ඒවා එතුමා හදාගත්ත ලේඛන. එතුමා හදාගත්ත ලේඛනය පෙන්වලා කිව්වා, "මෙන්න, රිසාඩ් බදියුදීන් ඇමතිවරයා ගමන් කරපු සතොස වාහන" කියලා. සතොස වාහන නම්, රට පුරාම ගමන් කරනවාමයි. ඒ සතොස වාහන තිබෙන්නේ, සතොස ළඟ park කරන්න නොවෙයි. සතොස වාහන ගමන් කරන්නේ රට පුරාම තිබෙන ශාඛාවල පරීක්ෂණ කටයුතු කරගන්නයි. එතුමා කියපු ඒ කථාව අමූලික බොරු බව ඊයේ ඒ අමාත්‍යාංශයේ ලේකම් රංජිත් අශෝක මැතිතුමා කියපු ප්‍රකාශයෙන් අපට සියයට සියයක්ම ඔප්පු වුණා; හෙළිදරව් වුණා. ඒ වාගේම, තමයි Lieutenant General මහේෂ් සේනානායක මහතා ඊයේ ප්‍රකාශ කළා, "රිසාඩ් බදියුදීන් කවදාවත් අපට බලපෑමක් කළේ නැහැ. කිසි වේලාවක, කිසි අවස්ථාවකදී එතුමා බලපෑමක් කළේ නැහැ. ඉතා සුහදව මාත් එක්ක කථා කළා, අත්අඩංගුවට ගත් කෙනෙක් සම්බන්ධව. මම උත්තරය දුන්නා. අවුරුදු එකහමාරකින් පසුව ඒ සම්බන්ධව ආයෙත් මම කථා කරනවා" කියලා. එතුමා ඒක තමයි ඒ වේලාවේදී සමහර නාළිකාවලටත් කියා සිටියේ. Mediaවලටත් එතුමා කිව්වේ ඒක තමයි.

බලන්න, දැන් මේකෙන් දේශපාලන වාසි ගන්න විරුද්ධ පක්ෂයේ ඉන්න හැම මන්ත්‍රීවරයෙක්ම උත්සාහ දැරුවා. මුස්ලිම් ජනයා ඔක්කොම අන්තවාදියි කියලා පෙන්වා දෙන්න හැදුවා. එහෙම නොවෙයි කියලා ඔප්පු වෙනකොට, දැන් ඒක අනෙක් පැත්තට හරවන්න හදනවා. දැන් වෙන මොකුත් කියන්න නැහැ. සමහර මන්ත්‍රීවරු කිව්වා, වාහනයේ GPS සවි කරපු ඒවා ගැන. ඒ උදවියට ඒක ඔප්පු කරන්න බැරි හින්දා දැන් සමහර මන්ත්‍රීවරු විල්පත්තු ගිහිල්ලා ඉන්නවා, මොනවා හරි හොයාගන්න පුළුවන් ද කියලා බලන්න. දැන් විල්පත්තු කථාව ඉවරයි. ඒක කාලයකට ඉස්සෙල්ලා අපි කථාබහ කරලා ඉවර කරපු subject එකක්. දැන් ආයෙත් බලනවා, විල්පත්තුවලින් මොනවා හරි හොයා ගන්න පුළුවන්ද කියලා. ගාමිණී ලොකුගේ මැතිතුමාත් ප්‍රකාශ කර තිබුණා, ජනපෝෂ- [බාධා කිරීමක්] ජනපෝෂ project එක යටතේ දවසකට 3,000කට විතර කෑම දුන්නා. 3,000ක් පමණ ඒකේ ප්‍රයෝජනය ගත්තා. මහරගම Cancer Hospital එකේ, Kalubowila Teaching Hospital එකේ, ඒ වාගේම Colombo General Hospital එකේ රෝගීන් 3,000ක් විතර දවසකට ආහාර ලබා ගත්තා. ඒ වේලාවේදී ඒවාට වස බෙහෙත් කලවම් කළා කියලා එතුමා බොරුවක් ප්‍රකාශ කරලා. මට ආරංචියි ඒක මුස්ලිම් ආයතනයක් සම්බන්ධ වෙලා කරපු හොඳ වැඩක්, නමුත් ඒ නිසා

[ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා]

ඒ ගොල්ලන් ඒ ව්‍යාපෘතිය නැවැත්වූවා කියලා. මෙන්න, දැක්කාද, මේ ගොල්ලන් කරන වැඩ? රටට මොනවා හෝ හොඳ වැඩක් කරනවා නම්, වඳ බෙහෙත් කලවම් කරනවා කියනවා. කොත්තු රොටී කියලා අම්පාර ප්‍රදේශයේ ඇති වූ ප්‍රශ්නය පටන් ගත්තේ එහෙම තමයි. කොත්තු රොටීවලට වඳ බෙහෙතක් කලවම් කළා කිව්වා. ගාමිණී ලොකුගේ මන්ත්‍රීතුමා මෙතැන නැහැ. මම දෙයක් අහන්න කැමැතියි. Middle East countriesවල ලාංකිකයෝ ලක්ෂ 15ක් ඉන්නවා. අවුරුදු දෙකක්, තුනක්, හතරක්, පහක් ඒ රටවල ඉඳලා එන ගැහැනු ළමයින් මොන check-up එකද කරගන්න ඕනෑ කියලා ඉල්ලන එක හොඳ නැද්ද කියන එක තමයි මම අහන්නේ. සවුදි අරාබිය, ඕමානය, කටාරය, කුවේට් වාගේ මුස්ලිම් රටවල වැඩ කරන අපේ ලාංකිකයෝ ලක්ෂ ගණනක් නැවත අපේ රටට එන වෙලාවේදී පරීක්ෂා කරන්නේ කොහොමද කියන එක මේ අවස්ථාවේදී මම අහන්න කැමැතියි. මේ තුළින් පටු දේශපාලන වාසි ගන්න එපා කියලා මම ඉල්ලීමක් කරනවා. දැන් ඔක්කෝම කරලා ඉවරයි. මේ ලංකාවේ සියයකට වැඩි ගණනක් පල්ලි කුඩු කළා. ඒ වාගේම අරාබි මද්‍රසා කුඩු කළා, කඩ ගිනි තිබ්බා, මිනිස්සු ඝාතනය කළා. අන්තිමේදී මේවා ඉවර වෙන්නේ කොහොමද? දැන් රජයේ මුදලින් තමයි අපි ඒවාට වන්දි ගෙවන්න අපි සූදානම් වෙන්නේ. ඒ වන්දි ගෙවන්න වෙනවා.

අත්අඩංගුවට ගත්ත මේ පිරිස නිකම් තියාගෙන ඉඳලා වැඩක් නැහැ. පොඩි පොඩි චෝදනා තිබෙන අය වහාම නිදහස් කරන්න කියලා මේ අවස්ථාවේදී අපි ඉල්ලීමක් කරනවා. ඒ වාගේම, ගිනි තියපු කඩ, පල්ලි, මද්‍රසා, ගෙවල්වලට වාගේම ඝාතනය කරපු මිනිසුන්ටත් -ඒ ඔක්කෝටම- අපි වන්දි ඉල්ලනවා. ඒවාට වන්දි ගෙවන්න ඕනෑ. ඒ වන්දි ගෙව්වේ නැත්නම්, ඒක එක ජන කොටසකට කරන ලොකුම අපරාධයක් කියලා මම මේ අවස්ථාවේදී කියනවා.

ඒ වාගේම තමයි Doctor Safi අත්අඩංගුවට අරගෙන තිබෙන්නේත්. එතුමා FR එකක් file කර තිබෙනවා. ඒ අදාළ පොලිස් නිලධාරියා දැන් ස්ථාන මාරු කරලා තිබෙනවා. අපි ඒ වෙලාවේදී ඉතා පැහැදිලිව කිව්වා, ඒ මනුස්සයා ඒකට සම්බන්ධයක් නැහැ කියලා. නමුත්, විරුද්ධ පක්ෂයේ ඉන්න අය ඒක ප්‍රයෝජනයට ගත්තා. මුස්ලිම් ජනයා වෙන් කරන්න ඕනෑ, ක්‍රිස්තියානි ජනයා වෙන් කරන්න ඕනෑ, දෙමළ ජනයා වෙන් කරන්න ඕනෑ-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
கௌரவ உறுப்பினர் அவர்களே, நன்றி. உங்களுடைய உரையை முடித்துக் கொள்ளவும்.

**ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා**
(மாண்புமிகு அமீர் அலி சிஹப்தீன்)
(The Hon. Ameer Ali Shihabdeen)
கைதுசெய்யப்பட்டிருக்கின்ற 300க்கும் மேற்பட்டவர்கள் உடனடியாக விடுதலை செய்யப்பட வேண்டும் என்று நான் இந்த நேரத்திலே இந்தச் சபையிலே கேட்டுக்கொள்கின்றேன். எந்தக் காரணமும் இல்லாமல் அவர்களைத் தடுத்துவைக்க முடியாது. அவர்கள் கத்தியை வைத்திருந்தார்கள்; Paper வைத்திருந்தார்கள் என்ற காரணங்களுக்காக அதாவது சிறு சிறு குற்றங்களுக்காக அவர்களைத் தடுத்துவைப்பதில் எந்த நியாயமும் கிடையாது. பாதிப்படைந்த கடைகள், இழக்கப்பட்ட உயிர்கள், அழிக்கப்பட்ட பள்ளிவாசல்கள், மதரஸாக்கள் குறித்து இந்த நாட்டிலே நியாயமான தீர்வும் அவற்றுகான நஷ்டஈடும் வழங்க வேண்டுமென்று நான் இந்த இடத்திலே வேண்டுகோள் விடுக்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
கௌரவ உறுப்பினர் அவர்களே, நன்றி.

**ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා**
(மாண்புமிகு அமீர் அலி சிஹப்தீன்)
(The Hon. Ameer Ali Shihabdeen)
Sir, one more minute please.

இந்தச் சபையிலே நீண்ட காலமாக நாங்கள் இந்தச் சமூகத்தினுடைய பிரச்சினைகளைப் பற்றிப் பேசியிருக்கின்றோம்; பேசுகின்றோம். முஸ்லிம் சமூகமாக இருக்கலாம், தமிழ் சமூகமாக இருக்கலாம், கிறிஸ்தவ சமூகமாக இருக்கலாம், இந்த நாட்டிலே எந்தச் சிறுபான்மைச் சமூகத்தையும் அரசியல் இலாபத்திற்காக அநியாயம் செய்துவிடாதீர்கள் என்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, Hon. Anura Dissanayake

[අ.භා. 12.23]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හදිසි නීතිය දීර්ඝ කරන අවස්ථාවේ කරුණු කීපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වනවා. දීර්ඝ කාලයක් හදිසි නීතිය ඉවත් කර තිබීමෙන් පසුව, මීට මාස දෙකකට පෙර අපේ රටේ නැවත හදිසි නීතිය පැනෙව්වා. අපට මතකයි, මීට පෙර හදිසි නීතිය තිබෙන කාලයේ හදිසි නීතිය දීර්ඝ කර ගැනීමේ හැම දවසකම විවාදයක් පවත්වනු ලැබුවා. හැබැයි ඒ හැම විටම, රත්නසිරි වික්‍රමනායක හිටපු අග්‍රාමාත්‍යවරයා හෝ එහෙම නැත්නම් රාජ්‍ය ආරක්ෂාව පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යවරයා හෝ එහෙම නැත්නම් රාජ්‍ය ආරක්ෂාව පිළිබඳ අමාත්‍යවරයා විසින් හෝ හදිසි නීතිය දීර්ඝ කර ගැනීම සඳහා තිබෙන අවශ්‍යතාවත්, මේ නිශ්චිත මොහොතේ ආරක්ෂාවට ඇති වී තිබෙන තත්ත්වයත්, ඒ සම්බන්ධයෙන් ගෙන තිබෙන පියවරත් මේ පාර්ලිමේන්තුවට පැහැදිලි කළා.

සභානායකතුමනි, දැන් මම ඔබතුමාගෙන් මේ කරුණ අහන්න කැමැතියි. දැන් අපි හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳව විවාදයක් පවත්වනවා. හැබැයි, ආරක්ෂක අමාත්‍යවරයා හෝ ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යවරයා හෝ අපි අසන ප්‍රශ්නවලට හෝ ඇති වී තිබෙන තත්ත්වය පිළිබඳව හෝ කිසිදු පැහැදිලි කිරීමක් කරන්න මේ ගරු සභාවේ නැහැ. ගරු සභානායකතුමනි, ඔබතුමා මේ තත්ත්වය අනුමත කරනවාද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කියන දේ මම පිළිගන්නවා. මම කිසිසේත්ම මේ තත්ත්වය අනුමත කරන්නේ නැහැ. නමුත්, සභානායකවරයා හැටියට මම මේ යෝජනාව පාර්ලිමේන්තුවට ගෙනාවා. ඒ යෝජනාව තමයි දැන් විවාද වෙන්නේ. නමුත්, ආරක්ෂක ඇමතිවරයා හෝ නියෝජ්‍ය ඇමතිවරයා හෝ මේ සභාවේ ඉන්න ඕනෑ. මම පිළිගන්නවා ඒක.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඔව්, අපි දැන් කවුරු එක්කද මේ විවාදය කරන්නේ? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි කවුරු සමඟද මේ විවාදය කරන්නේ? කාටද මේ කරුණු කියන්නේ? මොකටද මේ හදිසි නීතිය සම්මත කරන්නේ? මොකක්ද දැන් ඇති වී තිබෙන තත්ත්වය? මේ වන විට ආරක්ෂක අංශ විසින් ගෙන තිබෙන පියවර කවරේද? ඒවා මේ පාර්ලිමේන්තුව දැනගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ හදිසි නීති විවාදය මේ පාර්ලිමේන්තුවේ පැවැත්වීම කිසි ඵලක් නැති තත්ත්වයට පත්වී තිබෙනවා. පාර්ලිමේන්තුවට ඇවිල්ලා තමන්ට අවශ්‍ය නීති ප්‍රතිපාදන ශක්තිමත් කර ගැනීමට අවශ්‍ය යෝජනාව ඉදිරිපත් කිරීමේදී අඩුම තරමින් ඒ නියෝජ්‍ය අමාත්‍යවරයා හෝ මේ සභාවේ ඉන්න ඕනෑ. නැත්නම් ආරක්ෂක ඇමතිවරයා හැටියට ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ සම්බන්ධයෙන් කරුණු කියන්න ඕනෑ. එතුමා එළියේ ඇති තරමට දේවල් කියනවා. එළියේ කියන දේවල් ගැනයි, රටේ වෙලා තිබෙන දේවල් ගැනයි නිශ්චිත වශයෙන් ජනාධිපතිවරයාගෙන් ප්‍රශ්න කළ යුතුව තිබෙනවා. එතුමා ආරක්ෂාව පිළිබඳ අමාත්‍යවරයා. එතුමා පාර්ලිමේන්තුවට එන්නේත් නැහැ. නියෝජ්‍ය ආරක්ෂක අමාත්‍යවරයා පාර්ලිමේන්තුවට එන්නේත් නැහැ. ඒ නිසා අපි කවුරු එක්කද මේ විවාදය පවත්වන්නේ? අපට පිළිතුරු දෙන්නේ කවුද? මේවාට පිළිතුරු දෙන්නේ කවුද, අපි මේ ප්‍රශ්න අහන්නේ කාගෙන්ද, පිළිතුරු දෙන්න බැඳිලා ඉන්නේ කවුද කියලා අපි සභානායකතුමාගෙන් දැනගන්න කැමැතියි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ හදිසි නීති විවාදය කිසිදු වැදගැම්මක් නැති විවාදයක් බවට ආණ්ඩුව විසින් පරිවර්තනය කරලා ඉවරයි. ඒකෙන් පෙන්නුම් කරන්නේ අන් කවරක්වත් නොවෙයි, මහජනයාගේ ආරක්ෂාව හෝ මේ රටේ ආරක්ෂාව පිළිබඳව මේ පාලකයන් කිසිදු වග කීම් සහිත තැකීමක් නොකරන බවයි. මේ පාලකයන්ට එවැනි වග කීමක් තිබෙනවා නම්, මහ ජනයාගේ ආරක්ෂාව පිළිබඳවත්, රටේ ආරක්ෂාව පිළිබඳවත් යම් බැඳීමක් තිබෙනවා නම් මේ පාර්ලිමේන්තුවට පැමිණිය යුතුව තිබෙනවා. අග්‍රාමාත්‍යවරයා ඇවිල්ලා කරුණු පැහැදිලි කළ යුතුව තිබෙනවා. නැත්නම් ජනාධිපතිවරයා පැහැදිලි කළ යුතුව තිබෙනවා. එහෙමත් නැත්නම් ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා පැහැදිලි කළ යුතුව තිබෙනවා. මේ කිසිවෙක් මේ පාර්ලිමේන්තුවට කරුණු පැහැදිලි නොකිරීමෙන් පෙන්නුම් කරන්නේ අන් කවරක්වත් නොවෙයි, මේ රටේ ආරක්ෂාව පිළිබඳව මේ ආණ්ඩුවට තිබෙන වගකීම කොතරම්ද කියන එකයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ සිදුවීම ඇති වීමේ තත්ත්වය පිළිබඳවත්, සිදුවීමෙන් පසුව තිබෙන තත්ත්වය පිළිබඳවත්, අද හදිසි නීතියට ආණ්ඩුව දක්වන දායකත්වයෙන් පෙන්නුම් කර තිබෙන තත්ත්වය පිළිබඳවත් අපි කියන්නේ අන් කවරක්වත් නොවෙයි, මේ ආණ්ඩුවට තවදුරටත් මහජනයාගේ ආරක්ෂාව, රටේ ආරක්ෂාව භාර දිය යුතු නැහැ කියායි. ඒ නිසා තමයි මේ ආණ්ඩුව ඉල්ලා අස් වෙන්න ඕනෑ කියලා අපි විශ්වාස භංග යෝජනාවක් ගෙනැවිත් තිබෙන්නේ. මේ ආණ්ඩුවට තවදුරටත් මේ මහජනයාගේ ජීවිත සමඟ, මහජනයාගේ දේපොළ සමඟ සහ රටක් පිළිබඳව මෙවැනි විගඩම්කාරී සෙල්ලමක නිරත වෙන්න කිසිසේත්ම ඉඩ කඩ අපි ලබා නොදිය යුතුයි. මා විශ්වාස භංග යෝජනාව පිළිබඳව විවාදයේ දී ඒ පිළිබඳව වැඩිදුරටත් කරුණු ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි දන්නවා කලමැටිය ධීවර වරාය ගැන. කලමැටිය ධීවර වරායේ පෙරේදා රාත්‍රියේ ගිනි තැබීමක් සිදු වී තිබෙනවා. එයින් බෝට්ටු 21ක් මුළුමනින්ම විනාශයට පත් කරලා තිබෙනවා. බෝට්ටු 6ක් අර්ධ හානි වෙලා තිබෙනවා. මේ පිළිබඳව සිදුකර තිබෙන පරීක්ෂණ කවරේද? අත්අඩංගුවට ගෙන තිබෙන අය කවරේද? මොකක්ද ඒ සිදුවීම කියලා ආණ්ඩුවෙන් අපි දැනගන්න කැමැතියි. මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, ඔබතුමාට මේ ගැන කියන්න පුළුවන්ද? ඔබතුමා බලාගෙන ඉන්න විධියට දන්නේත් නැහැ වාගේයි මට නම් පෙනෙන්නේ. මේ පාර්ලිමේන්තුවේදී මේවාට උත්තර දෙන්නේ කවුද? සභානායකතුමනි, කලමැටිය තිබෙන්නේ කොහේද කියලා ඇහුවොත්, - [බාධා කිරීමක්] මම කියන්නේ ඒක එතුමාගේ වැරැද්දක් නොවෙයි. අදාළ අමාත්‍යවරු මේ සභාවේ ඉන්න ඕනෑ.

ආ! යාන්තම් කොහේ හරි ඉඳලා රාජ්‍ය ඇමති රුවන් විජේවර්ධන මැතිතුමා එනවා. ඔබතුමා නැඟිට්ටේ කීයටද? මේ ඔබතුමාගේ අමාත්‍යාංශයට අදාළ විවාදය. ඒක මතක තබාගන්න. මේ රටේ මහජනයාගේ ආරක්ෂාව පිළිබඳව විවාදය. අඩුම තරමින් අදවත් මේ සභාවට ඇවිල්ලා වග කීමෙන් පිළිතුරු ලබා දෙන්න බැඳී සිටින්න ඕනෑ. ආරක්ෂාව සම්බන්ධයෙන් ඇති වී තිබෙන තත්ත්වය පිළිබඳව ඔබතුමා පළමුව පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කරන්න. එම වාර්තාව මත පදනම්ව තමයි සාමාන්‍යයෙන් විවාදයක් ආරම්භ වන්නේ. සාමාන්‍යයෙන් මේ විවාදය ආරම්භ වෙන්නේ එහෙම. ඔබතුමා පාර්ලිමේන්තුවට ඒත්තු ගන්වන්න ඕනෑ, තවදුරටත් හදිසි නීතිය දීර්ඝ කර ගැනීම සඳහා තිබෙන අවශ්‍යතාව මොකක්ද කියලා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

ගරු මන්ත්‍රීතුමනි, දහවල් 12.30ට lunch break ගන්න ඕනෑ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

දිවා විවේකය සඳහා සභාවේ කටයුතු නවත්වන්නේ නැහැ කිව්වා නේද? රවි කරුණානායක ඇමතිතුමාගෙන් ප්‍රශ්නය අහපු වෙලාවේ අපි කිව්වා lunch break නැතිව සභාවේ කටයුතු කරමු කියලා. එහෙම නේද, සභානායකතුමනි?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

අපි දිවා විවේකය ගන්නේ නැතිව විවාදය දිගටම පවත්වමු. We will continue.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Does the House agree?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂ කාරක සභාව පිළිබඳව මතු වී තිබෙන තත්ත්වය තමයි ඊළඟ කාරණය. විශේෂයෙන්ම මා දැක්කා ජනාධිපතිවරයා විසින් ප්‍රකාශයට පත් කරලා තිබුණා, මෙම විශේෂ කාරක සභාව අරලියගහමන්දිරයෙන් කෙරෙන විගඩම් නාටකයක් කියලා. එම විශේෂ කාරක සභාව අපිත් නියෝජනය කරනවා. එම විශේෂ කාරක සභාව විගඩම්

[ගරු අනුර දිසානායක මහතා]

නාටකයක් බවට පත් වී තිබෙන්නේ කෙසේද කියන එක මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ජනාධිපතිවරයා විසින් ප්‍රකාශයට පත් කළ යුතුයි. ඒක පාර්ලිමේන්තුවේ කටයුත්තක්; පාර්ලිමේන්තුවේ ක්‍රියාදාමයක්. රටේ ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවේ ක්‍රියාදාමය සැලකිල්ලට භාජන කරන්නේ නැත්නම්, එතුමා තුළ තිබෙන්නේ ඒ ක්‍රියාදාමය පිළිබඳව වෙනස් අදහසක් නම්, ඒ ගැන මේ පාර්ලිමේන්තුවේ අපි විවාද කරමු. විශේෂ කාරක සභාව හරහා මේ රටට ඉදිරිපත් විය යුතු, මේ රටේ ජනතාව දැනගත යුතු, මේ අපරාධයේ සැබෑ අපරාධකරුවන් හෙළිදරව්වීම වැළැක්වීමට කිසිසේත්ම ඉඩ කඩ ලබා නොදිය යුතුයි.

ඒ වාගේම අපි දන්නවා, මේ විශේෂ කාරක සභාව තුළ වෙන දේශපාලන සූදුවක් ආණ්ඩුවට තිබෙන බව. වෙන දේශපාලන සූදුවක් ආණ්ඩුවට තිබෙනවා. හැබැයි, ඒ සූදුවට කිසිසේත්ම යටත් නොවී, මහජනයාගේ අවශ්‍යතාව වෙනුවෙන් කරුණු ඉදිරිපත් කිරීම සඳහා අපි අපේ මැදිහත්වීම කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පොලිස් නිලධාරින් නවදෙනකු සම්බන්ධව විමර්ශන කටයුතු ආරම්භ කර තිබෙනවාය කියලා ප්‍රවෘත්තියක් පළ කර තිබුණා, මා දැක්කා. විශේෂයෙන්ම කොළඹ ප්‍රදේශය භාර, බස්නාහිර උතුරු ප්‍රදේශය භාර සහ විශේෂ ආරක්ෂක දිසාව භාර නියෝජ්‍ය පොලිස්පතිවරුන් තිදෙනා මෙන්ම, කටාන සහ ජම්පටාවීදිය පොලිස් ස්ථාන භාරව කටයුතු කළ පොලිස් නිලධාරින් ඇතුළු නවදෙනකු පිළිබඳව මෙම චෝදනාවට අදාළව විමර්ශන කටයුතු කර තිබෙනවා .

ආරක්ෂක ලේකම්වරයා, පොලිස්පතිවරයා, නියෝජ්‍ය පොලිස්පතිවරු, අදාළ ප්‍රදේශ භාර පොලිස් නිලධාරින් මේ සිද්ධියට වගකිව යුතු නම්, ඔවුන් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීම පිළිබඳව අපේ විවාදයක් නැහැ. හැබැයි, අපි පළමුකොට අහන්නේ, මේ නිලධාරින් පිළිබඳව විමර්ශනය කරන්න තමුන්නාන්සේලාට සදාචාරාත්මක අයිතියක් තිබෙනවාද කියන එකයි. කවර හෝ කෙනකුට තව කාගේ හෝ වැරැද්දක් පිළිබඳව විමර්ශනය කරන්න සදාචාර සම්පන්න අයිතියක් තිබෙනවා, තමන් ඒ වැරැද්දට හවුල් වී නැත්නම්. හැබැයි, මේ ආණ්ඩුව කවුද? මේ ආණ්ඩුව, මේ ඝාතනයේ අපරාධකරුවන්. වළක්වා ගත හැකිව තිබුණු ඝාතනයක අපරාධකරුවන්. ඒ අපරාධකරුවන් හැටියට ජනාධිපතිවරයා නිශ්චිත ලෙස සඳහන් කළ යුතුයි; ඒ අපරාධකරුවන් හැටියට අග්‍රාමාත්‍යවරයා නිශ්චිත ලෙස සඳහන් කළ යුතුයි. ඒ චෝදනාවෙන් අමාත්‍ය මණ්ඩලයට ගැලවෙන්න බැහැ. මොකද, අමාත්‍යවරු මේ කරුණු දැනගෙන හිටියා.

ගොඩක් ප්‍රවෘත්තිවල කියැවුණා ඒ තොරතුරු මේ පාර්ලිමේන්තුවේ 225දෙනාම දැනගෙන හිටියා කියලා. ආරක්ෂාව පිළිබඳ දැනුම අතින් කෙලපැමිණි අයකු යයි කියන රොහාන් ගුණරත්න පසුගිය දා කියා තිබුණා, පාර්ලිමේන්තුවේ 225දෙනාම මේ තොරතුර දැනගෙන හිටියා කියලා. එතුමාට ආරක්ෂාව පිළිබඳව තිබෙන විද්‍යාත්මක දැනුම අපට තේරුම් ගන්න පුළුවන්. මොකද, ඒ ගැනවත් හරියට දන්නේ නැති නිසා. ජනතා විමුක්ති පෙරමුණෙන් පාර්ලිමේන්තුවේ ඉන්න අපි හය දෙනා නම්, ඒ ගැන දැනගෙන හිටියේ නැහැ. අනෙක් අය ගැන මම වග කියන්නේ නැහැ. අපි හය දෙනා දන්නේ නැත්තේ ඇයි? අපි කවර වර්ගයේ හෝ පොලිස් නිලධාරියෙකුගෙන්, ප්‍රභූ ආරක්ෂකයකුගෙන් ආරක්ෂාව අරගෙන නැහැ. මහජනතාව ළඟට යද්දී පොලීසිය අරගෙන යන්න ඕනෑ නැහැයි කියලා අපි හිතනවා. මහජනතාව ළඟට යාමේදී ආරක්ෂාව සහිතව යා යුතුයි කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. මහජනයාගේ ඡන්දයෙන් අපි පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙනවා නම්, මහජනයාගේ විශ්වාසය අපි රකිනවා නම් මහජනයා ළඟට ආරක්ෂක නිලධාරින්, අවිආයුධ නැතිව යන්න පුළුවන්. මහජන විශ්වාසය රකින්නේ නැති කෙනාට තමයි ඒවා අවශ්‍ය වන්නේ.

ගරු රුවන් විජේවර්ධන ඇමතිතුමනි, පසුගිය දවසක මිනුවන්ගොඩ ප්‍රදේශයේදී bikesවලින්, jeepsවලින් පෙළපාළියක් ගිය හැටි මා දැක්කා. මොන රංගනයක්ද මේ? ඊට පස්සේ "ටවුන් හෝල්" ප්‍රදේශයේත් එවැනි සිද්ධියක් වුණා. ඒ චෝදනාව එල්ල වුණෙත් ඔබතුමාටද දන්නේ නැහැ. ඒ කවුද කියන්න මම දන්නේ නැහැ. මා දැක්කා ඔබතුමා ගැනත් සඳහන් වෙලා තිබුණා. එහෙම නොවෙයි නම් මම එය නිවැරදි කරන්නම්. මොකක්ද මේ? තමුන්නාන්සේලාට ආරක්ෂාව සංදර්ශනයක්. [බාධා කිරීමක්] ඒ, ඔබතුමා නොවෙයි කියනවා නම්, මම පිළිගන්නම්.

**ගරු රුවන් විජේවර්ධන මහතා (ජනමාධ්‍ය කැබිනට් නොවන අමාත්‍යතුමා සහ ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ருவன் விஜயவர்தன - வெகுசன ஊடக அமைச்சரவை அந்தஸ்தற்ற அமைச்சர் மற்றும் பாதுகாப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Ruwan Wijewardene - Non Cabinet Minister of Mass Media and State Minister of Defence)
"ටවුන්හෝල්" වල සිද්ධියට අදාළ කෙනා නම් මම නොවෙයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ කවුද?

**ගරු රුවන් විජේවර්ධන මහතා**
(மாண்புமிகு ருவன் விஜயவர்தன)
(The Hon. Ruwan Wijewardene)
ඒක නම් මම ඇත්තටම දන්නේ නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා ඒක දැන ගන්න එපායැ. ඔබතුමා ආරක්ෂාව පිළිබඳව රාජ්‍ය අමාත්‍යවරයා නේ.

**ගරු රුවන් විජේවර්ධන මහතා**
(மாண்புமிகு ருவன் விஜயவர்தன)
(The Hon. Ruwan Wijewardene)
මම පොලිස්පතිතුමාගෙනුත් ඇහුවා කවුද ඒ ගියේ කියලා. පොලිස්පතිතුමාත් CCTV බලලා කියන්නම් කිව්වා. තවමත් මට-

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ලංකාවේ පොලීසිය නේද එතැනට දාලා තිබුණේ?

**ගරු රුවන් විජේවර්ධන මහතා**
(மாண்புமிகு ருவன் விஜயவர்தன)
(The Hon. Ruwan Wijewardene)
ලංකාවේ පොලීසිය තමයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එතකොට ලංකාවේ පොලිස්පතිවරයා නොදන්න තව අතුරු පොලීසියක් තිබෙනවාද?

**ගරු රුවන් විජේවර්ධන මහතා**
(மாண்புமிகு ருவன் விஜயவர்தன)
(The Hon. Ruwan Wijewardene)
ගරු මන්ත්‍රීතුමනි, ඒ කවුද කියලා මට නම් තවම කියලා නැහැ. මිනුවන්ගොඩ ප්‍රදේශයේ ඇති වූ සිද්ධියත් ඇත්තටම මගේ අවශ්‍යතාව උඩ සිදුවුණු දෙයක් නොවෙයි. ත්‍රිවිධ හමුදාවේ ඒ ප්‍රදේශය නියෝජනය කරපු අයට එන්න කියලා තිබුණා, ඒ ප්‍රදේශයේ ආරක්ෂාව පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවැත්වුණු සාකච්ඡාවකට. මම මිනුවන්ගොඩට යන කොට ඒ සියලුදෙනාම මා පිළිගන්න එතැනට ඇවිල්ලා තිබුණා. ඒ ගොල්ලන් තමයි ආවේ. මම දැනුවත්ව නොවෙයි එය සිදු වුණේ. මම ඉල්ලීමක් කරලාවත් නොවෙයි. මගේ නම් කවදාවත් ඔය වාගේ සංදර්ශන කරන්න කැමැත්තක් නැහැ; අවශ්‍යත් නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒක හොඳයි.

**ගරු රුවන් විජේවර්ධන මහතා**
(மாண்புமிகு ருவன் விஜயவர்தன)
(The Hon. Ruwan Wijewardene)
ඇත්තටම මම ඉල්ලීමක් කරපු දෙයක් නොවෙයි ඒක. එතැනට ඒ සියලුදෙනාම ආපු නිසා තමයි ඒ වාගේ ලොකු පෙළපාළියක් හැටියට ඒක ගියේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හොඳයි. ඔබතුමාගේ පැහැදිලි කිරීම මම පිළිගන්නවා. කෙසේ වුණත්, මම කියන්න උත්සාහ කළේ මේ මන්ත්‍රීවරු 225 දෙනාම දැන ගෙන හිටියාය කියන චෝදනාව අපට අදාළ වන්නේ නැහැ කියන එකයි. මොකද, කිසිදු ප්‍රභූ ආරක්ෂක නිලධාරියෙක් අපේ ආරක්ෂාව වෙනුවෙන් අපි අරගෙන නැහැ. අපි ජනතාවගෙන් ඡන්ද අරගෙන පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙනවා නම්, අපට ජනතාව ළඟට යන්න අවි ආයුධ සහිත ආරක්ෂාවක් අවශ්‍ය නැහැ.

මා කියමින් හිටියේ ආණ්ඩුවේ අමාත්‍යවරු විශාල පිරිසක් නිශ්චිත වශයෙන් මේ අපරාධය දැන ගෙන හිටියාය කියන එකයි. එහෙනම් ජම්පටාවීදියේ OIC මහත්මයා, කටානේ OIC මහත්මයා දඬු කඳේ ගහන්න කලින් අමාත්‍යවරු තමන්ගේ වගකීම් ඉටු කර තිබෙනවාද කියලා බලන්න ඕනෑ. අමාත්‍යවරු හැටියට ගත්තොත් එතුමන්ලා තමුන්ගේ වගකීම භාර ගෙන නැහැ. අග්‍රාමාත්‍යවරයාටත් වගකීමක් තිබෙනවා. මම එතුමා ගැන විශ්වාසභංග යෝජනාව විවාදයට ගැනෙන කොට කියන්නම්, එතුමා පසුව හැසිරුණේ කොහොමද කියලා. මම ඒක කියන්න හිතාගෙනයි ඉන්නේ. ජනාධිපතිවරයා තමන්ගේ වගකීම නිසි පරිදි ඉටු කර නැහැ. ඒ නිසා, නිලධාරීන්ට දඬුවම් ලබාදීම සඳහා සදාචාර සම්පන්න අයිතියක් තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට නැහැ. මොකද, අපරාධකරුවකුට තවත් අපරාධකරුවකුට දඬුවම් දෙන්න බැහැ. අපරාධකරුවකුට දඬුවම් දිය හැකි වන්නේ අපරාධයට හවුල් වුණේ නැති අයට පමණයි. හැබැයි තමුන්නාන්සේලා අපරාධයට හවුල් වූ අයයි. එය ඉතා පැහැදිලිව පෙන්නුම් කර තිබෙනවා.

සියලු මුස්ලිම් ජනතාව අන්තවාදීන් ලෙස සලකන්න එපා කියලා අමීර් අලි මන්ත්‍රීවරයා කිව්වා. ඒක ඇත්ත. අපේ රටේ පොදු ජනතාව අන්තවාදයට තල්ලුවෙලා නැහැ කියලා අපි විශ්වාස කරනවා. සිංහල පොදු ජනතාවත් තමන්ගේ සිංහල බෞද්ධ සංස්කෘතික උරුමයක් පිළිබඳව, තමන්ගේ සිංහල බෞද්ධ ඉතිහාසයක් පිළිබඳව, සිංහල බෞද්ධ ශිෂ්ටාචාරයක් ගොඩ නැඟීම පිළිබඳව අභිමානයෙන් කථා කරනවා. එය ඔවුන්ගේ සංස්කෘතියයි; ඔවුන්ගේ ඉතිහාසයයි; ඔවුන්ගේ ආධ්‍යාත්මයයි. හැබැයි ඒ නිසා අපි කිසිසේත්ම තේරුම් ගත යුතු නැහැ, සිංහල ජනතාව අන්තවාදී දිසාවකට තල්ලු වී තිබෙන බව.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මට විනාඩි 20ක කාලයක් තිබුණා නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
You have already taken 16 minutes.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
Lunch interval එක සඳහා වෙන්කර තිබුණු කාලය සභාවේ කටයුතු සඳහා ලැබුණා නේ. ඒකෙන් විනාඩි 10ක කාලයක් මට දෙන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
Give him some more time.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Okay. ඔබතුමාට තව විනාඩි 5ක කාලයක් දෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ විනාඩි 5යි, මගේ කාලයෙන් ඉතිරිව තිබෙන විනාඩි දෙකයි ගත්තාම තව විනාඩි 7ක කාලයක් තිබෙනවා.

මා කථා කරමින් සිටියේ, සිංහල බෞද්ධ ජනතාව ඔවුන්ගේ සංස්කෘතියේ, ආධ්‍යාත්මයේ ජීවත් වුණාට ඔවුන් අන්තවාදයට තල්ලුවෙලා නැහැ කියන කාරණයයි. නමුත් අපි දන්නවා, අන්තවාදී කණ්ඩායමක් සිටින බව. ඒ වාගේම මුස්ලිම් පොදු ජනතාවත් පොදුවේ මහත් අන්තවාදයකට තල්ලුවෙලා නැහැ. නමුත් මුස්ලිම් සමාජය තුළත් යම් අන්තවාදී කණ්ඩායම් ඉන්නවා. දැන් අමීර් අලි මන්ත්‍රීවරයාත්, අනිකුත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුත්, ඇමතිවරුත් පුන-පුනා කියන කාරණය තමයි, සහරාන්ගේ කල්ලිය පිළිබඳව මුස්ලිම් ජනතාව විටින්-විට කරුණු කිව්වාය කියන එක. මා දැන ගන්න කැමැතියි, කවුරුන් හෝ ඇමතිවරයකු ඒ පිළිබඳව කරුණු කිව්වාද කියලා. රිසාඩ් බදියුදීන් මන්ත්‍රීවරයා මේ ගැන කවදාවත් පාර්ලිමේන්තුවේ කථා කළාද? මඩකලපුවේ යම් යම් ක්‍රියා සිද්ධ වුණා. අමීර් අලි මන්ත්‍රීතුමා ඒ ගැන පාර්ලිමේන්තුවේ කථා කළාද? හකීම් ඇමතිතුමා මේ ගැන පාර්ලිමේන්තුවේ කථා කළාද? නැහැ. දැන් තමුන්නාන්සේලා ගැලවෙන්න උත්සාහ කරමින් ඉන්නවා. එතුමන්ලා කුමක්ද කියන්නේ? මුස්ලිම් ජනතාව නම් මේ ගැන පැමිණිලි කළාය කියනවා. ඔව්, පොදු මුස්ලිම්

[ගරු අනුර දිසානායක මහතා]

ජනතාව මේ ගැන පැමිණිලි කළා. හැබැයි මේ නායකයන් මේ ගැන පැමිණිලි කළේ නැහැ. මේ නායකයන් මේ ගැන දැනගෙන සිටියා. නමුත් එතුමන්ලා බෝම්බ අරගෙන ගියාය, ලොරිවල බෝම්බ පටවාගෙන ගියාය, තමන්ගේ ගෙදර බෝම්බ හංගාගෙන සිටියාය කියලා මා කිසිසේත්ම චෝදනා කරන්නේ නැහැ. ඒවා නිකම් කට වාචාලකමට කියන අයට අදාළ කරුණු. හැබැයි අපි කියනවා, මෙවැනි ඉස්ලාම් ආගමික අන්තවාදයක් තමන්ගේ සමාජය තුළ වර්ධනය වෙමින් තිබෙන බව මුස්ලිම් දේශපාලන නායකයන් දැනගෙන සිටිය බව. ඒ දේශපාලන නායකයන් මොකක්ද කළේ? එතුමන්ලා මේ පාර්ලිමේන්තුවේදී ඒ පිළිබඳව කවදාවත් කථා කළේ නැහැ. ඒ වෙනුවට එතුමන්ලා කළේ, මේ පාර්ලිමේන්තුවේ විවාදයක් පවත්වන හැම අවස්ථාවකදීම ඒ අන්තවාදී ක්‍රියාකාරකම් ආරක්ෂා කරන්න පෙනී සිටි එකයි. ඒ අන්තවාදී ක්‍රියාකාරකම්වලට එරෙහිව නොවෙයි එතුමන්ලා පෙනී සිටියේ. ඒ නිසා මේ සිදුවීම වුණාට පස්සේ පොදු ජනයා ඉදිරිපත් කරන ලද පැමිණිලිවල එල්ලෙන එක සාධාරණ නැහැ. දේශපාලන නායකයන් හැටියට එතුමන්ලා මුස්ලිම් සමාජය තුළ ඉස්ලාම් ආගමික අන්තවාදී ක්‍රියාදාමයක් ක්‍රියාත්මක වෙමින් තිබෙන එකට එරෙහිව කටයුතු කළේ නැහැ. ඒකෙන් අමීර් අලි මන්ත්‍රීතුමාට හෝ රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමාට හෝ හකීම් මන්ත්‍රීතුමාට හෝ කිසිසේත්ම ගැලවෙන්න අයිතියක් නැහැ. මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා ගැන මා දන්නේ නැහැ. බස්නාහිර පළාත කේන්ද්‍ර කරගෙන, වැඩිපුර සිංහල ජනතාවගේ ඡන්දවලින් තමයි එතුමා පාර්ලිමේන්තුවට පැමිණ තිබෙන්නේ. කෙසේ වුවත්, මේ අන්තවාදී ක්‍රියාදාමය පිළිබඳව එතුමාට කථා කරන්න තිබුණා.

අපට මතකයි, මේ පාර්ලිමේන්තුවේ අවස්ථා ගණනාවක, -

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පැහැදිලි කිරීමක් කරන්න මට අවස්ථාවක් දෙනවාද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මට පොඩි වෙලාවයි තිබෙන්නේ. ඔබතුමාගේ කථාවේදී කියන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Mujibur Rahuman.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මා මීට කලිනුත් පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළා, විශේෂයෙන්ම දිගන සිද්ධියෙන් පස්සේ සිකුරාදා දිනයක සහරාන් ඇවිල්ලා දේශනයක් කර තිබෙනවාය කියලා. ඒ වෙලාවේදීත් ඔහු හැංගිලා ඉඳගෙන තමයි ඒ දේශනය කරලා තිබෙන්නේ. ඒකේ video clip එකක් ඔහුගේ Facebook එක හරහා WhatsAppවලට ඇවිල්ලා තිබුණා. දිගන සිද්ධියෙන් පස්සේ මම ඒ video clip එක බලා, එය CD එකකට අරගෙන, පොලිස් මූලස්ථානයට භාර දුන්නා. ඔහුගේ දේශනය ඉතාම වෛර දේශනයක්, ඔහු වහාම අත්අඩංගුවට ගන්නය කියලා මම ඒ අවස්ථාවේදී කිව්වා. එතකොට තමයි මට දැන ගන්න ලැබුණේ, ඔහු සැඟවී සිට තමයි ඒ දේශනය කරලා තිබෙන්නේ කියලා. දිගන සිද්ධිය ඇතිවෙලා සුමාන දෙකක් වැනි කාලයක් ඇතුළත ඔහු කළ වෛරී දේශනය CD එකකට දමලා මා එය පොලිස් මූලස්ථානයට භාර දුන්නා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා එවැනි ක්‍රියාවක් කර තිබෙනවා නම් හොඳයි, ඒ පිළිබඳ විවාදයක් නැහැ. නමුත් ප්‍රශ්නය ඒක නොවෙයි, මුජිබර් රහුමාන් මන්ත්‍රීතුමනි. සහරාන් පිළිබඳව නිශ්චිත ලෙස ඔත්තුවක් දුන්නාද, සහරාන්ගේ කථාවක් පිළිබඳව නිශ්චිත ලෙස ඔත්තුවක් දුන්නාද කියන එක ද්විතීයිකයි. මෙහි ප්‍රධාන කාරණය බවට පත් වෙන්නේ, සහරාන්ලාගේ අන්තවාදී, ම්ලේච්ඡ, උමතු ආගමික සංවිධානයක ක්‍රියාදාමයක් සමාජය තුළ ක්‍රියාත්මක වෙමින් තිබෙනකොට එයට එරෙහිව මුස්ලිම් සමාජය වැඩ නොකළ එකයි. දේශපාලන නායකයනුත් ඔබතුමන්ලා නේ. සහරාන් මොකක් හෝ කිව්වාම, ඒ ගැනපැමිණිල්ලක් දැම්මාට මේ ප්‍රශ්නය බේරෙන්නේ නැහැ. සහරාන් අත්අඩංගුවට ගන්න කියන්න. මොකක්ද මේ තිබෙන්නේ? මෙවැනි අන්තවාදී ක්‍රියාදාමයක්, උමතුවක් මුස්ලිම් සමාජය තුළ වර්ධනය වෙමින් තිබුණා. ඒ උමතුවට එරෙහිව තමුන්නාන්සේලා නඟපු හඬ මොකක්ද? තමුන්නාන්සේලා පාර්ලිමේන්තුවේදී ඒ වෙනුවෙන් කළ කථාව මොකක්ද? ඒ වෙනුවෙන් අනික් මන්ත්‍රීවරුන් එක්ක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අදහස මොකක්ද? තමුන්නාන්සේලා එවැනි කිසිම අදහසක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ නැහැ. ඒ නිසා තමුන්නාන්සේලා ඉස්ලාම් ආගමික අන්තවාදයක් මුස්ලිම් සමාජය ඇතුළේ නිදැල්ලේ වර්ධනය වෙන්න ඉඩ දුන්නා. අන්න ඒ වගකීමෙන් අමීර් අලි මන්ත්‍රීතුමන්ලාට ගැලවෙන්න පුළුවන් වෙයි කියලා මා හිතන්නේ නැහැ.

සිංහල ආගමික අන්තවාදයක් ක්‍රියාත්මක වන හැම වෙලාවකදීම, දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපි එයට එරෙහිව කටයුතු කර තිබෙනවා; එය එළිදරවු කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ කිසිදු අන්තවාදයකට ඉඩ නොදිය යුතුයි කියලා හැම දාම විශ්වාස කරන දේශපාලන ව්‍යාපාරයක් තමයි අපි. ඒ අන්තවාදය සිංහල ජනතාවගෙන් පැන නඟින්න පුළුවන්; දෙමළ ජනතාවගෙන් පැන නඟින්න පුළුවන්; මුස්ලිම් ජනතාවගෙන් පැන නඟින්න පුළුවන්. ඒ කවර කෝණයකින් අපේ රටේ අන්තවාදය පැන නැඟුණත්, ඒ සියලු වර්ගයේ අන්තවාදය පරාජයට පත් කළ යුතුයි කියන ස්ථාවරයේ ඉන්න දේශපාලන ව්‍යාපාරයක් අපි. හැබැයි, මේ පාර්ලිමේන්තුවේ බොහෝදෙනා මෙවැනි ජාතිවාදී, අන්තවාදය තමන්ගේ වාසිය වෙනුවෙන් උපයෝගී කරගෙන තිබෙනවා. තමන්ගේ ඡන්ද මල්ල වෙනුවෙන් මෙවැනි ජාතිවාදී, අන්තවාදී ආස්ථානවලට ගමන් කර තිබෙනවා. අප්‍රේල් මාසයේ 21වන දාට පසුව සමහර අය හැසිරුණු ආකාරය දිහා බැලුවාම, ඔවුන් දේශපාලනික වශයෙන් විශාල ලෙස අසාර්ථකභාවයට පත් වෙලා තිබෙන ආකාරයක් අපි දකිනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
දේශපාලනික වශයෙන් ඔවුන් විශාල ලෙස නන්නත්තාර වෙලා හිටියා. පසුගිය ඔක්තෝබර් මාසයේ 26වන දා සිදු වූ අසාර්ථක, කුප්‍රකට ව්‍යවස්ථා දේශපාලන කුමන්ත්‍රණයේ වියරුවෙන් පරාජයට පත් වෙලා හිටියා. අන්න ඒ පරාජයෙන්

මිදීම සඳහා, යළි ජනතාව තුළ යම් ප්‍රසාදයක් අත්පත් කර ගැනීම සඳහා, වියරුවෙන් සහ ජාතිවාදී කෝණයෙන් බලා කටයුතු කරමින් සමහර කණ්ඩායම් අප්‍රේල් මාසයේ 21වන දාට පසු ක්‍රියාත්මක වෙන්න පටන් ගත්තා. මේකයි ඇත්ත කථාව.

මුස්ලිම් සමාජය ඇතුළතත් ඒ වාගේම තමයි. මුස්ලිම් දේශපාලන නායකයන් ඒ සමාජයත් එක්ක දේශපාලනය කරනවා වෙනුවට තමන්ගේ දේශපාලන පැවැත්ම වෙනුවෙන් එවැනි ආගමික අන්තවාදය පෝෂණය වීම සඳහා ඉඩකඩ නිර්මාණය කර තිබුණා. දේශපාලන බලය ආරක්ෂා කර ගනිමින්, එවැනි අන්තවාදයකට ආරක්ෂාව දෙමින්, එවැනි අන්තවාදයක් ආරක්ෂා කර ගනිමින්, එවැනි අන්තවාදයකට උත්තේජනයක් ලබා දීමෙන් විතරයි මුස්ලිම් සමාජය තුළ තමන්ගේ දේශපාලන බලය පවත්වා ගැනීමේ හැකියාව තිබෙන්නේ කියලා මුස්ලිම් නායකයන් කල්පනා කළා. ඒ අන්තවාදය පිළිබඳව, සමාජය දැනුවත් කරමින්, පොදු සමාජයේ සංඝටකයක් බවට පත් වෙනවා වෙනුවට, පොදු සමාජය තවත් කුලකයක් බවට පත් කරනවා වෙනුවට, බොහෝ මුස්ලිම් දේශපාලන නායකයන් ඔවුන්ගේ මුළු ක්‍රියාකාරිත්වයම යෙදෙව්වේ අන්තවාදය පෝෂණය කරන්නයි. ඒ අන්තවාදී ගැටුමේ ප්‍රතිඵලයක් තමයි මේ ඇති වී තිබෙන්නේ. මාස් පතා හදිසි නීතිය පනවලා මෙය සමනය කළ හැකිද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇති වූ සිදුවීම පාලනය කරන්නත්, ඒ සිදුවීම ඇති වීමට තුඩු දුන් කණ්ඩායම් අත්අඩංගුවට ගන්නත් සහ ඔවුන්ට දඬුවම් ලබා දීමටත් මේ හදිසි නීතිය යටතේ අපට පුළුවන් වෙයි. හැබැයි, දීර්ඝ ලෙස මේ සමාජය සුවපත් කළ හැකි වන්නේ කෙසේද? සිංහල, දෙමළ, මුස්ලිම් ජනයා අතර ඔවුන්ගේ සංස්කෘතික අනන්‍යතා, ඔවුන්ගේ ආගමික අනන්‍යතා ආරක්ෂා කර ගන්නා ගමන් පොදු සමාජයක් හැටියට අපි ඉස්සරහට යන්නේ කොහොමද, ඒ සඳහා තිබෙන සැලැස්ම කුමක්ද?

ආණ්ඩුවක් හැටියට ඒ පිළිබඳව දක්වා තිබෙන අවධානය ඉතාම අඩු බව මා දන්නවා. මේ හැම දෙයක්ම පොදු නීති පද්ධතියට අපි යටත් කර ගන්නේ කොහොමද, සියලු කාන්තා සහ ළමා අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සඳහා මැදිහත් වන්නේ කොහොමද, සියලු ආගමික සංස්ථා ආගමික අන්තවාදයක් කෙරෙහි යොමු වනවා වෙනුවට පොදු ජනතාවගේ සුව පතා කටයුතු කරන්නේ කොහොමද, දේශපාලනඥයන් තමන්ගේ කෙටි කාලීන බල වුවමනා වෙනුවෙන් මේ වපුරන ජාතිවාදය වෙනුවට ජාතික සමගිය, පොදු ජනතාවගේ අයිතිය වෙනුවෙන් දේශපාලන ව්‍යාපාර ගොඩ නඟන්නේ කොහොමද කියන සංවාදයයි අද අවශ්‍ය වී තිබෙන්නේ. හදිසි නීතිය මාසයකින් දීර්ඝ කර ගත්තාය කියලා මේ ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුම් ලැබෙන්නේ නැති බව ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා.

මට කථා කරන්න අවස්ථාව ලබාදුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

[පි.ව. 12.45]

**ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා**
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, பொதுமக்களின் பாதுகாப்பை முன்னிறுத்தி, அவசரகாலச் சட்டத்தை மேலும் ஒரு மாத காலத்துக்கு நீடித்துக்கொள்ளும் இந்தப் பிரேரணை தொடர்பில் உரையாற்றுவதற்கு வாய்ப்பளித்தமைக்காக முதலில் நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன். இது மிக முக்கியமான ஒரு விவாதமாகும். ஏனென்றால், கடந்த 10 ஆண்டுகளில் பெரிதளவில் பேசப்படாதிருந்த இந்த அவசரகாலச் சட்டம் பற்றி மீண்டும் கடந்த இரண்டு மாத காலமாக அதிகமாகக் கவனமெடுக்க வேண்டிய தேவையேற்பட்டிருக்கின்றது. அதற்கான ஓர் அசாதாரண சூழ்நிலை - துரதிட்டவசமான சூழ்நிலை இந்த நாட்டிலே எழுந்திருக்கின்றது. இந்தச் சட்டம் நடைமுறையி லிருந்த 1980 இலிருந்து 2009 வரையிலான காலப்பகுதியில் அது இயல்பாகவே நாட்டில் மாதந்தோறும் நீடிக்கப்பட்டு நடைமுறையிலிருந்த ஒரு சட்டம் என்கின்ற வகையிலே, அந்தச் சட்டத்தின்கீழாகப் பெருமளவில் பாதிப்புற்ற ஒரு சமூகத்தின் பிரதிநிதி என்ற வகையிலே, இன்று இந்தச் சட்டம் தொடர்பாக எத்தகைய நடவடிக்கைகள் கையாளப்படுகின்றது என்பது தொடர்பாக இந்தச் சபையிலே நான் உரையாற்ற வேண்டியிருக்கின்றது.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, அவசரகாலச் சட்டம் என்கின்ற பெயரில் அல்லது பொதுமக்களைப் பாதுகாக்கின்ற நடவடிக்கைகள் என்கின்ற பெயரில் இன்று நாம் காண்கின்ற பிரதான விடயங்களில் ஒன்றாக, பாடசாலைகளின் வாசல்களில் இராணுவத்தினரை - ஆயுதம் தாங்கிய படையினரை - நிறுத்தி, எமது எதிர்காலச் சந்ததியினரைச் சோதித்துக்கொண்டிருப்பது அமைந்திருக் கின்றது. எமது மாணவச் செல்வங்கள் கொண்டுசெல்லும் பாடசாலைப் பைகள் முதல் அவர்களை உடல்ரீதியாகவும் சோதனை செய்துதான் பாடசாலைக்குள் அனுமதித்துக் கொள்ளும் துரதிட்டவசமான ஒரு காலப்பகுதியிலே நாங்கள் வாழ்ந்து கொண்டிருக்கின்றோம். இன்று இந்தச் செயற்பாடு பாதுகாப்பு ஏற்பாடு என்ற வகையில் மேற்கொள்ளப் பட்டிருந்தாலும், எமது பிள்ளைகள் பாதுகாப்பாகப் பாடசாலைகளுக்குச் சென்றுவருகின்றார்கள் என நாங்கள் நினைத்துக்கொண்டாலும்கூட, இதற்குப் பின்னாலுள்ள மிகத் துரதிட்டவசமான உளவியல் தாக்கம் பற்றி நாங்கள் இந்தச் சபையிலே பேசவேண்டிய தேவையிருப்பதாக நான் உணர்கின்றேன். குறிப்பாக, 3 பிள்ளைகளின் தந்தை என்கின்ற அடிப்படையில் பிள்ளைகள் எவ்வாறு இதனை எதிர்கொள்கின் றார்கள் என்பதைப் பற்றிச் சிந்தித்துப் பார்க்கவேண்டிய நிலையிலிருக்கின்றேன்.

தினமும் காலையில் பாடசாலைக்குச் செல்கின்ற மாணவர்கள் முதலில் ஆசிரியரையோ அல்லது அவர்கள் மரியாதை செலுத்தவேண்டிய பாடசாலைப் பெரியவர் களையோ சந்திப்பதற்கு முன்னர் அவர்கள் வாசலில் பார்க்கின்ற முதலாவது காட்சியாக ஆயுதம் தாங்கிய இராணுவத்தினர் இருக்கின்றார்கள். இது எங்களின் பிள்ளைகளின் பாதுகாப்புக்கானதாக இருக்கலாம். ஆனால், அதனூடாக அவர்கள் எதிர்கொள்கின்ற உளவியல் ரீதியான பிரச்சினைகளை நாங்கள் ஆராய வேண்டும். குறிப்பாக, இந்தக் காட்சியை எதிர்கொள்ளும் ஆண் மாணவர்களைப் பொறுத்தவரைக்கும் அந்த ஆயுதம் தொடர்பான ஈர்ப்பு இயல்பாகவே அவர்களிடத்திலே ஏற்படக்கூடும் என்பதை நாங்கள் உணர வேண்டியவர்களாக இருக்கின்றோம். அதன் காரணமாக, அந்த ஆயுதத்தைப்பற்றி அதிகம் தெரிந்து கொள்வதற்கு அவர்கள் முயற்சி செய்கின்றார்கள்; அதன் வகைகளைப் பற்றித் தெரிந்து கொள்வதற்கு முயற்சி செய்கின்றார்கள். இவ்வாறு உளவியல் ரீதியாக எமது மாணவர்களுக்கு அந்த ஆயுதம் தொடர்பான ஈர்ப்பு ஏற்படுவதன் காரணமாக எதிர்காலத்தில் அவர்கள் எவ்வாறான மனநிலையைப் பெறப் போகின்றார்கள் என்பது தொடர்பான சிந்தனை எமக்குத் தேவையாக இருக்கின்றது. அதேநேரத்தில், பெண் பிள்ளைகளைப் பொறுத்தவரை, அவர்கள் இந்த ஆயுதங்களைக் கண்டு பயந்தவர்களாக, பயப்படுபவர்களாக

[ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා]

இருக்கின்றார்கள் என்பதையும் நாங்கள் தெரிந்துகொள்ள வேண்டியிருக்கின்றது.

சாதாரணமாக சிறுபிள்ளைகள் வீடுகட்டி விளையாடுவது வழக்கமாகும். 6 வயதுடைய என்னுடைய மகள் அவ்வாறு வீடு கட்டி விளையாடுகின்றபோது, தனது வீட்டுக்குள்ளே வருபவர்கள் சோதனை செய்யப்பட வேண்டும், அடையாள அட்டையைக் காண்பிக்க வேண்டும் என்ற வகையிலான விளையாட்டையும் சேர்த்தே விளையாடுகின்ற நிலைக்கு அவருடைய உளவியலில் மாற்றம் ஏற்பட்டிருக்கின்றது. ஆகவே, அடையாள அட்டை காண்பிக்காவிட்டால் அல்லது சோதனை செய்யப்படாவிட்டால் அங்கு குண்டுவெடிப் பதற்கான வாய்ப்பு இருக்கின்றது என நினைத்து பிள்ளைகள் விளையாடுகின்ற அளவுக்கு சிறுவர்களின் உளவியல் நிலை இந்த நாட்டிலே மோசமாகச் சென்று கொண்டிருக்கின்றது அடையாள அட்டை காண்பிக்காவிட்டால் என்ன? அல்லது சோதனை செய்யாவிட்டால் என்ன? என்பதை நாங்கள் விளையாட்டாகக் கேட்கின்றபோது, அவ்வாறான சந்தர்ப் பத்தில் இந்த வீட்டுக்குள் குண்டு வெடிப்பதற்கான வாய்ப்பிருக்கின்றது எனப் பிள்ளை பதில் கூறுகின்ற அளவுக்கு அவர்களது உளவியல் நிலை இந்த நாட்டிலே மோசமாகிக் கொண்டிருப்பது சம்பந்தமாக இந்தப் பாராளுமன்றத்தில் நாங்கள் தீவிரமாக ஆராய வேண்டியிருக்கின்றது. பாடசாலையின் பாதுகாப்புக்காக என்று எவ்வளவு காலம் இந்த நடவடிக்கைகளை நாங்கள் முன்கொண்டு செல்லப் போகின்றோம் என்பது சம்பந்தமாக ஆராயவேண்டியிருக் கின்றது.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இது சம்பந்தமாகக் கதைக்கின்றபோது நான் ஒரு விடயத்தை இங்கு கூறவேண்டும். அதாவது, கடந்த காலங்களில் இந்த அவசர காலச் சட்டம் நடைமுறையில் இருந்தபோது, எந்தவிதத்திலும் பயங்கரவாத நடவடிக்கையுடன் சம்பந்தப்படாத அல்லது விடுதலைப் போராட்டங்களின்போது நேரடியாக ஆயுதப் போராட்டங்களில் சம்பந்தப்படாத மலையக மக்கள் பெருமளவில் பாதிக்கப்பட்டிருந்தார்கள். அவசரகாலச் சட்டத்தின்கீழ்க் கைது செய்யப்பட்டு, பயங்கரவாதச் சட்டச் சரத்துகளுக்குக்கீழாகக் குற்றப்பத்திரம் சுமத்தப்பட்ட பலர் இன்றும் சிறைக் கைதிகளாக வாழ்ந்துகொண்டிருக் கின்றார்கள். பல்லாயிரக்கணக்கான முன்னாள் போராளி களைப் புனர்வாழ்வளித்து விடுதலை செய்த இந்த நாட்டில், விடுதலைப் புலிகளுடன் தொடர்பு வைத்திருந்தார்கள் என்ற குற்றச்சாட்டின் பெயரிலே இன்னும் பல இளைஞர்களைச் சிறையிலே வைத்திருப்பதைக் காணக்கூடியதாக இருக்கின்றது. அவர்களின் விடுதலைக்காக நாங்கள் இந்த அரசாங்கத்தோடு பலமுறை, பல வழிகளில் பல்வேறு பேச்சுவார்த்தைகளை நடத்தியும்கூட, அது சாத்தியமற்றதாக இருந்திருக்கின்றது.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் முடிவடைகின்றது.

**ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා**
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
கௌரவ அமைச்சர் திகம்பரம் அவர்களுடைய நேரத்தையும் நான் எடுக்கின்றேன்.

அவசரகாலச் சட்டத்தின் அடிப்படையில் ஏதேனும் ஒரு காரணத்திற்காக அவர்கள் கைது செய்யப்பட்டிருக்கிறார்கள். உதாரணமாக, ஒரு கைதியின் விடயத்தை ஞாபகப்படுத்த விரும்புகின்றேன். கண்டி தலதா மாளிகை மீதான குண்டுத் தாக்குதல் சம்பந்தமாக, அந்தத் தாக்குதலுடன் தொடர்புடைய வர்கள் எத்தனை பேர் கைதுசெய்யப்பட்டார்கள்? இப்போது, எத்தனை பேர் சிறையில் இருக்கிறார்கள்? என இந்தப் பாராளுமன்றம் விசாரிக்க வேண்டும். நான் அறிந்த வகையில், பிரதான சூத்திரதாரிகள் எல்லோரும் விடுதலையாகி விட்டார்கள். ஆனால், அந்தத் தாக்குதலுக்கு வந்த நபருக்கு கடையில் இருந்த உணவுப் பொதியொன்றை விற்பனை செய்ததன்மூலம் தொடர்புபட்டார் என்ற காரணத்திற்காக அன்று சிறையில் அடைக்கப்பட்ட ஒருவர் இன்றும்கூட வயதான நிலையில் சிறையில் அடைக்கப்பட்டிருக்கிறார் என்பதுதான் உண்மை! அதுபோல அந்தத் தாக்குதலுடன் தொடர்புடையவர்கள் என்ற குற்றச்சாட்டின்பேரில் அப்பாவி இளைர்கள் தடுத்து வைக்கப்பட்டிருக்கின்றார்கள். உதாரணமாக தாக்குதல் நடத்தியவர்கள் சம்பந்தப்பட்டவரின் முச்சக்கர வண்டியில் ஏறிச் சென்றார்கள் அல்லது ஏதோ ஒரு காரணத்திற்காக சம்பந்தப்பட்டவருடன் தொலைபேசி அழைப்பை எடுத்தார்கள் என்ற சிறு சிறு காரணங்களுக்காக வருடக்கணக்காக வாழ்வைத் தொலைத்தவர்களாகத் தமிழ் அரசியல் கைதிகள் இன்றும் சிறையிலே அடைக்கப்பட்டிருக் கின்றார்கள். இந்த அவரசகாலச் சட்டத்தினூடாக, அதனோடு தொடர்புடையதாகப் பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழாக அவர்கள் சிறையில் அடைக்கப்பட்ட நிலைமையை நாங்கள் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. இந்த நிலைமைகள் மாற்றப்பட வேண்டும் என்ற காரணத்திற்காக எந்த வகையிலும் நாங்கள் அவசரகாலச் சட்டத்திற்கு ஆதரவாக வாக்களிக்க முடியாது.

இன்று இந்த நாட்டிலே துரதிருஷ்டவசமான நிலைமை ஏற்பட்டிருக்கின்றது. நாட்டின் பாதுகாப்புத் தொடர்பில் கவனயீனமாகச் செயற்பட்டமை காரணமாக இந்த அவசர காலச் சட்டத்தை நீடிப்பது தொடர்பாக இன்று நாங்களும் அவதானம் செலுத்த வேண்டிய தேவை இருக்கின்றது. இருந்தபோதும்கூட, இதனைத் தொடர்ச்சியாக நீட்டிக் கொண்டு செல்வதற்கு மக்கள் பிரதிநிதிகள் என்ற வகையிலே எங்களது அனுமதியைக் கொடுக்க முடியாது. அவசரகாலச் சட்டத்தை குறிப்பிட்ட காலத்திற்கு நடைமுறைப்படுத்தி, அந்தக் குறிப்பிட்ட காலத்திற்குள், ஏற்பட்டிருக்கக்கூடிய இந்தப் பிரச்சினைகளுக்குத் தீர்வு காண்பதற்கு அரசாங்கமும் பாதுகாப்புத் துறை சார்ந்தவர்களும் நடவடிக்கை எடுக்கவேண்டுமென நான் வேண்டுகோள் விடுக்கின்றேன்.

இந்த விவாதத்தில் இன்னுமொரு முக்கியமான விடயத்தை நான் சேர்த்துக்கொள்ள விரும்புகின்றேன். கடந்த பாராளுமன்ற அமர்வின்போது, முன்னாள் அமைச்சர் றவுப் ஹகீம் அவர்கள் புள்ளிவிபரங்களுடன் இந்த நாட்டின் சனத்தொகையை இன ரீதியாகவும் மத ரீதியாகவும் எவ்வாறெல்லாம் கணக்கெடுத்திருக்கிறார்கள் என்பது பற்றிக் கூறினார். இப்போது எழுந்திருக்கின்ற சனத்தொகை ரீதியாக ஏற்பட்டிருக்கக்கூடிய பிரச்சினைகள் மற்றும் குழந்தைப் பிறப்பைக் கட்டுப்படுத்துவதற்கு, சனத்தொகையை இன ரீதியாக மேம்படுத்திக் கொள்வதற்கு அல்லது மட்டுப்படுத்து வதற்கு நாட்டிலே மேற்கொள்ளப்படுகின்ற கைங்கரியங்கள் குறித்துப் பல்வேறு சர்ச்சைகள் இடம்பெற்றுக் கொண்டிருக்கின்றன. அந்த வகையில், அன்று அவர் தெரிவித்த புள்ளிவிபரங்களின் அடிப்படையிலும் அதற்குப் பின்னராக நானும் தேடிப் பெற்றுக்கொண்ட புள்ளிவிபரங் களின் பிரகாரமும் இன்று, இன ரீதியாக சனத்தொகையை

மதிப்பிடுபவர்கள் ஒருபக்கம் இருக்க, சமகாலத்தில் இலங்கையில் மத ரீதியாகச் சனத்தொகை எவ்வாறு இருக்கிறது என்பது சம்பந்தமான பேசுபொருள் அதிகமாக இருக்கின்றது. அந்த வகையில், அண்ணளவாக 70% ஆனவர்கள் பௌத்த மதத்தைச் சேர்ந்தவர்களும் 12.6% ஆனவர்கள் இந்து மதத்தைச் சேர்ந்தவர்களாகவும் 9.7% ஆனவர்கள் இஸ்லாமிய மதத்தைச் சார்ந்தவர்களாகவும் இருப்பதாகப் புள்ளிவிபரங்கள் காட்டிநிற்கின்றன. முன்னாள் அமைச்சரான பாராளுமன்ற உறுப்பினர் கௌரவ றவுப் ஹகீம் அவர்கள் அன்று உரையாற்றும்போது ஒரு நூற்றாண்டுகால அடிப்படையில் சனத்தொகைக் கணக்கெடுப்பு ஆரம்பிக்கப் பட்ட நாளிலிருந்து இன்றைய காலம்வரை எவ்வாறு வேறுபட்டிருக்கின்றது என்பது தொடர்பில் மிக முக்கியமான ஒரு புள்ளிவிபரத்தைச் சொன்னார், 1800களின் இறுதிப் பாகத்திலே அதாவது, சனத்தொகைக் கணக்கெடுப்பை ஆரம்பித்த அந்தக் காலப்பகுதியில் 23% ஆக இருந்த இந்து சனத்தொகையானது, இப்போது 12.3%ஆக குறைவடைந் திருக்கின்றது என்கின்ற புள்ளிவிபரத்தைச் சொன்னார். நான் இதனை இன ரீதியாகவோ மத ரீதியாகவோ பார்க்கவில்லை. நான் மதச் சார்பற்றவனாக இருந்தபோதிலும்கூட, இந்துக்கள் சம்பந்தப்பட்ட புள்ளிவிபரத்தின்கீழ் தமிழ் சனத்தொகை வருவதன் காரணமாக, தமிழர்களில் பெரும்பாலானவர்கள் இந்துக்களாக இருப்பதன் காரணமாக 23 சதவீதமாக இருந்த இந்துக்களின் சனத்தொகை எவ்வாறு 12 சதவீதமாக வீழ்ச்சியடைந்தது என்பது சம்பந்தமாக நாங்கள் அவதானிக்க வேண்டியிருக்கின்றது. இந்தப் பாரிய வீழ்ச்சியினை அவதானிக்கின்றபோது, நாட்டிலே இடம்பெற்ற யுத்தம் காரணமாக வடக்கு, கிழக்கிலே வாழ்ந்த தமிழர்கள் பெருமளவில் வெளிநாடு சென்றதன் காரணமாகவும் யுத்தத்தினால் பெருமளவு தமிழ் மக்கள் அழிவடைந்ததன் காரணமாகவுந்தான் இந்த மாற்றம் ஏற்பட்டிருக்கின்றது என்று பொதுவாகவே நாட்டிலே ஓர் அபிப்பிராயம் ஏற்படக்கூடும்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
கௌரவ உறுப்பினர் அவர்களே, முடித்துக்கொள்ளுங்கள்!

**ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා**
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
ஒரு நிமிடத்திற்குள் முடித்துக்கொள்கின்றேன்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இதற்கப்பால் ஒரு முக்கியமான உண்மை இருக்கின்றது. மலையக மக்களுக்கு இந்த நாட்டிலே நான்கு விதமான அநீதிகள் இழைக்கப்பட்டிருக்கின்றன. அதில் ஒன்றுதான் 1948ஆம் ஆண்டு வாக்குரிமை பறிக்கப்பட்டமை! அதேபோல, 1964ஆம் ஆண்டு ஸ்ரீமா - சாஸ்திரி ஒப்பந்தத்தினூடாக இந்த மக்கள் கொத்துக்கொத்தாக - இலட்சக்கணக்காக இந்த நாட்டிலிருந்து நாடு கடத்தப்பட்டார்கள். அதுபோல, பொருளாதார ரீதியாக இவர்களைப் பின்னடையச் செய்யும் பல்வேறு நடவடிக்கைகளை மேற்கொண்டார்கள். அதாவது, பெருந்தோட்டத்துறையைச் சீரழிப்பதனூடாக, பெருந்தோட்டத் துறைக் கட்டமைப்பை இல்லாமலாக்குவ தனூடாக, அவர்களுடைய பொருளாதாரத்தை வலுவிழக்கச் செய்வத னூடாக இந்த மக்களை ஒடுக்குவதற்கான முயற்சிகள் மேற்கொள்ளப்பட்டன. இவை எல்லாவற்றுக்கும் அப்பால், 1980களில் அல்லது 1985களின் பிற்பகுதியிலிருந்து 2015ஆம் ஆண்டு வரைக்குமான காலப்பகுதியில் திட்டமிட்ட அடிப் படையில் கருத்தடை செய்கின்ற நடவடிக்கைகள் இந்த நாட்டிலே இடம்பெற்றன என்பதை இந்த உயரிய சபையிலே பதிவுசெய்ய வேண்டியிருக்கிறது. எனவே, இன்று எவரேனும் ஒரு வைத்தியரினால் LRT முறையினூடாகச் சனத்தொகைக் கட்டுப்பாடு செய்யப்பட்டிருப்பதாகச் சொல்லப்பட்டால், அது விசாரிக்கப்படுமாக இருந்தால், மலையக மக்கள்மீது ஏவிவிடப் பட்ட கட்டாயக் கருத்தடை சம்பந்தமாகவும் விசாரிக்க ஒரு குழுவினை அமைத்து ஓர் ஆய்வினைச் செய்ய வேண்டும் என்று மலையக மக்களின் பிரதிநிதிகள் என்ற வகையிலே நான் கேட்டுக் கொள்கின்றேன். அந்த மக்களுக்கு இழைக்கப்பட்ட அநீதிக்கு அதனூடாக நியாயம் கிடைக்கவேண்டுமென்ற கோரிக்கையை முன்வைத்து, வாய்ப்புக்கு மீண்டும் நன்றி கூறி, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

[අ.භා.12.56]

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳ විවාදය පැවැත්වෙන ඉතා වැදගත් අවස්ථාවකදී කථා කිරීමට කාලය ලබාදීම සම්බන්ධයෙන් මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම හිතන්නේ අපි නැවතත් අතීත යුගයකට ගියා කියලායි. 2009 අවුරුද්දට කලින් මේ රටේ හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳ විවාදය මාසිකව පැවැත්වුණා. පසුගිය අවුරුදු 9ක් තිස්සේ සම්පූර්ණයෙන්ම ඒ තත්ත්වයෙන් මිදිලා අපි සියලුදෙනාම බොහොම සාමයෙන්, සහයෝගයෙන්, සතුටින් ජීවත් වුණා. හැබැයි අද වන විට මේ රජය අපොහොසත් වෙලා තිබෙනවා, ජනතාවගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කරන්න. ජීවත් වීමේ නිදහස අද මේ රටේ ජනතාවට අහිමි වෙලා තිබෙනවා. ඒ වාගේම, තමුන් කැමැති, තමුන් විශ්වාස කරන ආගමක් ඇදහීමේ අයිතිය අද මේ රජය අහෝසි කරලා තිබෙනවා. ඒ අයිතිය ලබාදීමට අද මේ රජය අපොහොසත් වෙලා තිබෙනවා. අපට නිදහසේ ගමන් බිමන් යෑමට තිබුණු අයිතිය සම්පූර්ණයෙන්ම අද අපෙන් අයින් වෙලා තිබෙනවා. ඒ වාගේම, දරුවෙකුට භය නැතිව පාසලට ගිහිල්ලා අධ්‍යාපන කටයුතු සාර්ථකව කර ගැනීමට තිබෙන අයිතියත් අද අහෝසි වෙලා තිබෙනවා. ඒ නිසා අද අපේ රට ආර්ථිකමය වශයෙන් සහ ආරක්ෂාව අතින් ආපස්සට ගිහිල්ලා තිබෙනවාය කියන එක ඉතාම කනගාටුවෙන් කියන්න ඕනෑ. පසුගිය අප්‍රේල් 21 ප්‍රහාරය පිළිබඳව මේ රජය දැනුවත් කරලා තිබියදී, ඒ ප්‍රහාරයට ඉදිරිපත් වෙන අයගේ නාමලේඛන දීලා තිබියදී, ප්‍රහාරයට ඉදිරිපත් වෙන අයගේ ජාතික හැඳුනුම්පත් අංක දීලා තිබියදී රජය අපොහොසත් වුණා, ඒ ප්‍රහාරයෙන් රටේ ජනතාව ආරක්ෂා කරගන්න. ඒ නිසා තමයි එදා විශාල ජනතාවක් පල්ලියට ගිහිල්ලා හිටපු අවස්ථාවක මෙවැනි සිදුවීමක් වුණේ. අපි හිතුවේ පල්ලිය තමයි අපට තිබෙන ආරක්ෂිතම තැන කියලා. අපට ප්‍රශ්නයක් වුණාම අපි යන්නේ පල්ලියට. අපි විශ්වාස කරන ආගම අදහන ස්ථානයට ගිහිල්ලා අපි දෙවියන්ට කන්නලව් කරනවා, ප්‍රශ්නවලට විසඳුම් හොයන්න. හැබැයි, අපි එහෙම ගිය තැනෙක තිබුණු විශ්වාසය සම්පූර්ණයෙන්ම බිඳිලා, එතැනදී ජනතාවට බෝම්බ ප්‍රහාරවලට ලක් වෙන්න සිද්ධ වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාස්කු ඉරිදා කියන්නේ කතෝලිකයන්ට ඉතාම වැදගත් දිනයක්. දින 40ක් බොහොම දුක්මනස්තාප වෙලා, ජේසුතුමන්ගේ උථ්ථානය සිහිපත් කරන 2019 අප්‍රේල් 21දා ජනතාවට සිද්ධ වුණේ ඉතාම භයකට, ත්‍රාසයකට හා සංවේගයකට පත් වෙන්නයි. අපේ ජනතාව තවම ඒ තත්ත්වයෙන් මිදිලා නැහැ. අද ඒ ජනතාව ජීවත් වෙන්නේ භයෙන්. හැබැයි, කතෝලික ජනතාවට සිද්ධ වෙච්ච මේ අසාධාරණය ගැන, කතෝලික ජනතාව එල්ල කරගෙන සිදු වෙච්ච

[ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය ]

මේ ම්ලේච්ඡ ප්‍රහාරය ගැන නොවෙයි අද කථා කරන්නේ. අද ඒ අවධානය වෙන පැත්තකට යොමු කරලා, ජාතීන් අතර, ආගම් අතර තිබෙන අසමගිය ගැනයි කථා කරන්නේ. ඒ නිසා මේ හදිසි නීතිය දීර්ඝ කිරීමේ විවාදයට නැවත එක්කාසුවීමට ලැබීම පිළිබඳව අපි ඇත්තටම කනගාටු වෙනවා. අපේ කතෝලික ජනතාව පීඩාවට පත් වෙච්ච වෙලාවේ, මරණයට පත් වෙච්ච වෙලාවේ සමහර නායකයන් අදහස් ප්‍රකාශ කරපු විධිය, හැසිරිච්ච විධිය ගැන අපේ කනගාටුව අපි ඇත්තටම පළ කරන්න ඕනෑ.

ඒ වාගේම, අද කැකිල්ලේ නඩු තීන්දු තමයි දීලා තිබෙන්නේ. විශේෂයෙන්ම අප්‍රේල් 21 අවදානම පිළිබඳව ආණ්ඩුව දැනුවත් කරලා තියෙද්දී, ආණ්ඩුවට ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට අපොහොසත් වුණා. අද පුංචිම තැනට තමයි දඬුවම දීලා තිබෙන්නේ. පොලිස් අධිකාරිවරුන් කීප දෙනෙක් ඇතුළු කටානේ පොලිස් ස්ථානාධිපතිතුමා, ජම්පටාවීදියේ පොලිස් ස්ථානාධිපතිතුමා තමයි අද මේ වෙනුවෙන් ස්ථාන මාරු කරලා තිබෙන්නේ. ඔවුන්ට විරුද්ධව තමයි විනයානුකූලව කටයුතු කරලා තිබෙන්නේ. මොකක්ද මේ කැකිල්ලේ නඩු තීන්දුව කියලා අපි අහනවා. අප්‍රේල් 21වැනි දා සිදු වුණු ප්‍රහාරය පිළිබඳව විමර්ශනය කරන්න පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් ඉල්ලුවා. 21වැනි දා ප්‍රහාරයට හේතුව මොකක්ද, කොහොමද ඒක සිද්ධ වුණේ, ඇයි ඒක වළක්වාගන්න බැරි වුණේ, කවුද ඒකට වග කියන්න ඕනෑ කියලා අහනවා වෙනුවට, අද එම කාරක සභාව 'ළිඳ ළඟ සංගමය වාගේ' එම සිද්ධියට අදාළ නැති දේවල් තමයි කථා කරන්නේ කියන එක අපි ඉතා කනගාටුවෙන් කියන්නට ඕනෑ.

පාස්කු ප්‍රහාරය හේතුවෙන් මගේ ආසනය වන කටානේ, කටුවාපිටිය ප්‍රදේශයේ 115දෙනෙක් අද වෙනකොට මිය ගිහින් තිබෙනවා. එම ප්‍රහාරය වූ දවසේ 113දෙනෙක් සහ ඊට පස්සේ තවත් දෙදෙනෙක් මිය ගියා; 237දෙනෙකුට තුවාල සිද්ධවෙලා තිබෙනවා. හැබැයි, අද ආණ්ඩුව කියනවා, "අපි වන්දි ගෙව්වා" කියලා. වන්දි ගෙවලා සතුටට පත් වෙන්න පුළුවන්ද කියලා අපි ආණ්ඩුවෙන් අහනවා. මිය ගිය අය වෙනුවෙන් රුපියල් ලක්ෂ 10ක වන්දියක් තමයි දෙන්නේ. අපි කනගාටු වෙනවා, වන්දි ගෙවීමේ කටයුත්තේදී වෛද්‍ය වාර්තා හරියට අර්ථ කථනය කරන්න හානි පූරණ කාර්යාලයේ වෛද්‍යවරයෙක් නැති වීම ගැන. දවස් 50ක් සිහි නැතුව දැඩි සත්කාර ඒකකයේ හිටපු තරුණයෙක් මීට සති දෙකකට කලින් මිය ගියා. ඒ තරුණයාට රුපියල් ලක්ෂයක වන්දියක් තමයි දීලා තිබෙන්නේ. මොකද, වෛද්‍ය වාර්තාවට අනුව අකර්මණ්‍ය තත්ත්වය කොපමණ ප්‍රතිශතයකින් තිබෙනවාද කියන එක බලලා තමයි හානි පූරණ කාර්යාලයේ ඉන්න අය වන්දි ගෙවන්නේ. ඔහුගේ වෛද්‍ය වාර්තාවේ තිබෙනවා, මොළයට හානිවෙලා තිබෙනවා, යථා තත්ත්වයට, ප්‍රකෘති තත්ත්වයට පත් වෙන්නේ නැහැ කියලා. නමුත්, ඒ තරුණයාට ගෙවලා තිබෙන්නේ රුපියල් ලක්ෂයක වන්දියක් විතරයි. ඊට පස්සේ ඔහු මිය ගියා. ඒ වාගේම, කටාන ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙකුගේ බිරිඳක් ගිය සතියේ මිය ගියා. ඒ මන්ත්‍රීතුමාත් මිය ගියා, අම්මාත් මිය ගියා. නමුත්, එතුමියට කිසිම වන්දියක් ලැබී නැහැ. ඒ ජනතාව බොහොම අමාරුවෙන් ජීවත් වෙන්නේ, දුකෙන් ජීවත් වෙන්නේ, කනගාටුවෙන් ජීවත් වෙන්නේ කියන එක අපි ආණ්ඩුවට කියනවා. තව අවුරුදු ගණනාවක් ගියත් ඒ ප්‍රදේශයට, ඒ ජනතාවට සිදු වූ හානියෙන් ඒ ජනතාව මුදා ගන්න අපට හැකියාව ලැබෙන්නේ නැහැ. එම නිසා ඒ ජනතාවට සාධාරණය ඉෂ්ට කරන්න. ඒ හානිය අපට මුදල්වලින් මනින්න බැහැ. අපි දන්නවා, හානි පූරණ කටයුත්තේදී සමහර ගොඩනැඟිලිවලට විශාල මුදලක් දෙන්න රජය පසුබට වුණේ නැහැ කියන එක. හැබැයි, ජීවිත අහිමි වූ පවුල් අද අන්ත අසරණ තත්ත්වයට පත්වෙලා ඉන්නවා. සමහර අයට ව්‍යාපාර කරගෙන යන්න විධියක් නැහැ. ඒ වාගේම තව කාන්තාවක් ඉන්නවා, මොළයට වූ දැඩි හානිය නිසා ශරීරයේ වම්පස අකර්මණ්‍ය වෙලා. ඇය අංශභාග තත්ත්වයෙන් ඉන්නේ. ඇයගේ ස්වාමිපුරුෂයාට අද රැකියාවට යන්න විධියක් නැහැ. ඔහුගේ ත්‍රිරෝද රියේ ණය වාරිකය ගෙවාගන්න විධියක් නැහැ. ඒ අය ඉතාම අසරණ තත්ත්වයට පත්වෙලා ඉන්නේ. එම නිසා ඒ ජනතාව දිහා සානුකම්පිතව බලන්න. මාසයක් පාසා හදිසි නීතිය දීර්ඝ කළාට මේ ප්‍රශ්නවලට විසඳුම් සොයන්න බැහැ. මේ ප්‍රශ්නවලට හේතු තිබෙනවා. ඒ හේතු හොයලා ඉදිරියේදී එවැනි ප්‍රහාර වළක්වාගෙන, රටක් හැටියට ජාතීන් අතර සමඟිය, ආගම් අතර සමඟිය, සංහිඳියාව වර්ධනය කරන්න අපි සියලුදෙනාම එකතුවෙලා කටයුතු කරනවා නම්, මේ රට ඉදිරියේදී හෝ හොඳ තැනකට ගෙන යන්න පුළුවන් කියන විශ්වාසය අප තුළ තිබෙන බවත් මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 1.03]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කථා කරනකොට කිව්වා, චෝදනාවකුත් කළා, 21වැනිදා ප්‍රහාරය පිළිබඳව කවුරුවත් කලින් කිව්වේ නැහැයි කියලා. නමුත් අපි දන්නා කරුණු කාරණා ඉදිරිපත් කරලා තිබෙනවාය කියන එක මම එතුමාට කියනවා. ඒ වාගේම අපටත් යම් කාරණා ගැන කියන්න පුළුවන්.

ඊබ්‍රහිම් කියන වෙළෙඳ ව්‍යාපාරිකයා ජනතා විමුක්ති පෙරමුණේ ජාතික ලැයිස්තුවේ හිටපු කෙනෙක්. එතුමාගේ පුතාලා දෙදෙනා තමයි අප්‍රේල් 21වැනි දා ප්‍රහාරයේ ප්‍රධානම මරාගෙන මැරෙන බෝම්බකරුවන්. එතකොට, ඊබ්‍රහිම් මහත්මයා ඇවිල්ලා ජනතා විමුක්ති පෙරමුණට, අනුර දිසානායකට කිව්වේ නැද්ද, මගේ පුතාලා දෙදෙනා මේ විධියට ත්‍රස්තවාදී කටයුතුවලට සම්බන්ධ වෙලා ඉන්නවා, එම නිසා ඒ දෙදෙනා ඒකෙන් ගලවලා දෙන්න කියලා? මොකද, එතුමා ගෙනෙන තර්කය අනුව, ඒ විධියට එතුමා දැනුවත් කළේ නැද්ද කියන ප්‍රශ්නය අපට පෙරළා එතුමාගෙන් අහන්න වෙනවා. එතුමා තේරුම් ගන්න ඕනෑ, මුස්ලිම් සමාජයේ සිදු වන හැම සිද්ධියකටම, හැම ක්‍රියාදාමයකටම අපි වග කියන්න ඕනෑ කියලා කොහෙවත් සඳහන් නැහැ කියලා. එම නිසා මට එතුමාගෙනුත් අහන්න දෙයක් තිබෙනවා. ඊබ්‍රහිම් මහත්මයා එතුමන්ලාගේ දේශපාලන ව්‍යාපාරය තුළ, ජනතා විමුක්ති පෙරමුණත් එක්ක ඉතාම කිට්ටුවෙන් වැඩ කරපු කෙනෙක්. නමුත්, එතුමාගේ පුතාලා දෙදෙනාම මෙම සිද්ධියේ ප්‍රධානම බෝම්බකරුවෝ. එම නිසා ජනතා විමුක්ති පෙරමුණ මේ ගැන දැනගෙන සිටියේ නැද්ද කියන එකත් අපට පෙරළා එතුමාගෙන් අහන්න පුළුවන්. එම නිසා එතුමා ගෙනෙන ඒ තර්කය සාධාරණයි කියලා මම හිතන්නේ නැහැ. මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන කිසිදු මුස්ලිම් නායකයකුට වුවමනාවක් නැහැ, මුස්ලිම් අන්තවාදයක් වර්ධනය කරන්න හෝ ඒවා ආරක්ෂා කරන්න. ඒවා ගැන තොරතුරු දන්නවා නම්, අනිවාර්යයෙන්ම අපි ඒවා ආරක්ෂක අංශවලට ලබා දෙනවා. නමුත් මේ කාරණයේදී, මේ සහරාන්ලාගේ ක්‍රියාකලාපයේදී හුහක්දුරට ඔවුන් සැඟවී -හැංගිලා- වැඩ කළ කණ්ඩායමක් බව පෙනෙනවා. ඔවුන් ප්‍රසිද්ධියේ වැඩ කළ ප්‍රමාණයට වඩා වැඩ කළේ හැංගිලායි. ඔවුන් අන්තවාදී අදහස් පවා පළ කළේ ඉතාම රහසිගතවයි. විශේෂයෙන් එහි ආගමික මුහුණුවරක් තිබුණු නිසා තමයි මුස්ලිම් ආගමික නායකයන් ඇවිත් ඒ පිළිබඳව ආරක්ෂක අංශවලට දැනුම් දුන්නේ. මොකද, අපට වඩා ඔවුන් මේ පිළිබඳව කරුණු කාරණා දැනගෙන හිටියා. දේශපාලන මුහුණුවරකින් එන ත්‍රස්තවාදයකට වඩා ආගමික මුහුණුවරක් මෙහි තිබුණු නිසා හුහක්

ආගමික නායකයන් මේ පිළිබඳව අදාළ අංශ දැනුවත් කර තිබුණා. එම නිසා ඔබතුමා ගෙනෙන තර්කය එතරම් සාධාරණ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපි හදිසි නීතිය දීර්ඝ කිරීම සඳහා විවාද කරනවා. හදිසි නීතිය අපි මේ රටේ ක්‍රියාත්මක කරන්නේ අපේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් වෙන නිසා ජාතික ආරක්ෂාව රැක ගන්නටයි. හදිසි නීතිය අනුමත කරගෙන මොකක්ද අපි බලාපොරොත්තු වෙන්නේ? හදිසි නීතිය අනුමත කරගෙන අපි බලාපොරොත්තු වුණා, මේ රටේ ත්‍රස්ත ක්‍රියාවලට සම්බන්ධ පිරිස් අත්අඩංගුවට ගන්න; ත්‍රස්තවාදීන් විනාශ කරන්න. හමුදාපතිතුමා, පොලිස්පතිතුමා ඇතුළු ආරක්ෂක අංශවල ප්‍රධානීන් ඇවිල්ලා කිව්වා, "ත්‍රස්තවාදයට සම්බන්ධ ඒ ත්‍රස්තවාදීන්ගේ අවසාන පුරුක දක්වා අද වෙනකොට අත්අඩංගුවට ගෙන තිබෙනවා" කියලා. ඒ අනුව අද ත්‍රස්වාදීන්ගේ ක්‍රියා කලාපය අඩපණ කර තිබෙනවා. ඊයේ විශේෂ කාරක සභාවට හමුදාපතිතුමා ඇවිත් කිව්වා, "අපට හදිසි ප්‍රහාරයක් එල්ල වෙයි කියලා දැන් බලාපොරොත්තු වෙන්න බැහැ. එම තත්ත්වය අපි සමනය කරලායි තිබෙන්නේ" කියලා. ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් පිටරටවල සංචාරකයන්ට කියනවා දැන් මේ රටට එන්න කියලා. සංචාරකයන්ට මේ රටට එන්න දැන් කිසිම ප්‍රශ්නයක් නැහැ. අපි දන්නවා, අද වෙන කොට කොළඹ නගරයේ ආරක්ෂක මුර කපොලු බොහෝ ප්‍රමාණයක් අඩු කර තිබෙන බව. අද රට යථා තත්ත්වයට පත් වෙමින් යනවා. අපි සියලුදෙනාම අද එය දකිනවා.

අද ළමයින් විශාල වශයෙන් පාසල්වලට යනවා. ජනතාවගේ බිය සැක මීට කලින් තිබුණාට වඩා අද වෙනකොට පහව ගිහින් තිබෙනවා. එම නිසා අද රට සාමාන්‍ය තත්ත්වයකට පත් වෙලා තිබෙනවාය කියන එක අපි සියලුදෙනාම පිළිගන්නවා. ත්‍රස්තවාදීන්ගෙන් ප්‍රහාරයක් එල්ල වෙයි කියන ඒ සැකය තිබුණාට, "එහෙම වෙන්නේ නැහැ" කියන එක අද වෙනකොට ආරක්ෂක අංශ විසින් තහවුරු කර තිබෙනවා. ඒ තහවුරු කිරීම මතම හදිසි නීතිය ගෙනා එකේ වැදගත්කම අපට අද පෙනී යනවා; ඒක ඔප්පු වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ත්‍රස්තවාදී කටයුතු නිසා හුඟක් රටවල් අපේ රටට travel bans දාලා තිබුණා, ලංකාවේ සංචාරය කරන්නට එපා කියලා. Travel bans දමා තිබුණු හුඟක් රටවල් අද වෙනකොට ඒ travel bans අයින් කර ගෙන තිබෙනවා. නමුත් සමහර රටවල් කියලා තිබෙනවා, "තවම ලංකාවේ tense තත්ත්වයක් තිබෙනවා. කලබලකාරී තත්ත්වයක් ඇති වෙන්නට පුළුවන්. එම නිසා ලංකාවට ගමන් කිරීම ඉතාම අවදානම්" කියලා. ඊයේ ඇමෙරිකාව දමපු travel ban එක relax කර තිබෙනවා. ඔවුන් දැමූ ඒ නීති රීති අවම කර ගෙන තිබෙනවා. නමුත් ඇමෙරිකාව කියනවා, "තවම ලංකාව තත්ත්වය සාමාන්‍ය තත්ත්වයකට පත් වෙලා නැහැ, එම නිසා ගමන් කිරීම ගැන අවධානය යොමු කරන්න"කියලා. යන්න එපා කියලා ඔවුන් කියන්නේ නැහැ. එසේ නම් කවුද මේ රටේ tense තත්ත්වයක් ඇති කරන්නේ? හමුදාපතිතුමායි, පොලිස්පතිතුමායි කියනවා, "ත්‍රස්තවාදීන් නැහැ. ත්‍රස්තවාදීන් දැන් අත් අඩංගුවට ගෙන තිබෙන්නේ" කියලා. අගමැතිතුමාත් කිව්වා, "සහරාන්ගේ කල්ලිය දැන් නැහැ" කියලා. ජනාධිපතිතුමාත් කිව්වා,"ඔක්කොම ත්‍රස්තවාදීන් අපි අල්ලාගෙනයි ඉන්නේ. එකසිය ගණනක් හිටියා. එකසිය ගණනම දැන් ඉන්නේ හිරේ. දැන් ප්‍රශ්නයක් නැහැ" කියලා. ඒ නිසා අපි දැන් පිටරටවලට කියනවා ලංකාවට එන්න කියලා. අපි එහෙම එන්න කියනකොට ඒ රටවල් කියනවා,"තවම ලංකාවට යන්න පුළුවන් තත්ත්වයක් නැහැ. ලංකාවේ තවම tension එකක් තිබෙනවා. උණුසුම් තත්ත්වයක් තිබෙනවා" කියලා. දැන් මේ උණුසුම් තත්ත්වය ඇති කරන්නේ කවුද? ඒක තමයි දැන් තිබෙන ප්‍රශ්නය. මේ උණුසුම් තත්ත්වය ඇති කරන්නේ ත්‍රස්තවාදින් නොවෙයි. දැන් මේ රටේ ඉන්න ජාතිවාදීන් ටිකක් පාරට බැහැලා, උපවාස කරලා, මුස්ලිම් කඩවලට ගහලා, මුස්ලිම් ගෙවල් ගිනි තියලා, මුස්ලිම් ජාතිකයන්ට එරෙහිව වෛරය ප්‍රකාශ කරලා සිංහල මුස්ලිම් ගැටුමක් ඇති කරන්න ජාතිවාදය අවුස්සනවා. ඒ ගොල්ලෝ තමයි දැන් මේ රටේ tension එකක් ඇති කරන්නේ. නමුත් දැන් ඒ ගොල්ලන්ට විරුද්ධව හදිසි නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒක තමයි අද තිබෙන ප්‍රශ්නය.

හදිසි නීතිය ගෙනාවේ මේ රටේ ජාතික ආරක්ෂාවට. ජාතිවාදී අයගේ මේ ප්‍රකාශ නිසා මේ රටේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් නැද්ද? මේ රට තුළ, සමාජය තුළ ජාතිවාදී ලෙස වෛරී ප්‍රකාශ කරන එකෙන් ජාතික ආරක්ෂාවට තර්ජනයක් වෙන්නේ නැද්ද? මේ රටේ මුස්ලිම් අයගේ කඩවල්, ගෙවල් ගිනි තියපු එක ජාතික ආරක්ෂාවට තර්ජනයක් නොවේද? ඒවා නිසා ජාතික ආරක්ෂාවට තර්ජනයක් නැද්ද? පත්තරවල ද්වේශසහගත ලෙස කතුවැකි ලියනවා, ප්‍රවෘත්ති පළ කරනවා. සමහර මාධ්‍ය ඉතාම නිර්ලජ්ජිත ලෙස ජාතිවාදය අවුස්සන ප්‍රකාශ පළ කරනවා. ඒවායින් ජාතික ආරක්ෂාවට තර්ජනයක් නැද්ද? ත්‍රස්තවාදය විතරද ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන්නේ? දැන් ත්‍රස්තවාදය නැහැ කියලාත් කියනවා. ත්‍රස්තවාදය දැන් අවසන් කියලා අපේ හමුදාපතිතුමා, පොලිස්පතිතුමා, ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු සියලුදෙනාම ප්‍රකාශ කරනවා. නමුත් මේ රටේ නැවත කලබල ඇති කරන්න, මේ රටේ ජාතිවාදී ගැටුම් ඇති කරන්න, මේ රටේ නැවත සිංහල මුස්ලිම් ජනවාර්ගික ගැටුම් අවුලවන්න ප්‍රකාශ කරන උදවිය නිදහසේ ඉන්නවා. ඒ ගොල්ලන්ට හදිසි නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. [බාධා කිරීමක්] ඔව්. කියන්න මන්ත්‍රීතුමා.

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන දේ මම පිළිගන්නවා. හැබැයි, මංගල සමරවීර වාගේ ඇමතිවරයෙක් කියනවා, "මේක සිංහල බෞද්ධ රටක් නොවෙයි" කියලා. මේ එහෙම කියන වෙලාවක් නොවෙයි නේ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මංගල සමරවීර ඇමතිතුමා ඒ වාගේ ප්‍රකාශ -වෛරී ප්‍රකාශ- කරනවා නම්, එතුමාට විරුද්ධවත් ක්‍රියා කරන්න. ඒ ගැන ගැටලුවක් නැහැ. කිසිම ප්‍රශ්නයක් නැහැ. මම කියන්නේත් ඒකයි. නීතිය හැම කෙනාටම එක විධියට ක්‍රියාත්මක කරන්න. ජාතික ආරක්ෂාවට තර්ජනය වන දේවල් තිබෙනවා නේ. මේ search operationsවලදී වැඩිම පිරිසක් අත්අඩංගුවට අරගෙන තිබෙන්නේ කුරුණෑගලින්. අර DIG මහත්තයා කුරුණෑගල ඉන්න නිසා ඔහු තමයි වැඩියෙන්ම පිරිස් අත්අඩංගුවට අරගෙන තිබෙන්නේ. 250කට වැඩි පිරිසක් තවම රඳවාගෙන ඉන්නවා. ඒ මොකටද රඳවාගෙන ඉන්නේ? සමහර අයගේ accountsවල සල්ලි තිබුණාය කියලා, සමහර අයගේ ගෙදර අරාබි පොතක් තිබුණාය කියලා, සමහර අයගේ ගෙවල්වල camouflage T-shirt එකක් තිබුණාය කියලා, සමහර අයගේ ගෙවල්වල පිහියක් තිබුණාය කියලා, මන්නයක්, කඩුවක් තිබුණා කියලා අත්අඩංගුවට අරගෙන තිබෙනවා. බෙල්ට් එකක් තිබුණා කියලාත් එක්කෙනෙක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. පොලීසිය අඳින beltsවලට සමාන belt එකක් තිබුණාය කියලා එක්කෙනෙක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඒ මනුෂ්‍යයා belts වෙළඳාම් කරන මනුෂ්‍යයෙක්. ඒ මනුෂ්‍යයාත් අරගෙන ගිහිල්ලා DOs ගහලා ඇතුළේ තියාගෙන ඉන්නවා. මෙන්න මේ විධියට 250කට වැඩි පිරිසක් කිසිම සාක්ෂියක් නැතුව තවම රඳවාගෙන ඉන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපට පෙනෙනවා, මේවා ජාතික ආරක්ෂාවට තර්ජනයක් බව. මෙහෙම තියාගෙන ඉන්න එක ජාතික ආරක්ෂාවට තර්ජනයක් බව.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் இரண்டு நிமிடங்கள் உள்ளன.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
இல்லை. கௌரவ அமைச்சர் திகம்பரம் அவர்களின் நேரம் இருக்கின்றது.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
அவருடைய நேரம் எடுக்கப்பட்டிருக்கிறது.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
அவருடைய time ஐ எனக்குத் தருவதாக அறிவித்திருக் கிறார்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
கௌரவ திலகராஜா அவர்கள் அதில் ஐந்து நிமிடங்கள் எடுத்துவிட்டார். எனவே, உங்களுக்கு ஐந்து நிமிடங்கள் தரலாம்.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
கௌரவ அமைச்சர் திகம்பரம் அவர்கள் அவருடைய 10 நிமிடங்களையும் எனக்குத்தான் தந்திருக்கிறார்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
உங்களுக்கு ஐந்து நிமிடங்கள் தரலாம்!

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කියාගෙන ආවේ මේවා ජාතික ආරක්ෂාවට තර්ජනයක් කියන එකයි.

පසුගිය දවසක මම දැක්කා, "මුස්ලිම් සංවිධානවලින් කැම දෙන එක ගැන බලන්න ඕනෑ, හොයන්න ඕනෑ" කියලා ගාමිණී ලොකුගේ මන්ත්‍රීතුමා 'දිවයින' පත්තරයට කරපු ප්‍රකාශයක්. නමුත්, ගාමිණී ලොකුගේ මන්ත්‍රීතුමා එහෙම ප්‍රකාශයක් කළේ නැහැ කියලා audio clip එකකුත් දැම්මා. එතකොට ඒක වාර්තා කරපු මාධ්‍යවේදියා ගැන, -වෛරී ප්‍රකාශයක් කරපු, වෛරී විධියට ජාතිවාදය අවුස්සන, වෛරී පුවත් පළ කරපු මාධ්‍යවේදියා ගැන- හදිසි නීතිය යටතේ ක්‍රියාත්මක වෙන්නේ නැත්තේ ඇයි? ඒ ගැන ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒක තමයි මම කිව්වේ, හදිසි නීතිය එක පාර්ශ්වයකට ක්‍රියාත්මක වෙනවා කියලා. එතකොට,-

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
What is the point of Order, Hon. Member?

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමන්ලාගේ ආණ්ඩුවක් තියෙන්නේ. ඔබතුමා දොස් කියන්නේ කාටද? විපක්ෂයටද?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order, Hon. Member.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියාගෙන ආවේ එක පාර්ශ්වයකට හදිසි නීතිය ක්‍රියාත්මක වෙනවා, තව පාර්ශ්වයකට හදිසි නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ කියන එකයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊයේ අපේ ජනාධිපතිතුමා හමුවෙලා තියෙනවා, OIC රටවල ඉන්න තානාපතිවරු. ඒ තානාපතිවරු හමු වුනාම ජනාධිපතිතුමා කියලා තිබෙනවා, "මේ මුස්ලිම් විරෝධය ඡන්දය ඉවර වනතෙක් යයි" කියලා. එහෙම නම්, ඡන්දය ඉවර වනතෙක් අපි ගුටි කන්න ඕනෑ? ඒක මාර වැඩක්. ඒ කියන්නේ, බලය ගන්න මේ රටේ දේශපාලන පක්ෂ මුස්ලිම් විරෝධයක් ඇති කරනවා. ඒ මුස්ලිම් විරෝධය හරහා මේ රටේ ජාතිවාදය අවුස්සනවා. ඒක ඡන්දයෙන් පස්සේ ඉවර වෙයි. එතකොට, ඡන්දය ඉවර වනතෙක් අපි ගුටි කන්න ඕනෑ? ඡන්දය ඉවර වනතෙක් අපි 'බයිට්' වෙන්න ඕනෑ. ඒක මාර තර්කයක්. ඒක හරියට "යොන් මැරිල්ල" වාගේයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "යොන් මැරිල්ල" කියලා එකක් තිබෙනවා. ඒ "යොන් මැරිල්ල" වාගේ තමයි මේ න්‍යාය. ඒ කියන්නේ, මොනවා වුණත් අවසානයේ මැරෙන්නේ මුස්ලිම් එක්කෙනෙක්. ඒ නිසා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,- [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
What is your point of Order, Hon. Dayasiri Jayasekara?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු මන්ත්‍රීතුමා, ජනාධිපතිතුමා කොහේදීද ඒක කියලා තිබෙන්නේ?

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
එතුමා කරපු ප්‍රකාශය අද සමාජ මාධ්‍ය ජාලවල පළ වෙලා තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මොකේද තිබෙන්නේ?

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் றஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු මන්ත්‍රීතුමනි, gagana.lk කියලා website එකක් තිබෙනවා. ඔබතුමා බලන්න, ඒකේ පළ වෙලා තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Websitesවලද?

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் றஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඔව්, websitesවල ඒක පළ වෙලා තිබෙනවා. ඒවාගේම මම ඔබතුමාට කියන්න ඕනෑ- [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම කියන්නේ මේකයි. එතුමා ජාතිවාදී මතවල නැහැ. ඒක මතක තියා ගන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் றஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මම කියන්නේ නැහැ, එතුමා ජාතිවාදී මතයක ඉන්නවා කියලා. මම කිව්වේ, එතුමා තානාපතිවරුන්ට කරපු ප්‍රකාශය. "මේ මුස්ලිම් විරෝධය ඡන්දයක් එනතෙක් යයි" කියන එක. මම කියන්නේ ඒකයි. මම කියන්නේ නැහැ, ජනාධිපතිතුමා ඒ මතයේ ඉන්නවා කියලා. ජනාධිපතිතුමා කරපු ප්‍රකාශය ගැන මට තොරතුරු දැන ගන්න ලැබුණ විධියටයි මම කිව්වේ. ඡන්දයක් එනතෙක් මේ විරෝධය යන්න පුළුවන්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔය මඩ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் றஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්තුමනි, මෙය මඩක් නොවෙයි.

හදිසි නීතිය ක්‍රියාත්මක කිරීම දෙව්ධියකට වීම නිසා අද වනකොට ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. වෛරී ප්‍රකාශ කරමින් මේ රටේ ජනකොටස් අතර ඈත කොටාගැනීම් ඇති කරන්න, මේ රටේ ජාතිවාදය අවුස්සන්න හා පෙළපාළි යන්න හදිසි නීතියෙන් බාධාවක් නැහැ. ඒවාට හදිසි නීතියෙන් කිසිම ප්‍රශ්නයක් නැහැ. හදිසි නීතිය ක්‍රියාත්මක වෙද්දී ඒවා කරන්න පුළුවන්. හදිසි නීතිය තුළදීත් ඒගොල්ලන්ට කිසිම ගැටලුවක් ඇති වන්නේ නැහැ. අපේ ත්‍රිවිධ හමුදාපතිවරු, පොලිස්පතිතුමා ඇතුළු ආරක්ෂක ප්‍රධානීන් කියනවා, "මේ රටේ ත්‍රස්තවාදය අද වනකොට අවසානයකට අපි ගෙනැල්ලා තිබෙනවා. ඒ නිසා ත්‍රස්තවාදී ප්‍රහාරයක් සම්බන්ධව අප බිය විය යුතු නැහැ" කියලා. එසේ කියද්දීත්, මේ රටේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන, ජාතික ආරක්ෂාවට තර්ජනාත්මකව කරන ප්‍රකාශවලට කිසිදු ආකාරයෙන් නීතිය ක්‍රියාත්මක වීමක් අපි දකින්නේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රටක් හැටියට අපට එහෙම ඉදිරියට යන්න බැහැ.

ත්‍රස්ත විමර්ශන අංශයේ හිටපු අධ්‍යක්ෂ හා හිටපු DIG නාලක ද සිල්වා මහතා අපේ විශේෂ කාරක සභාවට ඇවිල්ලා මොකක්ද කිව්වේ? එතුමා විශේෂයෙන්ම කියා තිබෙනවා, සහරාන්ලාගේ ක්‍රියා කලාපය ගැන. සහරාන්ලාගේ ක්‍රියා කලාපය ඉක්මන් වුණේ, ඔවුන්ගේ දේශනා ත්‍රස්ත දේශනා බවට පත් වුණේ, විශේෂයෙන්ම අලුත්ගම හා දිගන ප්‍රදේශවල ඇති වූ සිදුවීම්වලින් පස්සේ, ඒ ක්‍රියා වේගවත් වුණා කියලා. සහරාන් ගැන එදා TID එකේ හිටපු අධ්‍යක්ෂ නාලක ද සිල්වා මහතා විශේෂ කාරක සභාවට ඇවිල්ලා කියපු ඒ ප්‍රකාශය බලන්න. එතකොට වෛරී ප්‍රකාශ කරමින්, ජාතිවාදය අවුස්සන්න හදන්නේ නැවත වතාවක් මේ රටේ සහරාන්ලා හදන්නද? මේ රටේ නැවත වතාවක් සහරාන්ලා හදන්න ඉඩ දෙනවාද කියන ගැටලුව අපට තිබෙනවා. අපි ඒකට ඉඩ දෙනවාද? මේ රටේ ඉන්න සමහර උදවියට අවශ්‍ය වෙලා තිබෙනවා, සහරාන්ලාට අවශ්‍ය පසුබිම මේ රටේ නිර්මාණය කරන්න, සහරාන්ලාට අවශ්‍ය දේශපාලන වාතාවරණය මේ රටේ හදන්න. ඒ පුද්ගලයන්ට අවශ්‍ය දේ කරගන්න ඉඩ දෙනවාද කියන ප්‍රශ්නය අපි ඉදිරිපිට තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අන්තවාදය කිව්වාම ඒක දෙමළද, මුස්ලිම්ද, සිංහලද කියන එක වැදගත් නැහැ. හැම අන්තවාදයක්ම අවසාන වෙන්නේ අප රට විනාශ කරලා තමයි. අන්තවාදය අපේ රටේ ජාතික ආරක්ෂාවට තර්ජනයක්. මුස්ලිම් අන්තවාදය මේ රටේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් වාගේම තමයි, ද්‍රවිඩ අන්තවාදයත් මේ රටේ ජාතික ආරක්ෂාවට තර්ජනයක්. ඒ වාගේම තමයි දකුණේ තිබෙන අන්තවාදයත්. දකුණේ තිබෙන අන්තවාදයත් මේ රටේ ජාතික ආරක්ෂාවට තර්ජනයක්. එහෙම නම් මේ රටේ ජාතික ආරක්ෂාව වෙනුවෙන් ඒ සියලු අන්තවාද අපි පරාජය කළ යුතුයි. ඒ සියලු අන්තවාද අපි වනසා දැමිය යුතුයි. ඒ සියලු අන්තවාදීන් අපි අත්අඩංගුවට ගත යුතුයි. ඔවුන්ට විරුද්ධව අපි නීතිය ක්‍රියාත්මක කළ යුතුයි. එහෙම නැතුව එක ජනකොටසක් ඉලක්ක කරගෙන නීතිය ක්‍රියාත්මක කිරීමේදී ඒ ජනකොටස තුළ අන්තවාදීන්ගේ ක්‍රියා කලාපය වැඩි වන බව අමතක කරන්න එපා. ඒක අමතක කරන්න එපා. නීතිය දෙව්ධියකට ක්‍රියාත්මක කරන්න එපා. නීතිය දෙව්ධියකට ක්‍රියාත්මක කිරීම නිසා මේ රටේ අවුරුදු 30කට වඩා වැඩි යුද්ධයකට අපි මුහුණ දීලා සිටියා. ඒ යුද්ධයේ අද්දැකීම් අපට තිබෙනවා. ඒ යුද්ධය හරහා මේ සමාජය විනාශ වූ හැටි අපි දෑස්වලින් දැක්කා. ඒ යුද්ධය හරහා අප සියලුදෙනා ඒ ත්‍රස්තවාදයේ ගොදුරක් බවට පත් වූ හැටි අපි දැක්කා. ඒ හින්දා මේ රටේ නැවත කිසිදු අන්තවාදයකට ඉඩ දෙන්න එපා. ඒ අන්තවාදී සියලු ක්‍රියා අපේ මේ සාමකාමී සමාජයට, අපේ සංහිඳියාවට, අපේ ජාතික සමඟියට බාධාවක් කියන එක මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 1.20]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳ විවාදය පැවැත්වෙන අවස්ථාවේ ඔබතුමා මූලාසනයේ සිටින විට කතා කරන්න ලැබීම ලොකු සතුටක්.

2019 අප්‍රේල් මාසයේ 21වන දා -පාස්කු ඉරිදා- ත්‍රස්තවාදී ප්‍රහාරය එල්ල වුණාට පසු, අද වන විට මාස දෙකකුත් දින 6ක්

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

තිස්සේ හදිසි නීතිය මේ රට තුළ ක්‍රියාත්මක වෙනවා. අද තවත් මාසයකට හදිසි නීතිය දීර්ඝ කරනවා. හදිසි නීතිය මාස තුනක් ක්‍රියාත්මක වන තත්ත්වයක් තුළ මේ රටේ විපක්ෂය වන අපට රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් අහන්න සිද්ධ වෙනවා, මේ මාස 2කුත් දින 6 තුළ ඒ ත්‍රස්තවාදී ක්‍රියාවලිය සම්බන්ධයෙන් දැනට ගෙන ඇති පියවර මොනවාද කියන එක; මේ වන විට කොපමණ පිරිසක් අත් අඩංගුවේ සිටිනවාද, ඒ අයගෙන් තවත් තොරතුරු ලබා ගෙන ඉදිරියේදී කොපමණ පිරිසක් අත් අඩංගුවට පත් කර ගැනීමට නියමිතව සිටිනවා ද කියන එක.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් අපට එක් ප්‍රශ්නයක් මතු වෙනවා. සහරාන් බෝම්බය පුපුරවාගෙන මළා. ඒත් සමඟම කටුවාපිටිය පල්ලියට, කොච්චිකඩේ පල්ලියට, මඩකලපුවේ පල්ලියට ගිය බෝම්බකරුවන්ද මිය ගියා, ගරු රාජ්‍ය අමාත්‍යතුමනි. හැබැයි ඒ බෝම්බකරුවන් මිය ගියාට, ඒ බෝම්බකරුවන් තනිවම නොවෙයි ඒ බෝම්බ නිෂ්පාදනය කරගත්තේ. ඒ බෝම්බකරුවන් තනිවම නොවෙයි පල්ලිය සොයාගෙන ආවේ. ඒවා ඒ බෝම්බකරුවන් තනිවම කරගත් දෙයක් නොවෙයි කියන එක මුළු රටම දැක්කා. සහරාන් ඇතුළු ඒ මරාගෙන මැරෙන ඒ සෑම ත්‍රස්තවාදියකුගේම පිටුපස දැවැන්ත බලවේගයක් තිබෙනවා, ගරු රාජ්‍ය අමාත්‍යතුමනි. දැවැන්ත බලවේගයක්! අප අන්න ඒ බලවේගය හරියාකාරව සොයා ගත්තේ නැති වුණොත්, මීට පෙර කතා කරපු මන්ත්‍රීතුමා කියපු විධියට නොව, එතුමා අර්ථ කථනය කරපු විධියට නොව තවත් සහරාන්ලා බිහි වේවි; මේ රටේ තවත් මිනිස් ජීවිත සංඛ්‍යාවක් -සංඛ්‍යාව කුඩා වෙන්න පුළුවන්, විශාල වෙන්න පුළුවන්- බිලි ගන්නා තවත් සහරාන්ලා බිහි වේවි. ඔවුන් යම් විධියකින් ආගමික අන්තවාදයකට යාවි.

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, එල්ටීටීඊ සංවිධානය ගෙන බලන්න. එහි සාමාජිකයන්ට අණ ලැබුණේ ඔවුන්ගේ නායකයා වූ වේළුපිල්ලේ ප්‍රභාකරන්ගෙන්. එතකොට, ඔවුන් දන්නවා ඔවුන්ගේ ඉලක්කය සොයාගෙන යන්න. හැබැයි, මෙහිදී අණ ලැබෙන්නේ කොහෙන්ද? ඔහු අන්තවාදී නම්, "මේක කරන්න කියලා මට දෙවියන් වහන්සේ කිව්වා" කියලා ඔහු කිව්වොත්, ඔහුට තීන්දුව ගන්න පුළුවන්කම ඇති වේවි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා විශේෂයෙන්ම රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් අපි ඉල්ලා සිටිනවා, හදිසි නීතිය යටතේ ක්‍රියාත්මක වෙලා මේ සිදුවීම පිටුපස සිටින සියලුදෙනා අත් අඩංගුවට ගන්න කටයුතු කරන්න කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප දකින ප්‍රායෝගික ප්‍රශ්නයක් තිබෙනවා. ඒ සිද්ධිය සම්බන්ධයෙන් නොයෙක් අවස්ථාවලදී -විශේෂ කාරක සභාව තුළ සහ ඉන් පිටත- විවිධ අයගෙන් ප්‍රශ්න කළාම මතු වූ කරුණු කාරණා දිහා අපි බලාගෙන සිටියා. විශේෂ කාරක සභාව ඉදිරියට කැඳවූ අයගෙන් ඒ සිද්ධිය සම්බන්ධයෙන් ප්‍රශ්න කරන කොට, "අපි සහරාන් සමඟ ගිවිසුමකට එළඹුණා." කියලා ඔවුන් පැහැදිලිව කියනවා අපි දැක්කා. ඔවුන් මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා විශේෂ කාරක සභාව පැවැති කාමරයේදියි එහෙම කියන්නේ. දැන් අපට ප්‍රශ්නයක් තිබෙනවා, සහරාන් එක්ක ගිවිසුම්ගත වුණා නම්, ඒ ගිවිසුම මොකක්ද කියලා. ඒ ගිවිසුම මොකක්ද කියන එක සොයන්න, ගරු අමාත්‍යතුමනි. ඔබතුමා ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා හැටියට, ඒ ගිවිසුම මොකක්ද, ඒ ගිවිසුමේ තිබෙන කරුණු මොනවාද කියලා සොයා බලන්න. සහරාන් සමඟ දේශපාලනයේ හිටපු නායකයන් යම් ගිවිසුමක් ඇති කර ගත්තා නම්, අපි තවම දන්නේ "ගිවිසුම" කියන වචනය විතරයි. ඒ ගිවිසුමේ අන්තර්ගතය මොකක්ද? ඒ ගැන පාර්ලිමේන්තුවේ හදිසි නීති විවාදයේ දී හෝ අපට දැන ගැනීමේ අවශ්‍යතාවක් තිබෙනවා. ඒ අය කියනවා, අපි දේශපාලන වශයෙන් මැතිවරණය කාලයේ තමයි මේ ගිවිසුමට ආවේ කියලා. ඒ අය මැතිවරණය ජයග්‍රහණය කළා ගරු රාජ්‍ය ඇමතිතුමනි. ඒ අය මැති ඇමතිවරු වුණා. එහෙම නම්, ගිවිසුම් ප්‍රකාරව සහරාන් පෝෂණය කරන්න අවශ්‍ය සම්පත් ලබා දීලා තිබෙනවාද නැද්ද කියන ප්‍රශ්නය තිබෙනවා. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, එහෙම නම් ඔබතුමාට මේ හදිසි නීතියෙන් බලවත් වෙනවා, මරා ගෙන මැරෙන කෙනා එක්ක ගිවිසුමක් ඇති කරගත් කෙනා අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කරන්න. මේ හදිසි නීතිය යටතේ එය කරන්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
හදිසි නීතිය යටතේ ප්‍රශ්න කරන්න පුළුවන්. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ආරක්ෂක රාජ්‍ය ඇමතිවරයා වශයෙන් ඒ සම්බන්ධව කටයුතු කරන්න කියලා.

ඊයේ අතිගරු ජනාධිපතිතුමා මේ රටේ සියලු මාධ්‍ය ආයතනවල මාධ්‍යවේදීන් කැඳවා ප්‍රකාශයක් කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම ප්‍රකාශයට අනුව දැන් රටට අවශ්‍ය හදිසි නීතිය නොවෙයි, ඇඳිරි නීතිය කියලා මට හිතෙනවා. ඊයේ ජනාධිපතිතුමා කළ ප්‍රකාශයත් එක්ක බලද්දී මේ වෙලාවේ රටට අවශ්‍ය වෙන්නේ හදිසි නීතිය නොවෙයි, ඇඳිරිනීතිය. ඇඳිරිනීතිය ඕනෑ වෙන්නේ ඇයි? ජනාධිපතිතුමා කියනවා, "මට හැට දෙලක්ෂයක ජනතාව වාහනයක් ලබා දුන්නා. මම ඒක එළවා ගෙන යනවා. එතකොට ඒ එළවා ගෙන යන වාහනයේ ඉස්සරහ සීට් එකේ වාඩි වෙලා සුක්කානම පැත්තකට අදිනවා, ගියර් එක දානවා, එහෙට මෙහෙට කපනවා" කියලා. එතකොට මොකද වෙන්නේ? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාත් වාහන එළවලා තිබෙනවා; පළපුරුද්ද තිබෙනවා. ඔබතුමා එළවන වාහනයේ සුක්කානම කවුරු හරි එහෙට මෙහෙට කැපුවොත් මොකද වෙන්නේ? අනිවාර්යෙන්ම ඒ වාහනය හැප්පෙනවා. වෙන කෙනෙක් ගියර් මාරු කළොත් ඒ වාහනය එහේ මෙහේ යනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එහෙම නම් මම කිව්වා වාගේ ඇඳිරිනීතිය ඕනෑ වෙන්නේ ඇයි? ඇඳිරිනීතිය තිබෙන වෙලාවට විතරයි දෙන්නෙකුට එක වාහනය එළවන්න පුළුවන් වන්නේ. මොකද, එතකොට පාරේ වෙනත් වාහන නැති නිසා. පාරේ වාහන නැතිවෙන තත්ත්වයක් ඇති කරගෙන තිබෙන්නේ කවුද? ඒ රටේ ජනාධිපති සහ අගමැති. රටේ ජනාධිපතිතුමා එහෙම කියනවා නම්, අද අපි මේ සම්මත කරන හදිසි නීතිය යටතේ රටේ ආරක්ෂාව ගැන වගකීමක් තිබෙන්නේ කොහොමද? ජනාධිපතිතුමා එළවන වාහනයේ steering wheel එක අගමැතිතුමා අදිනවා නම්, ජනාධිපතිතුමා පළමුවෙනි ගියර් එකට දානකොට අගමැතිවරයා reverse එකට ගියර් දානවා නම් යන්න පුළුවන් වෙයිද ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි? ඔබතුමාත් ඔළුව වනලා කියන්නේ "බැහැ" කියලා තමයි. ඒ නිසා අපි එකක් කියනවා. මේ රටේ රාජ්‍ය ආරක්ෂාව බිංදුවට දාපු ආණ්ඩුවක් තමයි මේ ආණ්ඩුව. මේක රාජ්‍ය ආරක්ෂාව සම්පූර්ණයෙන්ම විනාශ කරපු ආණ්ඩුවක්. මේ ආණ්ඩුවට ලජ්ජා නහරෙයි, හිරිකිත නහරෙයි තිබෙනවා නම් ඉල්ලා අස් වෙන්න ඕනෑ. ඒ තත්ත්වයට අද මේ ආණ්ඩුව පරිවර්තනය වෙලා තිබෙනවා. මේ හදිසි නීතිය යොදාගෙන දේශපාලන දඩයම් කරන්න ලෑස්ති වෙන්න එපා

කියලා අපි ආණ්ඩුවට කියනවා. ඒක කළ යුතු නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අපි දැක්කා, හදිසි නීතිය පාවිච්චි වූ විධිය. එදා නාගොඩ ඉස්පිරිතාලයට බලහත්කාරයෙන් ඇතුළු වෙලා වෛද්‍යවරුන්ට හිරිහැර කළා. ප්‍රජාතන්ත්‍රවාදය රජ කරවන්න නම් කරුණාකරලා නිවැරදි දේ කරන්න කියලා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 1.29]

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පැවැත්වෙන්නේ මහජන ආරක්ෂක පනතේ විධි විධාන යටතේ, ජනාධිපතිතුමා විසින් 2019 ජුනි 22වෙනි දා සිට ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් පනවන ලද හදිසි නීතිය දීර්ඝ කිරීමට අදාළ විවාදයයි. සාමාන්‍යයෙන් පසුගිය මාසයේ හදිසි නීතිය පැවැති කාලය තුළ ජාතික ආරක්ෂාවට අදාළව සිදු වූ ඒ සියලු සිද්ධි සම්බන්ධ සංඛ්‍යාලේඛන, දත්ත මේ සභාවට ඉදිරිපත් කරලා තමයි හදිසි නීතිය දීර්ඝ කිරීමේ විවාදය පටන් ගන්නේ. හැබැයි, අද එහෙම එකක් වුණේ නැහැ. පසුගිය මාසයේ එහෙම වුණේත් නැහැ. අප්‍රේල් 21වෙනි පාස්කු ඉරිදා මේ රටේ ඇති වූ ත්‍රස්ත ප්‍රහාරයේ තිබෙන භයංකාරකම හා ජාතික ආරක්ෂාවට තිබුණු තර්ජනය හේතුවෙන් හදිසි නීතිය ක්‍රියාත්මක කළ යුතුයි කියන මතයේ ඉඳගෙන තමයි අපි විපක්ෂයේ මන්ත්‍රීවරුන් හැටියට හදිසි නීතිය දීර්ඝ කිරීමට පක්ෂව ඡන්දය දෙන්නේ. අපට ඒ වගකීම තිබිය යුතුයි. හැබැයි, ආණ්ඩුවේ වගකීමක් තිබෙනවා, මේ විවාදය ආරම්භ කරන්න කලින් කිව යුතු දේවල් කියන්න. පසුගිය මාසය තුළ කී දෙනෙක් අත්අඩංගුවට ගත්තාද, කී දෙනෙකුට රැඳවුම් නියෝග ගත්තාද, කී දෙනෙක් අධිකරණයට ඉදිරිපත් කළාද, කී දෙනෙකුට නඩු පැවරුවාද, කී දෙනෙක් නිදහස් කළාද කියන තොරතුරු අපට දීලා තමයි මේ විවාදය පටන් ගන්න ඕනෑ. ගිය මාසයේ එහෙම කිව්වේත් නැහැ, අද කිව්වේත් නැහැ. මම ඒ ගැන කනගාටු වෙනවා.

ජනාධිපතිතුමා විසින් මේ නියෝගය නිකුත් කරනවා. නමුත් හදිසි නීතිය දීර්ඝ කරන්න ආණ්ඩු පක්ෂයට ඕනෑකමක් තිබෙනවාද කියලා මම දන්නේ නැහැ. මේ අවස්ථාවේ ආණ්ඩු පක්ෂයේ ගරු රුවන් විජේවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා මේ ගරු සභාවේ ඉන්නවා, තව මන්ත්‍රීවරුන් දෙදෙනෙක් ඉන්නවා, එච්චරයි. ඉදිරිපෙළ අසුන්වල කවුරුත් නැහැ.

අමාත්‍ය මණ්ඩලයම නැහැ. රටේ ජාතික ආරක්ෂාව තබලා තිබෙන තැන පිළිබඳව රටේ ජනතාවට තීන්දු කරන්න හොඳම වේලාව තමයි මේ විවාදය. අද මේ විවාදය රටේ ජනතාව සජීවී ලෙස නරඹනවා. සවස ප්‍රවෘත්ති විකාශයේදී "හිරු" වැනි රූපවාහිනී නාලිකා මේක ඉතාම හොඳින් පෙන්වයි. එතකොට පෙනෙනවා, ආණ්ඩු පක්ෂයේ ඉදිරි පේළි දෙක තුනම හිස් බව. මෙන්න මේ තත්ත්වයට තමයි රජය අද ජාතික ආරක්ෂාව ගෙනැවිත් තිබෙන්නේ. අපේ ආණ්ඩුව පැවැති කාලයේ යුද්ධය තිබෙනකොට, මාසයක් ගණනේ හදිසි නීතිය දීර්ඝ කරද්දී සියලු සංඛ්‍යාලේඛන, වාර්තා අපි ඉදිරිපත් කළා. ඒ අවස්ථාවේ අපි සභාවේ රැඳී සිටිමින්, විපක්ෂය අහන ප්‍රශ්නවලට උත්තර දුන්නා. ඒ විධියටයි අපි කටයුතු කළේ. නමුත් මෙන්න, අද ජාතික ආරක්ෂාවට දීලා තිබෙන තැන! දැන් සමහර අය උත්සාහ කරනවා, මේ මන්ත්‍රීවරුන් 225ටම වගකීම පවරන්න. ඒක එක්තරා විධියක කුමන්ත්‍රණයක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 42(1), 42(2) අනුව්‍යවස්ථා මං තමුන්නාන්සේලාට පෙන්වා දෙන්නම්. මම මේ කියවන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIII වැනි පරිච්ඡේදයෙන්. එහි අග්‍රාමාත්‍යවරයා සහ අමාත්‍ය මණ්ඩලය යටතේ, 42(1) හා 42(2) අනුව්‍යවස්ථාවල මෙසේ සඳහන් වෙනවා;

> "42.(1) ජනරජයේ ආණ්ඩුවේ පාලනය මෙහෙයවීම සහ ඒ පාලනය පිළිබඳ විධානය භාර අමාත්‍ය මණ්ඩලයක් වන්නේ ය.
>
> (2) අමාත්‍ය මණ්ඩලය පාර්ලිමේන්තුවට සාමූහිකව වගකීමට සහ පිළිතුරු බැඳීමට බැඳී සිටින්නේ ය."

දැන් කෝ, ඒ වගකීම? මේ ගරු සභාවේ එක කැබිනට් අමාත්‍යවරයෙක්වත් නැහැ. කැබිනට් නොවන අමාත්‍යවරු ඒ වගකීමට අයිති නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන එක තමයි මම කියන්නේ. එහෙම නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 42(1) ව්‍යවස්ථාව පවා අද මේ ඇමති මණ්ඩලය මේ ගරු සභාව තුළදීම උල්ලංඝනය කරලා තිබෙනවා. කෝ රටේ පාලනය? කෝ මෙහෙයවීම? කෝ වගවීම? මේ කිසි දෙයක් නැහැ. වගකීම් රහිත ආණ්ඩුවක් පවත්වා ගෙන යනවාට වඩා හොඳයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ

70 (1) proviso එක යටතේ යෝජනාවක් ගෙනෙන එක. අපි සූදානම් ඒකට ඡන්දය දීලා මේක විසුරුවා දමන්න.

මේ ගැන කියන්න තව හේතු තිබෙනවා නේ. ජනාධිපතිතුමා මොකද කියන්නේ? ජනාධිපතිතුමා ඊයේ මාධ්‍යවේදීන් අමතා කියපු දේ දැන් මෙතැනදී සාකච්ඡා වුණා. ඊට කලින් අගමැතිතුමා කිව්වා, "වාහනයේ රියැදුරන් දෙදෙනෙක් හිටියාම හරියට පදවන්න බැහැ" කියලා. දෙදෙනාම පදවන්න යනවා ලු. ජනාධිපතිතුමා කියපු දේ මාධ්‍ය තුළින් රටම දැක්කා. ජනාධිපතිවරණයේ දී, ජනාධිපතිතුමාට තමයි ලයිසන් එක ලැබිලා තිබෙන්නේ. එතුමා කිව්වා, "පාර්ලිමේන්තුවෙන් ලයිසන් එක ගත්ත හාදයෙක්" කියලා. එහෙමයි එතුමා කිව්වේ. "පාර්ලිමේන්තුවෙන් ලයිසන් එක ගත්ත හාදයෙක් driving seat එක ළඟ වාඩි වෙලා ගියර් මාරු කරනවා; steering wheel එකටත් අත තියනවා" කියලා එතුමා කිව්වා. මේක තමයි ප්‍රශ්නය. මේ ප්‍රශ්නය විසඳා ගන්න ගියාම, මානව හිමිකම් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. ජනතාවට ඒ අවස්ථාව දුන්නේ නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තීන්දුවක් දුන්නා. දැන් ඒ ප්‍රතිඵල පෙනෙනවා නේද? පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් 250කට අධික ජීවිත සංඛ්‍යාවක් බිලිගත්තා, 500දෙනෙක් පමණ තුවාල වුණා. රටේ ආර්ථිකය වැටෙන්න ඇරලා, සමාජය අතර වෛරී අදහස් ප්‍රකාශ වෙලා, ජනවර්ග අතර නොසන්සුන්තාවක් ඇති වූ ඒ සිද්ධිය ගැන නොවෙයි අද කථා කරන්නේ. අද ඒ සිද්ධියේ ප්‍රතිඵල ලෙස වෙනත් කරුණු කථා කරනවා. අද ජනතාවට ජීවත් වෙන්න බැහැ. මුදල් සංසරණය අඩු වෙලා. බැංකුවල ණය ගෙවා ගන්න බැහැ. ලීසිං එකේ වාරිකය ගෙවා ගන්න බැහැ. අද ජනතාවට ජීවත් වෙන්න පුළුවන් වාතාවරණයක් නැහැ. එහෙන් වැඩ වර්ජන. එහෙන් තර්ජනය කිරීම්. ආණ්ඩුවේ ඇමතිවරුන්ගේ හැසිරීම බලන්න. සදාකාලික බලයක් දුන්නාය කියලා මේ අය හිතනවා. තව මාස හතරක් යනකොට ආරම්භ කරන වැඩ පිළිවෙළින් දෙසැම්බර් මාසයේ නවවැනි දින වන විට මේ පාලනය වෙනස් කිරීමට මේ රටේ ජනතාව පුල පුලා බලා ඉන්නවාය කියන එක මතක තියාගෙන කටයුතු කරන්න කියලා අපි මේ ආණ්ඩුවේ අයට කියනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම අනුව කථානායකතුමා පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවක් පත් කළා, මේ සිද්ධිය ගැන හොයන්න. දැන් ඒකට දෙන අර්ථ නිරූපණය මොකක්ද? මේක නාට්‍යයක්. පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාව නාට්‍ය රඟදැක්වීමක් වෙලා. නාට්‍ය රඟදක්වන්න කලින් පෙර පුහුණුවීම් කරනවා. ඒ කොහේද? අරලියගහ මන්දිරයේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

මම ඉතිරි ටික විනාඩි දෙකෙන් කියන්නම්. මේ නාට්‍යයේ නිෂ්පාදකයා කවුද, අධ්‍යක්ෂ කවුද? නළු, නිළියෝ ටික නම් ඉන්න බව පෙනෙනවා. නිළියෝ නම් නැහැ. නළුවෝ විතරක් ඉන්නවා. දැන් අපට එහෙම තේ හිතන්න වෙලා තිබෙන්නේ. රටේ ජනාධිපතිතුමාම කියනවා, මේ විශේෂ කාරක සභාව නාට්‍ය රඟදැක්වීමක් කියලා. අපි අහන්නේ මෙහි නිෂ්පාදක කවුද, අධ්‍යක්ෂණය කරන්නේ කවුද කියලායි. හැබැයි, පෙර පුහුණුවීම් වෙන්නේ නම් අරලියගහ මන්දිරයේ බව කියනවා. ඒකට පිළිතුරු දෙන්නවත් මේ සභාවේ වගකිව යුතු අය, ඇමතිවරු නැහැ. පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාව විතරක් නොවෙයි, දැන් මුළු රටම නාට්‍යයක් බවට පත් කරලා. මෙයින් පැහැදිලි වන්නේ, මේ ආණ්ඩුව තමන්ගේ වගකීම් පැහැර හැර ඇති බවයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හදිසි නීතිය දෙවිධියකට ක්‍රියාත්මක වෙනවාය කියලා මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කියනවා. එතුමා ඒක අපට කියන්නේ ඇයි? හදිසි නීතිය ක්‍රියාත්මක කරන්නේ කවුද? ආරක්ෂක අංශ, පොලීසිය ඇතුළු නීතිය ක්‍රියාත්මක කරන ආයතන තමයි හදිසි නීතිය ක්‍රියාත්මක කරන්නේ. ඒවායේ පාලනයක් විපක්ෂයේ අපට තිබෙනවාද? ඒ බලය තිබෙන්නේ ආණ්ඩුවටයි; කැබිනට් මණ්ඩලයටයි; විෂයය භාර ඇමතිවරයාටයි. ඉතින් එතුමා ඒ කාරණය අදාළ අයට නොකියා මේ සභාවට ඇවිත් කිව්වාට වැඩක් නැහැ. එතුමාට ඒක කියන්න තිබුණේ එතුමන්ලාගේ කණ්ඩායම් රැස්වීමේදියි. පාර්ලිමේන්තුවේදී ඒක අපට කියලා වැඩක් නැහැ. අපට ඒකට විසඳුමක් දෙන්න බැහැ.

වෙනත් විවිධ මාතෘකා ඉදිරියට ගෙනැල්ලා, පාස්කු ඉරිදා සිදු වූ ඒ ප්‍රහාරයට සම්බන්ධ කාරණා යටපත් කරන්නයි තමුන්නාන්සේලා මේ උත්සාහ කරන්නේ. අද ජනතාවගේ ඡන්ද අයිතිය නැති කර තිබෙනවා. ජනතාවට ඕනෑ කරන ආණ්ඩුවක් පත් කර ගන්නට අවස්ථාවක් දෙන්නේ නැහැ. ජනතා නියෝජිතයන් නියම විධියට පත් කර ගන්නට ඉඩනොදී, විකෘති ආණ්ඩුවක් පවත්වාගෙන යමින් කරන මේ විගඩම නවත්වන්නය කියන එකයි අපි කියන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජාතික ආරක්ෂාව වෙනුවෙන්, හදිසි නීතිය දීර්ඝ කර ගැනීමට අපේ සහයෝගය ලබාදෙනවා. හැබැයි, ඒ සහයෝගය දෙන්නේ ජනතාව තළා පෙළන්නට නොවෙයි, නියම ත්‍රස්තවාදීන් අත්අඩංගුවට අරගෙන නීතිය ක්‍රියාත්මක කරන්නයි.

නීතිය ක්‍රියාත්මක කරන මේ ආයතන මඟින් නියම සැකකරුවන් අත්අඩංගුවට ගන්නවාද, මොකක්ද කරන්නේ කියන එක ගැන අද ජනතාව තුළ ප්‍රබල අවිශ්වාසයක් ඇතිවෙලා තිබෙනවා. [බාධා කිරීමක්] පාස්කු ඉරිදා සිදු වූප්‍රහාරය පිටුපස තිබුණු සියලු දේ හෙළි වුණේ නැහැ කියන මතය ජනතාව තුළ තිබෙනවා. එම නිසා, අඩුම තරමින් ඊළඟ මාසයේදී හදිසි නීතිය දීර්ඝ කර ගැනීමේ යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන දිනයේදීවත් ඒ සියලු තොරතුරු පාර්ලිමේන්තුව හමුවේ තබලා, ජනතාවට ඒ තොරතුරු ලබා දෙන්නය කියන ඉල්ලීම කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

[பி.ப. 1.38]

**ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා**
(மாண்புமிகு முஹம்மது இப்ராஹிம் முஹம்மது மன்சூர்)
(The Hon. Muhammad Ibrahim Muhammad Mansoor)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, அவசரகாலச் சட்டத்தை மீண்டும் ஒரு மாத காலத்துக்கு நீடிக்கின்ற பிரேரணை தொடர்பான விவாதத்திலே எனக்கும் பேசுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்காக உங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். உண்மையிலேயே எனக்கு முன்னர் பேசிய சிரேஷ்ட பாராளுமன்ற உறுப்பினர் கௌரவ சுசில் பிரேமஜயந்த அவர்கள் கூறியதுபோன்று, இற்றைவரைக்கும் இந்த அவசரகாலச் சட்டத்தைப் பாவித்து சாதித்தவை என்ன? என்று கேட்கின்றேன். இன்று மீண்டும் எதைச் சாதிப்பதற்காக இந்த அவசரகாலச் சட்டத்தினுடைய நீடிப்பு வேண்டப்பட்டிருக்கின்றது? இதனைக் கருத்தில் கொண்டே இந்தப் பிரேரணை கொண்டுவரப்பட்டிருக்க வேண்டும். அதுதான் வழக்கமும் நியாயமும்கூட. இந்த அவசரகாலச் சட்டத்தை நிறைவேற்றுவதற்குக் கையுயர்த்திய வர்களில் நாங்களும் அடங்கியிருக்கின்றோம். கடந்த ஏப்ரல் மாதம் 21ஆம் திகதி இந்த நாட்டிலே இடம்பெற்ற மிலேச்சத் தனமான பயங்கரவாதத் தாக்குதலுடன் தொடர்புடைய குற்றவாளிகளைக் கைதுசெய்வதற்கும் அவ்வாறான பிரச்சினைகள் இன்னுமின்னும் இடம்பெறாமல் இருப்பதை உறுதிசெய்வதற்குமே இந்த அவசரகாலச் சட்டத்தின் தேவை உணரப்பட்டது. அதற்காகவே நாம் ஆதரவு வழங்கியிருந்தோம்; அது நிறைவேற்றப்பட்டிருந்தது. ஆனால், அந்தச் சட்டம் மிக மோசமாக, பிழையாகப் பாவிக்கப்பட்ட நிலைமையைப் ஒரு பாரதூரமான விடயமாகவே நாம் பார்க்கின்றோம். வெறுமனே சாதாரண காரணங்களுக்காகக் கைதுசெய்யப்பட்ட அப்பாவிகள்கூட இந்த அவசரகாலச் சட்டத்தைப் பாவித்து அல்லது பயங்கரவாதத் தடுப்புச் சட்டத்தைப் பாவித்து மிக மோசமாகத் தண்டிக்கப் பட்டிருக்கிறார்கள்; தண்டிக்கப்பட்டுக் கொண்டிருக்கிறார்கள். இதனை நாங்கள் ஒரு பாரதுரமான, கவலையான விடயமாகப் பார்க்கிறோம். ஆனால், உண்மையாக இந்தப் பயங்கர வாதத்தோடு சம்பந்தப்பட்டவர்கள் ஒன்றில் மரணித்திருக் கிறார்கள் அல்லது தற்கொலை செய்திருக்கிறார்கள் அல்லது கொல்லப்பட்டிருக்கிறார்கள். ஏனைய அனைவரும் கைது செய்யப்பட்டிருக்கிறார்கள் என்றுதான் இராணுவப் புலனாய்வு அறிக்கை சொல்கிறது. அவ்வாறு இருக்கத்தக்கதாக இந்த அவசரகாலச் சட்டத்தினுடைய நீடிப்பு எதற்காக? என்ற கேள்வியை நான் கேட்க விரும்புகின்றேன்.

தற்போது நாட்டிலே குறிப்பாக அம்பாறை மாவட்டத்தின் கல்முனைப் பிரதேசத்திலே உண்ணாவிரதம் மேற்கொள்ளப் படுவதும், சம்பந்தப்பட்ட மக்கள் ஒன்றுகூடி சில பிரச்சினைகளை உருவாக்குவதற்குரிய ஆயத்தங்களைச் செய்வதுமாக இருக்கின்றபோதிலும் இந்த அவசரகாலச் சட்டத்தின்மூலம் அதனைக் கட்டுப்படுத்த முடியவில்லை. அப்படியானால் எதற்காக இந்த அவசரகாலச்சட்டம் இருக்கின்றது என்று நான் இந்தப் பாராளுமன்றத்தில் கேள்வி எழுப்புகின்றேன். ஆகவே, இந்த அவசரகாலச் சட்டத்தை அமுல்படுத்தி, இந்த நாட்டினுடைய சட்டவிதிகளுக்கு இணங்க இந்த நாட்டை முன்னெடுத்துக் செல்லமுடியாத ஒரு நிலைப்பாடு இன்று ஏற்பட்டுள்ளது. இன்று இந்த அவசரகாலச் சட்டத்தை மதிக்காமல் கல்முனையில், மட்டக்களப்பில் மற்றும் இலங்கையின் வெவ்வேறு பாகங்களில் உண்ணாவிரதம் மேற்கொள்ளப்படுகின்ற நிலையில், இந்த அவசரகாலச் சட்டத்தை எதற்காகக் கொண்டுவருகின்றீர்கள் என்ற கேள்வியை இந்த நாட்டினுடைய ஜனாதிபதியவர்களிடமும் பிரதமர் அவர்களிடமும் மற்றும் சகல பாராளுமன்ற உறுப்பினர்களிடமும் இந்த இடத்திலே நான் கேட்கின்றேன்.

இன்று அம்பாறை மாவட்டத்திலே, கல்முனைப் பிராந்தியத்திலே அட்டாளைச்சேனை, பாலமுனை, அக்கரைப்பற்று, கல்முனை, சாய்ந்தமருது போன்ற பிரதேசங் களிலே குற்றம் செய்யாத அப்பாவி மக்களை, மாணவச் செல்வங்களை, வீதிகளிலே நிற்கின்றவர்களை இராணுவத்தி லிருக்கின்ற ஒரு சிலர் அடிக்கின்ற, அச்சுறுத்துகின்ற செயற்பாடுகள் இடம்பெறுகின்றன. இவ்வாறான செயற்பாடு களை வன்மையாகக் கண்டிக்கின்றேன். சம்பந்தப்பட்டவர்கள் எந்தவொரு தவறும் செய்யாதவர்களாக இருக்கின்றபோதிலும் இராணுவத்தினரில் ஒரு சிலர் இவ்வாறு நடந்து கொள்கின்றனர். இது பற்றிப் பேசுவதற்கு முடியாத ஒரு நிலையில், அங்குள்ள இராணுவ முகாம் பொறுப்பதிகாரியிடம் இது தொடர்பில் நாங்கள் எடுத்துரைத்திருந்தபோதிலும், கடந்த 2 - 3 நாட்களுக்கு முன்பும் அவ்வாறான செயல்களில் இடம்பெற்றிருக்கின்றன. இது சம்பந்தமாக அக்கரைப்பற்றுப் பொலிஸ் நிலையத்திலே முறைப்பாடு செய்யப்பட்டும் அதற்கு எந்தவொரு நடவடிக்கையும் எடுக்கப்படாத நிலையில், இதையறிந்த ஒரு சில இராணுவத்தினர் இரவிலே அங்குள்ள வீதிகளுக்கு வந்து இளைஞர்களுக்கு அடித்துள்ள சம்பவம் நடந்தேறியிருக்கின்றது. அவசரகாலச் சட்டத்தை நீடிப்புச் செய்து, இராணுவத்தினருக்கு குறித்த அதிகாரங்களைக் கொடுக்கின்றபோதிலும், எந்தவோர் அநியாயமும் செய்யாதவர்களுடனும் இராணுவத்தினர் இவ்வாறு நடந்து கொள்வதை மிகவும் கவலைக்குரிய விடயமாகவே நான் பார்க்கின்றேன். இந்தப் பாராளுமன்றத்தில் கடந்த காலங்களில் அவசரகாலச் சட்டம் நிறைவேற்றப்பட்டபோது, அது நல்லபடியாக நடைமுறைப்படுத்தப்பட்டது.

இன்று சஹ்ரான் என்கின்ற முஸ்லிம் நபர் பயங்கரவாதச் செயற்பாட்டில் ஈடுபட்டபோதிலும், அப்பாவி முஸ்லிம் மக்கள் துன்புறுத்தப்பட்டு அவர்களுக்கெதிராகச் சட்ட நடவடிக்கைகள் எடுக்கப்பட்டு வருகின்றன. அதாவது, குற்றம் செய்யாதவர்களைக்கூடக் கைது செய்து தடுப்புக் காவலிலே - remand இலே காலஎல்லை இல்லாது தடுத்து வைத்திருக் கின்றார்கள். இதனைப் பார்க்கின்றபோது, இந்த அரசாங்கத்துக்கு நாங்கள் பக்கபலமாக இருந்தும், இதைத் தட்டிக் கேட்பதற்கு யாருமில்லையா? என்றொரு கேள்வி எங்கள் மக்கள் மத்தியிலே எழுகின்றது. இவ்வாறான செயல்கள் உடனடியாக நிறுத்தப்படுவதற்குச் செயற்படுமாறு குறித்த இராணுவ முகாம் அதிகாரிகள் பணிக்கப்படுவதற்கு இந்தப் பாராளுமன்றம் - இந்த உயர் சபை மிகவும் விரைவாக நடவடிக்கை எடுக்க வேண்டும் என்ற வேண்டுகோளை இந்த இடத்திலே மிகவும் பணிவோடு முன்வைக்கின்றேன். இன்று எதிர்க்கட்சியிலேயிருக்கின்ற கௌரவ உறுப்பினர்கள் பேசுகின்ற சில விடயங்கள் நியாயமாகத்தான் இருக்கின்றன. இருந்தபோதிலும் இராணுவத்திலிருக்கின்ற ஒரு சிலர் செய்கின்ற அநியாயங்கள் எங்களுடைய மனதை உள்ளங்களை நோகடித்திருக்கின்றது என்பதைக் கூறிக் கொண்டு, சந்தர்ப்பம் வழங்கியமைக்கு மீண்டும் நன்றி கூறி, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊළඟට ගරු ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක් තිබෙනවා.

[අ.භා.2.36]

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ ආරක්ෂාවට ඉතාම වැදගත් වන හදිසි නීතිය දීර්ඝ කිරීම සම්බන්ධයෙන් අද අප පවත්වන මේ විවාදයේදී ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ හැසිරීම දිහා බැලුවාම මට හිතෙනවා, වෙන දෙයක් වෙන්න ඇරලා පාඩුවේ ඉන්න තමයි ආණ්ඩු පක්ෂය උත්සාහ කරන්නේ කියලා. අද මේ වැදගත් සභාවේ ගණපූරණය රකින්නේ අපියි. මීට මොහොතකට පෙර, ගරු නිමල් ලාන්සා මන්ත්‍රීතුමා කථා කරන අවස්ථාවේදී ගණපූරණය නැති වූ විට දිනේෂ් ගුණවර්ධන මැතිතුමා අප සියලුදෙනාට පෞද්ගලිකව කථා කරලා මේ සභාවේ ගණපූරණය රැකීම සඳහා කටයුතු කළ යුතු බව දැනුම් දෙනවා මම දැක්කා. අපි ජනතාවගේ බදු මුදල්වලින් යැපෙන අය. අපි වරප්‍රසාද ලබනවා. ඒ වාගේම, බෙහෙත් ටික ඇතුළු සියලු පහසුකම් පාර්ලිමේන්තුවෙන් සපයා තිබෙනවා. ඒ හැම දෙයක්ම කර තිබියදීත් මන්ත්‍රීවරුන්ට පාර්ලිමේන්තුවට එන්න බැහැ. මේ

අවස්ථාවේදීත් ආණ්ඩු පක්ෂය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවේ ඉන්නේ මන්ත්‍රීවරු තුන්දෙනෙක් පමණයි. මෙය ඉතාම කනගාටුදායක තත්ත්වයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුවට තවත් ඉදිරියට යන්න බැහැ. මේ ආණ්ඩුව දැන් ජනතාවගේ දැඩි අප්‍රසාදයට පත්වෙලා අවසානයි. කන්න විධියක් නැති නිසා ළමයි පාසල් යවන්නේ නැති ගෙවල් අද මේ රටේ තිබෙනවා. පාසලට ගියාම ළමයි කලන්තය දමලා ඇද වැටෙනවා. ළමයි ජීවත් වන්නේ ඉතාම අමාරු තත්ත්වයකින්. හැබැයි, මේ ඉන්න මන්ත්‍රීවරුන්ට අබ මල් රේණුවක තරමින්වත් ඒ ගැන හැඟීමක් නැහැ. මොකද, එතුමන්ලාට අවශ්‍ය පරිසරය ගොඩ නැඟී තිබෙන නිසා. තමුන්ට තවත් මොනවා හෝ කර ගන්න පුළුවන් නම්, ඒ දෙය කර ගන්න බලනවා මිසක්, ජනතාව ගැන හිතන්නේ නැහැ. මට කලින් කථා කළ නිමල් ලාන්සා මන්ත්‍රීතුමා කිව්වා වාගේ, රටට හෙණ ගෙඩි පාත් වෙලා තිබෙන අවස්ථාවකට, රටේ ආර්ථිකය කඩා වැටී, කෘෂිකර්ම ක්ෂේත්‍රය කඩා වැටී, කෘෂි බෝග මිලට ගන්නේ නැති අවස්ථාවකට රට පත්වෙලා තියෙද්දී විවිධ බොරු -ප්‍රෝඩා- කරමින් ඉදිරියට යන්න මේ ආණ්ඩුව උත්සාහ දරනවා.

එදා මම දැක්කා, දයා ගමගේ ඇමතිතුමාට සෙවනගල ෆැක්ට්‍රිය දෙන ඒ විවාදය මුළු දවස පුරාම පැවැත්වුණ හැටි. අද මේ රට ගිනි ජාලාවක් බවට පත්වෙලායි තිබෙන්නේ. එහෙන් කතෝලික ජනතාව මැරිලා. මෙහෙන් තවත් පිරිසක් ආරෝග්‍යශාලාවල දුක් විඳිනවා. අනෙක් අය බොහෝ ආර්ථික අපහසුතා මධ්‍යයේ ජීවත් වනවා. මෙවැනි අවස්ථාවක, විශේෂයෙන්ම මේ රටේ ආරක්ෂාවට ඉතාම වැදගත් වන මේ විවාදයේදී ගණපූරණය රැකගෙන ඉන්නවත් ආණ්ඩු පක්ෂයට වුවමනාවක් නැහැ. මේක තමයි අද රටේ ඇති වෙලා තිබෙන ඇත්තම තත්ත්වය, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ජනතාව කියන්නේ මැතිවරණයක් පවත්වන්න කියලායි. පළාත් සභා මැතිවරණය හෙට වුණත් පවත්වන්න පුළුවන්. හැබැයි, ඒ මැතිවරණය පවත්වන්නේ නැහැ. මොකද, එක්සත් ජාතික පක්ෂය -ආණ්ඩු පක්ෂය- දන්නවා, එය කෙළවර වෙන්නේ කොතැනින්ද කියලා. ජනාධිපතිතුමා එක දෙයක් කියනවා. අගමැතිතුමා තව දෙයක් කියනවා. මේක අද ඊයේ ඇති වූ තත්ත්වයක් නොවෙයි. මේ ආණ්ඩුව පත් වූ දවසේ සිට මේ දෙදෙනා 'ගොනායි, මී හරකායි වාගේ' දෙපැත්තටයි ගියේ. මේකයි ඇත්ත කථාව. දෙන්නා එකට වාඩි වෙලා, මේ රටේ ජනතාවගේ ප්‍රශ්න ගැන කථා කළ අවස්ථාවක් අපි දැක නැහැ. එම නිසා අපට තේරුණා, ඔය ගිලෙන නැවේ ඉන්නවාට වඩා හොඳයි විපක්ෂය පැත්තට ගිහින් මොන වේදනාව හෝ විඳින එක හොඳයි කියලා. අපි විපක්ෂයට එකතු වුණේ ඒ නිසායි. ඒකයි, ඇත්ත කථාව. ආණ්ඩු පක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු දන්නවා, ඊළඟ මැතිවරණයේදී ඒ අයට ජයග්‍රහණය කරන්න බැරි බව. එතුමන්ලාට එක්කෝ ගෙදර යන්න වෙනවා. නැත්නම් nominations හෝ වෙන දෙයක් නැති වෙයි කියලා එතුමන්ලා දන්නවා. ඒවා ලබා ගැනීමේ පරමාර්ථය ඇතිව මිසක්, ජනතාව ගැන හිතා ඒ කිසිම මන්ත්‍රීවරයකු කටයුතු කර නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අද අසනීප තත්ත්වයෙන් ඉන්නේ. හරි විධියට නම් මම අද ඉන්න ඕනෑ ආරෝග්‍යශාලාවෙයි. හැබැයි, ජනතාව වෙනුවෙන් අපි ඒ දේවල් පැත්තකට දමලා, අද පාර්ලිමේන්තුවට ඇවිල්ලා වචනයක් හෝ කථා කරලා මේ යෝජනාවට සහයෝගය දැක්වීමේ වුවමනාවෙන් කටයුතු කරනවා. හැබැයි, සමහර පනත් ගෙනා අවස්ථාවලදී ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු ලෙඩ නැතිවත් ආරෝග්‍යශාලාවලට ගිහින් නතර වුණා. ඒක අපි මීට පෙරත් දැක්කා. ඉදිරියේදීත් එවැනි දේවල් ඊට වඩා සිද්ධ වෙයි. මොකක් හෝ වැදගත් පනතක් ගෙනා අවස්ථාවලදී එහෙම වුණා. මොකද, මේ ආණ්ඩුව එක්සත් ජාතික පක්ෂයටම එපා වෙලායි තිබෙන්නේ. හැබැයි, හෘදය සාක්ෂියට එකඟව වැඩ කරන මන්ත්‍රීවරු පිරිසකුත් ඉන්නවා. කවින්ද ජයවර්ධන කියන්නේ තරුණ මන්ත්‍රීවරයෙක්. එතුමාට ඍජු අදහස් තිබෙනවා. එතුමා කෙළින් කටයුතු කරයි කියන විශ්වාසය අපට තිබෙනවා. එතුමා මේ වනතෙක් ඒ විධියට ඉන්නවා. එතුමා අද පාර්ලිමේන්තුවේ එතුමාගේ පුටුවේ රැඳී ඉන්නවා. අපි එය අගය කරනවා.

හෘදය සාක්ෂියට එකඟව තීන්දු ගත්තේ නැත්නම්, කතෝලික ජනතාව නියෝජනය කරන තමුන්නාන්සේලාට ඒ ජනතාවගෙන් ගැලවීමක් ලැබෙන්නේ නැහැ. හදවතට එකඟව තීන්දු ගත්තොත්, තමුන්නාන්සේලාට ආපසු පාර්ලිමේන්තුවේ වාඩිවෙන්න පුළුවන් වෙයි. නැත්නම් කතෝලික ජනතාව තමුන්නාන්සේලාට ගෙදර යන්න අවසර දෙනවා. ඒ අය වෙනුවෙන් තමයි තමුන්නාන්සේලා මෙතැන රැඳී ඉන්නේ. ඒ නිසා තමුන්නාන්සේලා මේ ප්‍රශ්න ගැන කෙළින් කථා කරන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමන්ගේ ෆොටෝ එක පෙළපොත්වලට දමන්න කියලා කිව්වේ නැහැ කියලා ඊයේ අකිල විරාජ් කාරියවසම් අමාත්‍යතුමා කියනවා මාධ්‍ය තුළින් මම දැක්කා. ආණ්ඩුවෙන් මුදලක් යන්නේ නැත්නම් ඒක දැම්මත් වරදක් නැහැ ලු, "මේකට කිසි මුදලක් යන්නේ නැහැ, ෆොටෝ එක දමන්නද?" කියලා කවුදෝ නිලධාරියෙක් ඇසුවා ලු. නිලධාරින්ට වුවමනාවක් තිබෙනවාද, ඇමතිවරයාගේ ෆොටෝ එක දමලා ඇමතිවරයා ඔසවා තබන්න? මේවා හතර බීරි කථා නේ. කන්න නැතිව, පාසල්වලට යන්න විධියක් නැතිව මේ රටේ ළමයින් අද දුක් විඳිනවා. තමන්ගේ ෆොටෝ එක දමාගන්න, මොන නිලධාරියාගෙන් හෝ ඒ වැඩේ කරගන්න තමයි අකිල විරාජ් ඇමතිවරයා ලෑස්ති වෙන්නේ. හැබැයි, ඒ මොනවා කළත් වැඩක් වෙන්නේ නැහැ. රක්ෂා හත්-අටදහසක් දුන්නා. මම එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙක්. මම ආසනය දිනාගෙනයි, පාර්ලිමේන්තුවට ආවේ. රක්ෂා 14ක් දුන්නා, අනුරුද්ධ කුමාර ජාතික පාසලට. සේනාධිකාරි ජාතික පාසලට රක්ෂා 14ක් දුන්නා. නමුත් මගේ ආසනයේ එක්කෙනෙකුටවත් ඒ එක රස්සාවක්වත් දුන්නේ නැහැ; නාවලපිටිය ආසනයේ එක්කෙනෙකුටවත් දුන්නේ නැහැ. ඒ හැම රස්සාවකම ඉන්නේ කුලියාපිටියේ අය. පළාත් පාලන මැතිවරණයෙන් කුලියාපිටිය ආසනය කුජීත වෙලා පැරදුණේ. ඒ නිසා ඔය ෆොටෝ එක දමාගෙන අකිල විරාජ්ට කවදාවත් නැඟිටින්න හම්බවෙන්න නැහැ. රනිල් එක්ක ඔය දීගේ කෑවාට, ජනතාව එක්ක ඔය දීගේ කන්න ආයෙත් අධ්‍යාපන ඇමතිවරයාට හම්බ වෙන්නේ නැහැ. පසුගිය පළාත් පාලන මැතිවරණයේදී ඒකේ ප්‍රතිඵලය ලැබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ සියලු ජනතාවට මේ පාලන ක්‍රමය පිළිබඳව දැඩි පිළිකුලක් තිබෙන්නේ.

අද විශේෂ කාරක සභාවක් දමාගෙන මොන පිස්සුවක්ද මේ කරන්නේ? පාර්ලිමේන්තුවට නැවත එන්න බැරි, මහ ජනතාව ප්‍රතික්ෂේප කළ පිරිසක් තමයි ඒ කාරක සභාවේ සාමාජිකයන්

[ගරු ආනන්ද අලුත්ගමගේ මහතා]

වශයෙන් ඉන්නේ. සරත් ෆොන්සේකා මන්ත්‍රීතුමා ඒ කාරක සභාවේ සාමාජිකයකු වශයෙන් ඉන්නවා. එතුමා ජනාධිපතිවරණයට ඉදිරිපත් කළා. නමුත් දිනාගන්න බැරි වුණා. එතුමා මැතිවරණයට තනියම ඉදිරිපත්වෙලා මුළු ලංකාවෙන්ම ඡන්ද 28,000යි ගත්තේ. එතුමාගේ නෝනා ඇතුළු පරම්පරාවේ සියල්ලන්ගෙන්ම ඡන්ද 28,000යි ලැබුණේ. ඡන්ද 28,000ක් ලබාගෙන පළාත් සභාවටවත් යන්න පුළුවන්ද? එතුමාද, ජනාධිපතිවරණයට ආපසු ඉදිරිපත් කරන්න යන්නේ? අපේ කුමාර වෙල්ගම මන්ත්‍රීතුමාත් මොකක්දෝ ලුණුවක් කාලා, සරත් ෆොන්සේකා මන්ත්‍රීතුමා ජනාධිපතිවරණයට ඉදිරිපත් කරන්න ඕනෑය කියලා කියනවා මා දැක්කා. රටේ හීනයක් පෙනුණාම උදේට ඒ ගැන මාධ්‍යයට කියනවා. සමහර මාධ්‍යවලට පළ කරන්න ප්‍රවෘත්ති නැති වුණාම මිනිස්සු කුලප්පු කරන්න ඒවා පළ කරනවා. නමුත් මීට වඩා වැදගත් දේවල් මේ රටේ සිද්ධ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
මට තව තත්පරයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේකයි ඇත්ත තත්ත්වය. අහන්න ඕනෑ ප්‍රශ්න නොවෙයි ඒ කාරක සභාවේදී අහන්නේ. මා දැක්කා, යුද හමුදාපතිතුමා ගෙන්වා ප්‍රශ්න කරන හැටි. මේ රටේ බුද්ධි අංශ ගෙනෙන තොරතුරුවල ආරක්ෂිතභාවය, රහසිගතභාවය රැකුණොත් යුද හමුදාපතිතුමාත් බේරෙනවා, අපිත් බේරෙනවා. අපේ අගමැතිතුමා මේ සභාවේදී කිව්වා, ඒ කාරක සභාවේ කටයුතු මුළු මාධ්‍යයටම විවෘත කරලායි තිබෙන්නේ කියලා. එතකොට, පොලිස්පතිතුමාගේ කථාව විවෘතයි, අනිත් අයගේ කථා සියල්ලම විවෘතයි. නමුත් යුද හමුදාපතිතුමා කථා කරනකොට මාධ්‍ය එළියට යන්න ඕනෑ.

නියෝජ්‍ය කථානායකවරයා පත්කිරීමේදී මාත් එතුමාට ඡන්දය දුන්නා. එතුමාත් අර ගොන් කරත්තයට කර ගහලා තිබෙනවා. එතුමාත් මොකක්දෝ මඟුලකට කර ගහලා තිබෙනවා.

මේ සියලු දේවල් සිද්ධ වෙන්නේ මේ රටේ ජනතාවගේ හිත සුව පිණිස නොවෙයි කියන එක මා බොහොම පැහැදිලිව කියනවා. ඒ කනගාටුව ඇතිව තමයි අද එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් තමන්ගේ පුටුවේ වාඩිවෙලා ගණපූරණය රකින්නේ. මෙය ඉතිහාසගතවන අවස්ථාවක්. විපක්ෂයට තමයි අමාරුව තිබෙන්නේ. විපක්ෂය තමයි මේ රට පාලනය කරන්නේ. විපක්ෂය තමයි මේ ආණ්ඩුව ගෙන යන්නේ. විපක්ෂය තමයි පනත් කෙටුම්පත් ආදිය සම්මත කිරීමට ගණපූරණය හෝ රැක ගෙන මේ කටයුතු කරන්නේ කියන කාරණය ප්‍රකාශ කරමින්, වේලාව ලබා දීම සම්බන්ධයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තූතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පක්ෂ නායක රැස්වීමේදී ආණ්ඩු පක්ෂය හා විපක්ෂය අතර එකඟතාවක් ඇති වුණා, හදිසි නීතිය පිළිබඳ විවාදයේදී ගණපූරණය ඉල්ලන්නේ නැහැ කියලා. මෙය හදිසි නීතිය පිළිබඳ විවාදයයි. මෙයට විරුද්ධව ඡන්දය පාවිච්චි කරන්නේත් නැහැ කියලාත් එකඟතාවකට පැමිණ තිබෙනවා. මෙය රට වෙනුවෙන් කරන විවාදයක්. මෙය Quorum එක ඉල්ලා ප්‍රශ්න ඇති කරන විවාදයක් නොවෙයි. ගණපූරණය ඉල්ලන්නේ නැහැ කියලා එකඟතාවක් තිබුණා. මෙයට විරුද්ධව ඡන්දය පැවිච්චි කරන්නේ නැහැ කියාත් එකඟතාවක් තිබුණා.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නා විධියට නම් පාර්ලිමේන්තුව පවත්වාගෙන යන්න ගණපූරණය තිබෙන්න ඕනෑ. ගණපූරණය ඉල්ලන්නේ නැහැ කියලා පක්ෂ නායකයන්ට තීන්දු කරන්න පුළුවන්, පාර්ලිමේන්තුවෙන් පිටතදී. නමුත් මෙහිදී ගණපූරණය අවශ්‍ය වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
රීති ප්‍රශ්නයක්ද, ගරු මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමනි?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව කරන එකම දේ තමයි හදිසි නීතිය පනවා විවාදයක් පවත්වන එක. අපි එයට ආශීර්වාද කරලා, සහයෝගය ලබා දෙනවාය කියලා මේ අවස්ථාවේදී මා ප්‍රකාශ කරනවා.

[අ.භා.2.46]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr) Kavinda Heshan Jayawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හදිසි නීතිය දීර්ඝ කර ගැනීම පිළිබඳව සාකච්ඡා කරන ඉතාම වැදගත් මේ මොහොතේ, විශේෂයෙන්ම පාස්කු ඉරු දින සිදු වූ ප්‍රහාරයෙන් පස්සේ අපේ ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය කටයුතු කළ ආකාරය පිළිබඳව ඔවුන්ට ස්තූතිවන්ත වෙන්න ඕනෑ. විශේෂයෙන්ම ඔවුන්ගේ රාජකාරියෙන් ඔබ්බට ගිහින්, මේ රටේ ආරක්ෂාව තහවුරු කරන්නට අවශ්‍ය කරන්නා වූ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළාය කියන දැඩි විශ්වාසයක් අපට තිබෙනවා. ඒ ප්‍රහාරයෙන් පස්සේ පල්ලි, පන්සල්, නිවාස පරීක්ෂා කිරීමේ කටයුතු කරනවා අපි දැක්කා. ඒ පරීක්ෂණ කටයුතු කරද්දී පැමිණි පීඩනයත් එක්ක ඔවුන් නිර්පාක්ෂිකව ඒ සියල්ලක්ම ඉෂ්ට සිද්ධ කළා. විශේෂයෙන්ම වැරැදිකරුවන් නීතිය ඉදිරියට ගෙන යැමට අවශ්‍ය කරන්නා වූ කටයුත්ත ත්‍රිවිධ හමුදාවත්, පොලීසියත් එහිදී ක්‍රියාත්මක කළා. මේ ආරක්ෂක වැඩ පිළිවෙළ ඉතාම ශක්තිමත්ව තවදුරටත් ඉදිරියට ගෙන යන්නට ඕනෑය කියා අපි විශ්වාස කරනවා. අපි කොයිම ආකාරයකින්වත් අපේ ආරක්ෂක තත්ත්වය

අඩු කරන්න, එහෙම නැත්නම් කපා හරින්න, කප්පාදු කරන්න උත්සාහ ගන්න නරකයි. එයට හේතුව තමයි, "අපි ආරක්ෂිතයි" කියලා අපේ රටේ ජනතාව තුළ විශ්වාසය ගොඩ නැඟෙන්න ඕනෑ. අවුරුදු තිහක යුද්ධයක් අපි දැක්කා. ඒ යුද සමයේදී හැම පාරකම ආරක්ෂක මුර පොළවල් තිබුණා. යන එන වාහන නවත්වලා, ඒවා පරීක්ෂාවට ලක් කළා; යන එන අයගේ හැඳුනුම්පත් පරීක්ෂාවට ලක් කළා. නමුත් ඒ අවස්ථාවේදී ජනතාව ඔවුන්ට විරුද්ධ වුණේ නැහැ. ත්‍රිවිධ හමුදාවට, පොලීසියට ජනතාව විරුද්ධ වුණේ නැහැ. ඒ අය තමන් පරීක්ෂාවට ලක් කරන්න කියන ස්ථාවරයේ හිටියා. මේ විධියට පරීක්ෂාවට ලක් වුණොත් තමයි ඔවුන් ආරක්ෂා වෙන්නේ කියලා ඔවුන් දන්නවා.

නමුත් කනගාටුවට කාරණය මෙයයි. සමහර දේශපාලනඥයන් කිව්වා, "එතැන පරීක්ෂා කරන්න එපා. මෙතැන පරීක්ෂා කරන්න එපා" කියලා. නමුත් මේ රටේ අපි සියලුදෙනාටම සුරක්ෂිතව ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් නිර්මාණය වෙන්නේ ආරක්ෂක අංශවල රාජකාරි හරියට ක්‍රියාත්මක කළොත් පමණයි. යුද මානසිකත්වයක් මේ රටට අවශ්‍ය නැහැ. නමුත් ආරක්ෂක මුර පොළවල් දමලා, ආරක්ෂණ වැඩ පිළිවෙළ ඉතාම සක්‍රියව තවදුරටත් ක්‍රියාත්මක කරන්න අපේ ආරක්ෂක අංශවලට පුළුවන් නම් ඒක ඉතාම වැදගත් කියා මා හිතනවා. කොළඹ හෝටල්වලට අදාළ පරීක්ෂණ කටයුතු කරන බව අපට පෙනෙනවා. ඒක ඉතාම හොඳයි. ජනගහනය වැඩි අනිකුත් ප්‍රදේශවලත්, රෝහල්, පාසල් වැනි ස්ථානවලත් මේ පරීක්ෂණ කටයුතු සිදු විය යුතුයි. මේ පරීක්ෂණ කටයුතු අඩු කරන්න හොඳ නැහැ. මේ වනවිට ත්‍රස්තවාදී තර්ජනය අඩු වී තිබෙන්න පුළුවන්. නමුත් ඒක අපට හරියටම නිගමනය කරන්න බැහැ. ඒ නිසා අපි කරන්නා වූ පරීක්ෂණ අඩපණ කරන්නවත්, අඩු කරන්නවත් හොඳ නැහැ කියන හැඟීම තමයි මට තිබෙන්නේ. පොලීසියෙන් පල්ලි, පන්සල්වලට ආරක්ෂාව ලබා දීලා තිබෙන බව අපි දන්නවා. ඒක ඉදිරියටත් ක්‍රියාත්මක වෙන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, ඒ අය එම ස්ථානවල සිටින විට ආරක්ෂාව පිළිබඳව ජනතාව තුළ දැඩි විශ්වාසයක් තිබෙනවා.

විශේෂයෙන්ම ෂරියා විශ්වවිද්‍යාලය ගැන දිගින් දිගටම කථා කළා. සමහර අයට ඒක අමතක වෙලා තිබෙනවා. මේක ෂරියා විශ්වවිද්‍යාලයක් නොවෙයි කියලා සමහර අය කියනවා. නමුත් ජාතිය, ආගම මූලාශ්‍ර කරගත් විශ්වවිද්‍යාල මේ රටට අවශ්‍ය නැති බව අපි කියනවා. මේ විශ්වවිද්‍යාලය රජයට පවරා ගන්න කියලා අපි කාරුණිකව ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම ආශු මාරසිංහ මන්ත්‍රීතුමාගේ ඒ යෝජනාව ස්ථිර කර, ඒ යෝජනාව අනුව ක්‍රියාත්මක වෙන්න කියලා මා මේ ගරු සභාවෙන් ඉල්ලීමක් කරනවා. අපි ජාතීන් හැටියට බෙදෙන එකේ තේරුමක් නැහැ; අපි ආගම් හැටියට බෙදෙන එකේ තේරුමක් නැහැ; අපි කුළල් කාගන්න එකේ තේරුමක් නැහැ. අපි රටක් හැටියට එකතු වෙලා, ඉදිරියට යන්න ඕනෑ. එහෙම රටක් හැටියට ඉදිරියට යන්න පුළුවන් පරිසරය නිර්මාණය වෙන්නේ අපි පාසලේ සිටම එකමුතුකම පෙන්නුවොත් පමණයි කියන කාරණය මා මේ අවස්ථාවේදී මතක් කර දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර අය දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන කථා කරනවා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්න අපට පුළුවන්කම ලැබුණාය කියා මා විශ්වාස කරනවා. ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරපු එකට හොඳම උදාහරණය තමයි, එදා අතිගරු ජනාධිපතිතුමා මහින්ද රාජපක්ෂ මැතිතුමා අගමැති බවට පත් කිරීම. නමුත් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ස්තුතිවන්ත වෙන්න එය නැවත වතාවක් වෙනස් කරන්න පුළුවන්කම ලැබුණා. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික හරය ආරක්ෂා වන ව්‍යවස්ථාමය සංශෝධනයක් තමයි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මේ රටට අහිතකරයි කියා යමෙකු විශ්වාස කරනවා නම්, මා හිතන්නේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව අවබෝධයකින් නොවෙයි ඔහු කටයුතු කරන්නේ.

මේ රටේ පරමාධිපත්‍ය බලය තිබෙන්නේ ජනතාවටයි. මේ රටේ ආණ්ඩු බිහි කරන්න, ආණ්ඩු පෙරළන්න, පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ අයිතිය තිබෙන්නේ ජනතාවටයි. අවුරුදු හතරහමාරකින් තමයි පාර්ලිමේන්තුව විසුරුවන්න පුළුවන් වන්නේ. ඊට කලින් පාර්ලිමේන්තුව විසුරුවනවා නම් තුනෙන් දෙකක බලයක් අවශ්‍යයි. ඒ කියන්නේ, ජනතාවගේ බලය අවශ්‍යයි. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සමඟ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත වුණාය කියා අපි විශ්වාස කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම දහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කිරීම හරහා මේ රටේ ඒකාධිපති වියරුවෙන් වියරු වැටී සිටින යම්කිසි දේශපාලනඥයෙකු සිටිනවාද, ජනාධිපතිවරයෙකු සිටිනවාද නැවත නැවතත් මේ රටේ ජනාධිපති වීමේ ඔහුගේ සිහිනය බොඳ වුණා.

අපේ ආණ්ඩුව දින සියය කාල සීමාව තුළදී ඉතා වැදගත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළාය කියා මා හිතනවා. ඒ තමයි, දහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කිරීමත්, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීමත්.

කෙසේ වෙතත්, මම දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අපි ත්‍රිවිධ හමුදාවට සහ පොලීසියට කියා සිටින්නේ, මේ ආරක්ෂණ වැඩ පිළිවෙළ හොඳයි, පුළුවන් නම් මීටත් වඩා ඔබ්බට ගිහිල්ලා ක්‍රියාත්මක කරන්න කියායි. මේ ආරක්ෂණ වැඩ පිළිවෙළ තවදුරටත් ශක්තිමත් කරන්න පුළුවන් නම් ඒ දේ කරන්න. අපි ඒ අයගේ ක්‍රියාදාමය සහ සේවාව අගය කරනවා. ඒ වාගේම, අපි තුළ දැඩි විශ්වාසයක් ඔවුන් කෙරෙහි තිබෙනවා. ඒ වාගේම, ඔවුන්ට අවශ්‍ය කරන්නාවූ සහයෝගය මේ ආණ්ඩුවේ සිටින මන්ත්‍රීවරු හැටියට අපි ලබා දෙනවාය කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු අනුරාධ ජයරත්න මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා.2.53]

**ගරු අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳව විවාදය පැවැත්වෙන අවස්ථාවේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම සඳහන් කළ යුතු කාරණාවක් තිබෙනවා. අද හදිසි නීතිය විවාදයට ගන්නා වෙලාවේ කියන්න ඕනෑ, මේ රටේ ජනතාව බොහොම පැහැදිලිව ත්‍රිවිධ හමුදාවට පින් සිද්ධ වෙන්න සැක භය නැතිව ජීවත් වෙන තත්ත්වයක් අද මේ රටේ ගොඩ නැඟිලා තිබෙන බව. මේ රටේ ආණ්ඩුවක් තිබුණාට, ඒ ආණ්ඩුවේ කිසිම වැඩ පිළිවෙළක් නැහැ. අපි දන්නවා, ලෝකයේ තිබුණු දැවැන්ත ත්‍රස්තවාදයක් අපේ හමුදාව අවසන් කළ බව. රට තුළ මහා විශ්වාසයක් හමුදාව විසින් ගොඩ නැඟුවා. ඒ විශ්වාසයත් සමඟ විතරයි අද ජනතාවට ජීවත් වෙන්න පුළුවන් පරිසරය ගොඩ

[ගරු අනුරාධ ජයරත්න මහතා]

නැඟිලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ ජනාධිපතිවරයා රැස්වීමකට ගිහිල්ලා කියනවා, මේ රටේ සුක්කානම දෙදෙනෙක් හසුරුවනවා කියලා. අනෙක් පැත්තෙන් අගමැතිතුමා රැස්වීමකට ගිහින් කියන්නේ මොකක්ද? මේ සුක්කානම දෙදෙනෙකුට හසුරුවන්න පුළුවන්කමක් නැහැ, මේ සුක්කානම තනි පුද්ගලයෙක් ගත්ත දවසට හරියට පදවනවා කියලා. ඉතින් දෙවියනේ! මේ සුක්කානම් හදා ගත්තේ අපිද? 2015දී මේ සුක්කානම් දෙක එකතු වෙලා කරගත්ත වින්නැහියනේ මේ තිබෙන්නේ. මේවා අපි හදපු දේවල් නොවෙයි. අද මේ ආණ්ඩුවට කිසිදු වැඩ පිළිවෙළක් නැහැ. ත්‍රිවිධ හමුදාවට පින් සිද්ධ වෙන්න අද අපේ රටේ ජනතාව සැක බිය නැතිව ජීවත් වෙනවාය කියන කාරණාව අපි විශේෂයෙන්ම සිහිපත් කරන්න ඕනෑ. ඒ වාගේම, කැබිනට් මණ්ඩලයේ සිටින අමාත්‍යවරු දිහා බලන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කැබිනට් මණ්ඩලයේ සිටින අමාත්‍යවරු 30 දෙනාට එක මතයක ඉඳගෙන වැඩ කරන්න බැරි තත්ත්වයක් ගොඩ නැඟිලා තිබෙනවා. අද සරත් ෆොන්සේකා මන්ත්‍රීතුමාමොකක්ද කියන්නේ? සරත් ෆොන්සේකා මන්ත්‍රීතුමා එළියට ඇවිල්ලා කියනවා, රටේ ආරක්ෂාව පිළිබඳව කිසිදු විධියක විශ්වාසයක් තියන්න බැහැ කියලා. එතුමා යුද්ධය පිළිබඳව අවබෝධයක් තිබෙන නායකයෙක්. යුද්ධයට නායකත්වය දීපු පුද්ගලයෙක්. එතුමා එළියට ඇවිල්ලා එක කථාවක් කියනවා. හැබැයි, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා ගිහිල්ලා තව වේදිකාවකට නැඟලා කියනවා, "කිසිම විධියකින් භය වෙන්න එපා. අපි සියයට සියයක් මේ ත්‍රස්තවාදය අවසන් කර තිබෙනවා" කියලා. මේ ප්‍රශ්න සියල්ල අවසන් කර තිබෙනවා නම්, මොන කෙංගෙඩියටද අද මේ හදිසි නීතිය ගෙනෙන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ සම්බන්ධයෙන් කථා කරනකොට දෙමළ ජාතික සන්ධානයේ සහ එක්සත් ජාතික පක්ෂයේ සියලුදෙනාම වාගේ එතුමන්ලාගේ අදහස් ප්‍රකාශ කළා. හැබැයි, ඒ අදහස් ප්‍රකාශ කරපු ඒ සියලුදෙනාම කියන්නේ මොකක්ද? හදිසි නීතිය පැනවීමේ තිබෙන අවාසිය පිළිබඳවයි කියන්නේ. එහෙම නම් මහත්තයෝ හදිසි නීතිය ගෙනෙන්න එපා. ඇයි ගෙනෙන්නේ? අපි ඉල්ලලාද හදිසි නීතිය ගෙනෙන්නේ? ආණ්ඩුවේ සිටින මුස්ලිම් මන්ත්‍රීවරු, දමිළ මන්ත්‍රීවරු ඇතුළු සියලුදෙනා කියනවා නම්, හදිසි නීතිය ගෙනැල්ලා සම්පූර්ණයෙන්ම ජනතාවට අසාධාරණයක් කරන්නේ; මිනිස්සු තව ඉන්න තත්ත්වයෙන් පල්ලෙහාට දමන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙන්නේ කියලා, වෙන්නේ ඒ දේවල් නම් ඇයි අපි හදිසි නීතිය ගෙනෙන්නේ? හැබැයි හොඳට මතක තියා ගන්න. පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරුන් 225දෙනා අතර සිටින දෙමළ මන්ත්‍රීවරුන්ට හදිසි නීතිය සමහර විට allergic වෙන්න පුළුවන්. අපේ ත්‍රිවිධ හමුදාවත් සමහර වෙලාවට allergic වෙන්න පුළුවන්. හැබැයි, ලංකාවේ සිටින දමිළ ජනතාවට ත්‍රිවිධ හමුදාව allergic නැහැ කියන එක අපි බොහොම පැහැදිලිව සිහිපත් කරන්න ඕනෑ. උතුරේ සමහර බ්‍රිගේඩියර්ලා මාරුවෙලා එනකොට දමිළ ජනතාව අඬපු විධිය අපි දැක්කා. ඒ අය කෙරෙහි විශ්වාසය ගොඩ නැඟිලා තිබෙනවා. හැබැයි, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225 දෙනාටට තමයි මේ සියලු ප්‍රශ්න ඇවිල්ලා තිබෙන්නේ.

අනෙක් පැත්තෙන් ගත්තාම හදිසි නීතිය දමාගෙන අද මොනවාද කරන්නේ කියලා බලන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එක පැත්තකින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත් කෙටුම්පත ගෙනෙන්න උත්සාහ කරනවා. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත් කෙටුම්පත ගෙනෙන්න උත්සාහ කරනකොට මම ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව නියෝජනය කළා. ඒ ආංශික අධීක්ෂණ කාරක සභාවට අපි TID එකේ සහ CID එකේ අධ්‍යක්ෂවරු ගෙනාවා. ඒ සියලුදෙනාගේ මේ පිළිබඳ අදහස් අරගෙන බලන්න. ඒ අධ්‍යක්ෂවරු සියලුදෙනා කියන්නේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත් කෙටුම්පතක් අවශ්‍ය නැහැ කියන එක. හැබැයි, ඒක ගෙනෙන්න දඟලන එකම කෙනා වෙන කවුරුවත් නොවෙයි. අපේ ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමාට විතරයි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ගෙනෙන්න ඕනෑකම තිබෙන්නේ. විසඳාගන්න මෙපමණ ප්‍රශ්න තියෙද්දී, ත්‍රස්තවාදය වැළැක්වීම සඳහා කළ යුතු වැඩ පිළිවෙළවල් බොහොමයක් තියෙද්දී, ඒ වැඩ පිළිවෙළ අපි ක්‍රියාත්මක කරන්න ඕනෑ වෙලාවේදී ඒවාට අවශ්‍ය විසඳුම් සොයන එක නොවෙයි අපි කරන්නේ. අනවශ්‍ය වෙන වෙන මොනවා හෝ දෙයක් ගෙනැල්ලා ඒවා ක්‍රියාත්මක කර ගැනීම තමයි කරන්නේ.

අද බලන්න මේ ආණ්ඩුව කරන අනෙක් වැඩ පිළිවෙළ දිහා. හදිසි නීතිය විවාදයට ගන්නා අවස්ථාවේ මේ සභාවට ඉදිරිපත් කරන්න ඕනෑ පසුගිය කාලය ඇතුළත කී දෙනෙක් අත්අඩංගුවට ගත්තාද කියන ඒ විස්තර. කී දෙනෙකුගේ ප්‍රකාශ සටහන් කරගෙන තිබෙනවාද, මොන වාගේ තත්ත්වයකටද අද රට අරගෙන ගිහිල්ලා තිබෙන්නේ කියන විස්තර කියන්න ඕනෑ. රට තුළ විශ්වාසය ගොඩ නැඟිලා නම්, කොහොමද ඒ විශ්වාසය ගොඩ නැඟිලා තිබෙන්නේ? අද අවංකවම ත්‍රස්තවාදීන් නැද්ද? අද මේ කාරණා පිළිබඳ විස්තර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑ.

හැබැයි, ඒ කිසිම විස්තරයක් අද ඉදිරිපත් කරලා නැහැ. ඒ වෙනුවට ආණ්ඩුව මොකක්ද කරන්නේ? විශේෂ අධිකරණ හදාගෙන උදේ හවස එක්කෝ 'ගෝඨා, ගෝඨා' කියා ගහනවා. එහෙම නැත්නම් තව කවුරු හෝ අපේ හිටපු අමාත්‍යවරයෙක් අල්ලාගෙන ගහනවා. මේ කතන්දර අරගෙන යනවා හැර ත්‍රස්තවාදීන් පිළිබඳව අද පාර්ලිමේන්තුවේදී කථා කළාද? සමහරු කථා කරන්නේ ඊළඟ ආණ්ඩුව හදන එක ගැන, මහින්ද රාජපක්ෂ මහත්තයා බලයට එයි කියලා ඒක නතර කිරීම සඳහා වන වැඩ පිළිවෙළ ගැන. හැබැයි, පසුගිය අප්‍රේල් 21 වෙනි දා ඇති වූ ඒ ප්‍රශ්නය ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ආණ්ඩුවේ සිටින අයටත් හදිසි නීතිය එපා කියනවා. අනික් පැත්තෙන් ආණ්ඩුවට සහයෝගය දෙන අනෙක් සුළු පක්ෂවලටත් හදිසි නීතිය එපා කියනවා. එතකොට මේ රට පිළිබඳ ප්‍රශ්න තිබෙන්නේ විපක්ෂයේ අපට විතරද? මේ ආණ්ඩුවේ කාටවත් ඒ පිළිබඳ ප්‍රශ්නයක් නැද්ද? අද පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරු සංඛ්‍යාව කීයද බලන්න. යන්තම් අපේ රුවන් විජේවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා නම් මේ ගරු සභාවේ ඉන්නවා. ප්‍රධාන පෙළේ එක අමාත්‍යවරයෙක්වත් අද පාර්ලිමේන්තුවේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ ආරක්ෂාව, ජාතික ආරක්ෂාව පිළිබඳව ආණ්ඩුවට තියෙන අවශ්‍යතාව මේකෙන් පෙනෙනවා. සභානායකතුමා කියනවා, පක්ෂ නායක රැස්වීමේදී තීරණය කළා කියලා ගණපූරණය -Quorum - නොසලකා කටයුතු කරන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක මාර කථාවක් නේ. ඒ විධියට තීන්දු තීරණ ගන්න පක්ෂ නායකයන්ට පුළුවන් නම්, ස්ථාවර නියෝග ඕනෑ නැහැ; පාර්ලිමේන්තුවේ නීති රීති ඕනෑ නැහැ. පක්ෂ නායකයන් සියලුදේවල් තීරණය කරලා අපට කියන්න. ඒක කළාම ඇති. හැබැයි, එහෙම කරන්න පුළුවන්කමක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව තමයි ස්වාමීන්වහන්සේලා වැඩිම පිරිසක් හිරේ දැම්මේ. එදා "හංසයා" දිනවන්න, මේ ආණ්ඩුව හදන්න පාක්‍යසෝතිලා සහයෝගය දුන්නා.

අස්ගිරි මහනායක හාමුදුරුවන්ගේ ප්‍රකාශය පිළිබඳ ප්‍රශ්නයක් තිබුණා. හැබැයි, දවස් දෙකක් යනකොට උන්වහන්සේ නැවත ප්‍රකාශයක් කරලා ඒක නිවැරදි කළා. අද ඒ නායක මාහිමිපාණන් වහන්සේට සලකන විධිය බලන්න. ආණ්ඩුව පාක්‍යසෝති

සරවනමුත්තු දමලා පැමිණිලි ඉදිරිපත් කරනවා, මහානායක හාමුරුවන් අත්අඩංගුවට ගන්න කියලා. මේවා රටේ ජනතාව තුළ වෛරය ඇති කරවන දේවල් නොවෙයිද, රටේ ජාතිවාදී ප්‍රශ්න ඇති කරවන දේවල් නොවෙයිද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සියලුදේවල් කරලා අද අස්ගිරි මහනායක හාමුදුරුවොත් හිරේට දමන්න පුළුවන්. අස්ගිරි මහානායක හාමුදුරුවන්ගේ ප්‍රශ්නය ජාතිවාදය ගැන ප්‍රශ්නයක් නොවෙයි. අස්ගිරි මහානායක හාමුරුවෝ රට පිළිබඳව කෙළින් කථා කරන මහානායක හාමුදුරු නමක්. උන් වහන්සේ එදා බොහොම පැහැදිලිව ආණ්ඩුවේ වැඩ පිළිවෙළ පිළිබඳව කිව්වා. ආණ්ඩුව මොනවාද කළේ, ආණ්ඩුව නිසා අද රටේ ජාතික ආරක්ෂාවට මොනවාද වුණේ කියන එක උන්වහන්සේ බොහොම පැහැදිලිව කිව්වා. ඒ ගැන තමයි අද එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට කනගාටුව තියෙන්නේ. ඒ නිසා මොනවාද කරන්නේ? එදා ආණ්ඩුව හදන්න ආණ්ඩුවට සහයෝගය දීපු NGOකාරයෝ මගින් පැමිණිලි දමලා උන්වහන්සේ සිරගත කරන්න පුළුවන් නම් ඒක කරන්නයි මේ උත්සාහ කරන්නේ. හැබැයි, අපි බොහොම පැහැදිලිව ආණ්ඩුවට මතක් කරනවා මහානායක හාමුදුරුවෝ සහ අපේ ගෞරවණීය මහා සංඝරත්නය අල්ලාගන්න එන්න වෙන්නේ අපේ මිනී උඩින් බව.

දැන් බලන්න, මේ පත් කර තිබෙන විශේෂ කාරක සභාව පිළිබඳව. එදා ජනාධිපතිතුමා නීතිපතිතුමාගේ උපදෙස් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා, "මේ විශේෂ කාරක සභාව පවත්වන්න එපා. රටේ බුද්ධි අංශ පිළිබඳව වාගේම උසාවියේ තියෙන නඩු පිළිබඳව ඒක ප්‍රශ්නයක්" කියලා. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කිසි දෙයක් ආණ්ඩුව මායිමකට ගන්නේ නැහැ. පළමු වතාවට අපි දැක්කා, රටේ බුද්ධි අංශ නිලධාරීන් ගෙනැල්ලා සියලු මාධ්‍ය ඉදිරියේ ඔවුන්ගෙන් හරස් ප්‍රශ්න අහන හැටි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොන විළිලජ්ජා නැති වැඩක්ද මේ? රටේ බුද්ධි අංශ නිලධාරින් කියන්නේ මොන තරම් ආරක්ෂා කරන්න ඕනෑ කණ්ඩායමක්ද? ඔවුන් නිසා තමයි අපි අද නිදහසේ ඉන්නේ, මේ විධියට ජීවත් වෙන්නේ. ඒ මිනිස්සු ටික ගෙනැල්ලා මාධ්‍ය ඉස්සරහ තියලා අහනවා මොනවාද ගත්ත තීරණ, කොහෙන්ද news ලැබුණේ, මේවා කොහොමද ක්‍රියාත්මක වුණේ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අය මාධ්‍ය ඉස්සරහ තියාගෙන මේවාගේ ප්‍රශ්න අහනවාද? මේ හදිසි නීතියටත්, ත්‍රිවිධ හමුදාව සහ පොලීසියටත් පින් සිද්ධ වෙන්න මේ රට රැකෙයි. හැබැයි, ආණ්ඩුව පිළිබඳ ශතපහක විශ්වාසයක් අපට තියන්න පුළුවන්කමක් නැහැ කියන කාරණය සිහිපත් කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එඩ්වඩ් ගුණසේකර මැතිතුමා. ඔබතුමාට විනාඩි 7ක් තිබෙනවා.

[අ.භා.3.02]

**ගරු එඩ්වඩ් ගුණසේකර මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எட்வட் குணசேகர - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு பிரதி அமைச்சர்)
(The Hon. Edward Gunasekara - Deputy Minister of Lands and Parliamentary Reforms)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මාසයේත්, හදිසි නීතිය තවදුරටත් දිගු කර ගැනීම සඳහා පැවැත්වෙන විවාදයට සහභාගි වෙන්න මට කාලය ලබාදීම පිළිබඳව ස්තුතිවන්ත වනවා. මේ රටේ හමුදාපතිතුමා ඊයේ විශේෂ කාරක සභාවේදී කියා තිබුණා, "මේ රටේ නැවත ත්‍රස්තවාදයක් ඇති වෙන්න ඉඩ තියන්නේ නැහැ. නමුත් මේ රටේ මෙවැනි දේවල් ඇති නොවෙනවාය කියලා සියයට 100ක් කියන්න බැහැ" කියනවා වාගේ අදහසක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ඒක නේ වෙන්න ඕනෑ. අප්‍රේල් 21 සිද්ධිය සිදුවෙනවා කියලා මේ රටේ කවුරු හරි කෙනෙක් හරියටම දැනගෙන හිටියා නම්, ඒක වළක්වනවා නේ. එය වළක්වන්න අවශ්‍ය දේ කරනවා. ඒකට වගකිවයුත්තන් ගැන තමයි මම කියන්නේ. රටේ සාමාන්‍ය ජනතාව වුණත් එහෙමයි. මා දැන ගෙන තිබුණා නම්, අඩුම තරමින් මා ළඟ සිටින ආරක්ෂකයෙකුගෙන්වත් අහනවා, මේකට මොකක්ද කරන්නේ කියලා. එහෙමවත් අහන්න අපි ඒ ගැන දැනගෙන හිටියේ නැහැ. නමුත් රහස් ඔත්තු සේවය දියුණු නිසා අපේ රට දැනුවත් කර තිබෙනවා, "මෙවැනි සිද්ධියක් වනවා" කියලා. හැබැයි මේ වාගේ දෙයක් සිදු වෙයි කියලා හිතුවේ නැති බව හිටපු ආරක්ෂක ලේකම්වරයාත් කිව්වා. ඒ ප්‍රහාරවලින් මිය ගිය තුන්සිය ගණනටම අසාධාරණයක් වුණාට, මේ කියන කථාවලත් යම් සාධාරණයක් තිබෙනවා.

ලෝකයේ ඉතාම දියුණු තාක්ෂණයක් තිබෙන ඇමෙරිකාවේ වෙච්ච සිද්ධිය ගන්න. කවුරුවත් හිතුවාද ඇමෙරිකාවට ගහයි කියලා? කොහොමද හිතන්නේ ඇමෙරිකාවට ගහයි කියලා. ජර්මනියේ වේගයෙන් වාහනයක් පදවාගෙන ගිහින් pavement එකේ ඉන්න මිනිස්සු යට කරගෙන යන්න ත්‍රස්තවාදීන් එනවා කියලා කොහොමද හිතන්නේ? මේක තමයි ඇත්ත. මේක තමයි ඇත්ත වුණාට, මේ කථාව අහගෙන ඉන්න කවුරු හෝ මීළඟට කථා කරන්න ඉන්න කවුරු හෝ කියාවි, "එහෙම නම් ආණ්ඩුවක් මොකටද?" කියලා. ආණ්ඩුවක් නොවෙයි, මොනවා තිබුණත් අපට මේ වාගේ දේවල් වළක්වන්න බැරි අවස්ථාත් තිබෙනවා. හිටපු හමුදාපතිතුමා විශේෂ කාරක සභාවට ඇවිල්ලා කියලා තිබෙන්නේත් ඒකයි.

මේ රටේ ත්‍රස්තවාදය ඉවරයි. නමුත්, මෙවැනි දේවල් නැවත වෙන්නේ නැහැයි කියලා අපට කිසිසේත්ම කියන්න බැහැ. එක පුද්ගලයකුට වුණත් මේක කරන්න පුළුවන්. තවම හොයා නොගත්, එකලස් කරපු බෝම්බ කා ළඟ හෝ තිබෙන්න පුළුවන්; කාට හෝ දුන්නු විධාන තිබෙන්න පුළුවන්. ඒ නිසා හදිසි නීති විවාදයේදී මම විශේෂයෙන්ම කියන්නේ, හදිසි නීතිය දිගු කළ යුතුයි කියන එකයි.

මේ ප්‍රහාර පිළිබඳව කරුණු සොයද්දී අපේ ආරක්ෂක අංශ සහ මේ පිළිබඳව පරීක්ෂා කරන අංශවලින් සොයා බැලිය යුතු කරුණු රාශියක් දැන් ටිකෙන් ටික ඉස්මතු වෙගෙන එනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම් ගරු දයාසිරි ජයසේකර අපේ හිටපු ඇමතිතුමා "දෙරණ" නාළිකාවේ "360$^{O}$" වැඩසටහනේදී කිව්වා, එක්තරා හෝටලයකට බෝම්බය අරගෙන ඇවිල්ලා ඒ බෝම්බය පිපිරෙව්වේ නැත්තේ එක්තරා හේතුවක් මත කියලා. ඒ තමයි, ඒ හෝටලයේ යම් කෙනෙක් සිටිය නිසා කියලා. මාධ්‍යවලින් ඊට කලින් වාර්තා කළේ, ඒ බෝම්බය පුපුරවා ගන්න බැරි වුණා; ඒක අක්‍රියයි, ක්‍රියාත්මක වුණේ නැහැ කියලායි. එතකොට එතුමාගේ ප්‍රකාශය අනුව එතුමා දන්න කාරණාවක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කරුණු නොවෙයිද අපි සොයන්න ඕනෑ? ඊළඟට අපේ රවුෆ් හකීම් ඇමතිතුමා ඊයේ-පෙරේදා නුවර රැස්වීමකදී කියනවා, "මේ ප්‍රහාර ISIS එක භාර ගත්තාට මේක කළේ, ISIS එක නොවෙයි. ISIS එකට එය භාර ගන්න වුණා" කියලා. මේ වාගේ කරුණු දැන් ටිකෙන් ටික ඉස්මතු වනවා. ඒ පිරිස අපි වාගේ මන්ත්‍රීවරුන්ට වඩා ඉතාම ඉහළ මට්ටමෙන් දේශපාලනය කරන පිරිසක් නේ. මම කියන්නේ, මේ විශේෂ කාරක සභාවේ වෙන්න පුළුවන්, පරීක්ෂණ කරන වෙන ආයතනයක් වෙන්න පුළුවන්, රජයේ ඔත්තු සේවය වෙන්න

[ගරු එඩ්වඩ් ගුණසේකර මහතා]

පුළුවන්, හමුදාව වෙන්න පුළුවන් ඒ කවුරුන් හෝ මෙවැනි ප්‍රකාශ කරපු ගමන් ක්ෂණිකව ප්‍රශ්න කරන්න ඕනෑ. නමුත් ඇයි ඒක නොකරන්නේ? ඒක ලොකු ප්‍රශ්නයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කළ යුතු දේවල් දැනුත් නොකර ඉන්නවා වාගෙයි මට පෙනෙන්නේ.

අප්‍රේල් 21 සිද්ධියේදී කාටත් වැරදුණා කියලා අපි දන්නවා. ඒ ප්‍රහාරවලින් මිය ගිය අය පිළිබඳව අපි කනගාටු වනවා. නමුත්, දැනුත් එහෙම දේවල්ද සිද්ධ වෙන්නේ? මේ කාරණා කොහොමද සිද්ධ වෙලා තිබෙන්නේ? එතකොට කවුද ටාජ් සමුද්‍රා හෝටලයේ හිටියේ ඒ බෝම්බය පුපුරවා නොගන්න හේතුවක් වෙන්න? එතකොට ඒ ප්‍රහාරවල වගකීම ISIS එකට භාර දුන්නේ කවුද? ISIS එක වගකීම භාර ගත්තේ ඇයි? ඒකට හේතු මොනවාද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මගේ සිතුවිල්ලට නැඟෙන, මට පෞද්ගලිකව තිබෙන ප්‍රශ්න තමයි ඒවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ යුද්ධ ඇති වෙලා තිබෙනවා; හදිසි නීතිය තිබුණා. ඒ කාලයේ ඉඳලා මේ රටේ විවිධ විධියේ යුද්ධ ඇති වෙලා තිබුණා, විවිධ කැරලි ඇති වෙලා තිබුණා. ඒවා මැඩ පැවැත්වීම රටක ආණ්ඩුවක් විසින් කරන්න ඕනෑ කටයුත්තක්. ත්‍රස්තවාදී ක්‍රියා මර්දනය කරන්න හදිසි නීතිය පනවන්න වනවා. හදිසි නීතිය පනවන්න හා දිගු කරන්න බලය තිබෙන්නේ මේ පාර්ලිමේන්තුවට. ඒ තමයි ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය. මේ තත්ත්වය විවේචනය කරන්න විපක්ෂය කටයුතු කරන්නේ ඇයි? ආරක්ෂාව අඩු වැඩි වශයෙන් වෙනස් වන අවස්ථා ඇති. නමුත්, මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරු 225දෙනාටම වගකීමක් තිබෙනවා මේ රටේ ආරක්ෂාව පිළිබඳව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට නියමිත කාලය අවසන් වෙමින් යන නිසා අවසාන වශයෙන් මේ කාරණය මතක් කරන්න ඕනෑ. රට මෙවැනි තත්ත්වයකට පත්ව තිබෙන අවස්ථාවක ISISලාටත් වඩා පහත් වැඩ කරපු පිරිසක් හිටියා. ISISලා කරපු තුච්ඡ වැඩේ අපි අගය කරන්නේ නැහැ. ඒ පිළිබඳව අපි හැම දාම විරෝධය පළ කරනවා. නමුත් සිදු වූ ඒ ප්‍රහාරවලින් පස්සේ මේ රට අවුස්සන්න, මේ රටේ ඇති වූ ගිනි දැල් නිවෙන්න දෙන්නේ නැතුව තියා ගන්න ඕනෑකමක් මේ රටේ යම් පිරිසකට තිබුණා නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාත් ජීවත් වන මිනුවන්ගොඩ ප්‍රදේශයේ පසුගිය මැයි මාසයේ 13 වැනි දා ඒ කටයුත්ත කළේ කවුද? මැයි 13වන දා උදේ වෙද්දි මේ රටේ 6,000ක් මැරෙන බවට ප්‍රකාශ කළේ කවුද? එතකොට, මැයි 13වැනි දා හවස මිනුවන්ගොඩට ගැහුවේ කවුද? ඇයි, ඒවා හොයන්නේ නැත්තේ? ඒ සඳහා වන්දි මුදල් ගෙවන්න ඕනෑත් මේ ආණ්ඩුවෙන්. ඒ වාගේ විශාල විනාශයක් කළත්, ඒ පිළිබඳව කවුරුවත් පැමිණිලි කළේ නැහැ. ඒ පිළිබඳව කවුරුවත් කියලා නැහැ. ඒ කාගේවත් තොරතුරක් දන්නේ නැහැ කියලා ඒ ගැන සොයන්නේ නැතුව නවත්වන්නේ කොහොමද? කඩ විනාශ වූ මිනුවන්ගොඩ අය සොහොන් දිහා බලාගෙන ඉන්නවා වාගේ ඒ කඩවල් දිහා බලාගෙන ඉන්නවා. එච්චරයි. ඒකට වග කිව යුත්තෙක් නැහැ. අප්‍රේල් 21වැනි දා සිද්ධියෙන් පස්සේ වගකීම් පැහැර හැරපු අවස්ථා තිබෙනවා නේද? එම සිද්ධි සම්බන්ධයෙන් වග කිව යුතු අංශ තිබෙනවා. ඒ ගැන ඇමතිතුමාට, ජනාධිපතිතුමාට, අගමැතිතුමාට ඇඟිල්ල දිගු කිරීම නොවෙයි කරන්න ඕනෑ. එදා ඉඳලා මේ රටේ පැවැති යම් ක්‍රමයක් තිබෙනවානේ. ඒ වගකීම් භාරගත් නිලධාරින් කණ්ඩායමක් ඉන්නවා. ඔවුන් මේවා ගැන සොයන්නේ නැත්තේ ඇයි? ඒ අය කවුද? අන්න ඒ ගැන හොයන්න කියන එක මම එදාත් කිව්වා; මීට කලින් හදිසි නීතිය දීර්ඝ කිරීමේ විවාදයේදීත් කිව්වා; අදත් කියනවා. මැයි 13වැනි දා, අප ජීවත් වන මිනුවන්ගොඩ ප්‍රදේශයේ සාමය නැති කරපු, කඩ ගිනි තියපු ඒ තුච්ඡ මිනිසුන් සොයන්න කියලා ඉල්ලීමක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා.3.09]

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හදිසි නීතිය තව දුරටත් දීර්ඝ කිරීමේ විවාදයේදී මගේ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව පළමුවෙන්ම ඔබතුමාට ස්තුති කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හදිසි නීතිය රටට කොච්චර වැදගත්ද කියලා මේ පාර්ලිමේන්තු සභා ගර්භය දිහා බැලුවාම අපට හිතාගන්න පුළුවන්. ආණ්ඩු පක්ෂය දිහා බැලුවාම පෙනෙනවා, සභානායකවරයා, අගමැතිවරයා ඇතුළු කැබිනට් මණ්ඩලයේ කිසිම අමාත්‍යවරයෙක් හදිසි නීතිය දීර්ඝ කිරීමේ විවාදය පැවැත්වෙන මේ අවස්ථාවේ මේ සභාවේ නැහැ කියලා. ආරක්ෂක රාජ්‍ය ඇමතිවරයායි, නියෝජ්‍ය ඇමතිවරු දෙදෙනෙකුයි පමණයි මේ වෙලාවේ මුළු සභා ගර්භයටම ඉන්නේ. ඒකෙන් අපට පෙනෙනවා, මේ ආණ්ඩුවට රටේ හදිසි නීතිය දීර්ඝ කිරීම කොච්චර වැදගත්ද කියලා.

අපි දන්නවා, අප්‍රේල් 21වැනි දා ප්‍රහාරයට ප්‍රධානම හේතුවක් තමයි, මේ ආණ්ඩුව රටේ ආරක්ෂාව ගැන අධි තක්සේරුවක සිටීම කියලා. මේ රටට තිබුණු අවදානම් තත්ත්වය ගැන මෙතුමන්ලා කිසිසේත්ම ගණන් ගැනීමක් කළේ නැහැ; බුද්ධි අංශ වාර්තා ගණන් ගත්තේ නැහැ. ගිය සතියේ ඉන්දියාවේ බුද්ධි අංශය වන "රෝ" ඔත්තු සේවය නැවත වතාවක් කිව්වා, IS සංවිධානය විසින් ලංකාවටත්, ඉන්දියාවටත් ප්‍රහාර එල්ල කිරීමේ අවදානමක් තිබෙනවා කියලා. විශේෂයෙන්ම කේරළය ඇතුළු ප්‍රදේශවලට මුහුදින් පහර දීමට ඉඩ තිබෙනවාය කියලා ආරක්ෂාව තහවුරු කිරීමේ වැඩසටහනක් මේ වෙද්දී ඉන්දියාව තුළ ක්‍රියාත්මක වෙනවා. හැබැයි අපි දකින්නේ නැහැ, ලංකාව තුළ එවැනි සූදානමක් තිබෙනවා කියලා. මේ වෙද්දී ගුවන් තොටුපළවල්වලට, ඒ වාගේම වරායවල්වලට ලැබිය යුතු නිසි ආරක්ෂාව ලබා දී තිබෙනවාද කියලා මම ආරක්ෂක රාජ්‍ය ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි. මොකද, කිසිසේත්ම අපේ වරායවලට එවැනි ආරක්ෂාවක් ලබා දී තිබෙනවා අපි දකින්නේ නැහැ. අද කේරළය අවට සීමාවට එන බෝට්ටුත් check කරන්න පටන් අරගෙන තිබෙනවා. නමුත් ලංකාව තුළ ඒ විධියේ ආරක්ෂාවක් ලබා දෙන්න කිසිම පියවරක් අරගෙන තිබෙනවාය කියලා අපට පෙනෙන්නේ නැහැ. ඒ සඳහා තිබෙන හොඳම උදාහරණය තමයි ඊයේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ කලමැටිය වරායේ බෝට්ටු 27ක් ගිනි තැබීමේ සිද්ධිය. පෙරේදා රාත්‍රියේ -ඊයේ උදේ පාන්දර- බෝට්ටු 27කට ගිනි තබා තිබෙනවා. ඒ ධීවර වරාය තුළ කිසිම ආරක්ෂාවක් තිබිලා නැහැ; පොලිස් නිලධාරියෙක් ඉඳලා නැහැ. මේ වනතුරු එම වරාය තුළට විදුලි ආලෝකයවත් නැහැ. බෝට්ටුවලින් ඇවිල්ලා හෝ ISIS ප්‍රහාර එල්ල වෙන්න පුළුවන් කියලා "රෝ" ඔත්තු සේවය කියා තිබෙනවා නම්, මේ වෙද්දීත් අපේ වරායවලට ආරක්ෂාව සපයා නැත්තේ ඇයි කියලා අපට විශාල ගැටලුවක් තිබෙනවා. ඔබතුමන්ලා ඉදිරියටවත් ඒ වරායවලට ආරක්ෂාව සපයනවාද කියලා මම රාජ්‍ය ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි.

විශේෂයෙන්ම කලමැටිය වරාය ගැන කියනවා නම්, එම වරායට මුල් ගල තියන්නේ 2014 වර්ෂයේදීයි. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සියල්ලම සපයලා, අවශ්‍ය මුදල් ගෙනැල්ලා දැනට අවුරුදු 5ක් වෙනවා. නමුත්, තවමත් ඒ වරායේ වැඩ අවසන් කරගන්න බැරිවෙලා තිබෙනවා. ඒක ආණ්ඩුවේ අදක්ෂතාව. 2016 වර්ෂයේ තමයි එහි වැඩ අවසන් වෙන්න නියමිතව තිබුණේ. මෙතුමන්ලාට අද වන තුරුත් එම වරායේ වැඩ අවසන් කරගන්න හැකියාවක් ලැබී නැහැ. අඩුම ගණනේ විදුලියවත් දීලා නැහැ. පවුල් දෙදාහකට වඩා මේ වරායෙන් නඩත්තු වෙනවා. එවැනි පිරිසක් නඩත්තු වෙන මේ වරායට අද වෙනතුරු ආරක්ෂාව ලබා නොදෙන්නේ ඇයි කියන එක ගැන අපට විශාල ගැටලුවක් තිබෙනවා. ඒ බෝට්ටු 27න් පවුල් 83කට වඩා නඩත්තු වුණා. තව මාස ගණනක් යනතුරු ඒ අයට මේ වන්දි මුදල් ලැබෙන එකක් නැහැ. හැකි ඉක්මනින් ඒ වන්දි මුදල් ලබා දෙන්න කියලා අපි රජයෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමන්ලාගේ වරද නිසා, ඔබතුමන්ලා නිසි ආරක්ෂාව ලබා නොදුන් නිසා තමයි ඒ බෝට්ටු ගිනි ගත්තේ. ඒ නිසා හැකි ඉක්මනින් ඒ බෝට්ටු 27ට වන්දි ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා. ධීවරයන් එදිනෙදා මුහුදු ගිහින් කර්මාන්තය කරලා මාළු අල්ලාගෙන ඇවිල්ලා ඒ ලැබෙන මුදලින් තමයි ඔවුන්ගේ පවුල ජීවත් කරවන්නේ. ඒ නිසා වන්දි ලබා දෙනතුරු ඒ ධීවරයාට ජීවත් වෙන්නට, ඒ පවුල්වලට ජීවත් වෙන්නට පුළුවන් විධියට ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් හෝ යම් කිසි ආකාරයක වන්දියක් ලබා දෙන්න කියලා අපි ඉල්ලීමක් කරන්න කැමතියි. මොකද, මෙහි සම්පූර්ණ වරද ආරක්ෂක අමාත්‍යාංශය ඇතුළු මේ රටේ ආරක්ෂාව සපයන සියලු ආයතන විසින් භාරගන්නට ඕනෑ නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය පාස්කු ප්‍රහාරය ගැන විවිධ කථා ප්‍රචාරය වුණා. අපි රාජ්‍ය අමාත්‍යතුමාගෙන් අහන්නට කැමතියි, ISIS සංවිධානය තහනම් කරන්නට මේ වනතුරු ඔබතුමන්ලාට පුළුවන් වුණාද කියලා. අද වෙනතුරු මේ ISIS සංවිධානය තහනම් කරන්නට මේ ආණ්ඩුවට පුළුවන්කමක් ලැබිලා නැහැ. මේ ආණ්ඩුව හැම දාම පනත්වල අඩුපාඩු කියනවා. ඒවායේ අඩුපාඩු පෙන්වීම පමණයි මේ ආණ්ඩුවට කරන්නට පුළුවන්. ඒ හැම දේම "නටන්නට බැරි මිනිහාට පොළොව ඇදයි" කිව්වා වාගේ තමයි.

අවුරුදු තිහක් තිබුණු ලෝකයේ භයානකම ත්‍රස්තවාදී සංවිධානය පරාද කරන්න ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට මේ පනත්වලින් ඉඩ තිබුණා නම්, එදා මැලේෂියාවට ගිහින් "කේපී" ලා අරගෙන එන්න මේ පනත්වලින් ඉඩ තිබුණා නම් ඇයි මේ ආණ්ඩුවට බැරි වෙලා තිබෙන්නේ මේ පනත්වලින් ISIS සංවිධානය තහනම් කරන්න? ආණ්ඩුවට ඒ ගැන වුවමනාවක් නැහැ. මේගොල්ලන් තමයි ත්‍රස්තවාදී සංවිධාන පෝෂණය කරන්නේ. අපට එය පැහැදිලිවම පෙනෙනවා. පත්කර තිබෙන විශේෂ කාරක සභාව දෙස බැලුවාම අපට පෙනෙනවා, වැරදිකාරයා එළියට ගෙනෙනවා වෙනුවට, වැරදිකාරයා නිවැරදිකාරයා කරන තැනක් බවට ඒ විශේෂ කාරක සභාව පත් වෙලා තිබෙන බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ හමුදාපතිවරයා විශේෂ කාරක සභාවට ඇවිත් ප්‍රකාශයක් ඉදිරිපත් කරනවා අපි දැක්කා. හැබැයි, ඊට ස්වල්ප මොහොතකට පස්සේ තිබුණේ රිසාඩ් බදියුදීන් මන්ත්‍රීවරයාගේ ප්‍රකාශය සටහන් කර ගන්නයි. හැබැයි, මෙතුමන්ලා මොකක්ද කළේ? හමුදාපතිවරයාගේ ප්‍රකාශය දුන්නාට පස්සේ දවස් තුනක කාලයක් රිසාඩ් බදියුදීන් මන්ත්‍රීවරයාට දුන්නා ඊට අනුව එතුමාගේ කටඋත්තරය හදා ගන්න; ඊට අනුව එතුමාගේ ප්‍රකාශය හදා ගන්න. මෙහෙම තමයි ඒ අය ශුද්ධ කරන්නේ. රිසාඩ් බදියුදීන්ලා ශුද්ධ කරන්න, මේ ආණ්ඩුවට සම්බන්ධ අමාත්‍යවරු ශුද්ධ කරන්න හදපු තැනක් තමයි මේ විශේෂ කාරක සභාව. අපි දැක්කා, කාදිනල්තුමාට ඒ වාගේම ආගමික නායකයන් සියලුදෙනාට මේ කාරක සභාව පිළිබඳ විශ්වාසයක් නැති බව. මොකද, ඒ තුළින් මේ වෙනකොට නිලධාරීන්ට දඬුවම් දෙන බවක් අපට පෙනෙනවා; නිලධාරීන් නීතිය ඉස්සරහට ගෙනෙන බවක් අපට පෙනෙනවා. හැබැයි, මේ සිද්ධි පිටුපස හිටපු රාජ්‍ය නායකයන්, අමාත්‍යවරු එළියට එන බවක් නම් අපට පෙනෙන්නේ නැහැ.

ඒ ප්‍රහාරයෙන් මේ වෙනකොට ජීවිත 250කට වැඩියෙන් අහිමි වෙලා තිබෙනවා. ඒ ජීවිත නැතිවෙලා මේ රටට වූ හානිය අදටත් අවසාන වෙලා නැහැ. ඒ වාගේම 500කට වඩා තුවාල ලබා තිබෙනවා. මේ වෙනකොට තිබුණු පරීක්ෂණ පිළිබඳව අපට කිසිම විධියකින් සෑහීමකට පත් වෙන්නට බැහැ. මේ ආණ්ඩුව දිගින් දිගටම තමන්ගේ අමාත්‍යවරු ආරක්ෂා කරන බවක් අපට පෙනෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා සහරාන් විනාශ කළේ මේ රටේ සියයට එකයි. සියයට අනූනවයක්ම මේ ආණ්ඩුව විනාශ කරලායි තිබුණේ. සහරාන් බෝම්බ ප්‍රහාරය එල්ල කරනකොට මේ රටේ සියයට අනූනවයක්ම විනාශ කරලායි තිබුණේ. ජාතික ආරක්ෂාව විනාශ කරලායි තිබුණේ. ආර්ථිකය විනාශ කරලායි තිබුණේ. ලංකාවේ අංක එකේ ව්‍යාපාරිකයාගේ සිට කුඩාම ව්‍යාපාරිකයා දක්වා - ඒ සියලු දෙනා- විශාල ප්‍රශ්න රාශියකට, බදු රාශියකට මුහුණ දෙමින් තිබුණේ. හැබැයි, සහරාන්ගේ ප්‍රහාරයෙන් පස්සේ මොකද වුණේ? එදා වන විට පොඩ්ඩක් හෝ නැඟිටිමින් සිටියේ ලංකාවේ සංචාරක ව්‍යාපාරය විතරයි. ඒකත් දැන් ඉවරයි. දැන් ඒකත් සියයට සියයක්ම ඉවරයි. සංචාරක ව්‍යාපාරය විතරයි පොඩ්ඩක් හෝ ඉදිරියට ආවේ. අන්තිමට අද ඒකත් බිමටම කඩා දැම්මා. රටේ ආර්ථිකය විනාශ කළා. එදා දකුණු ආසියාවේ වේගයෙන්ම සංවර්ධනය වෙච්ච රට තමයි ශ්‍රී ලංකාව. හැබැයි අද මොකක්ද වෙලා තිබෙන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)

එදා දකුණු ආසියාවේ වේගයෙන්ම සංවර්ධනය වෙච්ච මේ රට පහළට ගෙනැල්ලා අද දකුණු ආසියාවේ අන්තිම ස්ථානයටම ගෙන එන්න මේ ආණ්ඩුවට හැකියාවක් ලැබුණා. සහරාන්ගේ ප්‍රහාරයට කලිනුත් අවුරුදු 17කට පසුව දකුණු ආසියාවේ සහ ලංකාවේ අඩුම ආර්ථික වර්ධන වේගය වුණේ මේ කියන සියයට 3යි. මේ රටේ ආර්ථික වර්ධනය සියයට 3ක් දක්වා පහළට ගෙනාවේ සහරාන්ගේ ප්‍රහාරයට කලින්. හැබැයි දැන් වන විට මොකක්ද වෙලා තිබෙන්නේ? අද ඒ සැබෑ ප්‍රතිශතය එළියට එන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව බලයට එන්නේ රැකියා දසලක්ෂයක් දෙනවා කියලායි. හැබැයි මොකක්ද වෙලා තිබෙන්නේ? අද මෙතුමන්ලාගේම මහ බැංකු වාර්තාවේ කියනවා, 472,000කට තිබුණු රැකියාත් අහිමි වෙලා තිබෙනවා කියලා. හැබැයි, ඒ 472,000 තුළ, සහරාන්ගේ ප්‍රහාරයෙන් පසුව හෝටල්වලින් ඉවත් කළ සේවකයන් නැහැ. රටේ සංචාරක ව්‍යාපාරයත් එක්ක එකතු වෙලා සිටි තවත් ලක්ෂ දෙකක් තුනක් පමණ වූ කණ්ඩායමටත් අද රැකියා අහිමි වෙලා තිබෙනවා. එතකොට ඒ 472,000ට තවත් ලක්ෂ තුනක් විතර එකතු වෙලා අද 772,000ක් පාරේ ඉන්නවා, රැකියා නැතිව. ඒ නිසා තමයි අද රටේ

[ගරු ඩී.වී. චානක මහතා]

ආර්ථිකය ඉතාම බරපතළ තත්ත්වයක තිබෙන්නේ. අද ඒ තරුණයන්ට කරන්න දෙයක් නැහැ. 772,000ක් වූ ඒ පිරිස තමන්ගේ ජීවිත ගෙන යන්නේ කොහොමද? ඒ අයගේ පවුල්වලට මොකක්ද වෙන්නේ? අද මෙතුමන්ලා ඒ අයට වන්දි ලබා දෙනවා ද? හරි නම්, සංචාරක ව්‍යාපාරය තුළ හිටපු රැකියාවලින් අයින් කරපු ඒ සේවකයන්ටත් මෙතුමන්ලා වන්දි ලබා දෙන්න ඕනෑ. මොකද, බුද්ධි අංශ වාර්තා තියෙද්දි තමයි ඒ ප්‍රහාරය එල්ල වුණේ. හැබැයි අද වන විට එයින් දුක් විඳින්නේ අපේ ගමේ නංගිලා මල්ලිලායි. අද ඒවාට ආණ්ඩුවෙන් විසඳුම් නැහැ. ඒ වෙනුවට අපි මාධ්‍ය සංදර්ශන දකිනවා. එක් පැත්තකින් විශේෂ කාරක සභාවේ කණ්ඩායමක් ඇවිල්ලා මාධ්‍ය සංදර්ශන පවත්වනවා. අරලියගහ මන්දිරයේ හොඳට train කරලා මෙතැනට ගෙනැල්ලා මාධ්‍ය සංදර්ශන පවත්වනවා මිස ඊට වඩා දෙයක් අපට පෙනෙන්නේ නැහැ. හැබැයි, අපි මේ ආණ්ඩුවෙන් ඉල්ලන්න කැමැතියි, රටේ ආරක්ෂාව ගැන මීට වඩා හිතන්න කියලා; රටේ ආර්ථිකය ගැන මීට වඩා හිතන්න කියලා. මීට අවුරුදු 4කට කලින් මේ රට තිබුණු තැනට ගෙන එන්න ඉතාම අමාරු තත්ත්වයක් ඇති වෙලායි තිබෙන්නේ. ඒ නිසා මේ ආර්ථිකයයි, මේ රටේ ආරක්ෂාවයි විනාශ කරන්නේ නැතිව, ඔබතුමන්ලාට බැරි නම් ඉල්ලා අස් වෙන්න කියලා මා ඉල්ලා සිටිනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු මහින්ද අමරවීර මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා.3.21]

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හදිසි නීතිය පිළිබඳ විවාදය පවත්වන මේ අවස්ථාවේ ප්‍රථමයෙන්ම කිව යුතු කරුණක් තිබෙනවා. මා අද මුලින්ම -දවස ආරම්භයේදීම- ප්‍රශ්නයක් මතු කළා. ඒ ප්‍රශ්නයෙන් කියැවුණා වාගේම හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳ යෝජනාව ඉදිරිපත් කරන්න පාර්ලිමේන්තුවේ වග කිව යුතු කිසිම අමාත්‍යවරයෙක් ඒ වෙලාවේ ඉදිරිපත් වුණේ නැහැ. දැන් නම් ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා මේ ගරු සභාවේ ඉන්නවා. අවම වශයෙන් කැබිනට් මණ්ඩලයේ සාමාජිකයකු වත් ඒ යෝජනාව ඉදිරිපත් කළ යුතුව තිබුණා. ඒ කටයුත්ත වත් සිද්ධ වුණේ නැහැ. ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමනි, දැන් මේ කථා අසාගෙන ඉන්නේත් ඔබතුමාත්, තවත් රාජ්‍ය ඇමතිවරු දෙදෙනෙකුත් විතරයි. ඉතින් අද මෙයින්ම පෙනෙනවා, ආණ්ඩුව මේ හදිසි නීති විවාදය පිළිබඳව, රටේ ආරක්ෂාව පිළිබඳව කොච්චර සැලකිලිමත් වෙනවාද කියලා. මා දන්නේ නැහැ, අමාත්‍යවරුන් කොහේද ඉන්නේ කියලා. පළමුවෙන්ම අපට කියන්න, ඒ අය ලංකාවේ ඉන්නවා ද පිට රටවල ඉන්නවා ද කියලා. පාර්ලිමේන්තුවේදි ප්‍රශ්නයක් ඇහුවාම උත්තර දෙන්න කෙනෙක් නැහැ. සමෘද්ධිය තුළ සිදු වන රුපියල් ලක්ෂ 4,000ක පමණ විනාශය පිළිබඳව ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයක් ඇහුවා. ඊට පෙරත් ප්‍රශ්න ගණනාවක් ඇහුවා. ඒවාට උත්තර දෙන්න කවුරුවත් නැහැ. සමෘද්ධි ඇමතිවරයා සොයා ගන්නත් නැහැ. ඒකට අංජනම් අරින්න වෙලා තිබෙනවා. අඩු ගණනේ වගකිවයුතු අමාත්‍යවරයෙක් වත් ඒ වෙනුවෙන් උත්තරයක් දෙන්න එන්නේ නැහැ. මා දන්නේ නැහැ මේ තරම් පාර්ලිමේන්තුව අරාජික වෙච්ච අවස්ථාවක් ගැන. මෙවැනි අවස්ථාවක් මට නම් දකින්න ලැබුණේ නැහැ. මාත් 1994 වර්ෂයේ ඉඳලා පාර්ලිමේන්තුවේ ඉන්නවා. පාර්ලිමේන්තුව මේ තරම් හැල්ලුවට අරගෙන කටයුතු කරපු කාලයක් මට නම් දකින්න ලැබුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපට ප්‍රශ්නයක් තිබෙනවා. අද අපට කියනවා, "රට ආරක්ෂිතයි" කියලා. මාත් දන්නා විධියට ආරක්ෂක අංශ කියනවා, "රට ආරක්ෂිතයි, නැවත එවන් ප්‍රහාරයක් එල්ල වීමේ අවදානමක් නැහැ" කියලා. නමුත්, ඔය පැත්තේ ඉන්න තවත් ආරක්ෂක විශේෂඥයෙක් කියනවා, "මෙය අවසන් කර ගන්න තවත් අවුරුදු 3ක් යනවා" කියලා. එහෙම නම්, මේ රටේ මිනිසුන් කවුරුන් ද විශ්වාස කරන්නේ? මේ රටේ මිනිසුන් කවුරු ගැන විශ්වාස කරලා ද වැඩ කරන්නේ? අපි ඒ කාරණය දෙස බලන්න ඕනෑ. විවිධ අය විවිධ දේවල් කියනවා. සමහරුන්ට ඕනෑකම තිබෙනවා, මේ අස්සේ ඇමතිකමක් අරගෙන තමුන් මෙම කටයුත්ත ඉවර කළාය කියන්න. මේ රටේ ජාතික ප්‍රශ්නයක් හැල්ලුවට සලකන්න ඕනෑ කාරණයක් නොවෙයි. මේක දේශපාලන පක්ෂයක් බදාගෙන කටයුතු කරන්න ඕනෑ අවස්ථාවක් නොවෙයි. යම් සිදුවීමක් වුණා. ඒ සිදුවීමේ වැරැද්ද අපි සියලුදෙනා භාර ගන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවැරු 225 දෙනාගෙන් එක සාමාජිකයකු විධියට මම මේ වැරැද්ද භාර ගන්නවා. මෙතැන අඩුපාඩුවක් වෙලා තිබෙනවා. දේශපාලන වශයෙන් අඩුපාඩු වෙලා තිබෙනවා. නිලධාරින්ගේ පැත්තෙන් අඩුපාඩු වෙලා තිබෙනවා. හැබැයි, ඒවා ගැන කථා කර කර, ඒවා ගැන විවාද තිය තියා ඉන්න එක නොවෙයි කළ යුත්තේ. ඒවා ගැන කථා කරන්න ඕනෑ. ඒවා විවාද කරන්න ඕනෑ. නමුත් ඊට වඩා එහාට ගිහිල්ලා ඉදිරි කාලය තුළදී මේ වාගේ තත්ත්වයක් ඇති නොවෙන මට්ටමට වගබලා ගැනීමේ වගකීම පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225 දෙනාටම තිබෙනවාය කියන එක මම පැහැදිලිව සඳහන් කරන්න කැමතියි.

අද තිබෙන ආරක්ෂාව පිළිබඳව කියන්න ඕනෑ. දැන් ප්‍රශ්නයෙන් සියයට 99ක් ඉවරයි, සියයට සියයක් ඉවරයි කියලා ප්‍රකාශ නිකුත් වෙනවා. ඒ වුණාට, අද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට පාර්ලිමේන්තුව ඇතුළට එන්න බැහැ, වාහනය පරීක්ෂා කරන්න බොහෝ වෙලාවක් ගන්නවා. මම මේ ගැන පක්ෂ නායක රැස්වීමේදීත් කිව්වා. එතැනදී ඒ නිලධාරින් අපට දුන්න උත්තරය තමයි, "ආරක්ෂක අංශ තවදුරටත් ඒ පරීක්ෂණය කරන්න කියනවා" ය එක. අපි ඒ කාරණය තවදුරටත් හැල්ලු කරන්නේ නැහැ. එහෙම නම් මෙතැන මොනවා හෝ තවත් ප්‍රශ්නයක් තිබෙනවාද? ඒ ත්‍රස්ත ක්‍රියාව අවසන් කළාය කියලා තවමත් නිලධාරින්ට විශ්වාසයක් නැද්ද? ඒ නිසා නිකම් විවිධ ප්‍රකාශ කරන්නේ නැතිව, එක මතයකට ඇවිල්ලා කවුරු හෝ මේ පිළිබඳ අදහස් දැක්වීම වැදගත් වෙනවා. ආරක්ෂක රාජ්‍ය ඇමතිතුමා මෙතැන ඉන්නවා. අපි එතුමාගෙන් බලාපොරොත්තු වෙනවා යථා තත්ත්වය මොකක්ද කියලා මේ පාර්ලිමේන්තුව තුළදී රටේ ජනතාව දැනුවත් කරයි කියලා.

අප්‍රේල් 21 වෙනි දා බෝම්බ පිපිරුවාට පස්සේ මේ රටම ආපස්සට ගියා. කොහොමටත් රට ආපස්සට යමින් තමයි තිබුණේ. පසුගිය කාලය පුරාම -මම කියන්නේ නැහැ, මේ ආණ්ඩුව විතරක් කියලා. මේ ආණ්ඩු කාලයේදී විතරක් නොවෙයි, පසුගිය අවුරුදු 71 තිස්සේම- සිදු වෙලා තිබෙන්නේ රට ආපස්සට ගිය එකයි. අපේ රට එහෙන් මෙහෙන් දියුණු වුණා කියලා පෙන්වන්න පුළුවන්. ඒ සඳහා කරපු සංවර්ධන වැඩ පෙන්වන්න පුළුවන්. දැනුත් සංවර්ධන කටයුතු කරගෙන යනවා. හැබැයි, ඒවායෙන් රටක් විධියට ඉස්සරහට ගියා කියලා අපට සතුටු වෙන්න පුළුවන්කමක් නැහැ. මොකද, අද රාජ්‍ය ආදායම අවසාන වෙනවා ණයයි, පොලියයි ගෙවනකොට. ඉතාම සොච්චම් මුදලක් තමයි අපට ඉතිරි වෙලා තිබෙන්නේ. ඒ ටිකට මොකද කරන්න හදන්නේ? ඊළඟ මාසයේ පඩි ගෙවා ගන්නත් බැරිව ඉන්න රජය දැනුත් සූදානම් වෙන්නේ තවත් මුදල් නාස්තියක් කරගෙන

යන්නයි. මට පෙනෙන විධියට ඒ නාස්තිය හැම පැත්තෙන්ම තිබෙනවා. මම මේ පාර්ලිමේන්තුවේ හෙළිදරව් කළා රුපියල් ලක්ෂ 4,000ක් විතර වැය වන සමෘද්ධි ප්‍රචාරක වියදම ගැන. මේ වෙලාවේ තවත් අමාත්‍යාංශ ගණනාවක් ප්‍රතිරූප හදන්න, තමන් පිම්බෙන්න, එහෙම නැත්නම් ආණ්ඩුව ආරක්ෂා කරන්න කියලා කරන්නේ මොකක්ද? කරන්නේ ප්‍රචාරණ වැඩ. නමුත් පත්තරවල දැන්වීම් දාලා, රූපවාහිනියේ දැන්වීම් දාලා ඒක කර ගන්න පුළුවන්කමක් නැහැ. ඒ වෙනුවට වැඩ කරලා පෙන්වන්න. ආදර්ශවත් වෙන්න. නාස්තිය නැති කරන්න. රටේ මිනිස්සු අමාරුවෙන් ඉන්නේ. මිනිස්සුන්ට ජීවත් වෙන්න සුදුසු පරිසරයක් නැහැ. මිනිස්සු අපේක්ෂා භංගත්වයට පත් වෙලා තිබෙනවා. එවන් අවස්ථාවක මේ විධියට ප්‍රචාරය කරලා -රූපවාහිනියේ දැන්වීම් දාලා, පත්තරවල දැන්වීම් දාලා- මේ තිබෙන අප්‍රසාදය නවත්වන්න පුළුවන්කමක් නැහැ. නායකයන් ආදර්ශවත්ව ඉඳලා පෙන්වන්න ඕනෑ.

ඒ අස්සේ තව තව ඩීල් යනවා. කොහොමද තිබෙන ඒවා විකුණා ගන්නේ, කොහොමද ඒකෙන් කොමිස් එකක් ගහ ගන්නේ, කොහොමද යටි මඩි ගහ ගන්නේ කියලා බලන අවස්ථා තිබෙනවා. නියෝජ්‍ය අමාත්‍ය රන්ජන් රාමනායක මැතිතුමා බොහෝ දේවල් හෙළිදරව් කරනවා. කවුරු කොහොම කිව්වත් ඒ පිළිබඳව මගේ තිබෙන්නේ ප්‍රසාදයක්. ආණ්ඩුවේ ඉඳගෙන ආණ්ඩුවේ වැරදි යම් ප්‍රමාණයක් හෙළිදරව් කරන්න එතුමාට කොන්දක් තිබෙනවා. එතුමාගේ ප්‍රමාණය අනුව, එතුමාට පුළුවන් ආකාරයට හෙළිදරව් කිරීමක් කරනවා. නමුත්, ඔබතුමාට හොයා ගන්න බැරි ගොඩක් දේවල් ගැන අපි හෙළිදරව් කරලා තිබෙනවා. අවශ්‍ය නම් අපි තවත් තොරතුරු දෙන්නම්. ඔබතුමා ඒ කටයුත්ත කරන්න. අපි ඒ කාලයේ -1994 වර්ෂයේ- පාර්ලිමේන්තුවේ සිටියදීත් මේ ආකාරයටම කටයුතු කළා. අපි "මල්බෙරි කණ්ඩායම" කියලා කණ්ඩායමක් සකස් කරගෙන, ඒ ආණ්ඩුවේ ඇමතිවරුන්ගේ වංචා, දූෂණ හොයා දුන්නා. එදා දැන් වාගේ මහා පරිමාණයෙන් ඒවා තිබුණේ නැහැ. පොඩියට පොඩියට වංචා, දූෂණ කටයුතු කරගෙන යනකොට අපි ඒවා හොයලා දුන්නා විතරක් නොවෙයි, ඒවා නවත්වා ගත්තා. අපි සමහර ඇමතිවරුන්ගේ වැය ශීර්ෂ වර්ජනය කළා. අපි ඒවාට කථා කළේ නැහැ; ඡන්ද පාවිච්චි කළේ නැහැ. අපි ඒවා මාධ්‍යවලටත් කිව්වා; රටටත් කිව්වා. ඒ නිසා අපට ඒවායේ පාලනයක් ඇති කර ගන්න පුළුවන් වුණා. නමුත් අද නායකයන්ට එහෙම වුවමනාවක් තිබෙනවාද කියන ප්‍රශ්නය තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳව අනිවාර්යයෙන්ම විශේෂ අවධානය යොමු කරන්න. එහෙම නැත්නම් අපේ රට මේ තිබෙන තත්ත්වයෙන් ඉස්සරහට ගෙන යන්න බැහැ. කොහොමත් අපේ රට බංකොළොත් වෙවී තමයි ගියේ. ඒ බංකොළොත් වෙමින් යන වෙලාවක තමයි මේ බෝම්බ පිපිරුවේ. දැන් ඒ බෝම්බ පිපිරීමත් එක්ක රට තවත් විනාශ මුඛයට යනවා. අද රටට විදේශ ආයෝජන එන්නේ නැහැ.

අද share market එක සම්පූර්ණයෙන් බැහැලා. ඒවායේ ගනුදෙනු සිද්ධ වෙන්නේ නැහැ. කොටස් වෙළෙඳ පොළ අද අඩපණ වෙලා. රට තුළ ආයෝජන ඇති කිරීමට ජාත්‍යන්තරයට විශ්වාසයක් ගොඩ නැඟිලා නැහැ. සංචාරක ව්‍යාපාරය සම්පූර්ණයෙන් ඇන හිටලා, බිඳ වැටිලා. සංචාරක ක්ෂේත්‍රයට සහන package එකක් ලබා දෙනවා කියලා මුදල් ඇමතිතුමා කිව්වා. සංචාරක ක්ෂේත්‍රය වෙනුවෙන් කියලා හෝටල් ටිකට සල්ලි ටිකක් දීලා හෝ සහන දීලා හරියන්නේ නැහැ. ණය ගෙවීම කල් දමලා විතරක් හරියන්නේත් නැහැ. සංචාරක ව්‍යාපාරයෙන් යැපෙන කොපමණ පිරිසක් ඉන්නවාද? ණයක් අරගෙන පොඩි පොඩි ගෙවල්වල කාමරයක් දියුණු කරලා homestay කියලා හදාගෙන කටයුතු කරගෙන ගිය අය හිටියා. දැන් ඒ මිනිසුන්ට කොහෙන්ද ආදායමක් ලැබෙන්නේ? දැන් ඒ අයට ණය වාරිකය ගෙවා ගන්නත් බැරි වෙනවා.

ඒ වාගේම සංචාරක මඟ පෙන්වන්නන් හිටියා. ඒ මාර්ගයෙන් දහස් ගණනක් ජීවත් වුණා. හෝටල්වල වැඩ කරන සේවකයන්ට දෙන්නේත් සොච්චම් පඩියක්. ඒ ගොල්ලන්ට සියයට 10ක සේවා ගාස්තුවක් - service charge - ලැබෙනවා. ඒක ඒ ගොල්ලන්ගේ පඩියට එකතු වෙනවා. සංචාරකයන් ඇවිත් කාලා, බීලා කීයක් හෝ දීලා යන එකෙන් තමයි ඒ ගොල්ලන් නඩත්තු වුණේ. දැන් ඒකත් සම්පූර්ණයෙන් ඇන හිටලා තිබෙනවා. ඒ වාගේම, සංචාරක ක්ෂේත්‍රයට අදාළව ප්‍රවාහන කටයුතු කරපු අය අද අන්ත අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ අය පිළිබඳව වැඩ පිළිවෙළක් නැහැ.

මම උදාහරණයක් කියන්නම්. තිස්සමහාරාමයේ, යාල ජාතික ජාතික වනෝද්‍යානයට ජීප් රථ 400කින් පමණ සංචාරකයන් ගෙනිච්චා. දැන් ඒ ගොල්ලන් ඒ වාහන නිකම් නවත්වාගෙන ඉන්නවා. ඒ මිනිසුන්ට කිසිම ආදායම් මාර්ගයක් නැහැ. ඒ මිනිසුන්ට ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් නැහැ. මේවා පිළිබඳව රජයෙන් බලන විධියක් පෙනෙන්නත් නැහැ. ඒ පිළිබඳව රජය අවධානය යොමු කරන්න ඕනෑ. සල්ලි නාස්ති කරන එක නවත්වලා, ඒ මිනිසුන්ට යම් සහනයක් ලබා දීම තමයි වෙන්න ඕනෑ කියලා මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි.

අපි විපක්ෂයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරනවා. අපි මේ ප්‍රශ්නය පිළිබඳව හරි අවබෝධයකින් කටයුතු කරනවා. අපි ආණ්ඩුවට බොරුවට චෝදනා කර කර, හැම දෙයම විවේචනය කර කර ඉන්නේ නැහැ. අපි හොඳ යෝජනාවලට ආණ්ඩුවට උදවු කරන්න සූදානම්. හොඳ වැඩසටහන්වලට අපි උදවු කරනවා. ආණ්ඩුව ගෙනෙන හොඳ යෝජනාවලට විරුද්ධ වෙන්නවත්, රට වෙනුවෙන් ගන්න තීන්දුවලට විරුද්ධ වෙන්නවත් අපට අවශ්‍ය නැහැ. නාස්තියට, දූෂණයට, වංචාවට හා රටට එරෙහි ගිවිසුම් අත්සන් කරනවාට, රාජ්‍ය දේපොළ විකුණා දැමීමට තමයි අපි විරුද්ධ වෙන්නේ.

බෝම්බ පුපුරලා දවස් දෙකක් ඇතුළත අපේ කණ්ඩායම රැස් වෙලා "එක රටක්, එක නීතියක්" කියලා වැඩසටහනක් හැදුවා. ඔබතුමන්ලා ඒ ගැන දන්නවා නේ. අපි විශේෂඥ සහයෝගය අරගෙන "one country, one law" කියලා මේ රට තුළ එක නීති පද්ධතියක් සකස් කිරීමට සියලු දේශපාලන පක්ෂ නායකයන් මුණ ගැහිලා, ආගමික නායකයන් මුණ ගැහිලා විශාල වැඩ පිළිවෙළක් සකස් කළා. මම ඒ කටයුත්තේ දී මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225දෙනාටම අපේ ගෞරවය හිමි කරනවා. ඒකට අකුල් හෙළන්නේ නැතිව සියලුදෙනා සහයෝගය ලබා දුන්නා. දැන් ඒ කාර්යයේ සැලකිය යුතු කොටසක් අවසන් වෙලා තිබෙනවා. ඉදිරි මාස දෙක ඇතුළත මේ රටට අවශ්‍ය නීති පද්ධතිය සකස් කරලා දෙන්න අපි සූදානමින් සිටින බව ඔබතුමාට සඳහන් කරන්න කැමැතියි. දැන් මේ ගැටුම ඇති වුණා. නැවත ගැටුමක් ඇති නොවීමට අපි කටයුතු කරන්න ඕනෑ. දෙමළ-මුස්ලිම් අරගලයක් වෙන්න පුළුවන්, දෙමළ-සිංහල අරගලයක් වෙන්න පුළුවන්, මුස්ලිම්-සිංහල අරගලයක් වෙන්න පුළුවන්, ඒ කිසිම අරගලයක් ඇති නොවන ආකාරයට, එක රටක් තුළ සියලුදෙනාට සමාන අයිතිවාසිකම් ලැබෙන විධියට, ඒ වාගේම එකම නීතියක් යටතට සියලුදෙනා එන විධියේ වැඩ පිළිවෙළකට අපි යන්න ඕනෑ. අපි ඒ වැඩ පිළිවෙළ දිහා තමයි -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

අපි ඒ වැඩ පිළිවෙළ වෙනුවෙන් තමයි මහන්සි වෙන්නේ. අද මේ රටේ සිංහල අය උඩරට නීතිය කියලා වෙනම නීතියක් හදාගෙන තිබෙනවා. උතුරු ප්‍රදේශයේ දෙමළ අයට තේසවලාමේ නීතිය කියලා එකක් තිබෙනවා. මුස්ලිම් අයට වකුෆ් නීතිය තිබෙනවා. එහෙම නැත්නම් වෙනම මුස්ලිම් නීති පද්ධතියක් තිබෙනවා. එක රටක මේවාගේ විවිධ නීති මොකද? රටක් තුළ එකම නීති පද්ධතියක් ඇති වුණාම, සමාන බවක් ඇති වෙනවා. එතකොට සහයෝගයෙන් කටයුතු කරන්න පටන් ගන්නවා. අතීතයේ එහෙම තත්ත්වයන් තිබුණා. සිංහල-දෙමළ මිනිසුන් එකට හිටියා. දැන් එන්න එන්න ඒ තත්ත්වයේ විරසක වීමක්, වෙන් වීමක් ඇති වෙනවා. මේ තත්ත්වය නැති වෙන්න ඕනෑ. මෙය පටන් ගත්තේ අපේ අධ්‍යාපන ක්‍රමය, ඒ වාගේම දේශපාලනඥයන් නිසා කියලායි මම නම් කියන්නේ. ජාතීන් නමින්, ආගම් නමින්, පළාත් නමින් දේශපාලන පක්ෂ පටන් ගත්තා. එතැනදී අපට වැරදුණා. අපි මේ තත්ත්වය නවත්වන්න ඕනෑ. පළමුවෙන්ම, අලුතින් පක්ෂ ලියා පදිංචි කරන එක නවත්වන්න ඕනෑ. මම මැතිවරණ කොමසාරිස්වරයා හමු වුණු වේලාවේ මේ ගැන අදහස් ඉදිරිපත් කළා. ඊළඟට, අපි ඒ පක්ෂවලට යෝජනා කරන්න ඕනෑ මේ නම් වෙනස් කර ගන්න කියලා. ඒවා කාටත් විවෘත වෙන්න ඕනෑ. ඒ වාගේම අපි පාසල් පද්ධතිය සකස් කරන්න ඕනෑ.

මම වීරකුමාර දිසානායක මන්ත්‍රීතුමාගේ කාලයෙන් විනාඩි දෙක, තුනක් ගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කුඩා කාලයේ පාසල් යනකොටම බෙදීම් ඇති කරගත්තා. දැන් බෞද්ධ විද්‍යාල, හිංදු විද්‍යාල, කතෝලික විද්‍යාල, ඉස්ලාම් විද්‍යාල තිබෙනවා. විවිධ විධියට පාසල් නම් කරගෙන තිබෙනවා. මීට අවුරුදු කීපයකට පෙර මෙවැනි තත්ත්වයක් තිබුණේ නැහැ. අපි ගිය පාසල්වලට මුස්ලිම් ළමයි ආවා. රාමසාන්වලට අපි ඒ අයගේ ගෙවල්වල ගියා. ඒ අය සිංහල අවුරුද්දට අපේ ගෙවල්වලට ආවා. පසුගිය කාලයේ ඒ වාගේ දේවල් දකින්නට තිබුණේ නැහැ. මේ විධියට වෙන් කර ගැනීම් වුණා. මේ වෙන් වීම තමයි පසුගිය කාලයේම අපට දකින්නට ලැබුණේ. ඒ වෙන්වීම, එකතුවීම දක්වා ගෙනෙන්න නම් අපි මේ තත්ත්වය වෙනස් කරන්නට ඕනෑ. පාසල්වල නම් වෙනස් කරන එක විතරක් නොවෙයි, ඕනෑම කෙනෙකුට ඒ පාසල්වල අධ්‍යාපනය ලබා ගන්නත් අවස්ථාව ලබා දෙන්නට ඕනෑ. එතකොට දරුවන් ඒ තත්ත්වයට පත් වේවි.

ඒ වාගේම, අමාත්‍යාංශ බෙදලා තිබෙන ආකාරය ගැන බලන්න. බෞද්ධ කටයුතු අමාත්‍යාංශය, බුද්ධ ශාසන අමාත්‍යාංශය, හිංදු ආගමික කටයුතු අමාත්‍යාංශය, මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය, ක්‍රිස්තියානි කටයුතු අමාත්‍යාංශය යනුවෙන් වෙන් කරගෙන තිබෙනවා. එහෙම අවශ්‍යතාවක් නැහැ, ඒ සියල්ලට අමාත්‍යාංශයක් ඇති. අපි යෝජනා කරලා තිබෙනවා, ආගමික කටයුතු කියලා අමාත්‍යාංශයක් හදලා ඒක ජනාධිපතිතුමාගේ යටතේ තියා ගන්න කියලා. ඒක රාජ්‍ය නායකයා යටතේ තියා ගන්න කියලා. සමහරවිට අග්‍රාමාත්‍යවරයා යටතේ වෙන්නත් පුළුවන්.

මේ වෙලාවේ බලය සම්බන්ධයෙන් කථා වෙනවා, ඉදිරියේ දී ජනාධිපති ක්‍රමය ඕනෑද නැද්ද කියන එක ගැන කථා වෙනවා. මේවා සම්බන්ධව තීන්දු ගන්න කාලය දැන් ඇවිල්ලායි තිබෙන්නේ. හැම දාම මගේ ස්ථාවරය වුණේ මේ රටේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරලා පාර්ලිමේන්තුවට බලය එන්න ඕනෑය කියන එකයි. ඒක තමයි වෙන්නට ඕනෑ. විධායක ජනාධිපති ක්‍රමය තුළින් මේ රටට යහපතක් වුණාය කියලා මම නම් දකින්නේ නැහැ. සමහර විට කියන්න පුළුවන්, යුද්ධය නතර කර ගත්තේ විධායක ජනාධිපති ක්‍රමය නිසාය කියලා. හැබැයි යුද්ධය පටන් ගත්තේත්, වැඩි වර්ධනය වුණේත් මේ විධායක ජනාධිපති ක්‍රමය තිබෙන වෙලාවකයි. ඒ නිසා, දැන් කොහොමවත් යුද්ධයක් නැති රටක අපට එහෙම අවශ්‍යතාවක් නැහැ. හැබැයි, මැතිවරණ ක්‍රමයේ ගැටලුවක් තිබෙනවා. මේවා පිළිබඳව පුළුල්ව සාකච්ඡා කරලා තීන්දු ගන්න කාලය ඇවිල්ලා තිබෙනවාය කියන එකත් සඳහන් කරන්නට කැමැතියි. මම මීට වැඩිය යමක් කථා කරන්නට බලාපොරොත්තු වෙන්නේ නැහැ.

හදිසි නීතිය තවදුරටත් දීර්ඝ කිරීම සඳහා අපේ සහයෝගය ලබා දෙනවා. මේක තමයි හදිසි නීතිය දීර්ඝ කිරීමේ අවසාන විවාදය කියලා මා විශ්වාස කරනවා. මේ මාසයෙන් පසුව නැවත හදිසි නීති විවාදයක් අවශ්‍ය වෙන්නේ නැහැයි කියන අදහස අප තුළ තිබෙනවා. ඒ තත්ත්වයට මේ රට පත් කරන්න ආරක්ෂක අංශවල සියලුදෙනාට අවශ්‍ය ශක්තිය ලැබෙන්න කියලා අපි ප්‍රාර්ථනා කරනව අවසාන වශයෙන් මම තව එක කාරණයක් කියන්නට ඕනෑ. අර, විශේෂ කාරක සභාවේ පාර්ලිමේන්තු රංගනයෙන් මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. ඒක රංගනයක් විතරයි. එතැන සිද්ධවන දෙයක් නැහැ; ඒකෙන් කිසිම ප්‍රතිඵලයක් ලැබෙන්නේ නැහැ. මේ රටේ ආරක්ෂාව සම්බන්ධයෙන් කිසිම වැදගත්කමක් ඇති දෙයක් එතැනින් සිදු වන්නේ නැහැ, රූපවාහිනී කැමරා ඉදිරියේ කරන මේ රංගනයෙන්. ප්‍රශ්නයක් පිළිබඳව සොයනවා නම් ඒක වෙනම සොයන්නට ඕනෑ, පාර්ලිමේන්තුවේ ගෞරවය ආරක්ෂා වෙන විධියට. ආරක්ෂක අංශ නිලධාරීන්, බුද්ධි අංශ නිලධාරීන් රූපවාහිනී කැමරා ඉදිරියට ගෙනැල්ලා තොරතුරු හෙළිදරවු කිරීමේ වැදගත්කම මොකක්ද? අනෙක් කාරණය, මේ කාරක සභාවේ ප්‍රශ්න අහන්නේ කවුද? විත්තිකාරයන් නඩුකාරයන් වෙලා ප්‍රශ්න අහනවා. ඒ හැමෝම වාගේ චෝදනා එල්ල වුණු අය. ඒ අයගේ චෝදනා විභාග කරන නිලධාරීන්ගෙන් තමයි ප්‍රශ්න අහන්නේ. කොයිතරම් දුරට ඒක සාධාරණද? පහළ ඉන්න ඕනෑ විත්තිකරුවන් ටික තමයි අද bench එකේ ඉන්නේ. අද විත්තිකාරුවන් bench එකට ඇවිල්ලා ඉන්නවා. ඒ නිසා ඒකෙන් කිසිම සාධාරණයක් බලාපොරොත්තු වෙන්න බැහැ. එම නිසා මේ විශේෂ කාරක සභාවෙන් කිසිම ප්‍රතිඵලයක් නැහැ. එම රංගනය පැත්තක තියලා රට වෙනුවෙන් වැඩ කරන්න කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු වී. රාධාක්‍රිෂ්ණන් මැතිතුමා. ඔබතුමාට විනාඩි 8ක් තිබෙනවා.

ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු කංචන විජේසේකර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු කංචන විජේසේකර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු විජිත බේරුගොඩ මහතා**
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු තාරක බාලසූරිය මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්,* ගරු කංචන විජේසේකර මහතා *මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு தாரக்க பாலசூரிய அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கஞ்சன விஜேசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. THARAKA BALASURIYA *left the Chair, and* THE HON. KANCHANA WIJESEKERA *took the Chair.*

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා (විශේෂ ප්‍රදේශ සංවර්ධන කැබිනට් නොවන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன் - விசேட பிரதேசங்கள் அபிவிருத்தி அமைச்சரவை அந்தஸ்தற்ற அமைச்சர்)
(The Hon.(Dr.) V. Radhakrishnan - Non Cabinet Minister of Development of Special Areas)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ගරු මහින්ද අමරවීර මැතිතුමා කියපු පරිදි ලබන මාසයේ මහජන ආරක්ෂක ආඥාපනත යටතේ වන යෝජනාව මේ ගරු සභාවට ගෙනෙන්න ඕනෑ නැහැ. මේක මෙතැනින් අවසන් කරන්නට ඕනෑ. මේ මාසයෙන් පසුව මේක අවසන් වෙන්න ඕනෑය කියලා අපිත් බලාපොරොත්තු වෙනවා. මොකද, අපේ රටේ එක ප්‍රශ්නයක් තිබිය දී මේ නිසා තවත් ප්‍රශ්නයක් ඇතිවෙයි කියලා අපි හිතනවා. එම නිසා හදිසි නීතිය දීර්ඝ කර ගැනීම මෙතැනින් පසුව අවසන් වෙන්න ඕනෑය කියලා මා බලාපොරොත්තු වෙනවා.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த அவரசகாலச் சட்டம் இந்த நாட்டினுடைய பொருளாதாரத்தை, அதனுடைய அபிவிருத்தியை மிகவும் பாதிக்கின்ற ஒரு சட்டமாகவே இருந்துவருவதை நாங்கள் அவதானிக்கக் கூடியதாக இருக்கின்றது. இருந்தாலும், இந்தக் காலச் சூழ்நிலை காரணமாக இவ்வாறான ஒரு சட்டம் அமுல் செய்யப்படுவதை நாங்கள் யாரும் மறுக்கவும் முடியாது. இதன் காரணமாக - *[இடையீடு]*

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශය පවත්වාගෙන යෑමට පහසුකම් මොනවත් තවම හම්බ වුණේ නැහැ නේද? ඔබතුමා වාගේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරයකුට, - [බාධා කිරීමක්]

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)

හම්බ වෙලා තිබෙනවා. අපි ඒ ගැන පසුව කථා කරමු.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

සමාවෙන්න, ඇමතිතුමනි. ඇත්තටම ඔබතුමාගේ අමාත්‍යාංශයට ගොඩනැඟිලි මොකුත් දීලා තිබෙනවාද?

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)

ඔව්. Red Cross එකෙන් දීලා තිබෙනවා. [බාධා කිරීමක්] හොඳයි. Thank you.

அப்போதைய காலப்பகுதியில் அவசரகாலச் சட்டமானது, மலையக இளைஞர், யுவதிகளுக்குப் பெரும் பாதிப்பை ஏற்படுத்தியது என்பது எல்லோருக்கும் தெரிந்த விடயம். தற்போது, பிரகடனப்படுத்தப்பட்டுள்ள அவசரகாலச் சட்டத்தினூடாக மலையக இளைஞர், யுவதிகளுக்கு அதேபோன்றதான ஒரு நிலைமை ஏற்படுவதற்கான வாய்ப்பு இல்லையெனினும், ஆளடையாளப்படுத்தக்கூடிய முக்கிய ஆவணங்கள் அவர்கள் வசம் இல்லாமையினாலும், குற்றமற்றவர்களாக இருந்தும் ஏற்கெனவே அவசரகாலச் சட்டத்தினூடாகப் பாதிக்கப்பட்டவர்களாக உள்ளமை யினாலும், இன்று அவர்களில் கொழும்பு போன்ற பிரதான நகரங்களிலே தொழில்வாய்ப்புகளைப் பெற்றுக் கொள்வதற்காக வருகின்றவர்களின் எண்ணிக்கை குறைந்துள்ளது.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

கௌரவ அமைச்சர் அவர்களே, இப்ப தோட்டத்துல மக்களுக்கு 50 ரூபா கூட கொடுக்கிறன் என்று அரசாங்கம் சொன்னாச்சு! இப்ப சொல்லிட்டு 3 மாதம் போயிட்டுது. இப்ப பாருங்க! இன்னும் 50 ரூபா இந்த அரசாங்கம் தோட்டத்து மக்களுக்குக் கொடுக்க இயலா. இப்ப 50 ரூபா கொடுக்க இயலா. அரசாங்கத்தைக் கொண்டு வாரத்துக்கு இவங்க எல்லோரும் support கொடுத்தாச்சு. இப்ப தோட்டத்துல வந்து அமைச்சர் என்ன செய்யப் போகிறார்? 50 ரூபா கொடுக்க இயலா என்டா என்னத்துக்கு இந்த அரசாங்கத்தில இருக்கிறது?

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)

கௌரவ நவீன் திஸாநாயக்க அவர்கள் வந்த பிறகு, கொடுப்பதாக Prime Minister அவர்கள் சொல்லியிருக்கிறார்.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

இப்ப எவ்வளவு காலம் அமைச்சர்?

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)

அதுவரைக்கும் பார்ப்போம்!

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

இப்ப நீங்க என்னத்துக்கு இந்த அமைச்சரா இருக்கிற?

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)

இவ்வளவு நாளும் நாங்கள் பொறுத்திருந்தோம்!

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

தோட்டத்துல மக்களுக்கு 50 ரூபா கொடுக்க இயலா என்டா, என்னத்துக்கு நீங்க இருக்கிற? வேலை இல்லயே அமைச்சர்! இந்த அரசாங்கத்துக்கு தோட்டத்து மக்களுக்கு 50 ரூவா கொடுக்க இயலாவா? தோட்டதுல மக்கள் எல்லாரும் உங்களுடைய அரசாங்கத்துக்குத்தான் 'வோட்' கொடுத்தது!

ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
ஆம்! அதை நான் இல்லையென்று சொல்லவில்லையே!

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
அப்ப அவங்களுக்கு 50 ரூபா கொடுக்க இயலாவா? 50 ரூபாக்கு சுருட்டொன்று எடுக்க இயலுமா? 50 ரூபாக்கு ஒரு றாத்தல் பாண் எடுக்க இயலுமா?

ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
கௌரவ மஹிந்தானந்த அலுத்கமகே அவர்களே, நாங்கள் இந்த 50 ரூபாயை வாங்கிக் கொடுப்போம்! அதில் எந்த விதமான மாற்றுக் கருத்துக்கும் இடமில்லை.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
உங்களுக்குக் கொடுக்க இயலா. நீங்க இந்த அரசாங்கத்தில இருந்து வேலை இல்ல அமைச்சர்! நீங்கள் வெளிய வாங்க!

ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
நாங்கள் arrears உடன் வாங்கிக் கொடுப்போம்.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
நீங்க அரசாங்கத்தில இருந்து வேலை இல்ல. உங்கட Ministry க்கு building இல்ல; ஒன்னுமில்ல.

ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
சரி! நீங்கள் உடனடியாக அரசாங்கத்தை அமையுங்கள்! அதன்பிறகு என்ன செய்யலாமென்று பார்ப்போம். அதை ஏன் உங்களால் செய்ய முடியவில்லை? நீங்கள் அரசாங்கமொன்றை அமையுங்கள்!

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
*ගරු නිමල් ලාන්සා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද?*

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
உங்களுடைய leader திகாம்ரம் அண்ணா சொன்ன -

ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
எனக்கு leader திகாம்பரம் இல்லை.

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
உங்கட 6 பேர் இருக்கிறாங்கள்தானே!

ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
நாங்கள் தனிக் கட்சியினர்!

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
நீங்க சொன்ன, 50 ரூபா கொடுக்காட்டி, portfolio இருந்து விலகிற என்று. நீங்க இன்னும் அதில இருக்கிற -

ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
நான் சொல்லவில்லை.

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
உங்கட 6 பேர் கொண்ட கூட்டம் சொன்ன.

ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
இல்லை!

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
நீங்கள் அப்பாவி மக்களோட -

ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
எனது time இனை நீங்கள் waste பண்ணாதீர்கள். உங்களுக்கு நான் பதில் சொல்கின்றேன். *[இடையீடு]* நீங்கள் முதலில் நீர்கொழும்பிலுள்ள விஷயத்தைப் பாருங்கள்! முதலில் உங்களது மக்களின் விஷயத்தைப் பாருங்கள்! அவர்கள் அடிபட்டுக் கிடக்கின்றார்கள். அவர்களுடைய விஷயத்தைப் பாருங்கள்! அந்த விஷயத்தை நீங்கள் பார்த்த பிறகு நாங்கள் பேசுவோம்.

இந்த அவசரகாலச் சட்டமானது எல்லோருக்கும் பிரச்சினையானதுதான். அது உங்களுக்கும் பிரச்சினை, எங்களுக்கும் பிரச்சினை. Christian இற்கும் பிரச்சினை, Hindu இற்கும் பிரச்சினை, Muslim இற்கும் பிரச்சினை, Buddhist இற்கும் பிரச்சினை! *[இடையீடு]* எல்லோருக்கும் பிரச்சினை தான். இல்லையென்று நான் சொல்லவில்லை. The whole economy has got upset now. நாங்கள் இந்த அவசரகாலச் சட்டத்தைப்பற்றிப் பேசும்போது மிக அவதானமாகப் பேச வேண்டும். இன்று நாட்டிலே மேதகு ஜனாதிபதி அவர்கள் Prime Minister அவர்களை விமர்சிக்கின்றார்; கௌரவ Prime Minister அவர்கள் மேதகு ஜனாதிபதி அவர்களை விமர்சிக்கின்றார். இன்று நாட்டில் இரண்டு drivers இருப்பதாகச் சொல்கின்றார்கள். ஆனால், ஒரு driverகூட ஒழுங்காக இல்லை என்று சொல்கின்றார்கள். அதனால்தான் நாட்டிலே பிரச்சினை ஏற்படுகின்றது. ஒரு வாகனத்துக்கு two drivers தேவையில்லை. ஒரு driver ஒழுங்காக வாகனத்தை

ஓட்டும்போது, பக்கத்திலுள்ளவர் ஏனைய விடயங்களை ஒழுங்காகச் செய்துகொண்டு போவார். அப்படியானால் பிரச்சினை வராது. இன்று நீங்கள் ஏட்டிக்குப் போட்டியாகப் பேசுவதால், நாட்டு மக்களுடைய பிரச்சினை பூதாகரமான ஒரு பிரச்சினையாக உருவாகியிருக்கின்றது.

பொதுவாக எங்களுடைய மாவட்டத்தை எடுத்துக் கொண்டால், நுவரெலியாவில் tourism மிகவும் பாதிக்கப் பட்டுவிட்டது. நுவரெலியா மக்கள் வாழ்வதே இந்த tourism இனை நம்பித்தான். அடுத்ததாக, அங்கே காய்கறி உற்பத்தியாளர்கள் இருக்கின்றார்கள். இவர்களுக்கெல்லாம் இன்று business இல்லாமற் போய்விட்டது. அதனால்தான் இந்த அவசரகாலச் சட்டம் வெகுசீக்கிரத்தில் நீக்கப்பட வேண்டும் என்று இந்த நேரத்தில் நான் கேட்டுக் கொள்கின்றேன்.

இன்று கிழக்குப் பகுதியிலே இருக்கின்ற முஸ்லிம் மக்களது பிரச்சினை ஒரு பூதாகரமான பிரச்சினையாக இருக்கின்றது. கல்முனை வடக்குப் பகுதியிலே இருக்கின்ற தமிழர்கள் தங்களுக்கு அதிகாரம் கேட்டுப் போராடுகின்றார்கள். அதேநேரத்தில், முஸ்லிம்கள் இன்னொரு பக்கமிருந்து அதைக் கொடுக்கக்கூடாது என்று போராடுகின்றார்கள். இரண்டு பக்கமும் பிரச்சினை உருவெடுத்திருக்கின்றது. ஆகவே, ஒன்றாக வாழ்ந்த தமிழ், முஸ்லிம் சமூகங்கள் இன்று பிரிவினைவாதச் சக்திகளாக உருவெடுத்திருக்கின்றன. முஸ்லிம் சகோதரர்கள் அல்லது முஸ்லிம் தலைவர்கள், தமிழர்கள் பெரும்பான்மையாக வாழும் கல்முனை வடக்குப் பகுதியைப் பெருந்தன்மையுடன் விட்டுக்கொடுக்க வேண்டு மென்பதுதான் என்னுடைய கருத்தாகும். அதாவது குறித்த பிரதேசத்தில் பெரும்பான்யைாக இருக்கின்ற மக்களுக்கு அதை விட்டுக் கொடுக்க வேண்டும். அன்று, கிழக்கு மாகாண சபையில் தமிழ்த் தேசியக் கூட்டமைப்பினருக்கு 11 உறுப்பினர்கள் இருந்தாலும்கூட, 7 உறுப்பினர்களைக் கொண்டிருந்த ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸுக்கு கிழக்கு மாகாண முதலமைச்சர் பதவியை தமிழ்த் தேசியக் கூட்டமைப்பினர் விட்டுக்கொடுத்தார்கள். இந்த விதத்தில் விட்டுக்கொடுப்புடன் வாழ்ந்தால் மாத்திரமே முஸ்லிம்களும் தமிழர்களும் ஒற்றுமையாக வாழ முடியும். குறித்த விடயத்தில் மூன்றாவது சக்தி உட்புகுந்து இன்று இந்த விடயத்தை குழப்பிக்கொண்டிருப்பதை நாங்கள் அவதானிக்கக் கூடியதாக இருக்கின்றது. இதை உடனடியாகக் கவனத்திலே கொண்டு அங்கிருக்கின்ற முஸ்லிம் தரப்புத் தலைவர்களும் தமிழ்த் தரப்புத் தலைவர்களும் பேசி, இதனை ஒரு முடிவுக்குக் கொண்டு வர வேண்டுமென்பது என்னுடைய கருத்தாகும்.

அது மட்டுமல்லாமல், இன்று நுவரெலியாவிலிருந்து கொழும்புக்கு வருகின்ற மக்களின் எண்ணிக்கை மிகவும் குறைவாக இருக்கின்றது. ஏனெனில், அவர்களுக்கு Identity cards இல்லாத காரணத்தினால் பயணம் செய்வதற்கு மிகவும் பயப்படுகின்றார்கள். இதனால் அவர்களுடைய பொருளா தாரம் மீண்டும் மீண்டும் பாதிக்கப்படுகின்றது. விடுதலைப் புலிகளின் போராட்டத்தின்போது தமிழர்கள் எப்படி ஒடுக்கப்பட்டார்களோ அல்லது நசுக்கப்பட்டார்களோ அதேபோன்ற சூழ்நிலையை மீண்டும் உருவாக்குவதற்கான சந்தர்ப்பத்தை ஏற்படுத்திக் கொடுக்கக்கூடாது என்பது என்னுடைய கருத்தாகும். இந்த அவசரகால நிலையினால் இன்று மக்கள் சுதந்திரமாக நடமாட முடியாது. பொலிஸாரும் இராணுவமும் அரசாங்கத்தின் கட்டுப்பாட்டில் இருந்தாலும் கூட, இன்றைய சூழ்நிலை காரணமாக அதிகாரத்தைக் கையில் எடுத்துச் செயற்பட வேண்டிய நிலைமை ஏற்படும்.

இலங்கை, ஜனநாயக மரபுள்ள ஒரு நாடு என்பதை நாங்கள் மறக்கக்கூடாது. இலங்கை ஜனநாயக மரபுள்ள ஒரு நாடாக உள்ள காரணத்தினால்தான், நாட்டில் இவ்வளவு பிரச்சினை கள் ஏற்பட்டாலும்கூட மக்கள் வீதிக்கு இறங்காமல் இருக்கின் றார்கள்; இராணுவப் புரட்சி இல்லாமல் இருக்கின்றது. இன்று ஒரு தலைவருக்குப் பதிலாக இரண்டு தலைவர்கள் இருந்தாலும்கூட அவர்களை மக்கள் ஏற்றுக் கொண்டு செயற் படுகின்ற நிலைமையையும் நாங்கள் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. இந்த நாட்டினுடைய ஜனநாயக மரபு மேலும் மேலும் பேணிப் பாதுகாக்கப்பட வேண்டும். இலங்கை உலகத்திலே ஜனநாயக மரபுள்ள பழைய நாடு என்பதை நாங்கள் மறக்கக்கூடாது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
இன்று சுமார் 125 கோடி மக்கள் வாழ்கின்ற இந்தியாவின் பிரதமர் நரேந்திர மோடி அவர்கள் உலகத்தின் சக்திமிக்க தலைவராக வந்திருப்பதை இன்று நாங்கள் அவதானிக்கக் கூடியதாக இருக்கின்றது. அதற்குக் காரணம், இந்தியா ஒரு ஜனநாயக நாடாகும். அந்த ஜனநாயக நாட்டிலே எல்லா மதத்திற்கும் சம அந்தஸ்து கொடுக்கப்படுகின்ற காரணத் தினால் தான் இன்று அந்த நாடு வளர்ந்திருக்கின்றது. எனவே, அங்கு ஜனநாயகம் பேணிப் பாதுகாக்கப்படுகின்றது என்பதை நாங்கள் மறந்துவிடக்கூடாது. ஆகவே, அவ்வாறான ஒரு சூழ்நிலையை இந்த நாட்டிலும் உருவாக்க வேண்டும். இங்கு ஜனநாயகம் பேணிப் பாதுக்கப்பட வேண்டும். கடந்த வருடத்திலே இந்த நாட்டிலே அரசியல் புரட்சி ஏற்பட்ட போதிலும் ஜனநாயகம் பாதுகாக்கப்பட்டது. அதே ஜனநாயகம் தொடர்ந்தும் நிலவுமானால் இந்த நாட்டிலே அவசரகாலச் சட்டத்தை நீக்கி, நாங்கள் எல்லோரும் சமமாக வாழ வழிவகுக்க முடியுமென்பதை இந்த நேரத்தில் கூறிக் கொள்கிறேன். நன்றி.

[අ.භා.3.47]

**ගරු විජිත බේරුගොඩ මහතා**
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන ආරක්ෂක ආඥාපනත යටතේ ගෙනෙන යෝජනාව අනුව හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳව පවත්වන මෙම විවාදයේදී අදහස් දක්වන්නට ලැබීම ගැන මා සතුටු වෙනවා. අපි දන්නවා, පාස්කු ඉරිදා ප්‍රහාරය සිදු වෙලා මාස දෙකයි, දින හයක් පමණ ගත වෙලා තිබෙන බව. පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් මිනිස් ජීවිත නැති වුණා විතරක් නොවෙයි, මේ රටේ ආර්ථිකය හා සමස්ත සංස්කෘතික, සමාජ පරිසරයත් දැඩි දෙදරීමකට ලක් වුණා.

අපි නිරන්තරවම ජාතික ආරක්ෂාව ගැන කථා කරනවා. ජාතික ආරක්ෂාව තිබෙන්න ඕනෑ. රටක් විධියට ගත්තොත් ජනතාවට බියෙන්, සැකෙන් තොරව ජීවත්වීමටත්, රටේ ආර්ථික සංවර්ධනය අත්පත් කරගැනීමටත්, ජනතාවගේ අභිලාෂ මුදුන්පත් කරගැනීමටත් ජාතික ආරක්ෂාව වැදගත් වෙනවා. ජාතික ආරක්ෂාවට තර්ජනයක් එල්ල වෙන වෙලාවකදී, හදිසි නීතිය වාගේ නීති සම්මත කර, ආරක්ෂක හමුදාවට බලතල දීලා, ඒ

[ගරු විජිත බේරුගොඩ මහතා]

තත්ත්වය මර්දනය කර ජන ජීවිතය යථා තත්ත්වයට පත් කරගන්නට ඕනෑ. සියල්ලටම පළමුව රට ගැන හිතනවා නම්, රටේ ජාතික ආරක්ෂාවට මුල්තැන දෙන්න ඕනෑ. ඒ පිළිබඳව විවාදයක් නැහැ. හැබැයි, ජාතික ආරක්ෂාවට මුල්තැන දෙනවා වාගේම රටේ අනෙක් සෑම ක්ෂේත්‍රයක් පිළිබඳවම අවධානය යොමු කර, ඒ සෑම ක්ෂේත්‍රයකටම ආරක්ෂාව ලැබෙන්නට ඕනෑ.

හැබැයි, අපි දකිනවා අද මේ ජාතික ආරක්ෂාව ගැන කථා කරන අතරේ, රටේ ආර්ථිකය පිළිබඳව ආරක්ෂාවක් නැතිවෙලා තිබෙන බව. අද වෙනකොට රාජ්‍ය බැංකු පෞද්ගලිකකරණය කිරීමට මේ ආණ්ඩුවේ බරපතළ උත්සාහයක් තිබෙනවා. ඒ නිසා රාජ්‍ය බැංකු බරපතළ අවදානමකට ලක් වෙලා තිබෙනවා. රාජ්‍ය බැංකු අටක් තිබෙන බවත්, ඒ බැංකු අට පෞද්ගලීකරණය කිරීමේ බරපතළ උත්සාහයක මේ ආණ්ඩුව යෙදෙන බවත් රාජ්‍ය බැංකු සේවක වෘත්තීය සමිති සඳහන් කරනවා. අපි දන්නවා, රටේ මූල්‍ය ස්ථාවරත්වයට වාගේම, ආණ්ඩුවට හදිසි අවස්ථාවකදී ණය දීමට, ජනතාවගේ තැන්පතු භාර ගැනීමට, ජනතාවගේ විශ්වාසය දිනාගෙන මූල්‍ය ක්ෂේත්‍රයට ආරක්ෂාව සපයන්නට රාජ්‍ය බැංකු විශාල කාර්යභාරයක් කරන බව. පසුගිය දවස්වල පෞද්ගලික බැංකු කඩා වැටෙනකොට, ඒවායේ ගනුදෙනුකරුවන් අනාරක්ෂිත තත්ත්වයට පත් වෙනකොට, රටේ මහජනතාව තවතවත් කිට්ටු වුණේ, සමීප වුණේ රාජ්‍ය බැංකුවලට බව අපි දැක්කා.

ජාතියේ මහා පහන් ටැඹ විධියට අපි ලංකා බැංකුව හඳුන්වනවා. ජනතාවගේ හදවත -ජන හද- දිනාගත් බැංකුව විධියට මහජන බැංකුව හඳුන්වනවා. අද මේ බැංකු පෞද්ගලිකකරණය කිරීමේ අවදානමකට ලක් වෙලා තිබෙනවා. අද මහජන බැංකුව වාගේම ලංකා බැංකුව ඇතුළු රාජ්‍ය බැංකුවල සේවකයෝ, ඒ වෘත්තීය සමිති කලබලයට පත් වෙලා තිබෙනවා. මොකද, මුදල් ඇමතිතුමා ගැන විශ්වාසයක් නැති නිසා. අපි දන්නවා, එතුමා මානව හිමිකම් කවුන්සිලයට ගිහිල්ලා ලංකාව වරදකරුවෙක් විධියට පිළිගත් ඇමතිවරයකු බව. අය වැය යෝජනාවලත් ඉතා පැහැදිලිව තිබෙනවා බැංකුවල කොටස් නිකුත් කිරීමක් කරනවා කියලා. අද මේ පිළිබඳව බැංකු වෘත්තීය සමිති කථා කරනකොට, මංගල සමරවීර මුදල් ඇමතිතුමා නිවේදනයක් නිකුත් කරමින් කියනවා, "මේ බැංකු පෞද්ගලිකකරණය කරන්නේ නැහැ. හැබැයි, ණයකර නිකුත් කිරීමක් කරනවා" කියලා. නමුත් අපි දන්නවා, මේ නිකුත් කරන ණයකර යම්කිසි මොහොතක කොටස් බවට පරිවර්තනය වුණොත්, මේ කොටස් විකුණනකොට, අනිවාර්යයෙන්ම බැංකු පෞද්ගලිකකරණය වෙන බව. ඒකට තමයි ආණ්ඩුව උත්සාහ කරන්නේ. ආණ්ඩුව හුඟක් වේලාවට නංගි පෙන්වලා, අක්කා පෝරුවට නංවන න්‍යායක් තමයි අනුගමනය කරන්නේ. ඒ නිසා මේ ආණ්ඩුව ගැන විශ්වාසයක් නැහැ.

අපි රටේ ජාතික ආරක්ෂාවට මුල්තැන දෙනවා වාගේම, රටේ මූල්‍ය ක්ෂේත්‍රයේ ආරක්ෂාවටත් මුල්තැන දෙන්න ඕනෑ. මේ ආණ්ඩුවේ වග කිවයුතු ඇමතිවරුන් අද මෙතැන සිටිනවාද කියන එකත් ප්‍රශ්නයක්. මෙතැන වග කිවයුතු ඇමතිවරයකු විධියට කවුරුවත් පෙනෙන්න නැහැ. අපි ආණ්ඩුවට කියනවා, මූල්‍ය ක්ෂේත්‍රයේ ආරක්ෂාව වෙනුවෙන් මේ බැංකු පෞද්ගලිකරණය කරනවාද, නැද්ද කියන කාරණය ගැන අපට උත්තරයක් දෙන්න කියලා.

ඒකට උත්තර දෙන්න කවුරුත් නැහැ. අද ජාතික ආරක්ෂාවට අදාළව සිදුවන විශේෂ කාර්යයක් වන හදිසි නීතිය දීර්ඝ කිරීමේ විවාදයට ආණ්ඩු පක්ෂයෙන් උත්තර දෙන්න පුළුවන් වගකිවයුතු ඇමතිවරයකු නැහැ.

මේ වනකොට බැංකුවල ආරක්ෂාව නැති වෙලා තිබෙන බව අපට පෙනෙනවා. එම නිසා මේ රටේ මූල්‍ය ක්ෂේත්‍රයේ ආරක්ෂාව අපට අවශ්‍යයි. ආර්ථිකය ඉදිරියට යන්න නම්, මූල්‍ය සුරක්ෂිතතාව ඉතා වැදගත්. රාජ්‍ය බැංකු පෞද්ගලිකකරණය කිරීමෙන් වැළකීම කෙරෙහි මේ ආණ්ඩුවේ අවධානය අපි යොමු කරනවා.

විශේෂයෙන් මම මේ අවස්ථාවේදී තවත් කරුණක් මතක් කරන්න ඕනෑ. සෞඛ්‍ය ක්ෂේත්‍රය ගත්තත්, අධ්‍යාපන ක්ෂේත්‍රය ගත්තත් මේ වනකොට බොහොම අනාරක්ෂිත තත්ත්වයක් තිබෙන්නේ. පසුගිය දවස්වල සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සිද්ධවෙලා තිබෙන අක්‍රමිකතා, දූෂණ ගැන බොහෝ මාධ්‍ය කථා කළ ආකාරය අපි දැක්කා. ගර්භිණී මාතාවන්ට බාල බෙහෙත් පොවන මට්ටමට අද මේ සෞඛ්‍ය ක්ෂේත්‍රය පත්වෙලා තිබෙනවා. ඒ වාගේම පිළිකා ඖෂධ හරහා විශාල ජාවාරමකුත් අද ක්‍රියාත්මක වනවා. ඒ තුළ රුපියල් බිලියන 20කට වඩා වැඩි වංචාවක් තිබෙනවාය කියලා රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය අද චෝදනා කරනවා. හැබැයි, මේ චෝදනාවලට අද පිළිතුරු ලැබෙන්නේ නැහැ. ඒවාට මඩවලින් පිළිතුරු සපයන එක තමයි මේ ආණ්ඩුව කරන්නේ.

අගමැතිතුමා ගැනත් මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. අද අගමැතිතුමාගේ මූලිකත්වයෙන් මේ ආණ්ඩුව විශේෂ කාරක සභාවක් පත් කර ගෙන තිබෙනවා. නමුත්, ආණ්ඩුවේ තිබෙන කුණු සෝදන ලොන්ඩරියක් බවට මේ විශේෂ කාරක සභාව පත්වෙලා තිබෙනවා. අපට මතකයි, මහ බැංකු බැඳුම්කර වංචාව සිදු වූ අවස්ථාවේ අර්ජුන් ඇලෝසියස්ට චෝදනා එල්ල වනකොට, අර්ජුන මහේන්ද්‍රන්ට චෝදනා එල්ල වනකොට අර්ජුන මහේන්ද්‍රන් ඇතුළු ආණ්ඩුවේ සියලුදෙනා බේරා ගන්න අගමැතිතුමා මොකක්ද කළේ කියලා. එතුමා "පිටිපන කමිටුව" නමින් කමිටුවක් පත් කළා. ඒ පිටිපන කමිටුවට තමන්ගේ නීතිඥයන් දමලා, කිසිම දෝෂයක් වුණේ නැහැ, කිසිම වංචාවක් සිදු වුණේ නැහැ කියලා මේ නිලධාරින් සහ තමන්ගේ ඇමතිවරු නිර්දෝෂීභාවයට පත් කර ගත්තා. හැබැයි, මහ බැංකුවේ බැඳුම්කර වංචාව පිළිබඳව සොයා බලන ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ තොරතුරු එළියට එනකොට තත්ත්වය කුමක්ද කියන එක අපට තේරුණා. ඉන් අනතුරුව මුදල් ඇමතිතුමාටත් ඉල්ලා අස්වන්න සිද්ධ වුණා. ඒ අනුව බලන විට අද අපි විශ්වාස කරනවා, ජාතික ආරක්ෂාව බිඳ වැටීම පිළිබඳව මේ ආණ්ඩුව වග කියන්න ඕනෑ කියලා. එහෙම නම්, ආණ්ඩුවේ නිර්දෝෂීභාවය සඳහා පවත්වාගෙන යන මේ විශේෂ කාරක සභාව විහිළුවක්. ඒක ලොන්ඩරියක් බවට මේ ආණ්ඩුව පත් කර ගෙන තිබෙනවා.

අගමැතිතුමා රට හමුවේ කියන්නේ විශාල අසත්‍ය. ජනතාව හමුවේ මුසාවන් දොඩා ජනතාව නොමඟ යවන තත්ත්වයකට මේ අගමැතිතුමා පත්වෙලා තිබෙනවා. මොකද, අගමැතිතුමා පසුගිය දවස්වල කිව්වා, ලංකාවේ පිදුරු සෙවිලි කළ, එහෙම නැත්නම් පොල්අතු සෙවිලි කළ මැටි ගහපු වරිච්චි බිත්ති තිබෙන නිවාස දකින්න නැහැ, ඒවා දකින්න තිබෙනවා නම් තිබෙන්නේ සංචාරකයන්ගේ ආකර්ෂණය සඳහා නිර්මාණය කළ ඒවා කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, අවසන් කරන්න.

**ගරු විජිත බේරුගොඩ මහතා**
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ජානක වක්කුඹුර මන්ත්‍රීතුමාගේ වෙලාවෙනුත් විනාඩි කීපයක් ගන්න කිව්වා.

මම අගමැතිතුමාට අභියෝග කරනවා, පුළුවන් නම් මොනරාගලට එන්න කියලා. අපි පෙන්වන්නම්, මොනරාගල දිස්ත්‍රික්කයේ පොල්අතු සෙවිලි කළ වරිච්චි බිත්ති සහිත නිවසක්වත් නොමැති බොහෝ පිරිසක් සිටින බව. එතුමා අභියෝග කරනවා නම්, මම වසම් වශයෙනුත් කියන්නම්. ඒ නිසා එතුමා ප්‍රායෝගික කෙනෙකු නොවෙයි. එතුමා බිම් මට්ටමේ ජනතාවත් සමඟ පැහෙන කෙනෙකු නොවෙයි. එම නිසා තමයි එතුමා මාධ්‍ය හරහා පට්ටපල් අසත්‍ය ප්‍රකාශ කරමින් ජනතාව නොමඟ යවන්න කටයුතු කරන්නේ.

මේ අවස්ථාවේදී මම තවත් කරුණක් මතක් කරන්න ඕනෑ. දිළිඳුකම පිටුදැකීම සඳහා පුරෝගාමී මෙහෙවරක් කරන සමෘද්ධි ව්‍යාපාරය අද වනකොට බරපතළ දේශපාලනීකරණයකට ලක්වෙලා තිබෙනවා. මේ වනකොට දයා ගමගේ ඇමතිතුමා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය, සමෘද්ධි අරමුදල්, සමෘද්ධි ව්‍යාපාරය තමුන්ගේ ජාවාරම් බවට පත් කර ගෙන තිබෙනවා. අද වනකොට ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ සමෘද්ධි නිලධාරින් සියලුදෙනා උද්ඝෝෂණයකට සම්බන්ධවනවා. ඒ අය මොනවාද කියන්නේ? ඒ අය කියන්නේ සමෘද්ධි ව්‍යාපාරය මේ ආණ්ඩුවෙන්, මේ ඇමතිවරයාගෙන් බේරා ගන්න ඕනෑය කියායි. ඉදිරියේදී එන මැතිවරණ බලාගෙන තමන්ගේ පාක්ෂිකයන් සතුටු කරවන්න සමෘද්ධි මුදල්, සමෘද්ධි බැංකුවල තිබෙන අරමුදල් විවිධ ණය යෝජනා ක්‍රම හරහා අනවශ්‍ය ආකාරයෙන් විනාශ කරන මට්ටමකට අද මේ ඇමතිතුමා පත්වෙලා තිබෙනවා. අපි දන්නවා, සමෘද්ධි ව්‍යාපාරය තිබෙන්නේ ග්‍රාමීය ජීවනෝපාය සකස් කර ගන්න කියලා. සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ජීවන තත්ත්වය උසස් කර ගන්න, දියුණු කර ගන්න, ඒ ගොල්ලන්ගේ ආර්ථිකය වර්ධනය කර ගන්න අවශ්‍ය බොහෝ දේවල් මේ සමෘද්ධි ව්‍යාපාරය තුළින් ලබාදෙනවා. ඒ ගොල්ලන්ට උපකරණ දෙනවා, පැළ වර්ග දෙනවා, මෙවලම් දෙනවා. අද ඒවාට මොකක්ද වන්නේ? අද ඒවා මොකුත් නැහැ. අද මේ ඇමතිතුමා උත්සාහ කරන්නේ මොකටද? සමෘද්ධි අරමුදල් පාවිච්චි කරලා දයා ගමගේ ඇමතිවරයාගේ farmsවල තිබෙන අඹ පැළ සහ රඹුටන් පැළ අද සමෘද්ධි ප්‍රතිලාභීන්ට බෙදනවා. මේ හරහා මොකක්ද වෙන්නේ? රජයේ මුදල් අවභාවිතයක් වෙනවා. අනෙක, ජනතාවට අවශ්‍ය නොවන, පරිසරයට, දේශගුණයට, පසට නොගැළපෙන බීජ, පැළ ලබා දෙනවා. ඒකෙන් කෘෂි ආර්ථිකය දියුණු කරගන්නත් බැහැ; ඒ ගොල්ලන්ගේ ග්‍රාමීය ආර්ථිකය දියුණු කරගන්නත් බැහැ. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා, මෙලෙස මේ සමෘද්ධි ව්‍යාපාරය විනාශ කරන්න එපා කියලා.

සමෘද්ධි ප්‍රතිලාභ ලබා දීමේදීත් බරපතළ අසාධාරණයක් වෙනවා. මේ රටේ ජීවත් වෙන්නේ එක්සත් ජාතික පක්ෂයේ අය විතරක් නොවෙයි. මේ රටේ පුරවැසියන් විධියට විවිධ පක්ෂවල අය ඉන්න පුළුවන්. මේ සියලුදෙනාටම සාධාරණ ලෙස ප්‍රතිලාභ ලබා දෙන්න කියන ඉල්ලීම අපි කරනවා.

මේ ආණ්ඩුවට තිබෙන්නේ තව මාස හයයි කියලා අපි ආණ්ඩුවට අනතුරු අඟවනවා. මේ මාස හය තුළදීවත් මේ වැරදි නිවැරදි කර ගෙන, ජනතාව වෙනුවෙන් කටයුතු කරන්නය කියන ඉල්ලීම කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[3.57 p.m.]

**ගරු ඒ.එච්-.එම්. ෆවුසි මහතා**
(மாண்புமிகு ஏ.எச்.எம். பௌஸி)
(The Hon. A.H.M. Fowzie)

Hon. Presiding Member, I am happy that I have been given an opportunity to speak a few words on the occasion of this Debate when we are discussing the Emergency Regulations. Let me, at the very outset, point out that these Regulations have been promulgated to deal with an extraordinary situation that has arisen as a result of the Easter Sunday terrorist attacks.

It is because the ordinary laws are not sufficient in the context of the situation that has developed after these tragic incidents that the President has gazetted these Regulations. However, after the Emergency Regulations are brought into force, there is no purpose served if the powers given to the security forces are not used for the benefit of the people. The main purpose of these Regulations was, in the first instance, to capture and dismantle the terrorist network. It is with the authority of the President and the Prime Minister that this has been achieved and all those connected with the despicable incidents have been captured.

The next important matter is to make sure that the security of the people and the country as a whole is ensured. As Muslim Parliamentarians, we have been deeply concerned about the increased targeting of the Muslim community after the terrorist attacks of April 21st. Although the Muslim community had provided information to the authorities regarding the unacceptable activities of some of the individuals involved in those attacks since 2012, no action had been taken against those individuals. After the Easter Sunday attacks, the Muslim community cooperated fully with the security forces, so much so that the authorities were able to announce within three weeks of the incidents that the terrorist network had been dismantled and 99 per cent of the suspects have been apprehended. However, the three weeks of relative calm ended on May 12th and 13th when gangs of thugs in motor bikes roamed various villages in the Kurunegala District as well as Minuwangoda torching Muslim business places as well as mosques in an organized and premeditated attack. There was hardly any protection given to the Muslims in those areas who had to face the brunt of these attacks.

Hate speech is spreading on the social media as well as other media giving rise to insecurity and fears among the Muslims living all over the country. In the meantime, various individuals and organizations are inciting people and acting in clear violation of the Emergency Regulations by making statements, not only against the Muslims, but also against Islam. Despite these violations of the Emergency Regulations, adequate action is not being taken to restrain these groups thus putting the safety of the Muslims at risk.

It is in this environment of escalating tension and vitriolic attacks on Muslims and Governmental inaction, an announcement has been made that the Bodu Bala Sena is organizing a meeting in Kandy where they expect to gather 10,000 Buddhist monks. Going by past experience, we know what they will say at these meetings, thus creating an environment for breach of peace and undermining the safety and security of the Muslim community. What is of utmost concern is how such meetings are organized and held in total violation of the Emergency Regulations without the security forces taking

[ගරු ඒ.එච්-.එම්. ෆවුසි මහතා]

preventive action. I am happy that in the case of the blatant discriminatory act of the Wennappuwa Pradeshiya Sabha Chairman who had made an order preventing Muslim traders from selling their goods at the weekly *pola,* the local police have taken action. So, I wish to call upon the Government to take action also to prevent the planned meeting in Kandy organized by the Bodu Bala Sena and other similar gatherings, by which tension can be escalated.

As you all are aware, it is worth repeating that the Muslim community completely disassociated itself from the actions of the small group of terrorists who launched the devastating attacks on the churches and tourist hotels. The Muslim community not only condemned the attacks with one voice, but also helped the security forces to identify and capture those involved with this group. However, we, as a community, are deeply troubled at the events that have taken place since the attack. There has been a systematic demonizing of Muslims in the past few weeks by feeding, through both conventional and social media, falsehoods and half-truths. An atmosphere has been created in the country where the ordinary Muslim people live in fear and uncertainty and are unable to get on with their day-to-day lives.

What is happening is that the same forces which began targeting the Muslims in or around 2012 are making use of the situation that has arisen after the Easter Sunday attacks to implement their anti-Muslim agenda. Various attempts are being made to change the Muslim Personal Law, the Muslim form of dress, Muslim food habits and, in short, anything that is "Muslim". None of these practices have, in any way, harmed the non-Muslims, but deliberate misinformation about these practices is being fed to the innocent Sinhala-Buddhist community in order to instil fear in them.

The cry for "one country, one law" is totally misleading because, in fact, there is only one law, but the problem is that the law is not applied equally to everyone. For example, innocent people are arrested for minor reasons like having Arabic tapes or books with Arabic letters and not released on bail. However, in contrast, hooligans, racists and religious fanatics who set fire to Muslim shops, houses and mosques are released on bail despite them being acts in the nature of terrorism.

In fact, the Muslims have always stood for one country. That is why they never supported the demand for a separate State by the LTTE. That is why the LTTE drove the Muslims away from the Northern Province in 1990, the mosques in Kattankudi and Eravur were attacked and worshippers were killed.

Then there is a misunderstanding about the Sharia Law. The Sharia is mistakenly associated with the cutting of hands and similar punishments. The Sharia applies only to Muslims and relates to all the practices that Muslims have to follow. For example, Muslims are required to pray five times a day and this is part of the Sharia. Other examples where Sharia is applicable only to Muslims are, how one should do business; how one should settle all one's debts before one dies; how we are to look after our families; how we should treat our neighbours and so on. According to the Sharia, suicide is a grave sin, which the terrorists committed. Even killing innocent people, as was done by the Easter Sunday bombers, is a sin and is in contravention of the Sharia.

In conclusion, let me remind this House that ensuring the safety and security of the people of this country including the Muslims is the responsibility of the Government. They must not fail in their duty at this critical time when the country is faced with unprecedented challenges.

Thank you.

[பி.ப. 4.04]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கா. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நாட்டின் தேசிய பாதுகாப்புக் கொள்கை எந்தளவிற்கு முக்கியமானதோ அதேபோன்று மக்களின் அச்சமில்லாத சகவாழ்வும் இன்றியமையாததாகும். கடந்த ஏப்பிரல் 21ஆந் திகதிய பயங்கரவாத நிகழ்வின் பின்னர் குறிப்பாக, முஸ்லிம் மக்கள்மீதான நேரடியான, மறைமுகமான அச்சுறுத்தல்களும் வெறுப்பூட்டல் சம்பவங்களும் ஆங்காங்கே நடந்தேறிக் கொண்டிருக்கின்றன. இந்நிலைமை தொடருமானால் நாடு பாரிய வீழ்ச்சியை நோக்கியே பயணிக்கும் என்பதை இச்சபையில் மிகவும் வேதனையோடு கூறிக்கொள்ள விரும்புகின்றேன். இன்று அரச நிறுவனங்களிலும் மற்றும் வேலைத்தலங்களிலும் பணியாற்றிய நூற்றுக் கணக்கான முஸ்லிம் பணியாளர்கள் அச்சம், அச்சுறுத்தல் மற்றும் ஒருசில சக ஊழியர்களின் தொல்லைகளினால் தொழிலை விட்டு விலகிச் சென்றுள்ளதாக நாம் அறிகின்றோம். அரசு அவ் வாறானவர்களுக்கு மாற்றுத் திட்டங்களினூடாக நிவாரணம் பெற்றுக்கொடுக்க ஆவன செய்யவேண்டுமென மிக விநயமாக வேண்டிக்கொள்கின்றேன். ஏப்பிரல் 21ஆம் திகதிய நிகழ்வை மையப்படுத்தி, அந்தத் தாக்குதலுக்கு எந்த வகையிலும் சம்பந்தமில்லாத காரணிகளை முன்னிலைப்படுத்தி இனவாதக் கருத்துக்களும் மக்களின் சகவாழ்வைப் பாதிக்கும் நிகழ்வுகளும் இடம்பெறுவதை அரசு அதன் உச்சக்கட்ட அதிகாரங்களைப் பயன்படுத்தித் தடுத்துநிறுத்த முன்வரவேண்டும். இவ்வாறு இடம்பெறும் சம்பவங்களை ஓரக்கண்ணால் பார்த்துக் கொண்டு அலட்சியப்போக்குடன் பராமுகமாகச் செயற்படுவது இந்நாடு இன்னொரு சோமாலியாவாக மாற வழிகோலும் என்பதில் எவ்விதச் சந்தேகமுமில்லை.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்நாடு சுதந்திரம் பெறுவதற்காக ஒருசில சமூகத் தலைவர்கள் ஆங்கிலேயரிடம் சம உரிமை கோரியபோது சிங்கள சமூகத்தின்மீதிருந்த எல்லையற்ற நம்பிக்கையின் காரணமாக, முஸ்லிம்களது உரிமைகளைச் சிங்களத் தலைவர்கள் வழங்குவார்கள் என்ற அளவு கடந்த நம்பிக்கையை அப்போதைய முஸ்லிம் தலைவர்கள் வெளிப்படுத்திச் சுதந்திரப் போராட்டத்திற்கு நிபந்தனையற்ற ஆதரவை நல்கியதோடு மாத்திரமன்றி, நாடு பாரிய சவால்களுக்கு முகம்கொடுத்த

எல்லாச் சந்தர்ப்பங்களிலும் நாட்டின் இறைமைக்கும் பாதுகாப்புக்கும் முழுமையான ஆதரவை வழங்கியமையை இன்று ஒரு சில இனவாத ஊடகங்களும் அரசியல்வாதிகளும் மறந்து பேசுவது பெரும் வேதனையளிக்கின்றது. இந்நாட்டின் பொருளாதார வளர்ச்சிக்கு அந்நியச் செலாவணியைப் பெற்றுக் கொடுப்பதில் முஸ்லிம்கள் ஆற்றும் பங்களிப்பையும் அதிகமானோர் மறந்து பேசுவது கவலை தருகிறது. இந்த நாட்டை ஒல்லாந்தர், போர்த்துக்கேயர், ஆங்கிலேயர் போன்றோர் ஆக்கிரமித்தபோதெல்லாம் சிங்கள மன்னர்களது விசுவாசிகளாகவும் நாட்டுப் பற்றாளர்களாகவும் முஸ்லிம்கள் திகழ்ந்தமை தற்பொழுது இனவாதிகளால் மறப்பிக்கச் செய்யப்பட்டுள்ளது. ஆனால், முஸ்லிம்கள் இந்நாட்டை ஆக்கிரமிக்கவோ அழிக்கவோ செயற்படவில்லை என்பதை மீண்டும் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்னும் எவ்வளவு காலத்திற்கு இந்த அவசரகாலச் சட்டம் அமுலில் இருக்கப்போகின்றது என்ற வினாவை கௌரவ பாதுகாப்பு இராஜாங்க அமைச்சர் அவர்களிடம் நான் கேட்க விரும்புகின்றேன். இந்த நிலைமை தொடருமேயானால் எமது நாடு உலக நாடுகளிலிருந்து தனிமைப்படுத்தப்படும் அபாயம் உருவாகும் என்பதனைக் கவனத்திற்கொண்டு செயற்படுவது சாலப்பொருத்தமென நினைக்கின்றேன். இந்த அவசரகாலச் சட்டத்தின்மூலம் சாதாரண அப்பாவி மக்களின் இயல்பு வாழ்க்கை பாதிக்கப்படுவதோடு ஜனநாயக விழுமியங்களும் சீரழிந்துவிடும் என்பதில் எவ்வித ஐயமுமில்லை.

கடந்த ஏப்பிரல் 21ஆம் திகதிய பயங்கரவாதத் தாக்குதலுடன் தொடர்புடையவர்களுக்கு உச்ச தண்டனை வழங்கப்பட வேண்டும். அதேபோல, சிறிய - சில்லறைக் காரணங்களுக்காகக் கைது செய்யப்பட்டவர்களை உடனடியாக விடுதலை செய்ய நடவடிக்கை எடுக்க வேண்டும். இனிவருங்காலங்களில், சட்டங்களைக் கையிலெடுக்கின்ற செயற்பாடுகள் அதாவது, அவசரகாலச்சட்டம் அமுலில் இருக்கின்றபோது தாங்கள் நினைத்ததைச் செய்ய நினைக்கும் சில இனவாதிகளின் நடவடிக்கைகளை இந்த அவசரகாலச் சட்டத்தைப் பயன்படுத்தித் தடுக்க வேண்டும். அவ்வாறு தடுக்க முடிந்ததா? என்பது இன்று பாரிய கேள்வியாக இருக்கின்றது. சட்டம் எல்லோருக்கும் சமமாகப் பயன்படுத்தப்பட வேண்டும் என்பதையும் இங்கு நான் கூறிக்கொள்ள விரும்புகின்றேன். அத்தோடு சமூக, இன நல்லுறவைப் பேண அரசியலமைப்பினூடாக இறுக்கமான ஒரு பொறிமுறையை நிறுவி, நாட்டில் நிரந்தரச் சமாதானம், சகவாழ்வு உருவாக அரசு மாத்திரமன்றி, எதிர்க்கட்சி உறுப்பினர்களும் பாரிய பங்களிப்புச் செய்வது இன்றியமையாததாகும்.

இன்று இந்த நாட்டில் அவசரகால நிலை நீடிக்கப்படுவது மிகவும் மன வேதனைக்குரிய விடயமாகும். இலங்கைவாழ் அனைத்து இன மக்களும் நிம்மதியான, சுபிட்சமான தேசத்தையே விரும்புகிறனர். அவசரகாலச் சட்டம் என்ற இரும்புக் கவசம் அணியப்படுவதை எந்தவொரு பொதுமகனும் விரும்பவில்லை. ஏனெனில் எமது அழகிய தேசத்துக்கு இது ஓர் அவமானச் சின்னமாகும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have one more minute.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கா. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
அவசரகாலச் சட்ட நீடிப்புக் காரணமாக எமது தேசியப் பொருளாதாரம் இன்னும் சில படிகள் பின்னடையலாம், எமது நாட்டுக்கான உல்லாசப் பயணிகளின் வருகை மேலும் வீழ்ச்சியடையலாம், எமது நாட்டுக்கான வெளிநாட்டு முதலீடுகள் குறைவடையலாம், எமது நாணயப் பெறுமதி மேலும் வீழ்ச்சியடைந்து, நாட்டின் அனைத்துத் துறைகளையும் மக்களையும் பாதிப்படையச் செய்யலாம். ஆனால், இன்று சிலர் சில திகதிகளைக் குறிப்பிட்டு, இன்னும் இனவாதத்தைக் கக்கும் சில முயற்சிகளில் ஈடுபட்டிருக்கிறார்கள். இந்த நிலையில் இந்த அவசரகாலச் சட்டத்தைப் பயன்படுத்தி, குறித்த இனவாதிகளைக் கட்டுப்படுத்த முடியாவிட்டால், இந்தச் சட்டம் எதற்கு? நான் முதலில் கூறியதுபோல குறித்த ஒரு சமூகத்தை அடக்குவதற்காகத்தான் இந்த அவசரகாலச் சட்டம் பயன்படுத்தப்படுமானால் அது ஏற்றுக்கொள்ள முடியாத விடயமாகும். இன்று இந்த அவசரகாலச் சட்டத்தை மேலும் நீடிப்பது எந்தவகையில் பொருத்தம் என்று தெரியாது. ஆனால், இனியும் இந்த அவசரகால நிலையை நீடிக்கக் கூடாது. ஆகவே, இதுவே எட்டாவது பாராளுமன்றத்தின் இறுதியான அவசரகாலச் சட்ட நீடிப்பு விவாதமாக அமையட்டும் என்ற பிரார்த்தனையுடன், எனது உரையை நிறைவுசெய்துகொள்கிறேன். நன்றி.

**ගරු රන්ජන් රාමනායක මහතා (මහාමාර්ග හා මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க - நெடுஞ்சாலைகள், வீதி அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Ranjan Ramanayake - State Minister of Highways and Road Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හදිසි නීතිය දීර්ඝ කිරීමේ විවාදය පැවැත්වෙන වේලාවේ වචනයකින් හෝ එයට දායක වෙන්න ලැබීම ගැන මම සතුටු වනවා. හදිසි නීතිය කියන මාතෘකාව අද කථා කිරීමට නියමිතව තිබුණත්, මේ සභාව තුළ වැඩිපුරම කථා වුණේ විශේෂ කාරක සභාව ගැනයි. ආණ්ඩු පක්ෂය විශේෂ කාරක සභාව "හොඳයි" කියන මතයේ ඉඳගෙන කථා කළා. පොදු විපක්ෂය විශේෂ කාරක සභාවට වැඩිපුරම බැණින්න ගත්තා. එතුමන්ලා එය විවේචනය කළා; මේක නාට්‍යයක් කිව්වා; මේක ටෙලි නාට්‍යයක් කිව්වා. අරලියගහමන්දිරයේදී දෙබස් ලියලා දීලා, තිර රචනය, අධ්‍යක්ෂණය කරලා, rehearsals කරලා, කට පාඩම් කරලා ප්‍රශ්න අහනවාය කිව්වා. [බාධා කිරීමක්] දැන් බලන්න, මට විතර නේ මේ කරදර කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සභාවේ මීට පෙර බොහෝ මන්ත්‍රීවරුන් කථා කළා. එතුමන්ලා කථා කරද්දී කිව්වා, එතුමන්ලා කථා කරද්දී කවුරුවත් සභාවේ නැහැ කියලා. ඒ වාගේම, එතුමන්ලාගේ කථාවට කාගේවත් අවධානයක් නැහැ කිව්වා. නීරස කථාවලට කවුරුවත් අවධානය යොමු කරන්නේ නැහැ. ඒ වෙන්නේ කථාවේ ආකර්ෂණය සහ පුද්ගලයාගේ අනන්‍යතාව මත. මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා, අනුර ප්‍රියදර්ශන යාපා මන්ත්‍රීතුමා කථා කරද්දී ඒ කථා අහන්න මේ සභාව පිරී ඉතිරී යනවා. කථාව අහන්න පිරිස එන්නේ කථිකයාගේ ආකර්ෂණය අනුව. මම දැක්කා සමහරු අඬනවා, "අනේ, මගේ කථාව අහන්න කවුරුවත් නැහැ. ඇයි මගේ කථාව අහන්නේ නැත්තේ. ඇයි සභාවේ Quorum එක නැත්තේ?" කියලා. ඒක ගණපූරණයේ ප්‍රශ්නයක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා කථා කරද්දීත් අපි ඒ කථාව අහන්න එනවා. ඒ කථාව ආකර්ෂණීයයි; ලස්සනයි. සමහර අය කථා library එකේ ඉඳලා අහනවා; සමහර අය canteen එකේ ඉඳන් අහනවා; සමහර

[ගරු රන්ජන් රාමනායක මහතා]

අය උත්තර දෙන්න බැරි හින්දා හැංගිලා අහනවා; සමහර අයගේ කථාව බල්ලෙකුටවත් අහගෙන ඉන්න බැරි නිසා දාලා යනවා. ඒකට කථිකයාට බැණලා වැඩක් නැහැ. තමන්ගේ කථිකත්වය අනුවයි එහෙම වෙන්නේ. ඒක meetingsවලදීත් එහෙමයි; ralliesවලදීත් එහෙමයි. සමහර කථිකයන්ගේ කථා අහන්න houseful වෙනවා; කට කපලා සෙනඟ එනවා. සමහර අයගේ කථා අහන්න සෙනඟ එන්නේ නැහැ. සමහරු කථා කරද්දී කට්ටිය එනවා. බණින්න හරි එනවා. Disturb කරන්න හරි එනවා.

මම නැවතත් මාතෘකාවට එන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විශේෂ කාරක සභාව ගැන අද සමහර කථිකයන් කිව්වා. විශේෂ කාරක සභාව ගැන කථා කරද්දී මට මේ කථාව අහගෙන ඉන්න ජනතාවට කියන්න තියෙන්නේ එක දෙයයි. මම කිව්වා පොදු විපක්ෂය විශේෂ කාරක සභාවට බණිනවා, ආණ්ඩුව හොඳ කියනවා කියලා. අපි බලමු ජනතාව මේ ගැන මොනවාද කියන්නේ කියලා. මාධ්‍ය මේ ගැන දක්වන උනන්දුව මොකක්ද? අන්න එතැන තමයි වැදගත් වෙන්නේ. මාධ්‍ය කොච්චර මේ subject එක කරේ තියාගෙන යනවාද? මේ විෂය කොච්චර කරේ තියාගෙන යනවාද? මේ ගැන කොච්චර උනන්දු වෙනවාද? අන්න එතැන තමයි නිමිත්ත තියෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් කසිප්පුකාරයෝ සුරාබදු නිලධාරීන්ට භයයි; කුඩුකාරයෝ Narcotic Bureau එකට භයයි; බීමත් රියැදුරන් බැලුම පුම්බන්න භයයි. තව මොනවාද?

පාතාල ලෝකයේ අය STF එකට භයයි. ඒ අය භය වෙන්නේ ඇයි? භය වෙන්නේ වරදක් කර තිබෙන නිසායි. ඉතින් මම හිතනවා, මේ විශේෂ කාරක සභාවට භය කවුද, ඒ ඇයි කියන එක මේ කථාව අහගෙන ඉන්න පොදු ජනතාව තේරුම් ගන්න ඕනෑය කියලා. විශේෂ කාරක සභාවට භය නැත්නම් කෙළින්ම ඇවිත් උත්තර දෙන්න පුළුවන්. "අපිත් එනවා, අපිත් ප්‍රශ්න අහනවා, අපට ඕනෑ ප්‍රශ්න අහනවා, ඔය dramas කරන්න දෙන්නේ නැහැ" කියලා කාරක සභාවේ වාඩිවෙන්න තිබුණා. වාඩිවෙලා, තමුන්ට අවශ්‍ය ප්‍රශ්න අහන්න තිබුණා. ඉතින්, ඇයි මේකට භය වෙන්නේ? මේකට භය වෙන්න යම්කිසි හේතුවක් තිබෙනවා.

පරිසරය විනාශ කරන අය, ගස් කපන අය, පස් කපන අය භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයට - GSMB එකට - භයයි. ඇයි භය? ඒ ගොල්ලන් අල්ලන නිසා. ඒ නිසා භයයි. ගමේ ඉන්න හොරු, මිනීමරුවෝ CID එක වාගේ ඒවාට භයයි. පසුගිය ටිකේ FCID - Financial Crimes Investigation Division - එකට සමහර අය භය වුණා. මොකටද ඒ භය වුණේ? භය වුණේ හොර අල්ලන නිසාය කියන එක මම නැවත නැවතත් ජනතාවට කියනවා.

මෙවැනි විශේෂ කාරක සභා ගැන ඉතිහාසයක් තිබෙනවා. මම අනුර ප්‍රියදර්ශන යාපා හිටපු ඇමතිතුමාගෙනුත් ඒ ගැන අහගත්තා මේ දැන්. එතුමාත් කිව්වා, ශිරානි බණ්ඩාරනායක මහත්මියට එරෙහිව තිබූ චෝදනා සම්බන්ධයෙන් විමර්ශනය කරන්න පත් කළ විශේෂ කාරක සභාවට භයදෙනෙක් වාඩි වුණා කියලා. ඒකේ රාජිත සේනාරත්න ඇමතිතුමා හිටියා, විමල් වීරවංශ මන්ත්‍රීතුමා හිටියා. අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා තමයි ඒ කමිටුවේ සභාපති. තව බොහෝ දෙනෙක් හිටියා. ඉතින් ඒක සහ මේ විශේෂ කාරක සභාව අතර වෙනස මොකක්ද? මේ කාරක සභාවේ කටයුතු live පෙන්වනවා. ඒ කියන්නේ, තවත් ටිකක් විනිවිදභාවයෙන්, transparent ලෙස, කටයුතු කෙරෙන තත්ත්වයක්. ඉතින් මම හිතනවා, මේ විශේෂ කාරක සභාවට ඒ අදාළ සියලුදෙනා ගෙනැල්ලා ප්‍රශ්න අහන එක ඉතාම හොඳ දෙයක් කියලා. ඒකට අකුල් හෙලන්නේ භය, චෝදනා තිබෙන, වක්‍රාකාරව හෝ සෘජුව වැරදිකාරයෝ වන අය තමයි. ඒ අය තමයි "මේක ටෙලි නාට්‍යයක්, drama එකක්, මේක rehearsals කරලා කරන වැඩක්" කියලා කියන්නේ. මට හිතෙන විධියට පොදු ජනතාවත් පුදුම උනන්දුවකින් මේ live programme එක දිහා බලාගෙන ඉන්නවා. ලෝකයම Internet එක හරහා මේ දේවල් බලනවා. අද මේ විශේෂ කාරක සභාව හරහා විශාල රහස් සංඛ්‍යාවක් හෙළි වෙලා තිබෙනවා.

මම කියන්නේ, මේ විශේෂ කාරක සභාවට අතිගරු මැල්කම් රංජිත් කාදිනල්තුමාත් බොහොම ගෞරවයෙන් කැඳවන්න කියලායි. ඒ කියන්නේ, එතුමාගෙන් ප්‍රශ්න අහන්න නොවෙයි. මොකද, උන්වහන්සේ වතිකානුවේ ගිහිල්ලා අලුත් ආරංචි කිහිපයක් කිව්වා. එදා 6.45ට call එකක් ආවාය කිව්වා. 21වැනි දා - පාස්කු ඉරිදා - 6.45ටත් call එකක් ආවාය කිව්වා. ඒ ආකාරයට විවිධ කථා තිබෙනවා; අලුත් කථා තිබෙනවා. පරණ කථා නම් මේ ටිකේ අපි කට්ටියම ඇහුවානේ. ගරු දයාසිරි ජයසේකර හිටපු ඇමතිතුමා කිව්වා, එක්තරා හෝටලයකට ගැහුවේ නැත්තේ ඇතුළේ හිටපු කෙනකුගේ බලවත්කම නිසාය කියලා. ඒ නිසා එයා ගෙන්වන්න ඕනෑ ඒ ගැන අහන්න. මනෝ ගනේසන් මහත්තයා මොනවාද කිව්වේ? "දවස් 10කට ඉස්සෙල්ලා මගේ PSO මේ ගැන කිව්වා" යි කිව්වා. හරින් ප්‍රනාන්දු ඇමතිතුමා මොකක්ද කිව්වේ? එතුමාගේ PSO එතුමාගේ තාත්තාට කිව්වාය කිව්වා. මේ ළඟදී වෙල්ගම මන්ත්‍රීතුමා කිව්වේ මොකක්ද? මන්ත්‍රීවරු 225 දෙනාම ඒක දැනගෙන හිටියාය කිව්වා. ඒක අපි සියලුදෙනාටම බලපාන චෝදනාවක්. මම නම් පිළිගන්නේ නැහැ ඒක. අද ඒකට විරුද්ධ වුණා, අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා. එතුමා කිව්වා, කිසිම PSO කෙනකු, කිසිම පොලිසියේ නිලධාරියකු ඒ ගොල්ලන් ආරක්ෂාවට අරගෙන නැහැයි කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය නැහැ.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-[බාධා කිරීම්] බලන්න, ප්‍රතිචාරය. කාලය නැහැ කිව්වාම මගේ මිත්‍රයෝ ඒකට හිනා වෙන හැටි බලන්න. [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නැවත නැවතත් කියන්නේ, මේ විශේෂ කාරක සභාවට පොදු විපක්ෂයේ සහයෝගය අපි බලාපොරොත්තු වෙනවා කියන එකයි. ඒ වාගේම මම කියනවා, මම අර නම් සඳහන් කළ සියලු දෙනා ඒකට ගෙන්වන්න කියලා. රන්ජන් රාමනායක වන මාත් ගෙන්වන්න. ගෙන්වා අහන්න, "ඔබේ PSO ඔබට මේ ගැන කිව්වේ නැත්තේ ඇයි, ලියුම පෙන්නුවේ නැද්ද" කියලා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ජනාධිපතිතුමා ගෙන්වනවාද?

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
එතුමා සන්නද්ධ සේවාවල සේනාධිපති; ආරක්ෂක ඇමති; නීතිය හා සාමය පිළිබඳ ඇමති; රටේ විධායක ජනාධිපති. ඉතින් මම කියන්නේ, එතුමාට නිවැරදි වෙන්න, එතුමාට නිරවුල් වෙන්න ඒක හොඳ අවස්ථාවක් කියලායි.

එතුමාට විශේෂ කාරක සභාවට ඇවිල්ලා කෙළින්ම කරුණු කියන්න පුළුවන්.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඊයේ කිව්වා, එන්නේ නැහැයි කියලා.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මා දන්නේ නැහැ එහෙම කිව්වේ මොකද කියලා. මොකද, එතුමා බොහොම විනිවිදභාවයෙන් යුතු, බොහොම ඍජු, නඩුවලින් හැංගෙන්නේ නැති, ගෝඨාභය රාජපක්ෂ මහත්මයා වාගේ බයිපාස් එකක් කියලා නිවාඩු ගන්නේ නැති, සිංගප්පූරුවේ හැංගිලා ඉන්නේ නැති කෙනෙක්. [බාධා කිරීමක්] සිංගප්පූරුවේ හැංගිලා නොවෙයිද ඉන්නේ? හරි. හරි. [බාධා කිරීමක්] ශ්‍රී ලංකා මහ බැංකුවේ කොල්ලකාරයන්ගෙන් සියයට 90ක් ඇල්ලුවා නේ. [බාධා කිරීමක්] කසුන් පලිසේන ඇල්ලුවා, ඇලෝසියස් ඇල්ලුවා, ඔහුගේ තාත්තා ජෙෆ්රි ඇල්ලුවා. මේ විධියට සියලුදෙනා අල්ලා තිබෙනවා. ජනාධිපතිතුමා නේ කිව්වේ, ශ්‍රී ලංකා මහ බැංකුවේ රුපියල් බිලියන 889ක කොල්ලයේ ලොකුම කොල්ලකාරයෝ අජිත් නිවාඩ් කබ්රාල්, පී.බී. ජයසුන්දර හා මහින්ද රාජපක්ෂ මහත්මයා කියලා. නමුත් මේකේ බිලියන 11යි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට disturb කළා.

මා කියන්නේ, මේ විශේෂ කාරක සභාවට සහයෝගය දෙන්න කියලායි. ඒ වාගේම ඒ කාරක සභාවට සහභාගිවෙලා ප්‍රශ්න අහන්න කියලා මා ඉල්ලීමක් කරනවා. ඒ වාගේම, මාධ්‍යවේදීන්ටත් අවස්ථාවක් දෙන්න. කාදිනල්තුමා වතිකානු රාජ්‍යයට ගිහින් කියන කථා එක්ක මේ කටයුතු අවුල් ජාලයක් වෙලායි තිබෙන්නේ. ඒ නිසා උන්වහන්සේත් කැඳවා, උන්වහන්සේ දන්නා අලුත් තොරතුරු අරගෙන විශේෂ කාරක සභාව බලවත් කරන්න, strengthen කරන්න. ඒ තුළින් මේ තිරය පිටුපස ඉන්න, මේ මහා අපරාධය පිටුපස ඉන්න, ඍජුව හෝ වක්‍රාකාරව හෝ දැනගෙන හෝ නොදැන මේ අපරාධයට හවුල් වුණු අය අල්ලන්න මෙය හොඳ අවස්ථාවක් කර ගන්න කියා ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා.4.22]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද හදිසි නීතිය පිළිබඳව සාකච්ඡා කරන්නේ අවුරුදු 10කට පමණ පසුවයි. මීට අවුරුදු 10කට කලින් අපි මාසයකට එක දවසක් හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳ විවාදයක් මේ පාර්ලිමේන්තුවේ පවත්වා තිබෙනවා. පසුගිය අවුරුදු දහයේම, විශේෂයෙන්ම එල්ටීටීඊ ත්‍රස්තවාදය පරාජය කළ දවසේ සිට අපේ රටේ සියලුදෙනාටම බොහොම ප්‍රීතිමත්, බොහොම නිදහස් කාල පරිච්ඡේදයක් උදා වුණා. හැබැයි, පසුගිය පාස්කු ඉරිදාවෙන් පස්සේ අපි නැවත වරක් හදිසි නීතිය පිළිබඳව සාකච්ඡා කරනවා, එකිනෙකාට චෝදනා කරනවා, එකිනෙකා ගැන සොයන්න ඕනෑය කියනවා. ඒ වාගේම, රන්ජන් රාමනායක රාජ්‍ය ඇමතිතුමා කියනවා, එතුමාගෙනුත් ඒ ගැන ප්‍රශ්න කරන්නය කියලා. එතුමා තවත් අයගේ නම් කියනවා. නමුත් මෙහි මූලික කාරණය ඒක නොවෙයි. අපි සොයන්න ඕනෑ ප්‍රධානම කාරණය තමයි, අවුරුදු 10ක් බොහොම නිදහසේ හිටපු රටකට මෙවැනි ප්‍රහාරයක් එල්ල වුණේ ඇයි කියන එක. මොකද, මේ ප්‍රහාරය පිළිබඳව කෙසේ වෙතත් ආගමික අන්තවාදය පතුරුවන පිරිසක් ගැන රජයට වාර්තා ලැබී තිබුණා. ආරක්ෂක රාජ්‍ය ඇමතිතුමා මේ සභාවේ ඉන්නවා. එතුමාටත් ඒ වාර්තා ලැබී තිබුණා. සහරාන් ඉන්නේ කොහේද කියලා අවුරුදු ගණනක් පොලීසියට සොයා ගන්න බැරි වුණා; හක් සහෝදරයන් ඉන්නේ කොහේද කියලා සොයා ගන්න බැරි වුණා. විශේෂයෙන්ම බුද්ධි අංශ විශ්වාස නොකරපු නිසාත්, බුද්ධි අංශ පිළිබඳ සැකයක් ඇති වුණු නිසාත්, බුද්ධි අංශවල ප්‍රධාන පිරිස් අත් අඩංගුවට ගැනීම්වලට වැඩි ඉඩක් දීලා තිබුණු නිසාත් තමුන්නාන්සේලා මේ ආගමික අන්තවාදය පැතිරෙන්න ඉඩ දුන්නා. ඒ තුළින් මේ බෙදවාචකයට ඉඩ සැලසුණා. ඒ පිළිබඳව තමයි අපි සාකච්ඡා කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අන්තවාදය එසේ මෙසේ අන්තවාදයක් නොවෙයි කියලා මා කියන්න කැමැතියි. ISIS සංවිධානය ඉරාකයේ සහ සිරියාවේ තිබුණු සංවිධානයක්. ඒ සංවිධානයේ කටයුතුවලදී ඔවුන්ගේ පවුලේ අය මැරුණේ නැහැ. යම්කිසි පුද්ගලයකු මිනිස් බෝම්බයක් මඟින් දිවි නසා ගත්තත්, ගෙදර ඉන්න කාන්තාව, දරුවන්, බඩේ ඉන්න දරුවායි මැරුණේ නැහැ නේ. මෙහිදී බෝම්බ පුපුරවාගෙන ස්වාමියාත්, ඔහුගේ භාර්යාවත්, දරුවනුත්, ඉපදෙන්න ඉන්න දරුවාත් මැරුණා. මේ පිළිබඳ නිවැරදි සත්‍යය තවම හෙළිවෙලා නැහැ. අපි තවම අඳුරේ අත පත ගාමින් ඒ ගැන එකිනෙකාට චෝදනා කරමින් ඉන්නවා. අපි කිව්වේ, පුද්ගලයන්ට චෝදනා එල්ල කරන්නේ නැතුව විශේෂ කාරක සභාවට මේ තත්ත්වය පිළිබඳව සොයන්නය කියලායි. නමුත් අද වෙලා තිබෙන්නේ නාටකයක් රඟපාන එකයි. ඒකට නාටකයක් කියන්නේ නැතුව මොකක් කියන්නද?

මෙවැනි තත්ත්වයක් නැවත මතුවෙන්න පුළුවන් කියලා ඊයේ හමුදාපතිවරයා ඇවිල්ලා කියනවා මා දැක්කා.

එහෙම නම් මේ පිළිබඳව හොයන්න. මේකට හේතුව මොකක්ද? ඒකට හේතු ගණනාවක් තිබෙනවා කියලා මා හිතනවා. ඒ ගැන කියන්න මට වෙලාව නැහැ. කෙසේ වෙතත් මා හිතන හැටියට ප්‍රධානම දේ තමයි අපේ ඔත්තු සේවා අඩපණ කිරීම. අපේ වාගේ මුහුදෙන් වට වෙලා තිබෙන රටකට, විශේෂයෙන්ම විවිධ ජාතීන් එකට ජීවත් වන රටකට, පසුගිය දශක කීපය තුළ -අවුරුදු දහයෙන් දහය- නොයෙකුත් ප්‍රශ්න ඇති වුණු රටකට මේ ඔත්තු සේවා මහ හැරලා, ඒවා සමඟ සම්බන්ධීකරණයක් නැතිව, ඒ තොරතුරු මත පොලීසියේ අය ක්‍රියාත්මක වන්නේ නැතිව මේ කටයුතු කරන්න බැහැ කියා මා

[ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

විශ්වාස කරනවා. ඒ කාරණය අපි පිළිගන්න ඕනෑ. ඒක ඔබතුමන්ලා අතින් වුණු වැරැද්දක්. ඒ වැරැද්ද මුළු ආණ්ඩුවම පිළිගන්න ඕනෑ. වැරැද්ද පිළිගනිමින් තමයි මේකට උත්තරයක් හොයන්න ඕනෑ. අපේ රටේ වැරැද්දක් වුණොත් ඒක පිළිගන්න කවුරුවත් ලැස්ති නැහැ. වැරැද්දක් වුණු හැම වෙලාවේම ඒ වැරැද්ද තව කාට හෝ පටවලා, තමන් නිදහස් වීමේ උපාය මාර්ගය පාවිච්චි කරන්නේ නැතිව, ලෝකයේ දියුණු රටවල් වාගේ මේ කටයුතු කරන්න ඕනෑ. යුරෝපය වාගේ රටක මේ වාගේ දෙයක් සිදු වුණා නම්, මේ වනකොට අගමැතිවරයා ඇතුළු ආණ්ඩුවම අස්වෙනවා. සමහර විට ජනාධිපතිවරයාත් අස්වෙනවා. ඒක තමයි ඇත්ත. අපේ රටේ වෙන්නේ නැත්තේත් ඒකයි. ඒ නිසා වැරැද්ද පිළිගෙන, මේ වැරැද්ද නැවත ඇති වීම වළක්වන්නේ කොහොමද කියන කාරණය සම්බන්ධයෙන් අපි කටයුතු කරන්නට ඕනෑ.

මම මේ සම්බන්ධයෙන් කරුණු කීපයක් ඉදිරිපත් කරන්න කැමතියි. අපේ රටේ විවිධ ආයතන තිබෙනවා. දැන් මේ ගරු සභාවේ වෛද්‍යතුමියකුත් ඉන්නවා. අපේ රටේ පළමුවැනි වතාවට වෛද්‍යවරයෙකුට ප්‍රශ්නයක් ඇති වුණා. ඒක ඇත්තද, බොරුද කියලා අපි දන්නේ නැහැ. කුරුණෑගල නිසා මා ඒ ගැන කථා කරන්න ඕනෑ. සිසේරියන් සැත්කම කර ගන්නා කාන්තාවන් වඳ කරනවා කියලා තමයි ඒ වෛද්‍යවරයාට ප්‍රශ්නයක් ඇති වුණේ. ඒක කරන්න පුළුවන්ද නැද්ද කියලා මා දන්නේ නැහැ, ගරු තුසිතා විජේමාන්න මන්ත්‍රීතුමියනි. නමුත් කාන්තාවන් දාහක් විතර පෝලිමේ ඇවිල්ලා ඒ ගැන සාක්කි දීලා තිබෙනවා. ඒ ප්‍රමාණය දාහකට වැඩියි. ඒ හැමෝම මොකක් හෝ ප්‍රශ්නයක් නිසා තමයි ඇවිල්ලා තිබෙන්නේ. සිසේරියන් සැත්කමින් පස්සේ ළමයෙකු ලැබුණා නම් කාන්තාවන් දාහක් සාක්කි දෙන්න එන්නේ නැහැනේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
බොහොම ස්තුතියි.

එතකොට මේ වෛද්‍යවරයාට එරෙහිව ක්‍රියාත්මක වෙන්න ඕනෑ කවුද? අද ක්‍රියාත්මක වෙන්නේ කවුද? මේ ගැන ප්‍රශ්න කරනකොට සෞඛ්‍ය ඇමතිතුමා ඉතාම කෝපාවිෂ්ටව කථා කරනවා. ඊළඟට, "මෙහෙම වෙන්න බැහැ" කියලා තව අය කියනවා. ඇත්තටම මේ ගැන හොයන්න ඕනෑ කවුද? හොයන්න ඕනෑ වෛද්‍ය සභාවෙන්. වෛද්‍ය සභාව අද සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දයි. මා ඔබතුමියගෙන් ප්‍රශ්නයක් අහන්න කැමැතියි. ඔබතුමියන්ලාගේ විනය කටයුතු කරන්නේ වෛද්‍ය සභාව නේද? විනය කටයුතු කරන්නේ වෛද්‍ය සභාව නේ. වෛද්‍යවරයෙකුට එරෙහිව විනයානුකූල ප්‍රශ්නයක් ඇති වෙලා තිබියදී, එවැනි දෙයක් ලංකාවේ කවදාවත් සිදු නොවී තිබියදීත් වෛද්‍ය සභාව නිහඬ ඇයි? මට ලැබිලා තිබෙන ආරංචිවලට අනුව නම් ඒගොල්ලන් රැස්වෙලා තිබෙනවා. "අපි මේ ගැන දැන්ම කථා නොකර සිටිමු" කියලා ඔවුන් මහ හැරලා තිබෙනවා. මෙහෙම ආයතන තියාගෙන රටක් පාලනය කරන්න පුළුවන්ද කියලායි මම අහන්නේ. අපේ නීතිඥවරුන්ට ප්‍රශ්නයක් ආවා නම් ශ්‍රේෂ්ඨාධිකරණය තමයි ඒ අයට විරුද්ධව ruling එකක් ගෙනැල්ලා, වැඩ කිරීම නවත්වන්නේ. පසුගිය කාලයේ නාගානන්ද මහත්මයාට එහෙම දෙයක් සිද්ධ වුණා. තව නීතිඥවරු ගණනාවකට එහෙම වුණා. මේ කටයුත්ත කරන්න සිටින වෛද්‍ය සභාව නිශ්ශබ්දව තියාගෙන, මොනවත් කරන්නේ නැතිව තමුන්නාන්සේලා මෙහි ඇත්ත හෙළි කරන්නේ නැත්තේ ඇයි? කාදිනල්තුමා කියන්නේත් ඒකයි. මෙවැනි අන්තවාදයක ඇත්ත හෙළි කරන්නේ නැත්තේ ඇයි? මේ වෛද්‍යවරයාගේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ඇත්ත හෙළි කරන්නේ නැත්තේ ඇයි? ඇත්ත හංගන්න එපා. ෆවුසි මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේක මුස්ලිම්වරුන්ට විරුද්ධව කරන දෙයක් නොවෙයි. එතුමා ඉතාම වැදගත් ප්‍රකාශයක් තමයි අද සිදු කළේ. ඇත්තටම මේ රටට ආගමික අන්තවාදී ප්‍රහාරයක් එල්ල වුණා. එලෙස අන්තවාදී ප්‍රහාරයක් එල්ල වුණාම ඒ ගැන හොයන්න ඕනෑ. ඒක, පුද්ගල කණ්ඩායමකට, ආගමික කණ්ඩායමකට හෝ යම් ජන කොට්ඨාසයකට එරෙහිව කරන එකක් නොවෙයි. අද කොහේවත් නැති ගෙවල්වලට ගැහුවා කියලා ඒ කාරණය සම්බන්ධ කරලා, මේ සිද්ධිය සම්පූර්ණයෙන් මහ හරිනවා. ඒ නිසා මේ සිද්ධිය ගැන හොයන්න; ඇත්ත කියන්න. මේ විශේෂ කාරක සභාවත් හොයන්නේ ඇත්ත නොවෙයි, වෙන ඒවා. ඒ නිසා ඇත්ත කථා කරන, පිළිගන්න පුළුවන් සත්‍යගරුක සභාවක් හදලා, මේවා ගැන හොයලා, අපේ ජාතීන් අතර තිබෙන ප්‍රශ්න විසඳන්න ක්‍රියා කරන්න. ෆවුසි හිටපු ඇමතිතුමාත් කිව්වා වාගේ අන්තවාදී විධියට මේ දිහා බලන්න බැහැ කියන එක ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ප්‍රසන්න රණතුංග මන්ත්‍රීතුමා.

ඊට ප්‍රථම කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙකු ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මන්ත්‍රීතුමියගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු පී. හැරිසන් මහතා (කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீ. ஹரிசன் - கமத்தொழில், கால்நடை வளங்கள் அபிவிருத்தி, நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரகவள மூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. P. Harrison - Minister of Agriculture, Livestock Development, Irrigation and Fisheries and Aquatic Resources Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු කංචන විජේසේකර මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு கஞ்சன விஜேசேகர அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) துஷிதா விஜேமான்ன அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. KANCHANA WIJESEKERA left the Chair, and THE HON. (DR.) (MRS.) THUSITHA WIJEMANNA took the Chair.*

[අ.භා.4.30]

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, හදිසි නීතිය පිළිබඳව සාකච්ඡා කරන අද දවසේ මේ හදිසි නීතියේ ගෙන ඒමේ අවශ්‍යතාව තිබෙන්නේ ආණ්ඩුවටද, විපක්ෂයටද කියන කාරණය සම්බන්ධයෙන් අපට මේ පාර්ලිමේන්තුව තුළ ගැටලුවක් මතුවෙලා තිබෙනවා. මොකද, විවාදය ආරම්භයේ ඉඳලා මේ පාර්ලිමේන්තුව තුළ ගණපූරණය පවත්වාගෙන යන්න පුළුවන්කම ලැබුණේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් නිසාය කියන කාරණය මේ අවස්ථාවේ දී මතක් කරන්නට ඕනෑ. ඒ නිසා මේ හදිසි නීතිය ගෙනෙන්න ආණ්ඩුවට සද්භාවයෙන්ම අවශ්‍යතාවක් තිබෙනවාද කියන කාරණය සම්බන්ධයෙන් අපට ගැටලුවක් මතු වනවා. ආණ්ඩුවේ අගමැතිවරයා, ආණ්ඩුවේ ඇමතිවරු, රජයේ ආරක්ෂක අංශ ප්‍රධානීන් පසුගිය දවස්වල කරපු විවිධ ප්‍රකාශ දිහා බැලුවාම, මේ හදිසි නීතිය ගෙන ඒමේ අවශ්‍යතාවක් තිබෙනවාද කියන කාරණය සම්බන්ධයෙන් ගැටලුවක් පැන නඟිනවා. "මේ රටේ ආරක්ෂාව තහවුරුයි. ආරක්ෂාව පිළිබඳව කිසිම ගැටලුවක් නැහැ" කියලා අගමැතිවරයා කියන කොට, මේ රටේ හිටපු හමුදාපතිවරයා වාගේම ආණ්ඩුවේ ප්‍රබල මන්ත්‍රීවරයකු වන සරත් ෆොන්සේකා මැතිතුමා කිව්වා, "රටේ ආරක්ෂාව ප්‍රමාණවත් නැහැ. ආරක්ෂාව තහවුරු කර ඇතැයි කිසිවෙකුට කියන්න බැහැ" කියලා.

ඒ වාගේම, යුද හමුදා ප්‍රධානියා අප්‍රේල් 21 ප්‍රහාරය සම්බන්ධයෙන් පිහිටවපු පාර්ලිමේන්තු කමිටුවට ඇවිල්ලා කියනවා, "ආරක්ෂාව තහවුරු කරන්න බැහැ, ඕනෑම මොහොතක ඕනෑම දෙයක් වෙන්න පුළුවන්" කියලා. මේ තුන් දෙනාම කියන කාරණා දිහා බැලුවාම මේ ගැන අවබෝධයෙන් ඉන්න මිනිසුන්ට මේ ආණ්ඩුවම විහිළුවක් බවට පත් වෙලා තිබෙනවා. අද ආරක්ෂාව තහවුරු කරලා කියලා අගමැතිවරයා කියනවා. නමුත්, දෙමව්පියන් ගිහිල්ලා පාසල් මුර කරනවා. පාසල් මුර කරන ව්‍යාපෘතිය ආණ්ඩුවේ රැකියා දස ලක්ෂයේ එක රස්සාවක් වාගේ අම්මලා, තාත්තලා ගිහිල්ලා තමන්ගේ දරුවන් වෙනුවෙන් පාසල් මුර කරනවා. රැකියා දස ලක්ෂය කෙසේ වෙතත්, අද දෙමවුපියන් දස ලක්ෂයකට වැඩිය මාසයක් තිස්සේ පාසල් මුර කරනවා. මේ රටේ ආරක්ෂාව තහවුරු කරන්න අවශ්‍ය නිසා තමයි, අපි වගකීමක් දරන විපක්ෂයක් හැටියට මේ හදිසි නීතියට සහයෝගය දෙන්න කටයුතු කරන්නේ. හැබැයි, අපි මේ කාරණා ඉදිරිපත් කරන්නේ ආණ්ඩුව විවේචනය කරනවාට වඩා, ආණ්ඩුව මේ වැරැදි නිවැරැදි කරගත යුතු නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පසුගිය දවසක අග්‍රාමාත්‍යතුමා මාධ්‍යයට ප්‍රකාශයක් කළා, "සිරියාවේ පුහුණුව ලබපු අය ඉන්න බව දන්නවා, නමුත් ඒ අය අත්අඩංගුවට ගන්න මේ රටේ නීති නැහැ"යි කියලා. හැබැයි, ඊයේ-පෙරේදා මේ පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ගෙනැල්ලා සම්මත කරලා, මේ රටේ මුස්ලිම් අන්තවාදී සංවිධාන කිහිපයක් හදිසි නීතිය යටතේ තහනම් කළා. ඇයි එදා ඒක කළේ නැත්තේ? එදා ඒ දේ කළා නම්, මේ මැරිච්ච 300ක විතර මිනිසුන්ට අද ජීවතුන් අතර ඉන්න ඉඩ තියන්න තිබුණා. මේක ආණ්ඩුවේ වගකීම් පැහැර හැරීමක්. මේ ආණ්ඩුව අද ජාතික ආරක්ෂාව විහිළුවකට ගෙන තිබෙනවා. ඒ නිසා මින් ඉදිරියටවත් මේවා පාඩමට අරගෙන කටයුතු කිරීම ආණ්ඩුවේ වගකීමක්. අද මේ ආණ්ඩුව බලයට ගෙනාපු අය කියන දේවල් අහපුවාම -රූපවාහිනිය දිහා බලාගෙන හිටියාම- අපට හිනා යනවා. මොකද, අපි මේ ආණ්ඩුව ගෙනෙන්න උදව් කරපු අය නොවෙන නිසා. මම දැක්කා ඊයේ-පෙරේදා සෝභිත හාමුදුරුවන් වෙනුවෙන් පැවැති උත්සවයක දී සරත් විජේසේකර මහාචාර්යවරයා කිව්වා, "මේ ජනාධිපති, අගමැති බලයට ගෙනෙන්න කටයුතු කරපු මට ශාප වේවා!" කියලා. එතුමාට ශාප වෙනවා. අපි හැමෝම කියනවා, තොටත් ශාප වේවා! කියලා. අපි විතරක් නොවෙයි, මුළු රටම කියනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒ විතරක් නොවෙයි, ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ටත් කියනවා. ඒ තරමට අද මිනිසුන්ට මේ ආණ්ඩුව එපා වෙලා තිබෙන්නේ. හැබැයි, ඒ ගොල්ලන්ට ශාප වුණා කියලා වෙච්ච වැරැද්ද නිවැරැදි කර ගන්න පුළුවන්කමක් නැහැ. දින 45ක් ඇතුළත තමයි මෛත්‍රීපාල සිරිසේන මේ රටේ ජනාධිපතිවරයා වෙන්නේ. රනිල් වික්‍රමසිංහ මහත්මයා දින 100න් අගමැතිවරයා වෙනවා. හැබැයි, මේ දෙන්නා එකතු වෙලා අවුරුදු හතරක් යනකොට රටම විනාශ කරලා ඉවරයි. රටම කාලා ඉවරයි. අනාගත දරුවන් වෙනුවෙන් රටක් ඉතිරි කරන්නේ නැති තත්ත්වයකට අද පත් වෙලා තිබෙනවා.

පසුගිය දවස්වල සෝභිත හාමුදුරුවන්ගේ අනුස්මරණයට ඇවිල්ලා රද්දොළුවේ සුනිල් අන්තෝනි පියතුමා ප්‍රකාශයක් කරනවා අපි දැක්කා. උන්වහන්සේ කිව්වේ මොකක්ද? උන්වහන්සේ කිව්වා, "අපට වැරදුණු බව මාදුළුවාවේ සෝභිත හාමුදුරුවෝ දිනක් මට කිව්වා" කියලා. සෝභිත හාමුදුරුවෝ අපවත් වෙන්නත් හේතුව උන්වහන්සේට ඇති වෙච්ච කනගාටුව තමයි. උන්වහන්සේගේ බලාපොරොත්තු කඩ වෙච්ච නිසා, ජනතාවට මුහුණ දෙන්න බැරි ලජ්ජාවටයි අපවත් වුණේ. ඒකටත් මේ ආණ්ඩුවේ අය වගකීම භාර ගන්න ඕනෑ. අපි ආපස්සට හැරිලා පසුගිය අවුරුදු හතර දිහා බැලුවාම, මේ ආණ්ඩුව බලයට පත් කරලා අවුරුදු හතරකට පස්සේ අපට වැරදිලා තිබෙන බව උන්වහන්සේ විතරක් නොවෙයි මුළු රටම පිළිගෙන ඉවරයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ඊයේ-පෙරේදා යුනිසෙෆ් සංවිධානය කියා තිබුණා, පසුගිය පාස්කු ප්‍රහාරයෙන් මියගිය අය අතර ළමුන් 45දෙනෙක් ඉන්නවා කියලා. පසුගිය සතියේ "මව්බිම" පුවත් පතේ තිබෙනවා මම දැක්කා, ළමයින් 31දෙනෙකුගේ හිස් කබල් අලුතින් දාන්න සිදු වෙලා තිබෙනවා කියලා. ඒ සඳහා ආධාර ඉල්ලලා තිබුණා, උදව් කරන්න කියලා තිබුණා. මේ ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ට මම කියනවා, ඔබතුමන්ලා දවස ගණනේ පුවත් පත්වල දමන දැන්වීම් ප්‍රමාණය බලන්න, ඒවාට කොයි තරම් වියදමක් දරනවාද කියලා බලන්න කියලා. තමන්ගේ ප්‍රතිරූපය ගොඩ නඟන්න මේ ආණ්ඩුව කොයි තරම් වියදම් කරනවාද? තමන්ට හොඳ දේශපාලන ගමනක් යන්න මොන තරම් වියදම් කරනවාද? ඇයි ඒ මුදල් මේ දරුවන් වෙනුවෙන් පාවිච්චි කරන්න බැරි? ඇයි මේ ආණ්ඩුව ඒ පිළිබඳ නිහඬ ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නේ? මේ ආණ්ඩුවේ වැරැද්දෙන් වෙච්ච මේ සිද්ධිය නිසා තුවාල ලබපු දරුවන්ට ආධාරයක් දීලා, ඒ දරුවන් විදේශ රෝහල්වලට හරි යොමු කරලා බෙහෙත් හේත් ටිකක් කර ගන්න මේ ආණ්ඩුව කටයුතු කරන්නේ නැත්තේ ඇයි? අද මහා පරිමාණයේ හොරකම්, මහා පරිමාණයේ නාස්ති කිරීම් විශාල වශයෙන් සිදු වෙනවා. නමුත්, පාස්කු ප්‍රහාරයට ලක් වෙච්ච අය පිළිබඳව සාධාරණයක් ඉටු කරන්න මේ ආණ්ඩුව කටයුතු කරන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ රටේ මාස 11ක දරුවෙක් කුසගින්නේ මිය යන තත්ත්වයක් තිබියදී මේ වාගේ දේවල් ගැන හොයන්න ආණ්ඩුව කොයි විධියට කටයුතු කරයිද කියන එක අපට හිතා ගන්න පුළුවන්.

කටුවාපිටිය දේවස්ථානයට එල්ල වූ ප්‍රහාරයෙන් කටාන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ 97 දෙනෙකු මිය ගිහින් තිබෙනවා. 230 දෙනෙක් තුවාල ලබා තිබෙනවා. අපි දන්නා තරමින් මේ මියගිය 97 දෙනාගෙන් 80 දෙනෙකුට විතර තමයි ලක්ෂ දහයේ වන්දිය දෙන්න කටයුතු කළේ. ජෝන් අමරතුංග ඇමතිතුමන්ලා වන්දි ගෙවන්න ගියාට පස්සේ ඒ මිනිස්සු "හූ"

[ගරු ප්‍රසන්න රණතුංග මහතා]

කියලා ආපසු යවපු හැටි අපි දැක්කා නේ. සමහර ඇමතිවරු සල්ලි කොළ ගණන් කර කර තමයි ඒ මිනිසුන්ට දුන්නේ. ප්‍රහාරයට ලක් වුණු මිනිස්සු ඒ තරම් හැල්ලුවට ලක් කරන්න මෙතුමන්ලා කටයුතු කළා.

අනෙක් කාරණය මේකයි. මේ ප්‍රහාරවලින් 230 දෙනෙක් තුවාල ලබා සිටිනවා. නමුත් ආණ්ඩුව ඒ අයට වන්දි ගෙවීමේ කටයුතු කරලා නැහැ. මේ අයටත් වන්දි ගෙවීම සිදු වෙන්න ඕනෑ, අග්‍රාමාත්‍ය කාර්යාලයට අනුබද්ධව තියෙන හානිපූරණ කාර්යාලයෙන්. මේ කටයුතු සම්බන්ධයෙන් ඒ ලියකියවිලි සකස් කරනකොට ඒ නිලධාරින් වෛද්‍යවරුන්ගේ උපදෙස්වත් පිළිගන්නේ නැහැ. ඒ නිසා තමයි, මේ සිද්ධියෙන් තුවාල ලැබූ අයට වන්දි ගෙවා ගන්න බැරි වෙලා තියෙන්නේ. ප්‍රහාරය සිදුවෙලා මාස දෙකක් ගතවෙන මේ අවස්ථාවේත් එයින් තුවාල ලැබූ අය මිය යනවා. මේ ඊයේ පෙරේදාත් ඒ ප්‍රහාරයට ලක් වුණු කෙනෙක් මිය ගියා. ආණ්ඩුව මේ පිළිබඳ වගකීම අරගෙන කටයුතු කරන්න ඕනෑ. මේ පාස්කු ප්‍රහාරය කටුවාපිටිය දේවස්ථානයට විතරක් නොවෙයි, එල්ල වුණේ. මඩකලපුව සහ කොච්චිකඩේ දේවස්ථානවලදීත් මේ සිද්ධියට මුහුණ දුන් මිනිසුන් පිළිබඳව රටේ අවධානය යොමු කරන්න ඕනෑ. මේ ප්‍රහාරයත් එක්ක, මේ ආණ්ඩුවේ කළමනාකරණය නිසි පරිදි කරගන්න බැරි වෙලා තිබෙන නිසා අද රටේ ආර්ථිකය පවා කඩා වැටෙන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ආණ්ඩුව ප්‍රජාතන්ත්‍රවාදය ගැන මහා ලොකුවට කියවනවා. නමුත් මේ ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍රවාදයක් නැහැ. මෙතුමන්ලා පළාත් පාලන මැතිවරණය අවුරුදු ගණනාවක් තිස්සේ කල් දැම්මා. අද පළාත් සභා මැතිවරණයත් දිගින් දිගටම කල් දමමින් සිටිනවා. මේ ආණ්ඩුව මැතිවරණ පවත්වන්න බයයි. එහෙම බය වෙලා තිබෙන්නේ, මේක ප්‍රජාතන්ත්‍රවාදය අමු අමුවේ උල්ලංඝනය කරන ආණ්ඩුවක් නිසායි. බලයට එනකොට නම් මේ අය කිව්වේ, "මේක ප්‍රජාතන්ත්‍රවාදය සුරැකීම සඳහා ගෙනෙන ආණ්ඩුවක්" කියායි. අගමැතිවරයා හැඳින්වූයේ, "ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රතිමූර්තිය" කියායි. හැබැයි, අද මිනිසුන්ගෙන් ඇහුවාම ඔවුන් ඒ ගැන හොඳ හැටි කියා දෙනවා.

මේ සිද්ධිය වුණාට පස්සේ, වැල්ලම්පිටියේ ඒ ෆැක්ටරි එක පිළිබඳව මම යම් ප්‍රකාශයක් කළා. මේකට ආණ්ඩුවේ ඇමතිවරයකුගේ සම්බන්ධතාවක් තිබෙනවාය, ඔහුගේ සහෝදරයකුගේ සම්බන්ධතාවක් තිබෙනවාය කියලා මම කිව්වා. මට ලැබුණු තොරතුරු මත තමයි මම ඒ ප්‍රකාශය කළේ. එය වැරදි වෙන්න පුළුවන්. මම ඒ වෙලාවේදී කිව්වා, 'සියලු සංශෝධනවලට යටත්ව මට ලැබුණු තොරතුරු' කියලා. අද කමිටුවල මේ ගැන සාකච්ඡා කරනවා. විශේෂ කාරක සභාවේ මේ පිළිබඳව සාකච්ඡා කරද්දී, ප්‍රශ්න කරද්දී, මුල ඉඳන්ම ඒ ෆැක්ටරි එකේ අයිතිකරුවන් කවුද, ඒ අය වෙනස් වෙලා තිබෙන්නේ කවදාද, ඒ අය කාගේ කවුද කියලා හොයා බලන්න ආණ්ඩුව කටයුතු කළාද කියන කාරණා විමසා බලනවාද කියලා අපි අහනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ කමිටුව මඟින් කරන්න හදන්නේ වැරදිකාරයන් සොයා බලා ඔවුන්ට දඬුවම් කිරීම නොව, වැරදිකාරයන්ට සුදු හුණු ගාන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමද කියලා මිනිස්සු අතර අද සැකයක් මතු වී තිබෙනවා.

අද මේ රටේ ආර්ථිකය කඩා වැටිලා තිබෙනවා. කටුනායක ප්‍රදේශයේ ටැක්සි ව්‍යාපාරයේ යෙදෙන කණ්ඩායම් ඊයේ පෙරේදා මා මුණ ගැහෙන්න ආවා. අද ගුවන් තොටුපළෙන් මේ රටට සංචාරකයන් එන්නේ නැහැ. ඒ නිසා ඒ අයට ආදායම් නැහැ. හැබැයි, ගුවන් තොටුපළ ඒ අයගෙන් අය කරන මුදල් අඩු කරන්න කටයුතු කරලා නැහැ. ඒ නිසා ඒ මිනිස්සු අසරණ තත්ත්වයට පත්වෙලා ඉන්නවා. මේ ප්‍රහාරයෙන් මිය ගිය අයගේ පවුල්වල සාමාජිකයන්, තුවාල ලැබූ අය වාගේම මේ හේතුවෙන් තම ආර්ථිකය කඩා වැටීම නිසාත් මේ රටේ විශාල පිරිසක් අද අසරණ වෙලා ඉන්නවා. සංචාරක ව්‍යාපාරයේ යෙදී සිටි අය කෝටි ගණනින්, ලක්ෂ ගණනින් ණය අරගෙන තමයි ඒ සංචාරක හෝටල් හැදුවේ. අද ඒ හෝටල් පවත්වාගෙන යන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඉදිකිරීම් කර්මාන්තයත් අද මුළුමනින්ම කඩා වැටී තිබෙනවා. ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළින් ජීවත් වුණු මේසන් බාස්ට, අත්වැඩ දුන් පුද්ගලයාට අද ජීවත් වෙන්න බැරි තත්ත්වයක් උදා වෙලා තියෙනවා. ආණ්ඩුව මේ කාරණා පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ. පුවත් පත්වලින් නම් හැම දාම එක එක දේවල් කියනවා. මේ අයට සහන දෙන්න කටයුතු කරනවාය කියලා ආණ්ඩුව කිව්වා. ඊළඟට, සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න කටයුතු කරනවාය කිව්වා. හැබැයි, ඒ අයට දීලා තියෙන සහන මොනවාද කියා ඔබතුමන්ලා මහ පොළොවට බැහැලා බලන්න. ඒ කියන දේවල් ප්‍රායෝගිකව සිද්ධ වෙන්න ඕනෑ. මේ හැම දෙයක් ගැනම ආණ්ඩුව අවධානය යොමු කරන්න ඕනෑ.

මේ විශේෂ කාරක සභාව ගැන ඊයේ පෙරේදා ජනාධිපතිවරයා මොනවාද කියලා තිබුණේ? "මේක නාට්‍යයක්, මේක පුහුණු කරන්නේ අරලියගහ මන්දිරයේ" කියලා එතුමා කියා තිබුණා. අපි නොවෙයි, එහෙම කිව්වේ. මේ ගරු සභාවේදී මීට පෙර කථා කළ මන්ත්‍රීතුමා කිව්වා, විපක්ෂයෙන් තමයි ඒක කියන්නේ කියලා.

අපි නම් එහෙම කිව්වේ නැහැ. තමුන්නාන්සේලා පත් කර ගත්ත ජනාධිපතිවරයා තමයි එහෙම කියන්නේ. ඔබතුමන්ලාගේ ප්‍රශ්න ඔබතුමන්ලා ප්‍රශ්න විසඳා ගන්න ඕනෑ. ඒවා අපට අදාළ නැහැ. එළ හරකයි, මී හරකයි කුඹුරේ වැඩ කරන්න දාපුවාම ඒ දේ තමයි වෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. "ජනාධිපතියි, අගමැතියි එළ හරකයි, මී හරකයි" කියලා නොවෙයි මම මේ කියන්නේ. මම කියන්නේ, එහෙම තමයි වෙන්නේ කියන එකයි.

අද මේ ආණ්ඩුව විහිළුවක් බවට පත් වෙලා ඉවරයි. ඇනස්ලි, සැමුවෙල් හා බර්ටි කියන්නේ ප්‍රවීණ විකට කලාකරුවෝ තුන්දෙනෙක්. ඔවුන් තුන්දෙනාට අගෞරවයක් නොවේවා කියායි මම මේ කථාව කියන්නේ. මොකද, ඔවුන් මිනිසුන් හිනැස්සුවේ විනෝදාස්වාදය ලැබෙන විධියටයි. අද මේ රට පාලනය කරන ජනාධිපති, අගමැති සහ කථානායක ගැන මිනිස්සු කියන්නේ මොනවාද? ඇනස්ලි, සැමුවෙල්, බර්ටි කියන තුන්දෙනාට වඩා දරුණු ලෙස මේ අය අද විහිළුකාරයෝ බවට පත් වෙලා කියායි මිනිස්සු කියන්නේ. ඒ නිසා මේ තත්ත්වයෙන් රට මුදාගත යුතු වනවා. මේ ආණ්ඩුවට මේ රට පාලනය කරන්න බැහැ. මේ ආණ්ඩුව ගැන ජනතාව තුළ විශ්වාසයක් නැහැ. විශ්වාසයක් නැතිය නොහැකි ආණ්ඩුවකට මේ රට ගොඩනඟන්න බැහැ. මේ රටේ ආර්ථිකය ගොඩනඟන්න පුළුවන් ආණ්ඩුවක් ඇති කරලා, මේ රට සමෘද්ධිමත් රටක් බවට පත් කරන්න රටේ ජනතාවට අවස්ථාවක් ලබා දෙන්නය කියන ඉල්ලීම කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු ප්‍රසන්න රණතුංග මන්ත්‍රීතුමා විශේෂ කාරක සභාව ගැන කථා කළා. ඇත්ත වශයෙන්ම ඒ විශේෂ කාරක සභාව පත් කිරීම ගැන පක්ෂ නායක රැස්වීමේදී සාකච්ඡා කරලායි පාර්ලිමේන්තුවට යෝජනාවක් ගෙනාවේ. ඒ යෝජනාව ඒකච්ඡන්දයෙන් සම්මත වුණා. ඒ විශේෂ කාරක සභාව පත් කිරීමේ ඒ යෝජනාවට ඔබතුමන්ලාගේ පැත්තේ අයත් අත්සන් කළා නේ, ගරු මන්ත්‍රීතුමනි. උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමා, විපක්ෂයේ ප්‍රබලයකු වන වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා, ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමා, අනුර ප්‍රියදර්ශන යාපා මන්ත්‍රීතුමා. සී.බී. රත්නායක මන්ත්‍රීතුමා, -

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු සභානායකතුමනි, - [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා පොඩ්ඩක් ඉන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු සභානායකතුමනි, අසත්‍ය ප්‍රකාශ කරන්න එපා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Member, please sit down.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු සභානායකතුමාට කියන්න අසත්‍ය ප්‍රකාශ කරන්න එපා කියලා. ඔබතුමා වාඩි වෙන්න. ඇයි, ඔබතුමා මේ පාර්ලිමේන්තුවේදි අසත්‍ය ප්‍රකාශ කරන්නේ? තමුන්නාන්සේලා ඒ යෝජනාව වෙනස් කළා නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒ වාගේම, නිමල් ලාන්සා මන්ත්‍රීතුමා,- [බාධා කිරීමක්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු සභානායකතුමනි, ඔබතුමා අසත්‍ය ප්‍රකාශ කරන්නේ ඇයි? ඔහොම කියන්න එපා. තමුන්නාන්සේලා ඒ යෝජනාව වෙනස් කළා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
අනුරාධ ජයරත්න මන්ත්‍රීතුමා, ලක්ෂ්මන් යාපා අබේවර්ධන මන්ත්‍රීතුමා කියන මේ සියලුදෙනාම ඒ යෝජනාවට අත්සන් කර තිබෙනවා. ඒ ඔබතුමන්ලාගේ පැත්තේ අය නේ, මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි. ඒ යෝජනාවට අත්සන් කරලා, ඒක සම්මත වෙලා, ඒ වැඩ කරගෙන යනකොට ඔබතුමන්ලා දැන් ඒකට විරුද්ධව කථා කරනවා.- [බාධා කිරීමක්].

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා.4.43]

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

මා පාර්ලිමේන්තු රැස්වීම්වලට සහභාගි වන්නේ සහ මාධ්‍ය ඉස්සරහට එන්නේ මාස දෙකකට පසුව බව පළමුවෙන්ම කියන්න ඕනෑ. අප්‍රේල් 24වන දා මගේ දෙවැනි දරුවා මෙලොවට බිහි වුණා. ඒ නිසා, අප්‍රේල් 21 සිදු වූ පාස්කු ප්‍රහාර පිළිබඳව කථා කරන්න හෝ ඒ ප්‍රහාරවලට මුහුණ දුන් සියලු ජනතාව වෙනුවෙන් සහ එම ප්‍රහාරවලදී මිය ගිය අයගේ පවුල් වෙත කනගාටුව ප්‍රකාශ කරන්න හෝ ඇත්තටම මට අවස්ථාවක් ලැබුණේ නැහැ. එම නිසා මා මේ අවස්ථාව ඒ සඳහා යොදා ගන්නවා.

පසුගිය මාස දෙකක කාලය ඇතුළතදී මාධ්‍යවල ප්‍රචාරය වුණු දේවල් නිවසේ ඉඳගෙන බලාගෙන ඉන්නකොට මම දැඩි කලකිරීමකට පත් වුණා. මොකද, මේ රටේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

විධියට අපි පත් කර ගත්ත පුද්ගලයා ඍජුව හා වක්‍රව පාස්කු ප්‍රහාරයට සම්බන්ධයි කියලා විශේෂ කාරක සභාවේදී ඔප්පු වනකොට ඇත්තටම මට පුදුමාකාර කනගාටුවක් ඇති වුණා. මේ පුද්ගලයා මෙවැනි කෙනෙක් කියලා අපි දැනගෙන හිටියා නම්, මෙවැනි අය වෙනුවෙන් අපි එළියට බහින්නේ නැහැ නේද කියන පසුතැවිල්ල මට ඇති වුණා. කෙසේ හෝ වේවා ජනාධිපතිතුමා කියනවා මම දැක්කා, "විශේෂ කාරක සභාව අගමැතිතුමා අරලියගහ මන්දිරය ඇතුළේ practise කරලා, ඊළඟ දවසේ උදේ පාර්ලිමේන්තුවේ පෙන්වනවා" කියලා. හැබැයි, මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. දැන් මේ විශේෂ කාරක සභාවේ කටයුතු අරලියගහ මන්දිරයේදී ඒ විධියට practise කරනවාය කියමු කෝ. විශේෂ කාරක සභාවට මේ වනකොට අසාත් සාලි මැතිතුමා කැඳවලා තිබෙනවා. එතුමා ජනාධිපතිතුමාගේ ගෝලයෙක්. ඊළඟට, හිස්බුල්ලා මැතිතුමා කැඳෙව්වා. එතුමාත් ජනාධිපතිතුමාගේ ගෝලයෙක්. ඊළඟට, හේමසිරි ප්‍රනාන්දු මහතා කැඳෙව්වා. එතුමාත් ජනාධිපතිතුමා පත් කළ කෙනෙක්. ඒ වාගේම හිටපු පොලිස්පතිතුමාත් කැඳෙව්වා. එතුමාත් ජනාධිපතිතුමා පත් කළ කෙනෙක්. මේ සියලුදෙනාම අගමැතිතුමාගේ හිතවතුන් නොවෙයි. ඒ අය ඇවිල්ලා සාක්ෂි දෙනකොට, ඒ අයගෙන් හරස් ප්‍රශ්න අහනකොට, ඒ අය කථා කරන විධියෙන් අවසානයේ ඇඟිල්ල දිගු වෙන්නේ, පැහැදිලිවම

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මට සැකයක් තිබෙනවා, ඇත්තටම මේ සිද්ධිය වෙන්න දීලා බලාගෙන හිටියාද කියලා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මේක දැනගෙන කාටවත් නොකියා සද්ද නැතිව හිටියාද? ඇත්තටම මේ ප්‍රශ්නය වුණාට පස්සේ කෙළින්ම චෝදනාව - blame - යන්නේ අග්‍රාමාත්‍යතුමා ඇතුළු කැබිනට් මණ්ඩලයට, මේ ආණ්ඩුවට නිසා එතුමා අත් දෙක පිහදාගෙන පැත්තකට වුණාද කියලා ඇත්තටම සැකයක් ඇති වනවා. ඒ සැකය මට විතරක් නොවෙයි, සාමාන්‍ය ජනතාවටත් ඇති වනවා. හැබැයි, ඒක පාරා වළල්ලක් විධියට එතුමාටම කැරකිලා ආවා. මොකද, උඩ ඉන්නවා නේ, දෙවිවරු කියලා කට්ටියක්. ඇත්තටම මේවා කොහෙන් හෝ කැරකිලා එන්න ඕනෑ නේ. එහෙම නැත්නම් එතුමාට දැනෙන්නේ නැහැ. එතුමාගේ පවුලේ කෙනෙකුට කරදරයක් වෙනවාය කිව්වොත් තමයි ගණන් ගන්නේ. සාමාන්‍යයෙන් එහෙම නේ, වෙන්නේ.

[ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය]

එතකොට තමයි භය වෙන්නේ. තමන්ගේ හිතවත්ම කාන්තාවකට, එහෙම නැත්නම් පවුලේ කාට හෝ කරදරයක් වෙනවා කිව්වොත් භය වෙනවා ඇරෙන්න, රටේ ජනතාවට යම් කිසි දෙයක් වෙනවා කිව්වොත්, තමන්ගේ කන ළඟ ඉඳගෙන අඩබෙර ගැහුවත්, බෝම්බයක් පිපිරුණත් ගණන් ගන්නා ජාතියේ මනුස්සයෙක් නොවෙයි. අපි එතුමා ගැන ටික ටික දන්නා නිසයි මම මේ කියන්නේ. එක්කෝ එතුමා මේ දේ ගණන් ගත්තේ නැහැ. මේ දෙකෙන් එකයි වෙලා තිබෙන්නේ. මන්ත්‍රීවරු 225දෙනාම දැනගෙන සිටියා කියලා දැන් අග්‍රාමාත්‍යතුමාටත්, කැබිනට් මණ්ඩලයේ උදවියටත් ටිකෙන් ටික ඇඟිල්ල දිගු කරගෙන යනවා. මම ඒක පිළිගන්නේ නැහැ. මන්ත්‍රීවරු 225දෙනාම මේ තත්ත්වය දැන ගන්න විධියක් නැහැ. එහෙම දැන ගත්තා නම් හෝ පසු පෙළ මන්ත්‍රීවරු විධියට අපට එහෙම ආරංචියක් ඇවිල්ලා තිබුණා නම් හෝ එහෙම නැත්නම් කවුරු හෝ කියා තිබුණා නම්, මාධ්‍ය සාකච්ඡාවකදී අපට mike එකක් අල්ලන වෙලාවකදී අපි කියනවා, "අපට මෙහෙම දෙයක් ආරංචි වෙලා තිබෙනවා. සමහර විට හෙට මෙහෙම දෙයක් වෙන්න පුළුවන්" කියලා.

එදා, අප්‍රේල් 21වැනි දා සමෘද්ධි නියාමකවරුන්ගේ අවුරුදු උත්සවයක් තිබුණා. කොළඹ දිස්ත්‍රික්කයේ විතරක් මට අවුරුදු උත්සව පහකට යන්න තිබුණා. අපි එහෙම දෙයක් දන්නවා නම් meetings දමා ගන්නේ නැහැනේ, උත්සව දමා ගන්නේ නැහැනේ. එතකොට, මන්ත්‍රීවරු 225දෙනාම දැන ගත්තාය කියන කථාව පැහැදිලිවම බොරුවක්. ඒක විපක්ෂයටත් අදාළ නැහැ, ආණ්ඩු පාර්ශ්වයටත් අදාළ නැහැ.

අනෙක් කාරණය මේකයි. ජනාධිපතිතුමා කියනවා, "එතුමා විශේෂ කාරක සභාවට එන්නේ නැහැ" කියලා. මීට අවුරුද්දකට කලින් විතර ඉඳලා -මහින්ද රාජපක්ෂ මැතිතුමා අගමැති කරපු දවසේ ඉඳලා- එතුමාට මහින්ද රාජපක්ෂ ආවේශ වෙලා තිබෙනවා. ඒ කියන්නේ, මහින්ද රාජපක්ෂ මැතිතුමා තැන් තැන්වල වීර කථා කියන එක මෙතුමාත් ඇහට අරගෙන තිබෙනවා. එතුමාත් ඒ වාගේ වෙන්න හදනවා. එතුමාට එහෙම වෙන්න බැහැ. එහෙම වෙන්න බැහැ කියන්නේ, එතුමා වෙන පුද්ගලයෙක්, මෙතුමා වෙන පුද්ගලයෙක් නිසා. කෙසේ නමුත් එතුමා ඒ වාගේ කථා කියනවා. "මම එන්නේ නැහැ. විශේෂ කාරක සභාවට කථා කළොත් මම යන්නේ නැහැ" කියලා කියනවා. එහෙම යන්නේ නැතුව ඉන්නේ කොහොමද? එතුමා තමයි ඒ ප්‍රශ්නය වෙනකොට හිටපු නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා. ඒ නිසා එතුමා අනිවාර්යයෙන්ම යන්න ඕනෑ. අග්‍රාමාත්‍යතුමා යනවා නම්, ජනාධිපතිතුමාත් ඒ විශේෂ කාරක සභාව ඉදිරියේ අනිවාර්යයෙන්ම කරුණු ඉදිරිපත් කළ යුතුයි; උත්තර දිය යුතුයි; මොකද වුණේ කියලා කියන්න ඕනෑ. ඒක එතුමාගේ වගකීම. මේ රටේ මිනිස්සු බලාගෙන සිටිනවා, දෙසීය ගණනක් ජනතාව, - [බාධා කිරීමක්] නැහැ, ඉල්ලීමක් කළත් නැතත්, එතුමා යන්නේ නැහැයි කිව්වා. ඒක එතුමා පැහැදිලිවම කිව්වා. "ඉල්ලීමක් ආවත් නැතත් මම යන්නේ නැහැ" කියලා කිව්වා. මම කියන්නේ, එතුමාට ඒ විධියට විශේෂ කාරක සභාව ඉදිරියට යන්නේ නැතුව ඉන්න බැහැ කියන එක. ඒ මිය ගිය අයගේ පවුල්වල අයට හිතට සැනසීමක් දැනෙන්න නම්, අඩුම ගණනේ රටේ ජනාධිපති විධියට එතුමා ඒ වගකීම භාර ගන්නවාද නැද්ද කියන්න ඕනෑ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අගමැතිතුමා ඒ කාරක සභාවට කැඳවනවාද?

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
අගමැතිතුමා කැඳෙව්වොත්, එතුමා යන්න ලැස්ති වෙලා තමයි ඉන්නේ. එතුමා අප දැනුවත් කළා, "කැඳෙව්වොත් මම යනවා" කියලා. එහෙම නම් ජනාධිපතිතුමාත් අනිවාර්යයෙන්ම යන්න ඕනෑ. අගමැතිතුමා කිව්වා, "යනවා" කියලා. එහෙම නම් ජනාධිපතිතුමාත් අනිවාර්යයෙන්ම යන්න ඕනෑ.

ජනාධිපතිතුමා විශේෂ කාරක සභාව ඉදිරියට යන්නේ නැති හේතුව මම කියන්නද? ගරු රන්ජන් රාමනායක රාජ්‍ය ඇමතිතුමා ලස්සනට ඒ කථාවට ප්‍රවේශ වුණා. ඉතුරු ටික මම කියන්නම්.

CID එකෙන්, STF එකෙන් ඇවිල්ලා කුඩු අල්ලනවාට කුඩුකාරයෝ භයයි. එතකොට හොරු භයයි FCID එකට. ඒ වාගේම පස් හොරු භයයි, පොලීසියට. ඒ වාගේම, විශාල ජනතාවක් මිය ගිය සිද්ධියට වගකිව යුතු පුද්ගලයා විශේෂ කාරක සභාවට භයයි. එපමණයි. ඒ කියන්නේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

විශේෂ කාරක සභාවට භයයි. ඒක තමයි වුණේ. ඒ නිසා තමයි ජනාධිපතිතුමා විශේෂ කාරක සභාවට යන්නේ නැතුව ඉන්නේ.

පසුගිය දවස්වල මට hospital වාගේ තැන්වලට තමයි වැඩිපුර යන්න සිද්ධ වුණේ. එහෙම යනකොට එක පුද්ගලයෙක් ඇවිල්ලා මට අපූරු කථාවක් කිව්වා. මුස්ලිම් ජනතාව වෙනුවෙන් මුස්ලිම් නායකයන් සිටිනවා කිව්වා. දෙමළ ජනතාව වෙනුවෙන් දෙමළ නායකයන් සිටිනවා කිව්වා. සිංහල ජනතාව වෙනුවෙන් සිංහල නායකයෙක් නැතිකම ගැන අපට හරිම කනගාටුයි කිව්වා. ඒ කථාව ඇත්ත. මොකද, සිංහල මිනිසුන්ට සිංහල නායකයෙක් නැහැ කියලා දැනෙන තත්ත්වයට අද පත්වෙලා තිබෙනවා. ඕනෑම පුද්ගලයෙකුට සැකය හා අවිශ්වාසය කියන දේ ඇති වුණාම තමයි ප්‍රචණ්ඩත්වය ඇති වෙන්නේ. දෙමළ, සිංහල ගැටුමේදී දෙමළ මිනිසුන්ට තමන්ගේ ප්‍රශ්න කියන්න නිවැරදි නායකයෙක් හිටපු නැති නිසා alternative පිළිතුරු සොයන්න ගියා. ඒ ගොල්ලෝ වෙනත් පාරක් සොයා ගත්තා. අවසානයේ ඒක තමයි යුද්ධයකින් අවසන් වුණේ. එම නිසා මෙතැන සිටින සියලුදෙනාගෙන්ම මම ඉල්ලීමක් කරනවා. අර ගොල්ලෝ වෙනුවෙන් කථා කිරීම, මේ ගොල්ලෝ වෙනුවෙන් කථා කිරීම නොවෙයි කළ යුත්තේ. හොඳට මතක තබා ගන්න ඕනෑ, මේ රට තමයි සිංහල භාෂාව කථා කරන එකම රට. ඒ වාගේම, ථෙරවාදී බුදු දහම හරියට අදහන එකම රට. අපට යන්න වෙනත් රටක් නැහැ. අපට ද්විත්ව පුරවැසිභාවයක් නැහැ. සිංහල මනුස්සයාට සැකය කියන දේ ඇති වුණොත් අවසානයේ මේ ප්‍රශ්න කොතැනින් නවතියිද දන්නේ නැහැ. සැකය, අවිශ්වාසය කියන එක දැන් අපේ මිනිසුන්ගේ හිතට ඇවිල්ලා තිබෙන්නේ. අපි වෙනුවෙන් කථා කරන්න නායකයෙක් නැහැ. සුදු පාට national dress එක ඇඳගෙන, අරවා මේවා කරගෙන පාර්ලිමේන්තුව නියෝජනය කරන එක නායකයෙක්වත් ජාතිවාදී නැහැ, ජාතිකවාදීත් නැහැ. ඒක හොඳට මතක තබා ගන්න. මෙතැන ඉඳගෙන සිටින කිසිම නායකයෙක් ජාතිවාදීත් නැහැ, ජාතිකවාදීත් නැහැ. මොකද, ජාතිවාදී නම් එතුමන්ලාට පාර්ලිමේන්තුවට එන්න බැහැ. ජාතිකවාදී නම්, එතුමන්ලාට ඔය විධියට දේශපාලනය කරන්නත් බැහැ. මෙතැන සිටින එක්කෙනෙක්වත් ජාතිකවාදී වෙන්නේ කොහොමද? මහින්ද රාජපක්ෂ මැතිතුමා ජාතිකවාදී නැහැ. මහින්ද රාජපක්ෂ මැතිතුමා ජාතිවාදීත් නැහැ. ජාතිවාදී නම්, එතුමාගේ බිරිඳ ශිරන්ති රාජපක්ෂ වෙන්න විධියක් නැහැ. එතුමාගේ පුතාගේ බිරිඳ ටට්යානා වෙන්න විධියකුත් නැහැ. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජාතිවාදී නැහැ. එතුමා ජාතිකවාදීත් නැහැ. එහෙම නම් එතුමාට ඇමෙරිකාවේ ද්විත්ව පුරවැසිභාවයක් තිබෙන්න විධියකුත් නැහැ. එතුමාගේ ළමයි ඇමෙරිකාවේ ඉන්න විධියකුත් නැහැ. ඒ විධියට මෙතැන සිටින කිසිම කෙනෙක් ජාතිවාදී හෝ ජාතිකවාදී නැහැ.

බොහෝ අය කියනවානේ අග්‍රාමාත්‍යතුමාට රට, ජාතිය ගැන කිසි කැක්කුමක් නැහැ කියලා. එතුමා ඉගෙන ගත්තේ Royal College එකේ. එතුමා ගියේ Colombo University එකට. ඊළඟට එතුමා නීති විද්‍යාලයට ගියා. එතුමා කිසිම degree එකක් කරන්න පිට රටකට ගිහිල්ලාවත්, පිට රට ගැහැනු කෙනෙක් කසාද බැඳලාවත් නැහැ. ඒ වාගේ කිසි දෙයක් කර නැහැ.

අන්න ඒවා තමයි මිනිස්සු බලන්නේ. මෙතැන සිටින හුඟ දෙනෙකුගේ ළමයින් පිටරටවල තමයි ඉන්නේ. ඉතින් ඒ අය ජාතිවාදිත් නැහැ, ජාතිකවාදිත් නැහැ. ප්‍රශ්නයක් එනකොට මේ දවස්වල හොඳම මාතෘකාව තමයි ජාතිවාදය. එම නිසා හැම එක්කෙනාම තමන්ගේ ඡන්ද ගොඩ වැඩි කර ගන්න කරන හොඳම වැඩේ ජාතිවාදය ගැන කථා කරන එකයි. එම නිසා මම ඉතා වුවමනාවෙන් කියනවා, අපේ කටවල් නිසාමයි මිනිස්සු රණ්ඩු වෙන්නේ කියලා. එළියේ මිනිස්සු ජාතිවාදී වෙලා තිබෙන්නේ, එළියේ මිනිස්සු රණ්ඩු වෙන්නේ, අන්තවාදී වෙලා තිබෙන්නේ, පාර්ලිමේන්තුව ඇතුළත ඉඳගෙන අපි ඔවුන්ට පෙන්වන රූපය නිසායි. ඇත්තටම අපි එහෙම නැහැනේ. තමන්ගේ හදවතට තට්ටු කරලා බලන්න. මෙතැන සිටින මොන එක්කෙනාද මැතිවරණ කරන්න මුස්ලිම් මනුස්සයාගෙන් සල්ලි අරගෙන නැත්තේ? මෙතැන මොන එක්කෙනාද මුස්ලිම් මිනිස්සු සමඟ කන්නේ බොන්නේ නැත්තේ? මෙතැන එසේ නොකරන කිසිම කෙනෙක් නැහැ. එම නිසා මා ඉල්ලා සිටිනවා, මේ රට සිංහල බෞද්ධ රටක් කියන එක තැන් තැන්වල කිය කියා මහ ලොකුවට ප්‍රශ්නයක් ඇති කර ගන්න ඕනෑ නැහැ කියලා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කියවා බලන්න. මේ රට සිංහල බෞද්ධ රටක්. ඒ නිසා ආයෙත් ඒ ගැන කථා කරන්න දෙයක් නැහැ.

මේ රටේ සිටින සිංහල මිනිසුන් වෙන කිසිම රටක නැහැ. දෙමළ භාෂාව කථා කරන මනුස්සයාට සවුදි අරාබියට ගිහින් හෝ ඕනෑම රටකට ගිහින් දෙමළ භාෂාව කථා කරන්න පුළුවන්. හරිද? ඔබතුමන්ලාට දෙමළ භාෂාව කථා කරන්නට පුළුවන්. අරාබි භාෂාව කථා කරන්නට පුළුවන්. ඉංග්‍රීසි භාෂාව කථා කරන මනුෂ්‍යයාට ඕනෑම රටකට ගිහින් ඉංග්‍රීසි භාෂාව කථා කරන්නට පුළුවන්. අපේ සිංහල මනුස්සයාට වෙන රටකට ගිහින් සිංහල භාෂාව කථා කරන්න පුළුවන්ද? වෙන රටවල අයට සිංහල තේරෙනවාද? අපට තිබෙන්නේ එකම රටයි. එම නිසා මා ඉල්ලා සිටිනවා, මේ රට ඇතුළත ප්‍රශ්න ඇති කරන්න එපා කියලා. සිංහල මනුස්සයාගේ හිතට අවිශ්වාසය සහ සැකය එන්න දෙන්න එපා. එහෙම වුණොත් මේ ප්‍රශ්න නවතින්නේ මෙතැන නොවෙයි.

මම ඊළඟට මේ කරුණ කියන්න ඕනෑ. අපි තමයි ජනාධිපතිතුමා පත් කර ගත්තේ. මට හිතා ගන්නට බැහැ අපි මොකක් සඳහා පත් කර ගත්තාද කියලා. කමක් නැහැ, තව මාස හතරයි පහයි තිබෙන්නේ. අපි ඒ ටිකත් විඳවමු. විඳවලා ඊට පස්සේ අපි හොඳ තීරණයකට එමු. කෙසේ වෙතත් එතුමා කියනවා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය රටට ශාපයක් ලු. මම එළියේ කෙනෙකු සමඟ කථා කර කර හිටියා. ඔහු මට කියනවා, "මැඩම්, මේ රූම්ස්වලට ගිහින් මැති ඇමතිවරු සමඟ කථා කරලා ඈප් කර ගත්ත විධිය අපි තමයි දැක්කේ" කියලා. තේ බොන තැනට ගිහින් කථා කළාලු, කරට අත දැම්මාලු, හිනා වුණාලු, බදාගත්තේ නැති ටික විතරලු, කොහොම හෝ ඒකට ඡන්දය ගන්න. ඒ ඔක්කොම කර ඉවර වෙලා දැන් කියනවා, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හොඳ නැහැලු. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ වැරදි තිබෙන්නට පුළුවන්. හැබැයි, හැට දෙලක්ෂයක් ජනතාව එතුමාට ඡන්දය දීලා එතුමා driving seat එකේ වාඩි කර වූයේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් ඕනෑ කියලා, ඒකත් ඇතුළත් කරලා තමයි. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් අවශ්‍යයි කියලා, ඒකත් සමඟයි එසේ කළේ. ඒ නිසා දැන් එතුමාට ඒ විධියට කියන්න බැහැ. රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත් එතුමාටත් තමයි ඒ ජනවරම දුන්නේ. හැට දෙලක්ෂයක් ජනතාව එතුමාට ඡන්දය දුන්නේ ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න තමයි. සෝභිත හාමුදුරුවෝ, අපි, ඔක්කොම කට්ටිය එක්කාසු වෙලා අපේ "යහපාලනය" කියන මාතෘකාව යටතේ තමයි පාලනය භාර දුන්නේ. අද යහපාලනය විහිළුවක් වෙලා තිබෙන්නේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

නිසායි. එතුමා පත් වුණු හැටියේම මොකද කළේ? පක්ෂයේ නායකත්වය ගත්තා. පක්ෂ නායකත්වය ගත් එකෙන් තමයි ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් දෙපැත්තට ඇදුණේ. එහෙම නැතුව දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නිසා නොවෙයි. එතුමා පක්ෂ නායකත්වය ගත්ත නිසා එතුමාගේ පක්ෂයේ උදවිය කියන විධියටයි වැඩ කරන්න සිද්ධ වුණේ. ඒකනේ ඇත්ත කථාව. එතුමා නිර්පාක්ෂිකව හරියට කෙළින් සිටියා නම්, අදටත් අගමැතිතුමාත් සමඟ ලස්සනට මේ වැඩ කටයුතු ටික හරියට කර ගෙන යනවා.

අපි ගම් පෙරළිය වැඩසටහන කරනවා. ඒක බලාගෙන ඉන්න බැහැ. අපි කරන එක එක සංවර්ධන කටයුතු දෙස බලාගෙන ඉන්න බැරි නිසා එක එක කොකු දමනවා. ඒක හරි වැරදියි. ඒවා හරි වැරදි වැඩ. අපි මේ රට සංවර්ධනය කරන්නට, ප්‍රදේශ සංවර්ධනය කරන්නට තමයි හදන්නේ. එම නිසා මම ජනාධිපතිතුමාට මෙය කියන්නට කැමතියි. ඔබතුමා කියා තිබුණා, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මේ රටට ශාපයක් කියලා. මම කියනවා, කණ්ණාඩියක් ඉස්සරහට ගිහින් බලන්න කියලා. ශාපය ඔබතුමාටම පෙනේවි. ඇත්තටම මේ රටට ශාපයක් වුණේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වෙන කවුරුවත් නොවෙයි. මට හිතා ගන්න බැහැ, මේ ආණ්ඩුවේ සිටින මැති ඇමතිවරු කට වහගෙන තමන්ට blame එක අරගෙන ඉන්නේ ඇයි කියලා. මගේ නම් ඇඟේ මාළු නටනවා. පසුගිය මාස දෙක තුනේ අපේ එක්කෙනෙක් කථා කරන්නේ නැහැ, පාස්කු ප්‍රහාරයට කෙළින්ම වගකිව යුත්තේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කියලා. විශේෂ කාරක සභාවේදී පොලිස්පතිතුමා කියනවානේ, මොකද වුණේ කියලා. එතුමා පත් කරපු හේමසිරි ප්‍රනාන්දු මැතිතුමා කියනවානේ, ගහකින් ඇවිත් මරන්න ආපු ඒවා ගැන රස කථා කිය කියා හිටියා මිසක් මෙපමණ දෙයක් වෙන එක ගැන කථා කළේ නැහැ කියලා. මම රුවන් විජේවර්ධන ඇමතිතුමාගෙන් ඇහුවා, එතුමාට ආරක්ෂක කවුන්සිලයට එක දවසක්වත් එන්න කියලා නැහැ. අපේ අයගේ වැරැද්දකුත් තිබෙනවා. දින 52ක් බලෙන් අරලිය ගහ මන්දිරයේ හිටියා නම් ආරක්ෂක කවුන්සිලයට බලෙන් යන්න බැරි ඇයි? ඒකට අගමැතිතුමා හෝ රුවන් විජේවර්ධන මැතිතුමා ගියේ නැහැ. එතුමන්ලාට එයට යන්න තිබුණා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ටිකක් උද්ධච්චකම තිබෙන නිසා ගියේ නැහැ. එතුමාට ඒකට යන්න තිබුණා. දින 52ක් බලෙන් අරලිය ගහ මන්දිරයේ හිටියා නේ. එන්න කිව්වේ නැති වුණත් අපිත් ආරක්ෂක කවුන්සිලයට යනවා කියලා ඒ දෙදෙනාට යන්න තිබුණා; බලෙන් ගිහින් වාඩි වෙලා ඉන්න තිබුණා. ගියාට පොල්ලෙන් ගහලා එළවන්නේ නැහැ නේ. අවසානයේ බලනකොට, ආරක්ෂක කවුන්සිලය කැඳවා නැත්තේ මේ දෙදෙනාට එන්න කියන්න වෙන නිසායි. ඒ වාගේ තත්ත්වයකට අද ඇවිත් තිබෙනවා.

ඒ කෙසේ වෙතත්, මට කියන්න තිබෙන්නේ මෙච්චරයි.
දයාසිරි අංකල්- [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අංකල්!

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
I am sorry. දයාසිරි හිටපු ඇමතිතුමා- [බාධා කිරීමක්] නැහැ, නැහැ. [බාධා කිරීමක්] සමාවෙන්න. දයාසිරි හිටපු ඇමතිතුමා මගේ තාත්තාගේ යාළුවෙකු හින්දා පුරුද්දට මට එහෙම කියැවුණා. මට දයාසිරි හිටපු ඇමතිතුමාට කියන්න තිබෙන්නේ මෙච්චරයි. මේ ළඟදි දවසක- [බාධා කිරීමක්] එපා, ඔබතුමා ජනාධිපතිතුමා වෙනුවෙන් කතා කරන්න. නිකම් සවුත්තු වෙනවා. බොරු වැඩක්. ඇත්තටම ඔබතුමාට මම හරිම ආදරෙයි. මා ළඟදි "දෙරණ" රූපවාහිනියේ වැඩසටහනක් බැලුවා. අන්තිමට, බේරාගන්න ආවාද, ජනාධිපතිතුමා? නැහැ. හැම දාම එතුමා ඒක තමයි කරන්නේ. එතුමා වෙනුවෙන් පුළුවන් තරම් වැඩ අරගෙන, අරගෙන- [බාධා කිරීමක්] දැන් ඔබතුමාට කිසිම සහයෝගයක් දෙනවා ද? ඇත්ත කියන්න. අර "දූමි" අය්යගෙන් වැඩ අරගෙන, අරගෙන- [බාධා කිරීමක්] දුමින්ද දිසානායක මැතිතුමාගෙන් වැඩ අර ගත්තා;

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වාගේ පැත්තකට දැම්මා. ඊළඟට, ඔබතුමාටත් කරන්නේ ඒක තමයි. මම දන්නවා නේ. අපි අවුරුදු 4ක් එකට සිටියා නේ. අපට ඒක කිව්වා, ඉස්සරත්.

ඒ කෙසේ වෙතත්, මට දයාසිරි හිටපු ඇමතිතුමාටත් කියන්න තිබෙන්නේ මෙච්චරයි. එපා- [බාධා කිරීමක්] ඔබතුමා වෙනත් තීරණයක් ගන්න. එන්න, අපිත් එක්ක ඉඳගන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එදා ඔබතුමිය අපි කියපු දේ ඇහුවේ නැහැ නේ.

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
මට අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා. [බාධා කිරීම්]

[අ.භා.4.57]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට විනාඩි කීයක් විතර තිබෙනවාද, කතා කරන්න?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි 7යි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට තවත් විනාඩි කීපයක් වැඩිපුර දෙන්න වේවි. එහෙම නැත්නම් මේ අහපු ප්‍රශ්නවලට උත්තර දී ගන්නත් බැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාගෙන් හෝ ඉල්ලා ගන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon.  Lakshman Kiriella)
විනාඩි 10ක් දෙන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා සන්තෝෂ වෙනවා මට මේ අවස්ථාව ලබා දීම ගැන. නමුත් අද දවසේ සන්තෝෂ වෙන්න විධියක් නැහැ. මොකද, රටේ ආරක්ෂක තත්ත්වය වෙනුවෙන් හදිසි නීතිය දීර්ඝ කරන්න ලැබීම පිළිබඳව එක් පැත්තකින් අපි සියලුදෙනාම කනගාටු විය යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ප්‍රධාන කාරණා කීපයක් ගැන කියලා මට පෙර කතා කළ අපේ ගරු මන්ත්‍රීතුමියටත් පොඩි උත්තරයක් දෙන්නම්. එහෙම නැත්නම්, හොඳ නැහැ. එතුමියගේ තාත්තා මා එක්ක ඉතාම හොඳින්, ඉතාම ළඟින් ආශ්‍රය කරපු කෙනෙක්. ඒ වාගේම, එතුමියත් මා බෙහෙවින්ම ආදරය කරන කෙනෙක්. [බාධා කිරීමක්] දියණියක් විධියට. ඒක තමයි එතුමිය "අංකල්" කියලා කිව්වේ. එහෙම නැතිව වෙනත් එකක් නිසා නොවෙයි. [බාධා කිරීමක්] එහෙම පෙනෙන්නේ නැතිව ඇති කියා මා විශ්වාස කරනවා.

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
නැහැ, නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එහෙම පෙනෙන්නේ නැහැ නේ, හොඳයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා විශ්වාස කරන විධියට හදිසි නීතිය දීර්ඝ කරන්නේ වෙනත් කාරණයක් හින්දා නොව අද රටේ තිබෙන තත්ත්වය සැලකිල්ලට ගෙන ආරක්ෂක අංශවලින් කෙරුණු ඉල්ලීම මතයි. බුද්ධි අංශවලින් තොරතුරු ලබා දීමේ කටයුතු, පොලීසිය සිදු කරන පරීක්ෂණ කටයුතු, CID එක කරන පරීක්ෂණ කටයුතු, ඉටු කරන අනෙකුත් සේවාවන්, හමුදාව කරගෙන යන වැටලීම්, හමුදාව කරගෙන යන ආරක්ෂක කටයුතු තවදුරටත් ශක්තිමත්ව ක්‍රියාත්මක කරගෙන යන්න නම් තවත් මාසයක විතර කාලයක් හදිසි නීතිය පැවතීම අවශ්‍යයි කියන කාරණය මත ඔවුන්ගෙන් විශේෂ ඉල්ලීමක් කෙරුණා. ඇත්ත වශයෙන් ආරක්ෂක හමුදාවල, ආරක්ෂක අංශවල, ආරක්ෂක අමාත්‍යාංශයේ ඉල්ලීම පිළිගෙන තමයි අතිගරු ජනාධිපතිතුමාත්, ආණ්ඩුවත් මේ ක්‍රියා දාමයට යන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සමහර වෙලාවට විදේශ තානාපති කාර්යාල දැන් පොලීසියේ ආරක්ෂාව ඉල්ලන්නේ නැහැ.  ඒ අය කියන්නේ, "අපට හමුදාවේ ආරක්ෂාව දෙන්න" කියලායි. එහෙම නේද, අපේ ආරක්ෂක රාජ්‍ය ඇමතිතුමනි?

**ගරු රුවන් විජේවර්ධන මහතා**
(மாண்புமிகு ருவன் விஜயவர்தன)
(The Hon. Ruwan Wijewardene)
ඔව්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මා හිතනවා, එතුමාත් මේ සම්බන්ධයෙන් දන්නවා කියලා.

එක පැත්තකින්, "පොලීසියේ ආරක්ෂාව එපා. හමුදාවේ ආරක්ෂාව ඉල්ලනවා" කියන තානාපති කාර්යාල ම කියනවා, "මේ හදිසි නීතිය වහාම ඉවත් කරන්න" කියලා. මා අහන්න කැමැතියි, මේ pressure එකේ අවසානය මොකක්ද කියලා? ඒ අය පැහැදිලිව කියනවා, "පොලීසියේ ආරක්ෂාව අවශ්‍ය නැහැ. අපට ඕනෑ හමුදාවේ ආරක්ෂාවයි" කියලා. හමුදාවේ ආරක්ෂාව දෙන්න නම් හදිසි නීතිය අනිවාර්යයෙන්ම ක්‍රියාත්මකව පැවතිය යුතුයි. එහෙම නැති නම් හමුදාව බැරැක්කවලට සීමා වෙනවා. හමුදාවට මුර සංචාරවල යෙදීම, තානාපති කාර්යාලවලට ආරක්ෂාව සැපයීම, අනෙක් ආරක්ෂක කටයුතු කිරීම ආදිය කරන්න නම්, ඒ සඳහා ඔවුන්ට එළියට බහින්න නම් මේ රටේ හදිසි නීතිය පැවතිය යුතුයි. මා කියන්නේ නැහැ, තානාපති කාර්යාලවලට ආරක්ෂාව දෙන්න ඕනෑ නිසා හදිසි නීතිය හැම දාම තිබෙන්න ඕනෑ කියලා. ඒ වාගේම, තානාපති කාර්යාලත් දැනගන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ලෝකයේ අනෙක් රටවල විවිධ ප්‍රදේශවල තිබෙන ප්‍රශ්නත් එක්ක ලංකාවේ තත්ත්වයත් සංසන්දනය කරලා තානාපති කාර්යාල දවස ගණනේ, උදේ ඉඳලා රෑ වන කල් pressure එක දෙනවා, 'හදිසි නීතිය ඉවත් කරන්න' කියලා. ඒ නිසා තමයි අද TNA එකේ සමහර මන්ත්‍රීවරුන් හදිසි නීතිය දීර්ඝ කරනවාට විරුද්ධ වෙන්න අවශ්‍ය හේතුව පාදා ගෙන තිබෙන්නේ. රට ඇතුළේ ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා නම්, ත්‍රස්තවාදය පිළිබඳව තවදුරටත් බියක්, සැකයක් තිබෙනවා නම් ආරක්ෂක හමුදා අදාළ ක්‍රියාන්විතවල අනිවාර්යයෙන් යෙදිය යුතුමයි. එහෙම නැත්නම් විශාල අර්බුදයක් මේ රට තුළ ඇති වෙන්න පුළුවන්. මොකක්ද එහෙම කියන්න හේතුව? නැවත බෝම්බ පිපිරීමක් සිද්ධ වුණොත් කියාවි, "අපි කිව්වා නේ හදිසි නීතිය ඉවත් කරන්න එපා, දැන් මොකක්ද වුණේ?" කියලා. මා හිතන හැටියට ආරක්ෂක හමුදාවලට ක්‍රියාත්මක වෙන්න නම් මේ ක්‍රියා දාමය අනිවාර්යයෙන් ඉදිරියට යන්න වෙනවා.

ඒ විතරක් නොවෙයි, රඳවා ගැනීම් සම්බන්ධව කියනවා නම් දැන් DOs ගහලා විශාල පිරිසක් රඳවා ගෙන ඉන්නවා. මම හිතන හැටියට ගොඩක් අය රඳවා ගෙන නැහැ,. රඳවා ගෙන හිටපු විශාල පිරිසක් දැනට නිදහස් කරලා තිබෙනවා. ඒ වාගේම, දැන් රඳවා ගෙන ඉන්න පිරිස තවදුරටත් ප්‍රශ්න කිරීම්වලට යටත් වෙනවා. මේ අය යම් කිසි කාලයක් තියා ගෙන ප්‍රශ්න කරලා, නිවැරදි තත්ත්වය හා නිවැරදි තොරතුරු දැන ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරන්න ආරක්ෂක හමුදාවලටත්, බුද්ධි අංශවලටත්, රහස් පොලීසිය ඇතුළු සියලු ආරක්ෂක අංශවලටත් බලය අවශ්‍ය වෙනවා. ආරක්ෂක අංශවල අවශ්‍යතාව මත තමයි මේ ක්‍රියාදාමය ක්‍රියාත්මක කරන්නේ. ආණ්ඩුව ඉදිරි මාසය ඇතුළත හදිසි නීතිය ලිහිල් කරලා, රටේ ජනතාවටත් යම් ශක්තියක් ඇතිව වැඩ කරන්න අවශ්‍ය කටයුතු සලසා දෙයි කියලා මා විශ්වාස කරනවා.

අපි අවුරුදු 10ක් තිස්සේ බුක්ති විඳපු යම් නිදහසක් මේ රටේ ඇති කරලා තිබුණා. ඒ නිදහස නැතිවීම තුළ අපේ අයත් මේ ක්‍රියාදාමය තුළ විශාල අපහසුතා ගණනාවකට ලක් වෙනවා. හැබැයි, ඉස්ලාම් ත්‍රස්තවාදය තුළින් ඇති වුණු තත්ත්වය, සාමාන්‍යයෙන් මේ රට තුළ කවදාවත් ඇති නොවුණු තත්ත්වයක් නිසා මේ තත්ත්වයට මුහුණ දෙන්නේ කොහොමද කියලා ඔවුන් තේරුම් ගනිමින් ඉන්නවා. ඒ, මේ ක්‍රියාදාමයේ එක පැත්තක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙවන කාරණය වශයෙන් මම කියන්න කැමතියි, අපේ ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාත් මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාත් මතු කළ මේ Select Committee එක පත් කිරීම සම්බන්ධයෙන්. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුත්, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රීවරුත්, ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුත් ඒ යෝජනාවට අත්සන් කරලා තිබුණු බව ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා කිව්වා. හැබැයි, එදා මම ඒ ගැන කාරණයක් මතු කළා. ඒ යෝජනාවට ඔබතුමන්ලා තවත් කාරණයක් එකතු කළා. ඒ එකතු කළේ මේ පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයකට. මම ඇහුවා, ඒ දේ කරන්න කලින් ඒ යෝජනාවට අත්සන් කරපු මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීමක් කරලාද මේ දේ කරන්නේ කියලා. නමුත්, එහෙම කළේ නැහැ. එහෙම නොකර, එවැනි ප්‍රහාරවලට පෙර ඒ සම්බන්ධයෙන් බුද්ධි තොරතුරු නීතිය ක්‍රියාත්මක කරන්න බලධාරීන් වෙත ලැබී තිබුණ තොරතුරු... යනාදී වශයෙන් හා "ත්‍රස්තවාදීන්ට අනුබල දුන්න ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ ආණ්ඩුකාරවරයෙකු හෝ ඕනෑම පුද්ගලයෙකුට විරුද්ධව ඇති චෝදනා සත්‍ය ද යන්නත්" පිළිබඳ කාරණයත් යෝජනාවට ඇතුළත් කරලා තිබුණා. ඇත්තවශයෙන්ම ඒක කලින් ගෙනා යෝජනාවට ගෙනාපු amendment එකක් හැටියටයි ගෙනාවේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 60 ගණනක් අත්සන් කළ යෝජනාවට ඒ අයගේ අදහස් නැතිව තවත් කරුණු එකතු කිරීමෙන් එක පැත්තකින් ඔවුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනයවීමක් සිද්ධ වෙනවා. මොකද, ඔවුන් දන්නේ නැහැනේ මේ අලුත් යෝජනාව ගැන. ඒ අනුව දැන් වෙනත් යෝජනාවක් ගෙනැල්ලා මේ කාරක සභාව ක්‍රියාත්මක කරගෙන යනවා. ඒකටත් කමක් නැහැ කියමුකෝ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ මන්ත්‍රීතුමිය එනම් අපේ ආදරණීය දියණිය හිරුණිකා මැතිනිය ප්‍රකාශ කළා, "හොයා ගෙන හොයා ගෙන යනකොට

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

සඳහා දැන් වරදකරු බව පෙනෙනවා" කියලා. මට තේරෙන්නේ නැහැ එතුමිය ඒ කොමිටියේ හිටියාද, නැත්නම් අර පැය ගණනක් කථා කරපු ඒවායෙන් එක එක රූපවාහිනී නාලිකාවල දාපු ඒවායෙන් කෑල්ලක් අල්ලාගෙන ඒ මතද කථා කරන්නේ කියලා. තවදුරටත් මේ පරීක්ෂණයේ කටයුතු අවසන් වෙලා වාර්තාවක් දීලා නැති තත්ත්වයක් තුළ ජනාධිපතිතුමා කියන කාරණය හරියට හරි කියලා බොහොම පැහැදිලියි. මොකද, ජනාධිපතිතුමා කියන්නේ, බොහොම පැහැදිලි කාරණාවක් විධියට ගත්තොත් මෙතැන විශාල අර්බුදයක් තිබෙනවා කියලායි. එතුමා කියන්නේ ඒකයි. ඒ නිසා එක පැත්තකින් එක තැනක rehearsals කරලා මෙතැනට ඇවිල්ලා රඟපාන තත්ත්වයක් තිබෙනවාය කියන එක හරි. දැන් මෙතුමියම කියනවා, "මේ තිබෙන තත්ත්වය අනුව එතුමා වැරදිකරු කියලා දැන් පෙනෙනවා" කියලා. එසේ පෙනෙන නිසා ලු දැන් මේ ප්‍රශ්නය තිබෙන්නේ. මම කියන්න කැමතියි ආදරණීය දියණියනි, මේ කාරණා තේරුම් ගන්න කියලා. මාමා කෙනකු හැටියටත්, එහෙමත් නැත්නම් වැඩිහිටියකු හැටියටත් තමයි මම මේ කියන්නේ. එතුමිය මේ ගරු සභාවේ දැන් නැහැ. නමුත්, මම කනගාටු වෙනවා එතුමිය එවැනි ප්‍රකාශයක් කිරීම ගැන. මම හිතන හැටියට එතුමිය ප්‍රාදේශීය සභාවකවත්, පළාත් සභාවකවත් හිටපු නැති කෙනෙක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පළාත් සභාවේ හිටියා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

පළාත් සභාවේ පොඩි කාලයක් හිටියා. නමුත්, පාර්ලිමේන්තුව ඇතුළේ කථා කිරීමේ දී යම් යම් කාරණා අනුව කථා කළ යුතුයි. ඒ නිසා මම මේ අවවාදයක් විධියටයි කියන්නේ. එතුමිය ඒ සමහර කාරණා ප්‍රකාශ කිරීම ගැන බොහොම කනගාටුයි. මම දන්නා හැටියට එතුමිය ජනාධිපතිතුමාත් එක්ක ඉතාම ළඟින් හිටපු කෙනෙක්. එතුමියගේ තාත්තා නැති වුණ වෙලාවේ සියලු බැණුම් මැද තාත්තාගේ මිනිය අරගෙන ගෙදරට ගිහිල්ලා ඒ සියලු දේවල් කරපු නායකයෙක් තමයි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා. ඒක එක කාරණයක්. ඒක පැත්තකින් තියමු. මොකද, ඒවා දේශපාලනයට අදාළ නැහැයි කියලා හිතන්න පුළුවන්නේ. නමුත්, අනෙක් කාරණය මේකයි. එතුමා මේ රටේ ජනාධිපති. ඉතිහාසයේ කවදාවත් "ජනාධිපති" කියන වචනය මේ පාර්ලිමේන්තුව ඇතුළේ දී කිව්වොත්, මට මතක හැටියට, කිරිඇල්ල මැතිතුමාටත් මතක ඇති, ඒ කාලයේ මම විපක්ෂයේ ඉඳලා එහෙම කියනකොට මර්වින් සිල්වා මැතිතුමා කුණුහරුප කියාගෙන පහළට එනවා මට ගහන්න. අපේ පාලිත තෙවරප්පෙරුම මැතිතුමාත් ඉන්නවා. එතුමාටත් මතක ඇති කියලා මම විශ්වාස කරනවා. ඒ කාලයේ ජනාධිපති කියලා කිව්වොත් ඉවරයි. ගුටි කන්න වෙන තත්ත්වයක් තමයි තිබුණේ.

හැබැයි, දැන් ප්‍රශ්නයක් නැහැ. දැන් ලංකාවේ මේ පාර්ලිමේන්තුව ඇතුළේ ජනාධිපතිතුමාට ගහන්න තිබෙන සියලු මඩ ගහන්න පුළුවන්, කිසිම ප්‍රශ්නයක් නැහැ. ඒ ප්‍රජාතන්ත්‍රවාදය එතුමා ඇති කරලා තිබෙනවා. ඒ ප්‍රජාතන්ත්‍රවාදය තමයි හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මැතිනියත්, මේ සියලුදෙනාත් ප්‍රාර්ථනා කරපු නිදහස. ජනාධිපතිතුමා තේ පානය කරමින් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන මන්ත්‍රීවරුන්ට කථා කර කර කටයුතු කළේ මොකටද? එතුමාගේ බලය වැඩි කර ගන්නද? එතුමාගේ බලය වැඩි කර ගන්න නොවෙයි. මේ රටේ ජනාධිපතිවරයෙක් එතුමාගේ බලය අඩු කර ගැනීම සඳහා රෑ 12.00 වන තෙක් මන්ත්‍රීවරුන් පොලඹවා ඒකට ඡන්දය දෙන්න කිව්වා නම්, ඒ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා පමණයි කියලායි මම හිතන්නේ. මම එතුමා වෙනුවෙන් පෙනී සිටීම සම්බන්ධව කලබල වෙන්න එපා. මගේ පක්ෂ නායකයා වෙනුවෙන් පෙනී සිටින්නේ නැතිව, වෙන කවුරුවත් වෙනුවෙන් පෙනී සිටින්න මට බැහැ. මම නායකයෙක් එක්ක වැඩ කරනවා නම්, ඒ නායකයා වෙනුවෙන් මම සියයට සියයක් පෙනී සිටිනවා. මොන බැණුම් ඇහුවත්, පක්ෂයේ මහ ලේකම්වරයා විධියට මම පක්ෂයේ නායකයාගේ වැරැදි අඩු පාඩු එතුමාත් එක්ක කථා කරනවා වාගේම, අනෙකුත් අඩු පාඩු සම්බන්ධව, එහෙම නැත්නම් වැරැදි සම්බන්ධව එතුමාට තිබෙන විවේචනවලදී උත්තර දෙන්න ඕනෑ. ඒ නිසා ඒ ගැන කලබල වෙන්න එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම තවත් කරුණක් කියන්න කැමතියි. මේ ක්‍රියාදාමය තුළ මේ විශේෂ කමිටුව පිළිබඳ විශාල අර්බුදයක් ඇවිත් තිබෙනවා. අපි මේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග පිළිගන්නවා නම්, ස්ථාවර නියෝග 36. (ඊ) හි මෙසේ සඳහන් වනවා:

> "අධිකරණයක විනිශ්චයට භාජන වෙමින් පවතින යම් කාරණයක් හෝ අධිකරණ තීරණයක් ලබා දීමට නියමිත යම් කාරණයක් සම්බන්ධයෙන් ප්‍රශ්නයක සඳහනක් නොතිබිය යුත්තේය."

මේ කාරක සභාව පත් කරන්නේත් මේ ක්‍රියාදාමය යටතේ. මේ වන විට මේ කාරණාව සම්බන්ධයෙන් නඩු පහකට අධික සංඛ්‍යාවක් ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වෙමින් තිබෙනවා. 2019 ජූනි මාසයේ 4වැනි දින මේ සම්බන්ධව මේ රටේ නීතිපතිවරයා ජනාධිපති ලේකම්වරයාට ලිපියක් යවා තිබෙනවා. එහි "Terror Attacks that Took Place on 21st April, 2019" යනුවෙන් සඳහන් වෙනවා. එහි බොහොම පැහැදිලිව නීතිපතිවරයා කියන කාරණය මොකක්ද? "I am of the opinion that the said proceedings pending before the Select Committee of Parliament would have a substantial danger, a prejudicial and adverse impact on the ongoing criminal investigations being presently conducted in that regard. Further, the said proceedings would also have a prejudicial and adverse impact on pending judicial proceedings in the Supreme Court and the judicial proceedings impending in other judicial fora. In the circumstances, it would be prudent that necessary steps are taken to inform the relevant authorities of the above concerns in order to ensure that the said authorities take cognizance of same with regard to the matters pending inquiry before the aforementioned Select Committee of Parliament."

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මගේ කථාව ඉක්මනින් අවසන් කරන්නම්.

මෙම ලිපිය මේ පාර්ලිමේන්තුවේ කථානායකතුමාට එවලා තිබෙනවා. නීතිපතිතුමා විසින් එවා තිබෙන මේ ලිපියෙන් බොහොම පැහැදිලිව කියනවා, "මේ රටේ තිබෙන නඩුවලට මේක විශාල ප්‍රශ්නයක් වෙනවා" කියලා. මේ සම්බන්ධව කථානායකතුමා ගන්න පියවර මොකක්ද කියලා මම අහන්න කැමතියි. සාමාන්‍යයෙන් මෙච්චර කාලයක් නීතිපතිවරයාගේ උපදෙසක් ලැබුණාම, ඒක අනුගමනය කරපු කථානායකවරයෙක් තමයි මේ පුටුවේ හිටියේ. ඇයි මෙහෙම කරන්නේ කියලා මට තේරෙන්නේ නැහැ. ඒ නිසා මේ කොමිටිය අත් හිටුවීමට වහාම කටයුතු කරන්න කියලා මම කියන්න කැමතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, හෙට මෙම කාරක සභාවට මටත් එන්න කියලා තිබෙනවා. දැන් අපත් කැඳවනවා. ඒකාබද්ධ විපක්ෂයයි, එක්සත් ජාතික පක්ෂයයි දෙගොල්ලන්ම එකතු වෙලා අත්සන් කරලා පත් කළ කොමිටියට පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු කැඳවන්න නීතියක් නැහැ. හැබැයි, අලුත් සංශෝධනයක් ගෙනැත්, දැන් මටත් මේ කොමිටියට එන්න කියලා තිබෙනවා. මේ කොමිටියට යා යුතුද, නැද්ද කියලා මම දැන් කල්පනා කරනවා. මේ පාර්ලිමේන්තු කොමිටියේ කථා වෙන දේවල් නිසා අධිකරණයට විශාල ප්‍රශ්නයක් වෙනවාය කියලා නීතිපතිවරයා පාර්ලිමේන්තුවට ලිපියක් එවලා තිබෙනවා නම්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විධියට මම කොහොමද මේ කොමිටියට ගිහින් උත්තර දෙන්නේ? ඒ නිසා දැන් අපට ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙන්නේ කියලා මම කියන්න කැමතියි. මටත් ඒ කොමිටියට එන්න කියලා තිබෙනවා. හේතුව මොකක්ද? මම හිතන හැටියට "ටාජ් සමුද්‍රා හෝටලයේ සිද්ධියක් සිදු වුණා. ඇයි එතැන බෝම්බයක් පිපිරුණේ නැත්තේ" කියපු කථාව සම්බන්ධව වෙන්න ඕනෑ මා කැඳවා ඇත්තේ. ඒ ගැන පරීක්ෂණයක් කරන්න කියලා මම කිව්වා. ඒ ගැන පරීක්ෂණයක් කරන්න ඕනෑ. ඒ ගැන මගෙන් අහලා වැඩක් නැහැ. මම ඒකම තමයි කොමිටියට ආවත් කියන්නේ. දැන් මොකක්ද මේ කරන්නේ? මේ කොමිටියේ ඉන්න සරත් ෆොන්සේකා වැනි මන්ත්‍රීවරු පැහැදිලිවම ජනාධිපතිතුමා ඉලක්ක කරගෙන කටයුතු කරන කොමිටියක් බවට මෙය පත් වෙලා තිබෙනවා. මඩ ගැසීමේ චේතනාවෙන්, එතුමා ඉලක්ක කරගෙන හදපු කොමිටියක් බවට මේ කොමිටිය පත් කරලා තිබෙනවා. ඒ නිසා මේ වැඩ පිළිවෙළත් නිසා මේ කොමිටියේ වැඩ කටයුතු අවසන් කිරීමට කථානායකතුමා තීන්දුවක් ගන්න ඕනෑය කියා මම කියන්න කැමතියි.

මොකද, පැහැදිලිවම නීතිපතිතුමා මේ ලිපිය එවලා තිබෙන්නේ කථානායකතුමාට. ජනාධිපතිතුමාගේ ලේකම්වරයාට එව්වාට පසුව එතුමා කථානායකතුමාටත් එවලා තිබෙනවා. එම නිසා මම කියන්න කැමැතියි, මේ ස්ථාවර නියෝග අනුවත්, නීතිපතිතුමාගේ නියෝග අනුවත් මේ විශේෂ කාරක සභාව පවත්වාගෙන යන්න විධියක් නැති බව. කරුණාකර එක්කෝ මේ කාරක සභාව අහෝසි කරන්න, නැත්නම් මේ සඳහා වෙනත් ක්‍රියාමාර්ගයක් ගන්න.

ඊළඟට පළාත් සභා මැතිවරණය සම්බන්ධයෙන් මම තව එක කාරණයක් කියන්නට කැමැතියි. දහනව වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පළාත් සභා මැතිවරණය තියන්න කියලා මැතිවරණ කොමසාරිස්තුමා ජනාධිපතිතුමාට ලිපියක් එවලා තිබෙනවාය කිව්වා. නමුත්, එතුමාට එහෙම ලිපියක් එවලා නැහැ. එතුමාට කියලා තිබෙන්නේ ගිහිල්ලා නඩු දාන්න කියලායි. නඩු දාන්න දෙයක් නැහැ. ඇත්ත වශයෙන්ම ගරු අගමැතිතුමාට මාස දෙකක කාලයක් තිබුණා ඒ සඳහා පත් කළ කමිටුවේ තීන්දුව ගන්න. ඒ කමිටුවේ තීන්දුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා ඒ ගැන පාර්ලිමේන්තුවෙන් තීන්දුවක් ගන්නට තිබුණා. ඒක පාර්ලිමේන්තුවෙන් ගන්න ඕනෑ තීන්දුවක්. දැන් ඒක අනෙක් පැත්තට කරකවලා මැතිවරණ කොමිසම ජනාධිපතිතුමාට කියනවා, ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පවරන්න කියලා. මොකක්ද මේ කථාව? මේ සියලු දේවල අවසාන ප්‍රතිඵලය බවට පත්වෙලා තිබෙන්නේ මොකක්ද? මැතිවරණ පැවැත්වීමත්, මැතිවරණ පැවැත්වීම නැවැත්වීමත් පාර්ලිමේන්තුව විධියට අපි ගන්න ඕනෑ තීන්දුවක් විධියට දහ නවවෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ අපට බලය දීලා තිබෙනවා. නමුත්, ඒ මත ක්‍රියා කිරීම පැත්තකින් තියලා ඒකත් ජනාධිපතිවරයාටම පවරලා නිකම් ඉන්න ක්‍රියාදාමයක් තමයි යන්නේ. ඒ නිසා කරුණාකරලා මේ ක්‍රියාදාමය පිළිබඳව නිවැරදි තීන්දුවක් ගන්න කියලා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

ඔබතුමියට බොහොම ස්තුතියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමා ගරු මන්ත්‍රීතුමා දීර්ඝ කාලයක් මේ පාර්ලිමේන්තුවේ ඉඳලා තිබෙනවා; පාර්ලිමේන්තුවේ නීති රීති ගැන දන්නවා. අධිකරණයටවත්, කාටවත් පාර්ලිමේන්තුවට තහංචි දාන්නට බැහැ. අනුර බණ්ඩාරනායක මැතිතුමා කථානායකවරයා හැටියට තීරණයක් දීලා තිබෙනවා, අධිකරණයටවත් පාර්ලිමේන්තුවට තහංචි දාන්න බැහැයි කියලා. ඔබතුමා දන්නවානේ. [බාධා කිරීමක්] නැහැ, මම නිකම් කියන්නේ. එහෙම කාටවත් තහංචි දාන්නට බැහැ. නීතිපතිවරයාටවත්, ශ්‍රේෂ්ඨාධිකරණයටවත් පාර්ලිමේන්තුවේ කටයුතුවලට බලපෑමක් කරන්නට බැහැ. ඒක අපියි තීරණය කරන්නේ. [බාධා කිරීමක්] ඔබතුමා දන්නවානේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට විනාඩියක අවසරයක් දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
You are a lawyer. So, you should know that.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
As a lawyer, I know that. But, I am referring to the Standing Orders of Parliament. Madam Chairperson, can I explain that?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Yes.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒ ගැන විවාදයක් නැහැ, මම නිකම් පැහැදිලි කිරීමක් කළේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට ඔබතුමාට කියන්නට තිබෙන්නේ මෙයයි. අධිකරණය මේකට අත ගහනවාට මම කැමැති නැහැ. ඔබතුමා වාගේම මාත් ඒකට බොහොම විරුද්ධ කෙනෙක්. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ, අපි විසින්ම හදපු ස්ථාවර නියෝගවල තිබෙනවා "*sub judice*" කියලා. ඒක කොහොමද මෙතැනට වංලගු වෙන්නේ කියන එකයි මගේ ප්‍රශ්නය. එහෙම නැතිව වෙනත් එකක් නොවෙයි. අධිකරණයට අපට බලපෑම් කරන්නට බැහැ, ඒක හරි. පාර්ලිමේන්තුවේ අපි හදා ගත්ත ස්ථාවර නියෝගවලම තිබෙනවා අධිකරණ කටයුත්තක් සම්බන්ධයෙන් අපට කථා කරන්නට බැහැයි කියලා. ඉතින් අපි මොකක්ද කරන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊළඟට, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා.5.14]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මූලාසනය හොබවන ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව. මට කථාව ආරම්භ කරන්නට වෙන්නේ හිටපු අමාත්‍ය අපේ ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කියපු කාරණයක් සම්බන්ධවයි. එතුමා අතිගරු ජනාධිපතිතුමා ගැන කථා කළා. එතුමා කිව්වා "අද ප්‍රජාතන්ත්‍රවාදය ලැබිලා තිබෙනවා. එදා ජනාධිපතිවරයා කියලා ප්‍රකාශ කරන්න බැහැ. නමුත් අද ජනාධිපතිවරයාට මේ පාර්ලිමේන්තුවේදී සහ මින් පිටතදී ඕනෑ තරම් මඩ ගහන්නට පුළුවන්" කියලා. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, අපි හැමදෙනාම ආපහු හැරිලා බලන්නට ඕනෑ, අතිගරු ජනාධිපතිතුමා එතුමාගේ ගෞරවය ආරක්ෂා වෙන විධියට මේ රට තුළ වැඩ කටයුතු කළාද, නැද්ද කියන එක. මම සාමාන්‍යයෙන් අතිගරු ජනාධිපතිතුමාට එහෙම වචන කියන කෙනෙක් නොවෙයි. හැබැයි, මේ රටේ හැට දෙලක්ෂයක් ජනතාව එතුමාට ඡන්දය දීලා මේ රටේ ජනාධිපතිවරයා හැටියට එතුමා පත් කරලා අපට ආණ්ඩු බලය ලබා දෙනකොට මේ රටේ ජනතාව එතුමාගෙන් බලාපොරොත්තු වුණු දේ එතුමාගෙන් සිද්ධ නොවුණු නිසා තමයි, ඒ ඇතිවෙලා තිබෙන යම්කිසි දුර්වලතා නිසා තමයි අද සමස්ත

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

ජනතාවත්, මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ සිටින පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඇතුළු රටේ දේශපාලන අධිකාරියේ සියලුදෙනාත් එතුමා ගැන යම්කිසි විග්‍රහයක් කරන්නේ.

ඒ නිසා කනගාටුවෙන් වුණත් කියන්න ඕනෑ, අප සියලුදෙනාම ආපසු හැරී බලා මේ ගැන දුක් වෙන්න ඕනෑය කියලා. ඊළඟට, මේකෙන් පාඩමක් ඉගෙන ගෙන අපි රට තුළ ඉදිරියේදී කරන වැඩ පිළිවෙළ මොකක්ද කියලා හරියාකාරව හඳුනා ගන්න ඕනෑ. අප්‍රේල් 21වැනි දා එල්ල වුණු ප්‍රහාරයෙන් අපේ රටේ අහිංසක අම්මලා-තාත්තලා, සහෝදර-සහෝදරියන්, දූ දරුවන් මිය ගියාට පසුව, මේ රටේ සමස්ත ප්‍රජාව තුළ ආන්දෝලනාත්මක තත්ත්වයක් ඇති වුණා. ඒ වාගේම නොයෙක් විධියේ සිතුම්-පැතුම් ඉස්සරහට එන්න ගත්තා; එළියට එන්න ගත්තා. බොහෝ වේලාවට ජනතාව අතර අවිශ්වාසය ගොඩනැඟුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අදහන ආගම අනුව තමයි අප සියලුදෙනා වෙනස් වෙලා තිබෙන්නේ. අපෙන් සමහර කොටසක් කතෝලික ආගම අදහනවා; බෞද්ධාගම අදහනවා; හින්දු ආගම අදහනවා; ඉස්ලාම් ආගම අදහනවා; තව නොයෙක් ආගම් අදහනවා. අදහන ආගම් අනුව තමයි අපි අපේ සමාජ ක්‍රමය, අප ජීවත් වෙන ක්‍රමවේද බොහෝ වේලාවට වෙනස් කරගෙන තිබෙන්නේ. නමුත් මිනිස්සු හැටියට ගත්තාම, ශ්‍රී ලාංකිකයන් හැටියට ගත්තාම අපේ ඇඟේ දුවන්නේ රතු පාට ලේ; සම්පූර්ණයෙන්ම අප පිහිටා තිබෙන්නේ එක ආකාරයට; අප ජීවත් වෙන්නේ, කන්නේ-බොන්නේ, අඳින්නේ සහ අනෙක් ක්‍රියාවලි සියල්ල සිද්ධ වෙන්නේ එක විධියට. හැබැයි, අපි ක්‍රියාත්මක කරන දේශපාලන කටයුතු සහ සමාජයීය කටයුතුත්, අප ආරූඪ කරගත් සමහර කටයුතුත් නිසා අප අතර බොහෝ වේලාවට වෙනස්කම් තිබෙනවා. හැබැයි, ඒ වෙනස්කම් දේශපාලනයට පාවිච්චි කරන්න ගිහින් තමයි රටේ මේ ආකාරයේ විනාශකාරී තත්ත්වයක් උදා වෙලා තිබෙන්නේ කියලා මා විශ්වාස කරනවා.

අප්‍රේල් 21වැනි දා එල්ල වූ ප්‍රහාරයෙන් මිය ගිය අපේ ඒ අහිංසක මිනිසුන් විකුණාගෙන කන සමාජයක් අද මේ රටේ බිහිවෙලා තිබෙනවා. අද වනවිට අපූරු වැඩසටහන් එළියේ පහළියේ සිද්ධ වෙන බව අපි දකිනවා. Facebook එකේ, වේදිකාවල සමහර අය අලුතින් වැඩසටහන් හදාගෙන තිබෙනවා. මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමියනි, හැමදෙනාම කථා කරන්නේ මේ පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරු 225 දෙනාම ගෙදර යවන්න ඕනෑ කියලායි. හැබැයි, සිනහවට කාරණාව වන්නේ, පාර්ලිමේන්තුවේ ඉන්න 225 දෙනාම ගෙදර යවන්න ඕනෑ කියන කණ්ඩායම, එළියේ ඉඳගෙන පාර්ලිමේන්තුවට එන්න කෙළ හළන එක. පාර්ලිමේන්තුව ගැන, එහෙම නැත්නම් දේශපාලනය ගැන එක පැත්තකින් විගණකාධිපතිත් කථා කරනවා, තව පැත්තකින් ආගමික නායකයෝ කථා කරනවා, තවත් පැත්තකින් ව්‍යාපාරිකයෝ කථා කරනවා, තවත් පැත්තකින් නීතිඥයෝ කථා කරනවා, සමහර කණ්ඩායම් සිවිල් සංවිධාන හදාගෙන කථා කරනවා. හැබැයි, මේ සියලුදෙනාම කථා කරන්නේ එක්කෝ, ජනාධිපති ධුරය ගන්න, නැත්නම් අගමැති ධුරය ගන්නයි. එහෙම නැත්නම් අඩුම තරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්වත් වෙන්නයි. මේක අද මේ රටේ විහිළුවක් වෙලා. ඒ කියන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාට ඇඟිල්ල දිගු කරකර, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාට මඩ ගහන ගමන්ම, පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය කෙලෙසන ගමන්ම වක්‍රාකාරයෙන් ඒ ගොල්ලන් ජනතාවට ආමන්ත්‍රණය කරනවා, පාර්ලිමේන්තුවට ඒ අය එන්න ඕනෑය කියලා; මේ 225 දෙනාම එළියට ගිහිල්ලා, අලුතින් වෙනත් කණ්ඩායමක් එන්න ඕනෑය කියලා. හැබැයි, අලුත් කණ්ඩායමක් එනවා නම් හොඳයි කියලා මාත් විශ්වාස කරනවා. එතකොට ඒ අයටත් මේකේ රස ගුණ වාගේම, මේක අස්සේ තිබෙන මඩ ටිකත් හොඳට හඳුනා ගන්න පුළුවන් වෙයි, විඳ දරා ගන්නත් හැකිවෙයි කියලා මා විශ්වාස කරනවා.

මේ රටේ සමස්ත ජනතාව හඳුනා ගත යුතු කාරණාවක් තිබෙනවා. අප්‍රේල් 21වැනි දින එල්ල වුණු ප්‍රහාරයෙන් මිය ගිය අහිංසක සහෝදරයන්ගේ ඒ මිනී ගොඩ උඩ ඉඳිමින් සමහර අය කථා කරන්නේ මොනවාද? මේ සිද්ධිය වෙච්ච ගමන්ම අපි මේ රටේ ආගමික නායකත්වයට, මේ රට පාලනය කරන නායකයන්ට කියපු පළමුවැනිම කාරණය තමයි අපි "දේශපාලනය" කියන වචනය සහ ඒ ක්‍රියාව පුංචි කාලයකට අමතක කරමුය කියන එක. එසේ අමතක කරලා අපි යම්කිසි වැඩ පිළිවෙළකට එමු කියලා. ප්‍රධාන වශයෙන් අපි හැම දෙනාටම වැරදුණා කියලා හිතලා, අපි පළපුරුද්දෙන් ලබාගත් අත්දැකීම් එක්ක මේ රටේ ආරක්ෂාව සම්බන්ධයෙන් කළ යුතු වැඩසටහනක් තිබෙනවා. ඒකට ආරක්ෂක අංශ විතරක් නොවෙයි, රටේ නායකයෝ විතරක් නොවෙයි, ආරක්ෂක අංශ විතරක් නොවෙයි, සමස්ත ජනතාවත් එකට එක්කාසු වෙලා තමයි ආරක්ෂක වැඩ පිළිවෙළ අපි ක්‍රියාත්මක කළ යුත්තේ. මම හිතනවා ජනතාව හැටියට හැම පුරවැසියෙකුටම මේ හැම දේටම දායකත්වයක් ලබා දෙන්න පුළුවන් කියලා; සහභාගිත්වයක් දක්වන්න පුළුවන් කියලා. අපි සියලුදෙනා එකතු වෙලා සිද්ධ කළ යුතු වන්නේ ඒකයි. මේ පාර්ලිමේන්තුවේ ඉන්න අපේ මන්ත්‍රීවරු 225 දෙනාගේ වගකීම වන්නේ, ජනතාවත් එක්ක අත්වැල් බැඳගෙන ඉදිරියේදී රටේ නැවතත් විනාශයක් වෙන එක නවත්වන එකයි; ත්‍රස්තවාදී ක්‍රියාවකට අවශ්‍ය කරන ඒ ශක්තිය ලබා නොදෙන එකයි.

එම නිසා තමයි අපි හිස්බුල්ලාගේ ෂරියා විශ්වවිද්‍යාලය ගැන විශේෂයෙන් කථා කළේ. එම නිසා මම හිතනවා, මේ කාලය තුළදී මේ විශේෂ කාරක සභාව නිසා අපේ රටේ ජනතාව යම් කිසි දෙයක් ඉගෙන ගත්තා, යම් කිසි දෙයක් දැන ගත්තා කියලා. අපේ ගමේ සිටින දුප්පත් අහිංසක මිනිසුන් විශේෂ කාරක සභාව හරහා දැන ගත්තා, ඇත්තටම රටේ මොනවාද සිද්ධ වන්නේ කියන කාරණය. ඒ විතරක් නොවෙයි. අද හිස්බුල්ලාගේ ෂරියා විශ්වවිද්‍යාලය නවත්වන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළත් ඒ හරහා ක්‍රියාත්මක වනවා. විශේෂ කාරක සභාවෙන් රටට අවශ්‍ය වැඩ පිළිවෙළ අපි ක්‍රියාත්මක කර ගත යුතුයි. ඒක තමයි අපි කළ යුත්තේ. විශේෂ කාරක සභාවට මඩ ගසමින්, ඒ කාරක සභාව තමන්ගේ ඡන්ද ව්‍යාපාරයට යොදා ගන්නේ නැතිව, මේ හදිසි නීතිය ක්‍රියාත්මක කරන මොහොතේ මේ රටේ සමස්ත ජනතාවට අවශ්‍ය විධියට ඉදිරි අනාගතයේ නිදහසේ සාමයෙන් හා සමඟියෙන් ජීවත් වන්න පුළුවන් රටක් ගොඩ නඟන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළට අපි සියලුදෙනා අත් වැල් බැඳගන්න ඕනෑය කියලා මම විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මී ළඟට, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා.5.22]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාගේ වෙලාවත් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳව විවාද කරන අතරතුර මගේ ජංගම දුරකථනයට පණිවුඩයක් එනවා, "මහින්දානන්ද අලුත්ගමගේට අද විශේෂ අධිකරණය නඩු පවරයි" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් විශේෂ මහාධිකරණයේ මහින්දානන්ද අලුත්ගමගේට නඩුවක් පවරනවා කියලා message එකක් ඇවිල්ලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ පණිවුඩය ජුනි මාසයේ 12 වෙනි දා "දිවයින" පත්තරයේ මුල් පිටුවේ මෙසේ පළ වෙලා තිබුණා:

> "විශේෂ මහාධිකරණය හමුවේ මහින්දානන්දට නඩු පැවරීමට අගවිනිසුරු අනුමැතිය"

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 17වන වගන්තියේ පැහැදිලිව මෙසේ සඳහන් වෙලා තිබෙනවා:

> "කොමිෂන් සභාවේ සෑම සාමාජිකයකු විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ කොමිෂන් සභාවට සහාය වීම සඳහා පත් කරන ලද සෑම නිලධරයකු හෝ සේවකයකු විසින්, ස්වකීය ධුරයේ කාර්ය භාර ගැනීමට ප්‍රථම මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්ය සඳහා හැර, මේ පනත, යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කර්තව්‍ය ඉටු කිරීමේ දී තමන්ට ලැබෙන හෝ තමන්ට දැනගැනීමට ලැබෙන තොරතුරු කිසිවක් අනාවරණය නොකරන බව ප්‍රකාශයක්, අත්සන් කළ යුතු ය."

මේ අනුව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සෑම නිලධාරියකුම බැඳී සිටිනවා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් නඩුවක් පැවරීම සම්බන්ධයෙනුත්, එයින් ලැබෙන තොරතුරු කිසිවකුත් එළියට නොදීමටත්. හැබැයි, දැන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව දවස් 20කට කලින් පත්තරයට දෙනවා, "මහින්දානන්ද අලුත්ගමගේට නඩු දමනවා" කියලා. මේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 18. (1) වගන්තිය අනුව කොමිෂන් සභාවේ සාමාජිකයන්, අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ කොමිෂන් සභාවට සහාය වීම පිණිස පත්කරන ලද නිලධරයන් හා සේවකයන් එම නීති කඩ කළොත් දණ්ඩ නීති සංග්‍රහය අනුව කටයුතු කළ හැකියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ රටේ ඕනෑම පුරවැසියෙකුට මේ අයිතිය තිබෙනවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පරීක්ෂණයක් පවත්වන අවස්ථාවක ඒ කිසි තොරතුරක් එළියට දෙන්න බැහැ. හැබැයි, මේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් මේ තොරතුරු එළියට දෙනවා. මම ඒ පිළිබඳව ඉන් එහාට කථා කරන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම කියන්නේ මේකයි. මේ විශේෂ මහාධිකරණ මේ රටේ ස්ථාපිත කළේ මේ රටේ සිදුවන මහා පරිමාණ දූෂණ වංචා හොරකම් එළියට දමන්නයි. ඒක හොඳයි. මේ රටේ සිදුවන මහා පරිමාණ වංචා, මහා පරිමාණ ගනුදෙනු, මහා පරිමාණ දූෂණ වෙනුවෙන් අධිකරණයක් පිහිටුවා ඔවුන්ට දඬුවම් දෙන්න ඕනෑ. ඒක හොඳයි. හැබැයි, දැන් මේ විශේෂ මහාධිකරණයේ ලොකුම චෝදනා එල්ල වන පුද්ගලයන් කවුද? 2020 ජනාධිපති, ගෝඨාභය රාජපක්ෂ. ඒ, මේ විශේෂ මහාධිකරණයේ නඩු තිබෙන එක චූදිතයෙක්. දැන් ගෝඨාභය රාජපක්ෂ තමයි මේ රටේ විශාලම වැරැද්ද කර තිබෙන කෙනා. ඊ ළඟට, මේ රටේ විශාලම වැරැද්ද කර තිබෙන පුද්ගලයා තමයි, මහින්දානන්ද අලුත්ගමගේ. ඊ ළඟ ජනාධිපතිවරණ සටනේ ගෝඨාභය රාජපක්ෂත් එක්ක ළඟින්ම ඉන්න සෙන්පතියෙකු තමයි මම. ඒ නිසා තමයි මට නඩුව වැටෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ නඩුව මට දමන්නේ ලංකා සතොස ආයතනය විසින් කැරම් බෝඩ් 14,000ක් ආනයනය කිරීම සම්බන්ධයෙන්. ඒ සඳහා LC විවෘත කරන්නේ සතොස, ගෙන්වන්නේ සතොස, බෙදන්නේ සතොස. ඒ සියල්ල කරන්නේ සතොස. එවකට මම ක්‍රීඩා ඇමති. මේක ක්‍රීඩා භාණ්ඩයක් නිසා ක්‍රීඩා ඇමතිට නඩු දමනවා. මම දන්නේ නැහැ, මේ රටේ නීතිය මේකද කියලා. එම නිසා මැතිවරණ ළං වෙද්දී විශේෂ මහාධිකරණ හදලා ඒවායේ දේශපාලන නඩු දමනවා.

ඒ නිසා කිරිඇල්ල මහත්තයෝ, අපි තමුන්නාන්සේලාගේ වික්‍රමසිංහ අගමැතිතුමාට කියනවා, තමුන්නාන්සේලා විශේෂ අධිකරණවල නොවෙයි, එයින් එහාට ගිය අධිකරණවල නඩු දැම්මත් තමුන්නාන්සේලාට අප පාලනය කරන්න හම්බ වෙන්නේ නැහැ කියලා. තමුන්නාන්සේලා හිතන්න එපා, නඩු දමලා අප භය කරන්න පුළුවන් වෙයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම අමාත්‍යාංශයෙන් අයින් වුණාට පස්සේ ක්‍රීඩා ඇමතිවරු තුන්දෙනෙක් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව යටතේ හිටියා. මෙතැන ඉන්නවා දයාසිරි ජයසේකර හිටපු ඇමතිතුමා. එතුමා ක්‍රීඩා ඇමතිවරයා හැටියට පාර්ලිමේන්තුවේ දී උත්තරයක් දීලා කිව්වා, "මේකට ක්‍රීඩා අමාත්‍යාංශය කිසිම සම්බන්ධයක් නැහැ. මෙතුමාට නඩු දැම්මොත් මම කෝට් එක දාගෙන ඇවිල්ලා උසාවියේ කථා කරනවා"යි කියලා. ඊළඟට ආවා, ෆයිසර් මුස්තාපා හිටපු ඇමතිතුමා. එතුමා ජනාධිපති නීතිඥවරයෙක්. එතුමා මේ පාර්ලිමේන්තුවේදී කිව්වා, "මේකට ක්‍රීඩා අමාත්‍යාංශයේ කිසිම මැදිහත්වීමක් නැහැ" කියලා. දැන් ඉන්නවා එක්සත් ජාතික පක්ෂයේ හරින් ප්‍රනාන්දු මැතිතුමා. එතුමා මේ සභාවේ දී කිව්වා, "මේකට ක්‍රීඩා අමාත්‍යාංශයේ කිසිම සම්බන්ධතාවක් නැහැ. මේකට අපේ සම්බන්ධයක් නැහැ. මේක සතොස ආයතනයෙන් කරපු ගනුදෙනුවක්" කියලා. මේ වෙනුවෙන් ක්‍රීඩා අමාත්‍යාංශය ශත පහක්වත් ගෙවලා නැත්නම්, ක්‍රීඩා අමාත්‍යවරයා ලිඛිතව හෝ කිසිම දෙයක් කරලා නැත්නම් ක්‍රීඩා ඇමතිවරයාට නඩු දමන්නේ මොන පදනම මතද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, තමුන්නාන්සේලාගේ අගමැතිවරයාට අපි කෙළින් උත්තර දෙනවා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ හොරකම්වලට විරුද්ධව අපි කෙළින් කථා කරනවා. තමුන්නාන්සේලාට විරුද්ධව මේ සටන අපි මෙහෙයවනවා. ඒක තමයි තමුන්නාන්සේලාට තිබෙන ලොකුම ප්‍රශ්නය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ සිද්ධියට මට විරුද්ධව දමන හතරවැනි නඩුවයි මේ. මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු තුනක් දැම්මා. එකම චෝදනාව, එකම චූදිතයෝ. කිසිම සම්බන්ධයක් නැති සිද්ධියකට අධිකරණ හතරක නඩු දමලා තියෙනවා. අපට විශේෂ අධිකරණවල නඩු දමලා ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ ජනාධිපතිවරණ සටන බේරාගන්න පුළුවන් කියලා තමුන්නාන්සේලා හිතනවා නම්, ඒ තමයි තමුන්නාන්සේලා කරන ලොකුම වැරැද්ද. ඒ නිසා නඩු පිට නඩු වැටුණත්, හිරගෙවල් දහසක ගියත් ඒ සටන අපි නවත්වන්නේ නැහැ කියන එක තමුන්නාන්සේලාට විශේෂයෙන් මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි දැක්කා මේ ආණ්ඩුව බලයට පත් කරන්න වැඩිම කාර්ය භාරයක් කරපු පාක්‍යසෝති සරවනමුත්තු මහත්මයා CID එකට ගිහිල්ලා පැමිණිල්ලක් කරලා තිබුණා, "අස්ගිරියේ මහානායක හාමුදුරුවන් වහාම අත් අඩංගුවට ගන්න" කියලා. අපි සරවනමුත්තු මහත්මයාගෙන් අහනවා, කොහෙන්ද එතුමාට ඒ ලයිසන් එක දුන්නේ කියලා. අඩු ගණනේ මහනුවර ඉන්න, උඩරට භාරව ඉන්න ඇමතිවරයා හැටියට කිරිඇල්ල ඇමතිතුමාවත් මේ පිළිබඳව අද වෙනකල් ප්‍රකාශයක් කළේ නැහැ. ඒ ගැන මම කනගාටු වනවා. තමුන්නාන්සේලා

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

හැමදේටම දුවගෙන යන්නේ අස්ගිරියේ හා මල්වතු මහා විහාරයට. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමනි, අඩු ගණනේ ඔබතුමාටවත් බැරි වුණා අස්ගිරියේ මහානායක හාමුදුරුවන් වෙනුවෙන් වචනයක් කථා කරන්න. අපි දන්නවා, අස්ගිරියේ මහානායක ස්වාමීන් වහන්සේ කියන්නේ මේ රටේ බොහොම ගෞරවයට, ආදරයට පාත්‍රවුණු නායක ස්වාමීන් වහන්සේ නමක් බව. උන්වහන්සේ කෙරෙහි මේ රටේ බෞද්ධ ජනතාවගේ විශාල විශ්වාසයක් තියෙනවා. උන්වහන්සේ කිසිම අවස්ථාවක මුස්ලිම් ජනතාවට එරෙහිව කථා කළේ නැහැ. උන්වහන්සේ, "මෙවැනි දෙයක් ඇති වුණොත්" කියන කාරණය පමණයි කිව්වේ.

සරවනමුත්තු මහත්මයා කියන්නේ, මේ යහ පාලන ආණ්ඩුව බලයට පත් කරන්න වැඩිම කාර්ය භාරයක් කරපු පුද්ගලයෙක්; NGOකාරයෙක්; NGOsවලින් පඩි ගන්න, NGOsවලින් යැපෙන ඇමෙරිකානු ගැත්තෙක්. මේ සරවනමුත්තු මහත්මයා කියනවා, "අස්ගිරියේ මහානායක හාමුදුරුවෝ අත්අඩංගුවට ගන්න ඕනෑ"ය කියලා. අපි අහනවා, මේක ආණ්ඩුවේ මතයද කියලා. ආණ්ඩුව වෙනුවෙන් හිටගත්ත මනුස්සයෙක්, ආණ්ඩුව හදන්න කැප වුණු මනුස්සයෙක් අස්ගිරියේ මහානායක හාමුදුරුවන්ට මෙවැනි ප්‍රකාශයක් කරනවා නම්, මේක ආණ්ඩුවේ මතයද කියලා අපි තමුන්නාන්සේලාගෙන් අහන්න කැමැතියි. අද වෙනකල් ආණ්ඩුවේ කිසි කෙනෙක් මේ පිළිබඳව ප්‍රකාශයක් කළේ නැහැ. ඒ නිසා අස්ගිරියේ මහානායක හාමුදුරුවෝ අත්අඩංගුවට ගන්න නොවෙයි, අඩු ගණනේ උන්වහන්සේගෙන් කටඋත්තරයක් ගන්න හරි තමුන්නාන්සේලා කටයුතු කරනවා නම් ඒකට විරුද්ධව මේ රටේ මිනිස්සු දැඩි පියවර ගනීවි. එවැනි පහත් තත්ත්වයට පත් වෙන්න එපා කියලා අපි ඉතාම ගෞරවයෙන් මේ ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පසුගිය දා සිදු වූ පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් කථා කරද්දී අපි හැම අවස්ථාවකදීම කිව්වා, මේක සමස්ත මුස්ලිම් ජනතාව කරපු ක්‍රියාවක් නොවෙයි කියලා. හාරිස් මන්ත්‍රීතුමා, අපේ බොහොම හොඳ මිත්‍රයා. අපි කවදාවත් එතුමාට චෝදනාවක් එල්ල කළේ නැහැ, එතුමා අන්තවාදියෙක් කියලා. එතුමාට එහා පැත්තේ ඉන්නවා නසීර් මන්ත්‍රීතුමා. අපි කවදාවත් ඔබතුමාට කිව්වේ නැහැ ඔබතුමා අන්තවාදියෙක්, එහෙම නැත්නම් ජාතිවාදියෙක් කියලා. අපේ රවුෆ් හකීම් හිටපු ඇමතිතුමා, ඒ වාගේම අපේ කබීර් හෂිම් ඇමතිතුමා, අපේ ගමේ අහිංසක හලීම් ඇමතිතුමා, මේ කිසි කෙනෙක් ජාතිවාදීන්, අන්තවාදීන් කියලා අපි හැඳින්වූයේ නැහැ.

අපේ ගම්වල අපේ මුස්ලිම් ජනතාවගේ ප්‍රශ්න ගැන බලන්නේ අපි. ඒ ගොල්ලන්ගේ මරණයට, මඟුලට, දුකට, සැපට ඉන්නේ අපි. තමුන්නාන්සේලා නැහෙනහිර ඉඳලා එන්නේ නැහැ. රවුෆ් හකීම් මන්ත්‍රීතුමා ඡන්ද ටික අරගෙන කොළඹට පනිනවා. ආයෙත් ගමට එන්නේ නැහැ. අපි තමයි ඒ මිනිසුන්ගේ මඟුලට, මරණයට යන්නේ. අපි ඒ මිනිසුන්ගේ තමයි පාර හදලා දෙන්නේ. අපි තමයි ඒ ඉස්කෝල හදලා දෙන්නේ. අපි තමයි ඒ ළමයා ඉස්කෝලෙට දාලා දෙන්නේ. අපි තමයි මුස්ලිම් ජනතාවගේ දුකේදී, සැපේදී හැම දාම ඒ අයත් එක්ක හිටපු මිනිස්සු. ඒ නිසා අපි කිසිසේත් කියන්නේ නැහැ, සමස්ත මුස්ලිම් ප්‍රජාව මේ ක්‍රියාවට සම්බන්ධයි කියලා. හැබැයි, අපි කියනවා මේ සිද්ධිය පිටුපස යම් පිරිසක් හිටියාය කියන එක. මේ අන්තවාදය පිටුපස යම් පිරිසක් හිටියා. මාවනැල්ලේ බුදු පිළිම කඩපු පුද්ගලයන් අත්අඩංගුවට නොගන්න බලපෑම් කරපු මිනිස්සුන්ට, වනාතවිල්ලුවේ බෝම්බත් එක්ක අත්අඩංගුවට ගත්ත මිනිස්සු නිදහස් කරපු අයට, මරාගෙන මැරෙන ප්‍රහාරයට සම්බන්ධ මිනිස්සුත් එක්ක ගනු දෙනු කරපු රිසාඩ් බදියුදීන් වාගේ තනි පුද්ගලයකුට විරුද්ධවයි අපි මේ චෝදනාව එල්ල කළේ. එතුමාට විරුද්ධව චෝදනා කරන්න අපට තොරතුරු තිබුණා. ඒ නිසා මෙතැනදී රිසාඩ් බදියුදීන් කියන තනි පුද්ගලයාට විරුද්ධව කථා කළාම, සමස්ත මුස්ලිම් ජනතාවම ඒ චෝදනාව බෙදා ගත්ත එක හරි අසාධාරණයි. අපි-තමුන්නාන්සේලා බොහොම හොඳ හිතවතුන්. අපි හොඳ මිත්‍රයෝ, ඥාතියෝ. තමුන්නානේස්ලා-අපි හරි හිතවත්. ඒ නිසා සිංහල, මුස්ලිම් අපි-තමුන්නාන්සේලා එකට ඉන්න සමාජයක් තුළ එවැනි මතවාදයක් හදලා, සියලුදෙනාම තනතුරුවලින් ඉල්ලා අස්වෙලා ඒ කරපු ක්‍රමවේදය ඉතාම වැරැදියි ගරු ඇමතිතුමනි. මුස්ලිම් ජනතාවගේ පමණක් නොවෙයි, සිංහල ජනතාවගේත් යම් වේදනාවක් තිබෙනවා, තමුන්නාන්සේලා සියලුදෙනා රිසාඩ් බදියුදීන් ඇමතිවරයා වෙනුවෙන් හිටගත් එක පිළිබඳව.

තමුන්නාන්සේලාට අගමැතිතුමා ලණුවක් දුන්නා. තමුන්නාන්සේලා ඒ ලණුව කෑවා. අගමැතිතුමා දිග කඹයක් දුන්නා. එතුමා මොකක්ද කිව්වේ? "මාසයකට අයින් වෙන්න. ඕක මහ හැරිලා යාවි" කිව්වා. "ඔරු මාසම්" කිව්වා. තමුන්නාන්සේලා මාසයකට ඇමති තනතුරුවලින් අයින් වුණා. මාසයකින් පස්සේ ආයෙත් ඇමතිකම් ගන්න බලාගෙන හිටියා. දැන් කරන්න දෙයක් නැහැ. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ටෙන්ඩර් ටික මේ දවස් ටිකේ කඩනවා. ටෙන්ඩර් ටික කඩන කොට හරි වැඩේ! ඇමතිතුමා නැහැ. දැන් හරි අමාරුවකින් දැන් ඉන්නේ. ඒ ඇමතිවරුන්ට ඇමතිකම් ටික ආපසු ගන්න බැරිව බොහොම අමාරුවෙන් ඉන්නේ. එක ටෙන්ඩර් එකකින් ඇමරිකානු ඩොලර් මිලියන 3යි, 4යි. ඉතින් බොහොම අමාරුවෙන් ඉන්නේ. ඒ නිසා ඔබතුමන්ලාට ආණ්ඩුවේ අගමැතිතුමා දුන්නේ ලණුවක්. තමුන්නාන්සේලාට කිව්වා, මාසයකින් මේ ඇමතිකම් භාර ගන්න කියලා. දැන් මොකද වුණේ? හලීම් ඇමතිතුමා ඇවිල්ලා නැවත දිවුරුම් දුන්නා, අගමැතිතුමා දන්නෙත් නැහැ. ඒ වාගේම අපේ කෑගල්ලේ ඇමතිතුමාත් ගිහිල්ලා වැඩ භාර ගත්තා. තමුන්නාන්සේලා සමස්ත මුස්ලිම් ජනතාව වෙනුවෙන් තීන්දුවක් ගත්තා. දැන් තමුන්නාන්සේලාත් එක මතයක නැහැ කියලා මුස්ලිම් ජනතාව අතර ඉන්න මගේ හිතවත් හාජ්ජියාර් කෙනකු කිව්වා. ඒ හාජ්ජියාර් කිව්වා, "බලන්න, ඇමතිතුමනි. ඔක්කෝම එකට අයින් වුණාම අපි සතුටු වුණා. හැබැයි, අන්න දෙදෙනෙක් ගිහිල්ලා ආයෙත් වැඩ භාර ගත්තා" යි කියලා. තමුන්නාන්සේලා එකට එකතු වෙලා ගත් තීන්දුව මාසයක් තියා ගන්න බැරි වුණා.

ගරු හරීස් හිටපු ඇමතිතුමනි, 21වැනි දා වූ සිද්ධිය සම්බන්ධයෙන් විශාල පිරිසක් අත්අඩංගුවට අරගෙන ඉන්නවා. ඒ අතර, ත්‍රස්තවාදයට සම්බන්ධ පිරිසකුත් ඉන්නවා. අපි ඒක පිළිගන්නවා. ඒ වාගේම සම්බන්ධ නැති අහිංසක පිරිසකුත් ඉන්නවා. ඒ අය වෙනුවෙන් සාධාරණයක් ඉෂ්ට වෙන්න ඕනෑ. ඒ අය ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගෙන තිබෙනවා. ඒ අයට සාධාරණයක් වෙන්න ඕනෑ. ඒ පිළිබඳව අපි කවදාවත් විරුද්ධ නැහැ. හැබැයි, ඔබතුමාට කියන්න ඕනෑ, දිගන සිද්ධියේ දී සිංහල, බෞද්ධ දෙසිය ගණනක් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට අරගෙන මාස 7ක් ඇතුළේ හිටිය බව. ඒ ගොල්ලන් බේරන්න කවුරුවත් කථා කළේ නැහැ. ඒ ගොල්ලන් බේරන්න කිසි කෙනකු හිටියේ නැහැ. අපේ සිංහල කොල්ලෝ මාස 7ක් ඇතුළේ ඉඳලායි එළියට ආවේ. හැබැයි, අද තමුන්නාන්සේලා වෙනුවෙන් පොලිස්පතිතුමා කියා තිබෙනවා, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඉවත් කරලා සාමාන්‍ය නීතියෙන් කටයුතු කරන්න කියලා. අපි ඒකට විරුද්ධ නැහැ. හැබැයි, අපි ඔබතුමන්ලාට කියනවා, ත්‍රස්තවාදියායි, සාමාන්‍ය පුද්ගලයායි එකට තියලා තීන්දු ගන්න එපා කියලා.

ආරක්ෂාව භාර රාජ්‍ය ඇමතිතුමනි, දැන් ජනාධිපතිතුමා ඔබතුමා ආරක්ෂක කවුන්සලයට කැඳවනවාද දන්නේ නැහැ. දැන්

ඔබතුමාට තීන්දු ගන්න පුළුවන්ද කියලා අපි දන්නේ නැහැ. අපි බොහොම ගරු කරන ආරක්ෂක රාජ්‍ය ඇමතිතුමනි, අපි ඔබතුමාට කියනවා, මේ නීතිය ගෙනෙන කොට පැහැදිලිවම ත්‍රස්තවාදයට සම්බන්ධ වෙච්ච පුද්ගලයන් සම්බන්ධයෙන් කටයුතු කරනකොට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඉවත් කරලා කටයුතු කරන්න එපා කියලා. හරීස් ඇමතිතුමනි, පැහැදිලිවම අහිංසක පිරිස් ඉන්නවා. ඒ අය නිදහස් කිරීම පිළිබඳව අපේ විරෝධතාවක් නැහැ. ඒ පිළිබඳව තමුන්නාන්සේලාගේ අවධානය යොමු කරන්නය කියන ඉල්ලීම කරනවා.

අවසාන වශයෙන් මේ පත් කර තිබෙන විශේෂ කාරක සභාව සම්බන්ධයෙනුත් වචනයක් කියන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
හොඳයි.

දැන් මේ විශේෂ කාරක සභාව බදාදාට පෙන්වන "කෝපි කඩේ" ටෙලි නාට්‍යය වාගෙයි. ගම්වල මිනිස්සු ඔක්කෝම බලනවා, ස්වාධීන රූපවාහිනියේ "කෝපි කඩේ" ටෙලි නාට්‍යය බලනවා වාගේ. දැන් මේක විහිළුවක් බවට පත් වෙලා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
විහිළුවක් නොවෙයි, most popular TV programme එක.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Yes, the most popular TV programme. ඔබතුමා හරියට හරි. වැඩි දෙනා බලන තත්ත්වයක් තිබෙනවා. මේක හරි විහිළුවක් බවට පත් වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා ඒ කාරක සභාවේදී ප්‍රශ්න අහද්දිත් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට "ෂොට්" එක දෙන්න පුළුවන් ප්‍රශ්න විතරයි අහන්නේ. අගමැතිතුමා බේරලා ජනාධිපතිතුමා බිත්තියට හේත්තු කරලායි ප්‍රශ්න ටික අහන්නේ. ඒ නිසා තමුන්නාන්සේලා ඒ පාවිච්චි කරන ක්‍රමවේදය "අමු" වැඩියි. තමුන්නාන්සේලා- [බාධා කිරීමක්]

ඔව්, රවි කරුණානායක ඇමතිතුමාගෙන් CID එක ප්‍රශ්න අහනවා, රවි කරුණානායක ඇමතිතුමා CID එකෙන් ප්‍රශ්න අහනවා. ඒක තමයි වැඩේ. උදේ රවි කරුණානායක ඇමතිතුමා CID එකට ගිහින් කටඋත්තරයක් දෙනවා. සවසට CID එක පාර්ලිමේන්තුවේ කාරක සභාවට ආවාම රවි කරුණානායක ඇමතිතුමා CID එකෙන් ප්‍රශ්න අහනවා. මෙවැනි විගඩම් කෝලමක් තමයි, තමුන්නාන්සේලාගේ මේ විශේෂ කාරක සභාව. අපි ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා, කතෝලික ජනතාවට වුණු අසාධාරණය ගැන සොයා බලන්නය කියලා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමනි, ඒ ප්‍රහාරයෙන් මිය ගිය කතෝලික ජනතාව වෙනුවෙන් තවම තුන් මාසයේ දානයවත් දුන්නේ නැහැ. ඔවුන් වේදනාවෙන්, අමාරුවෙන් ඉන්නේ. ඒ ගොල්ලන්ගේ තුවාල තවම වේළිලා නැහැ. මේකට වැරැදිකරුවන් කවුද කියලා ඔවුන් බලාගෙනයි ඉන්නේ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු මන්ත්‍රීතුමනි, මෙතැන තිබෙන ගැටලුව මේකයි. ඔබතුමන්ලාට මේ විශේෂ කාරක සභාව වර්ජනය නොකර ඉන්න තිබුණා. මෙම කාරක සභාවට සහභාගි වීම සඳහා දැන් හෝ ඔබතුමන්ලාට කථානායකතුමාගෙන් ඉල්ලීමක් කරන්න පුළුවන්. එතකොට ඔබතුමන්ලාට ඕනෑ විධියට ප්‍රශ්න අහන්න පුළුවන් නේ. ඔබතුමන්ලා මේ විශේෂ කාරක සභාව වර්ජනය කරන්නේ ඇයි?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අපට, "කෝපි කඩේ"නාට්‍යයේ රඟපාන චිකට නළුවන් වාගේ වෙන්න කිසිසේත්ම අවශ්‍යතාවක් නැහැ. අපට ඔය "කෝපි කඩේ" චිකට නළුවකු වෙන්න ඕනෑ නැහැ. අපි මේ විශේෂ කාරක සභාව ගැන දැන ගත්තා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඒකට 'කුරුං ගුරුං' චරිතය විතරයි අඩුවෙලා තිබෙන්නේ. අපි ඒකට එන්න ඕනෑ නැහැ නේ. අද තමුන්නාන්සේලාට පෙනෙනවා නේ, කාදිනල්තුමා මේ ආණ්ඩුවට විරුද්ධව එල්ල කරන චෝදනා මොනවාද කියලා. මේක විහිළුවකට ගන්න එපා. ඒ ප්‍රහාරයෙන් කිතුනු බැතිමතුන් තුන්සියයකට ආසන්න පිරිසක් මිය ගියා, පන්සිය ගණනක් තුවාල ලැබුවා. මේ පාර්ලිමේන්තුවත් "කෝපි කඩයක්" කරලායි තිබෙන්නේ. ඒ ගැන අපි පුදුම වෙන්නේ නැහැ. කථානායකතුමා දැන් පාර්ලිමේන්තුව දිහා බලන්නේත්, "කෝපි කඩේ" දිහා බලනවා වාගේ නේ. ඒ නිසා ඒ විශේෂ කාරක සභාවත් "කෝපි කඩයක්" වාගේ වන එක ගැන අප පුදුම වෙන්නේ නැහැ. මේවාට ඇමෙරිකාවෙන් පඩි ගන්නා අය දමා ගන්නා කථානායකවරයෙක් තමයි අපට ඉන්නේ. ඒ නිසා, මේ විශේෂ කාරක සභාව කෝලම් මඩුවක් බවට පත්කර ගන්න එපා කියන ඉල්ලීම කරමින්, මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු එච්.එම්.එම්. හරීස් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා.5.38]

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
*බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී කල්මුනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන ප්‍රශ්න පිළිබඳව කථා කරන්න මා කැමතියි. පසුගිය සතියේ කල්මුනේ ප්‍රදේශයේ තිබුණු උද්ඝෝෂණය, උපවාසය පිළිබඳව මේ සභාවට පැහැදිලි කරන්නට මා කැමැතියි. පසුගිය සතියේ කල්මුනේ දෙමළ සහ මුස්ලිම් ජනතාව උද්ඝෝෂණයක්, උපවාසයක් පැවැත්වූවා. දෙමළ ජනතාව උපවාසය කරනකොට පූජ්‍ය ගලගොඩඅත්තේ ඥානසාර ස්වාමීන් වහන්සේ ඒ ස්ථානයට ගිහින් උපවාසය කළ දෙමළ ජාතික සන්ධානයේ නාගරික මන්ත්‍රීතුමාත් එක්ක කථා කරලා ඒ උපවාසය අවසන් කළා. ඒ වාගේම, රජය ලබාදුන් පොරොන්දු අනුව මුස්ලිම් ජනතාවගේ උපවාසය, උද්ඝෝෂණය අවසන් කළා.

කල්මුනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා මාර්ගයෙන් විසඳුමක් ලබාගන්න ඕනෑ. 1989දී -යුද්ධය තිබුණු කාලයේ- එල්ටීටීඊ එක විසින් බලහත්කාරයෙන් කල්මුනේ

[ගරු එච්.එම්.එම්. හරීස් මහතා]

ප්‍රදේශයේ දෙමළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ස්ථාපිත කරනු ලැබුවා. ඒ අවස්ථාවේදී මුස්ලිම් ජනතාවගේ ගම්මාන, ව්‍යාපාරික ස්ථාන, කුඹුරු ඉඩම්, ඒ වාගේම වටිනා දේවල් බලහත්කාරයෙන් ඒකට ඇතුළු කළා. ඒ නිසා කල්මුනේ මුස්ලිම් ජනතාව අසාධාරණයට පත් වුණා. අවුරුදු 30ක කාලයක් තිස්සේ අපි මේ පිළිබඳව අපේ රට පාලනය කළ ජනාධිපතිතුමන්ලාගෙන්, ආණ්ඩුවලින් ඉල්ලීමක් කළා. කල්මුනේ මුස්ලිම් ජනතාවට සාධාරණයක් කරන්නය කියා අපි කියා සිටියා. හැබැයි කවුරුත් එහෙම කළේ නැහැ. අපේ අගමැතිතුමා මීට මාස දෙකකට කලින් දෙමළ ජාතික සන්ධානයේත්, ඒ වාගේම මුස්ලිම් කොංග්‍රසයේත් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා සමඟ සාකච්ඡා කරලා, මේ ප්‍රශ්නයට විසඳුමක් ලබාගන්න සීමා නිර්ණය කොමිෂන් සභාවක් පත් කළා.

ඒ කමිටුව හරහා මේ ප්‍රශ්නයට විසඳුමක් ලබා ගන්න පුළුවන් වෙයි කියලා අපි සියලුදෙනාම විශ්වාස කළා. හැබැයි, අපි අතරේ ඇති වුණු මේ පොරොන්දුව කල්මුනේ දෙමළ ජාතික සන්ධානයේ නාගරික මන්ත්‍රීවරයා විසින් අවලංගු කළා. ගිය සතියේ ලොකුවට උපවාසයක්, උද්ඝෝෂණයක් කළා. ඇත්තටම කල්මුනේ ජීවත් වන දමිළ, මුස්ලිම් ජනතාව අතරේ තිබුණු සහජීවනයට එයින් හානියක් සිදුවෙලා තිබෙනවා.

ඊළඟට, මෙන්න මේ කාරණයත් ඔබතුමන්ලාට මතක ඇති. 1987 අවුරුද්දේ ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් කළා .ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් කළේ ඇයි? ඒ කාලයේ එල්ටීටීඊ කණ්ඩායමේ බලපෑම් නිසා, ජාත්‍යන්තර රටවල් අපේ රටට බලපෑම් කළා. ඒ නිසා ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් කරලා, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා, පළාත් සභා පිහිටෙව්වා. එමඟින් උතුර සහ නැඟෙනහිර පළාත් ඒකාබද්ධ කළා. ඒ නිසා නැඟෙනහිර පළාතේ සිටි බහුතර සිංහල ජනතාවට, මුස්ලිම් ජනතාවට අසාධාරණයක් සිදු වුණා. ඒ කාලයේ කවුරුවත් ඒ ගැන කථා කළේ නැහැ. 1987 ඉඳලා 2007 වනතුරු -අවුරුදු 20ක කාලයක්- මේ ඒකාබද්ධ කිරීම නීතිමය වශයෙන් තිබුණා. මේ ඒකාබද්ධ කිරීම හරි ක්‍රියාදාමයක් කියලා දමිළ පක්ෂ නායකවරුන්ට පෙනුණා. හැබැයි, මේ රටේ හිටපු බහුතර සිංහල දේශපාලන නායකයන්ට, මුස්ලිම් නායකයන්ට අපි පැහැදිලි කළා, මේ ඒකාබද්ධ කිරීම වැරදියි කියලා. මේ ඒකාබද්ධ කිරීම ලොකු වරදක් කියලා, නඩු දමලා, අවසානයේ උසාවියෙන් තීන්දුව ලබා ගත්තා. උතුර, නැඟෙනහිර ඒකාබද්ධ කිරීම නීතිමය වශයෙන් නිවැරදි බව අවුරුදු විස්සක් තිස්සේ මේ රටට පෙනුණා. හැබැයි අවසානයේදී, ඒක මේ රටේ නීතියට පටහැනියි කියලා, උතුර, නැඟෙනහිර ඒකාබද්ධ කිරීම උසාවිය විසින් අවලංගු කළා.

ඊළඟට, කල්මුනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ගැනත් මම වචනයක් කිව යුතුයි. මේ රටේ තිබෙන නීති රීතිවලට විරුද්ධව එය ස්ථාපිත කළා. ජාති වශයෙන් බලලා, එහෙම නැත්නම් භූගෝල සම්බන්ධතා ගැන බලන්නේ නැතිව ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් පාලන ආයතන ස්ථාපිත කරන්න බැහැ කියලා මේ රටේ නීති රීතිවල පැහැදිලිව කියනවා. හැබැයි, මේ නීතිරීතිවලට විරුද්ධව,- [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එස්. ශ්‍රීතරන් මන්ත්‍රීතුමා.

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ நண்பர் ஹரீஸ் அவர்களே, நீங்கள் முதலில் சொன்னதுபோல, இந்தப் பிரச்சினையைத் தமிழ் தேசியக் கூட்டமைப்பினராகிய நாங்களும், நீங்களும் பேசித் தீர்த்துக்கொள்வதுதான் மிகவும் நல்லது. ஆனால், 1989ஆம் ஆண்டு தமிழீழ விடுதலைப் புலிகளினால்தான் இந்தப் பிரதேசச் செயலகப் பிரிவு பிரிக்கப்பட்டது என்பதை ஏற்றுக்கொள்ள முடியாது. ஏனென்றால், தமிழீழ விடுதலைப் புலிகள் ஒரு காலமும் எந்த அரசாங்கத்தோடும் ஆட்சி அதிகாரங்களில் இருக்கவில்லை. ஆகவே, இங்கு நீங்கள் ஒரு தவறான கருத்தைச் சொல்லக்கூடாது. இந்தப் பிரச்சினையை வளரவிடாமல் தீர்க்கவேண்டிய ஒரு பாரிய பொறுப்பும் கடமையும் உங்களுக்கு முன்னால் இருக்கிறது. கல்முனையில் மட்டுமல்ல, அம்பாறை மாவட்டம் முழுவதும் தமிழ், முஸ்லிம் மக்கள் ஒற்றுமையாக வாழ வேண்டும். மட்டக்களப்பிலே 12 கிராம அலுவலர் பிரிவுகளுக்கு ஒரு பிரதேச செயலகம் இருக்கிறது. ஆனால், 26 - 27 கிராம அலுவலர் பிரிவுகளைக் கொண்ட குறித்த பிரதேசத்தில், அதிலும் 100 வீதம் தமிழ் மக்கள் வாழுகின்ற ஓர் இடத்தில் இந்தப் பிரதேச செயலகத்தை அமைப்பதை நீங்கள் தடுக்கக்கூடாது. ஆகவே, இந்த விடயத்தில் நீங்கள் தயவுசெய்து மானசீகமாக, மனட்சாட்சிப் படி விட்டுக்கொடுப்போடு நடப்பதுதான் இந்த நாட்டில் இந்த இரண்டு இனங்களும் இணைந்து வாழ்வதற்குப் பொருத்தமான விடயமாக அமையும். ஆகவே, தயவுசெய்து, அதைக் கவனத்தில் எடுங்கள்! ஆனால், நீங்கள் விடுதலைப் புலிகளை இதற்குள் இழுப்பது சரி என்று நான் நினைக்கவில்லை.

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)

கௌரவ பாராளுமன்ற உறுப்பினர் அவர்களே, உண்மையில் 1989ஆம் ஆண்டு என்பது, விடுதலைப் புலிகள் அன்று ஜனாதிபதி பிரேமதாஸவுடன் சமாதானப் பேச்சுவார்த்தையில் ஈடுபட்ட காலம்! அது மிகவும் சக்திவாய்ந்த ஒரு தருணம்! அன்று நாட்டில் இந்தியப் படை நிலைகொண்டிருந்தது. நான் அன்பான முறையில்தான் இந்த விடயங்களை உங்களுக்குக் கூறுகின்றேன். இவ்வாறான தொரு சூழ்நிலையில்தான் எங்களுக்கு நெருக் குவாரம் ஏற்படுத்தப்பட்டது. அன்று உண்ணாவிரதம் இருந்தார்கள். அப்பொழுது நான் ஒரு பாடசாலை மாணவனாக இருந்தேன், இப்பொழுதும் எனக்கு ஞாபகம் இருக்கின்றது. உண்மையில் கல்முனைவாழ் தமிழ் மக்களுக்கென்று பிரதேச செயலக மொன்று உருவாகுவதற்கு நாங்கள் எதிர்ப்பில்லை. ஆனால், இந்த நாட்டினுடைய சட்டதிட்டங்களின்படி அது அமைய வேண்டும். அதேநேரம் அதை நிலத் தொடர்பற்ற ரீதியாகவும் 100 வீதம் தமிழ் மக்கள் வாழுகின்ற ஒரு பிரதேச செயலகமாகவும் அமைக்க முடியாது. அங்கு தமிழ்ப் பிரதேச செயலகப் பிரிவுக்குள் முஸ்லிம்கள் வாழ வேண்டும். அதேபோன்று முஸ்லிம்கள் பெரும்பான்மையாக வாழுகின்ற பிரதேசத்துக்குள் தமிழ் மக்கள் வாழவேண்டும். இதுதான் எங்களுடைய நிலைப்பாடு! இப்பொழுது, முஸ்லிம்களாகிய நாங்கள் காயப்பட்டிருக்கிறோம். இந்தத் தருணத்தில் தெற்கிலுள்ள பெரும்பான்மை மக்களைப் பிரதிநிதித்துவப் படுத்துகின்ற மதகுருமார் அந்த இடத்திற்கு வந்து, குறிப்பாக எங்களுக்கு எதிராக இந்தப் பிரச்சினையைக் கையாளுகின்ற விதத்தைத் தமிழ்த் தேசியக் கூட்டமைப்பு அனுமதிக்கின்றதா? என்று நான் கேட்க விரும்புகின்றேன்.

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එස්. ශ්‍රීතරන් මන්ත්‍රීතුමා.

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
கௌரவ உறுப்பினர் ஹரிஸ் அவர்களே, முஸ்லிம்கள் காயப்பட்டிருக்கின்ற இந்த நேரத்தில் நாங்கள் இன்னோர் இனத்தோடு சேர்ந்திருந்து உங்களுக்கெதிரான பிரச்சாரத்தையோ அல்லது உங்களுக்கெதிரான நடவடிக்கையையோ செய்வதை நாங்கள் ஏற்றுக்கொள்ளவில்லை. ஆனால், மானசீகமாக நீங்கள் யோசியுங்கள்! கிழக்கு மாகாணத்திலே நிலத்தொடர்பற்ற முறையில் பல கல்வி வலயங்கள் இருக்கின்றன; நிலத்தொடர்பற்ற வகையில் பிரதேச செயலகங்களும் உண்டு. அப்படியிருக்கும்பொழுது -

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
அதை நான் ஏற்றுக்கொள்கின்றேன். ஆனால், அவற்றை எங்களது கட்சி ஏற்படுத்தவில்லை.

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
தயவுசெய்து நீங்களும் நாங்களும் சேர்ந்து இதற்கு ஒரு நீதியான தீர்வைப் பெற்றுக் கொடுக்க வேண்டும். தமிழர்கள் தங்களுடைய பிரதேசத்தை ஆளக்கூடிய வகையில் நீங்கள் இந்த விடயத்தில் விட்டுக் கொடுப்பதுதான் இரண்டு இனத்துக்கும் சௌகரியமாகும்.

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
கௌரவ பாராளுமன்ற உறுப்பினர் அவர்களே, நீங்கள் ஒரு விடயத்தைச் சொல்கின்றீர்கள். அதாவது, இரு தரப்பினரும் பேசித் தீர்க்கவேண்டும் என்று கூறுகின்றீர்கள். உண்மையில் நான் அதை வரவேற்கின்றேன். ஆனால், நீங்கள் எங்கள் தரப்பு நியாயங்களையும் புரிந்துகொள்ள வேண்டும். நான் உண்மைக்குப் புறம்பான விடயங்களைச் சொல் லவில்லை. அங்கு குறித்த பிரதேசத்துக்குள் முஸ்லிம்களுடைய bazaar உள்ளடக்கப்பட்டிருக்கின்றது, வயற்காணிகள் உள்ளடக்கப்பட்டிருக்கின்றன, கிராமங்கள் உள்ளடக்கப் பட்டிருக்கின்றன என்பதை பாராளுமன்ற உறுப்பினர் கோடீஸ்வரன் அவர்களே ஏற்றுக்கொண்டார். எனவே, அவற்றினை நீங்கள் திரும்பப் பெற்றுக்கொள்ளுங்கள் என்று கூறப்பட்டது. அப்பொழுது ஓர் உடன்பாடு வந்தது. அப்படியென்றால் எல்லை நிர்ணய ஆணைக்குழு நியமிக்கப்பட்டு, அதனூடாக இந்த விடயத்தைத் தீர்த்து வைப்போம் என்று அதற்கான committee அமைக்கப்பட்டது. துரதிட்டவசமாக ஏப்ரல் 21ஆம் திகதி சஹ்ரான் மேற்கொண்ட தாக்குதலினால் நாட்டில் எந்தவித உத்தியோகபூர்வக் கடமைகளும் ஒன்றரை மாதங்களாக இடம்பெறவில்லை. இந்தச் சந்தர்ப்பத்தில் மூன்றாவது சக்தி வந்து இந்தப் பிரதேசச் செயலகம் பற்றிய செயற்பாட்டில் இவ்வாறான தூண்டுதலைச் செய்தது உண்மையில் மனவருத்தமாக உள்ளது. இதை நீங்கள் அனுமதிக்காதீர்கள்! உண்மையில் இப்பொழுதும் நாங்கள் பேச விரும்புகின்றோம். அதற்கு நாங்கள் தயாராக இருக்கின்றோம். இதனை உங்களுடை தலைவர் சம்பந்தன் ஐயாவிடம் கூறுங்கள்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය තව විනාඩියකින් අවසන් වෙනවා, ගරු මන්ත්‍රීතුමා.

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

நான் கல்முனையில் பிறந்து, கல்முனையில் தமிழ் மாணவர்கள் பெரும்பான்மையாக இருந்த ஒரு பாடசாலையில் கல்வி கற்றவன். கொழும்புப் பல்கலைக்கழகத்தில் தமிழ் நண்பர்களுடன் கல்வி கற்றிருக்கின்றேன். உண்மையில் இந்த விடயத்தில் நான் படுகின்ற அவஸ்தை எனக்குத்தான் தெரியும். கௌரவ பாராளுமன்ற உறுப்பினர் சிறீதரன் அவர்களே, நான் தமிழ் மக்களுக்கு எதிராக நிற்கின்றேன் என்று நீங்கள் நினைக்கலாம்! ஆனால், அப்படியில்லை. உங்களுக்கு ஞாபகமிருக்கும், ஒரு வருடத்துக்கு முன்பு நடந்த ஒரு சம்பவம். அதாவது, சாய்ந்தமருது எங்களுடைய கல்முனைத் தொகுதியிலுள்ள ஒரு பிரதேசம்தான். அன்று அங்கு இதைவிட மிக உக்கிரமான நகர சபைப் போராட்டம் ஆரம்பித்தது. ஆனால், அதைப் பேசித் தீர்க்கவேண்டுமென்று அந்தப் போராட்டத்துக்கும் நாங்கள் இடம்கொடுத்துப் போகவில்லை. "பேசித்தான் தீர்க்கமுடியும்; இப்பொழுது தரமுடியாது" என்று நின்றோம். அப்படி நாம் ஏன் கூறினோம் என்றால், கல்முனையிலுள்ள எல்லாப் பிரச்சினைகளையும் பேசித் தீர்க்க வேண்டும் என்பதனாலாகும். அங்கு தமிழ் மக்களுடைய அதேபோன்று சாய்ந்தமருது மக்களுடைய, கல்முனை முஸ்லிம் மக்களுடைய, மருதமுனை மக்களுடைய, நற்பிட்டிமுனை மக்களுடைய பிரச்சினை எல்லாம் பேசித்தான் தீர்க்கப்பட வேண்டும். அங்கு இவ்வாறு பல கிராமங்கள் இருக்கின்றன. அவற்றின் பிரச்சினைகள் எல்லாவற்றையும் பற்றிப் பேசி, அவற்றுக்கு நிரந்தரத் தீர்வு காண வேண்டும்.

கடந்த காலத்தில் - 1897ஆம் ஆண்டு கல்முனையில் 4 நிர்வாக வலயங்கள் இருந்திருக்கின்றன; 4 உள்ளூராட்சிச் சபைகள் இருந்திருக்கின்றன. அந்த எல்லைகளில் விட்டுக்கொடுப்புச் செய்வதற்கு முஸ்லிம் சமூகம் தயாராக இருக்கின்றது. எனவே, அந்த அடிப்படையை வைத்து நாங்கள் பேசுவோம். கௌரவ தமிழ்த் தேசியக் கூட்டமைப்புப் பாராளுமன்ற உறுப்பினர்கள் இதற்கான ஒரு முயற்சியைச் செய்யவேண்டும். ஏனென்றால், இதுவொரு முக்கியமான தருணம்! ஒரு ஜனாதிபதித் தேர்தலை எதிர்நோக்குகின்ற இந்தச் சந்தர்ப்பத்தில் மிகப் பொறுப்புடன் இந்த இரு சமூகங்களும் செயற்பட வேண்டுமென்று நான் இந்த இடத்தில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

අවසාන වශයෙන් මම ගරු මේ සභාවට කියන්න කැමැතියි, කල්මුණේ මේ ප්‍රශ්නය පිළිබඳව දැන් අපේ අගමැතිතුමා කමිටුවක් පත් කරලා තිබෙන බව. ඒ කමිටුව හරහා මේ ප්‍රශ්නයට විසඳුමක් සොයන්න ඕනෑ. ඊට වඩා පිටින් ගිහිල්ලා දැන් වෙන වෙන අය උත්සාහ කරනවා, මේ ප්‍රශ්නය ඔවුන් අතට අරගෙන කල්මුණේ ජීවත් වෙන මුස්ලිම්, දෙමළ, බෞද්ධ, කතෝලික ජනතාව අතර ප්‍රශ්න ඇති කරන්න ඕනෑ, මේ රට විනාශ කරන්න ඕනෑ කියලා. ඒකට ඉඩ දෙන්න බැහැ. ඒ නිසා කරුණාකරලා මේ රටේ ඉන්න ජනාධිපතිතුමා, අගමැතිතුමා, සම්පන්දන් මැතිතුමා, අපේ රවුෆ් හකීම් මැතිතුමා ඇතුළු සියලුදෙනාම මැදිහත් වෙලා මේ ප්‍රශ්නයට විසඳුමක් දෙන්න කියලා අවසාන වශයෙන් ඉල්ලීමක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඊළඟට, ගරු සුසන්ත පුංචිනිලමේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා.5.53]

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද හදිසි නීතිය දීර්ඝ කරන දවස. විශේෂයෙන්ම අපේ ආරක්ෂක රාජ්‍ය ඇමතිතුමා මේ ගරු සභාවේ සිටින නිසා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ජීවත් වන පුරවැසියකු හැටියටත්, ඡන්දදායකයනු හැටියටත් මම එතුමාට මේ කාරණය මතක් කර දෙන්න ඕනෑ. ඒ තමයි, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ජනතාවට ත්‍රිකුණාමලය වරාය පිළිබඳව ඇති වෙලා තිබෙන බලවත් සැකය. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තිබෙන ප්‍රධානම වරාය තමයි ත්‍රිකුණාමලය වරාය. ඕනෑම ගැඹුරු නැවක් එතැනට ගෙනෙන්න පුළුවන්. ඕනෑම නැවක් ගෙනැල්ලා ඒ පරිශ්‍රය තුළ කාටවත් නොපෙනෙන විධියට හංගන්න පුළුවන් විශේෂිත වූ වරායක් ඒක. ඒ වරාය ආශ්‍රිත ත්‍රිකුණාමලය භූමි ප්‍රදේශය ඇමෙරිකානු හමුදා කඳවුරකට -නාවික හෝ යුද කඳවුරකට- දෙන්නට යනවා කියලා ඒ ප්‍රදේශයේ ජනතාව තුළ විශාල භයක් ඇති වෙලා තිබෙනවා. ඔබතුමා මේ ගරු සභාවේ සිටින නිසා මා පැහැදිලිවම දැන ගන්න ඕනෑ, මේ ප්‍රදේශය එවැනි කටයුත්තකට දෙනවා ද, නැද්ද කියන එක විතරයි. විශේෂයෙන්ම 2018 අගෝස්තු මාසයේ 25වැනි දින අපේ රටට ඇමෙරිකානු Seventh Fleet එකේ නැවක් ආවා. දැන් මා ළඟ ඒ නැවේ පින්තූරය තිබෙනවා. මේක තමයි ඒ නැවේ පින්තූරය. මේක තමයි නැවේ commission කරපු, berth කරපු ලේබලය. මේක තමයි නැවේ ඉඳලා ගොඩබිම බලද්දී Elephant Island ආදී තැන් පෙනෙන පින්තූරය. මේක තමයි මේ නැවේ තිබුණු hovercraftවලින් එකක්. මේකට ගොඩබිමත් ගමන් කරන්න පුළුවන්. මේකේ තිබෙන විශේෂත්වය තමයි ඒකට රෝදත් තිබෙනවා. මේකට ගොඩබිමේදී රෝදවලින් යන්න පුළුවන්. මා ළඟ තිබෙන මේ පින්තූරයේ තිබෙන්නේ ඒ නැවේ නතර කර තිබෙන ලෝකයේ නවීනතම හෙලිකොප්ටර් යානා. මේ නැව ඇතුළේ තිබෙනවා ඊටත් වඩා GPS තාක්ෂණයෙන් මුහුද යට, ගොඩබිම ඕනෑම තැනක් scan කර ගන්න පුළුවන් විශේෂිත වූ හෙලිකොප්ටර් එකක්. මේ නැවේ, තව තැනෙක දෙයක් තිබෙනවා. මේ තිබෙන සියලුදේවල් අපේ ගුවන් හමුදාවේ නිලධාරින් ඇමෙරිකාවේ ගියාම දැකලා ඇති. ඒ විශේෂිත වූ හෙලිකොප්ටර් යානාවලින් හුඟක් දේවල් කරන්න පුළුවන්. ඒ අතර Hummer වර්ගයේ යුද වාහන කිහිපයක් තිබෙනවා. මේ ගොල්ලන් මේවා පාවිච්චි කරලා මේ ගොල්ලන්ට අවශ්‍ය කරන භූමි ප්‍රමාණය, අපේ ත්‍රිකුණාමල අවට මුහුදේ තිබෙන සම්පත් මොනවාද කියන එක නිරීක්ෂණය කරලා තිබෙනවා.

ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අද දවසේ වරාය බලන්න ගිහිල්ලා තිබෙනවා. මොකට ගියාද කියලා දන්නේ නැහැ. ඉතින් ඒ සැකය තවත් වැඩි වෙනවා. මේ වරාය ඇමෙරිකාවට දෙන්නම තමයි යන්නේ කියන එක තමයි ඒ ජනතාවගේ හදවත් තුළ තියෙන්නේ. මතක තියා ගන්න, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය ගත්තාම සියයට 77ක් දමිළ සහ මුස්ලිම් ජනතාවයි ඉන්නේ. සියයට 23යි සිංහල ජනතාව ඉන්නේ. ලංකාවේ දිස්ත්‍රික්ක අතරින් සියයට 51ක වනගහනයක් තියෙන්නේ ත්‍රිකුණාමලයේ පමණයි. අනිත් භූමි ප්‍රමාණයේ තමයි මිනිස්සු ඉන්නේ. අවුරුදු තිහක යුද්ධයකට මැදිවෙලා හිටපු ජනතාවක් තමයි ඒ ප්‍රදේශයේ ඉන්නේ. සිංහල, දෙමළ, මුස්ලිම් කියන සියලුදෙනාම සිටින ඒ ප්‍රදේශය මීට අවුරුදු 10කට ඉස්සෙල්ලා මහින්ද රාජපක්ෂ මහත්තයා, ගෝඨාභය රාජපක්ෂ මහත්තයා, බැසිල් රාජපක්ෂ මහත්තයා ඇතුළු අපේ ආණ්ඩුවෙන් නිදහස් කරගෙන සංවර්ධනය කළා. හැබැයි, ඒ මිනිසුන්ට ගෙදර ඉන්න තිබුණු නිදහස, නිදහසේ මහපාරේ ගමන් කරන්න තිබුණු නිදහස අද අවහිර වෙලා තිබෙනවා. අද මූතූර්, තෝප්පූර්වල ඉන්න මනුස්සයා කොළඹට එනකොට තුන්පොළක බහින්න සිද්ධ වෙනවා, පරීක්ෂාවට. පුල්මුඩේ මනුස්සයා කොළඹ එනකොට හතර පොළක බහින්න ඕනෑ. ත්‍රිකුණාමලයෙන් කොළඹට එන මිනිස්සු තවත් දෙපළක, තුන්පළක බහින්න ඕනෑ. ඒ නිසා අද ඒ මිනිස්සු සම්පූර්ණයෙන් පීඩාවට පත්වෙලා. ඒ වාගේම අද වෙනකොට එළියේ ඉන්න බැරි තරමට ඒ පළාතේ උෂ්ණත්වයත් ඉතා අධිකයි.

මිනිසුන් මේ වාගේ පීඩාවට පත් වුණේ 21 වෙනි දා කවුරු හෝ වේවා කළ ඒ සිද්ධියෙන් පසුවයි. මේ රජයේ ආරක්ෂක අංශ භාර, පොලීසිය භාර ඇමතිවරයා වුණේ ජනාධිපතිවරයා. එහි ප්‍රතිඵල හැටියට තමයි ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය ඇතුළු අනික් දිස්ත්‍රික්කවල සිටින ජනතාව මේ විධියට අද දුක් විඳින්නේ. මේ තත්ත්වය ඉක්මනින් නැති කරන බවට ආණ්ඩුව සහතිකයක් දෙන්න ඕනෑ. ඒ මිනිස්සු අවුරුදු ගණනාවක් දුක් වින්දා. ඒ වාගේම අවුරුදු ගණනක් තිස්සේ විඳපු ඒ නිදහස අපි ආපසු ලබා දෙන්න ඕනෑ. මේවා ඉටු කිරීම තමයි රජයක වගකීම.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ආරක්ෂක රාජ්‍ය ඇමතිතුමා හැටියට දන්නවා, වැලිසර ගැමුණු නාවික හමුදා කඳවුර ගැන. ඒකට කියන්නේ මැගසින් එක කියලා. එතැන Army එකේ වෙඩි බෙහෙත් ගබඩාව තියෙනවා; CEFAP Unit එක තියෙනවා; වෙඩි පිටිය තියෙනවා. මේ කඳවුර භාරව තියෙන්නේ MOD එකට. මේ කඳවුරේ ඉන්නේ රියර් අද්මිරාල් නානායක්කාර කියන විශ්‍රාමික නාවික හමුදා නිලධාරියෙක්. මේ කඳවුර තුළ නිලධාරින් 4,000ක් 5,000ක් විතර ඉන්නවා. ඒ වාගේම පාර අයිනේ petrol shed එකක් තියෙනවා, ඒක අයිති නාවික හමුදාවට. එයට ආරක්ෂාව දෙන්නේ නාවික හමුදාව සහ යුද හමුදාව විසින්. මෙහි හිටපු බුද්ධි නිලධාරින් 14 දෙනා 21 වෙනි දා සිද්ධියට මාස තුනකට පෙර සම්පූර්ණයෙන් ඉවත් කරලා තිබෙනවා. ඊට කිලෝමීටර හතරකට එහායින් check කරනකොට තමයි පල්ලියක් ළඟ තිබිලා බයිසිකලයක් හමු වුණේ. නමුත් බෝම්බ අහුවුණේ නැහැ. බයිසිකලය හම්බ වුණා. සැකකරු කුරුණෑගල ප්‍රදේශයෙන්ද කොහේද හමු වුණා. මේ 21 සිද්ධියෙන් පස්සේ නැවතත් බුද්ධි නිලධාරින් 4 දෙනෙක් එවා තිබෙනවා. ඔබතුමා සමහර විට මේ කාරණය දන්නවාත් ඇති; නොදන්නවාත් ඇති. හැබැයි, රාජ්‍ය ඇමති හැටියට ඔබතුමා නොදන්නවා කියන්නත් බැහැ. මෙහි යම් පිපිරීමක් සිදු වුණා නම්, මට ලැබුණු තොරතුරුවලට අනුව, කිලෝමීටර් 25ක ප්‍රමාණයක් සම්පූර්ණයෙන්ම විනාශයට පත් වෙනවා. ඉතින් මේ වාගේ වගකිව යුතු තැනක ඉන්න ඕනෑ බුද්ධි නිලධාරින්ගේ ප්‍රමාණය නැත්තටම නැති කරලා, 21 වෙනි දා ප්‍රහාරයෙන් පසුව නැවතත් බුද්ධි නිලධාරින් 4 දෙනෙක් පමණක් දමා තිබීමෙන් ජාතික ආරක්ෂාව පිළිබඳව එතරම් තැකීමක් දක්වන්නේ නැත කියන කාරණය පිළිබඳව සැකයක් මතු වෙනවා. ඒ බෝම්බය පිපිරුවා නම්, විශාල විනාශයක් සිදු වනවා. කිලෝ මීටර් 25ක් විනාශ වෙනවාය කිව්වාම, power එක වැඩියි. සමහර විට මේ ප්‍රදේශයටත් බලපාන්න තිබුණා. ත්‍රස්තවාදීන් ඒක දැනගෙන සිටියා නම් මොකක් වෙයිද? මේවා තමයි අපි සැලකිල්ලට ගන්න ඕනෑ කාරණා.

දැන් අපේ ගරු මන්ත්‍රීතුමෙක් කිව්වා, විශේෂ කාරක සභාව ගැන. විශේෂ කාරක සභාවක් ඇති කරපු එක හොඳයි. ඒකෙන් සත්‍යය එළියට එනවා. විශේෂ කාරක සභාව පිළිබඳව වෙන විධියකට දකින්නත් පුළුවන්. ඒ අනුව විවේචන කරන්නත් පුළුවන්. අපි දකින දේ තමයි කියන්න ඕනෑ. මේ ආණ්ඩුව බලයට

ආවාට පස්සේ හිරේ දාපු පළමුවැනි පුද්ගලයා තමයි බැසිල් රාජපක්ෂ මහත්තයා. ඇයි, හිරේ දැම්මේ? සමෘද්ධිලාභීන්ට වැඩි පඩියක් දුන්නාට ; ප්‍රාදේශීය සභා සහ නගර සභාවලින් ඉල්ලපු බට දුන්නාට . මේ රටේ ඒ විධියට නඩු පවරන්න ගියොත්, අනාගතයේ ඔය පැත්තේ ඉන්න ඇමතිවරු කී දෙනෙකුට විරුද්ධව නඩු පවරන්න වෙයිද? කවුරු කළත් කරපු දේ වැරදි නම්, වැරදියි. ඒ නිසා මේ රජයෙන් මම ඉල්ලීමක් කරනවා. අපි මැතිවරණ පොරොන්දුවක් දෙනවා නම්, ඒක ඒ විධියට ඉටු කරන්න ඕනෑ. අපි ජනතාව වෙනුවෙන් හරි දේ කරන්න ඕනෑ. දැන් හදිසි නීතිය දීර්ඝ කරනවාට අපට විරුද්ධ වෙන්න බැහැ. නමුත් රජයෙන් අපට සහතිකයක් දෙන්න ඕනෑ, "ඒ පැවැති කලබලකාරී වාතාවරණය සම්පූර්ණයෙන්ම ඉවරයි" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ශිෂ්‍ය භට බලකායක එක්තරා කර්නල්වරයෙක් මගේ නෝනාගේ දුරකථනයට ඇමතුමක් දීලා කියනවා, "පාර්ලිමේන්තුව හරක් මඩුවක්" කියලා. මම ඒ පිළිබඳ තොරතුරු යුද හමුදාපතිට, ආරක්ෂක ලේකම්වරයාට සහ අදාළ අනෙකුත් ආයතනවලට යවා තිබෙනවා. කර්නල්වරයකු හැටියට ඔහුට එහෙම කථා කරලා කියන්න පුළුවන් තත්ත්වයක් මේ රටේ මීට පෙර තිබුණේ නැහැ. සමහර අය කියයි, මේ ප්‍රජාතන්ත්‍රවාදය කියලා. මොකද ඉස්සෙල්ලා කිව්වානේ "දැන් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාටත් බණින්න පුළුවන්" කියලා. විශේෂයෙන්ම මේ වාගේ සිදුවීම් ඇති වෙන්නේ ජනතාව තුළ විශ්වාසය නැති නිසා. දැන් පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුන් 225 ගැන කිව්වා. මේ 225දෙනා ගියාට තවත් 225දෙනෙක් එනවා නේ. ඒ නිසා අපි කථා කරද්දී, අපේ ගරුත්වය සහ අනන්‍යතාව රැකෙන විධියට කථා කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවසාන වශයෙන් මම විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා, මම ඉදිරිපත් කළ ලේඛන **හැන්සාඩගත*** කරන්න කියලා. මේ රටේ ජාතික ආරක්ෂාව පිළිබඳව, මේ රටේ මහ ජනතාව පිළිබඳව මීට වඩා වැඩි වගකීමකින් කටයුතු කරන්න කියලා, මේ රජයේ ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු ආණ්ඩුවෙන් ඉල්ලා සිටිමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා.6.04]

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියට ස්තුතිවන්ත වනවා.

හදිසි නීතිය තවත් මසකින් දීර්ඝ කර ගැනීම සම්මත කර ගැනීම සඳහා පැවැත්වෙන මේ විවාදයේදී කරුණු කීපයක් ප්‍රකාශ කරන්නට මා අදහස් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට පෙර කථා කළේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයෙන් ඡන්දය ඉල්ලා අද පොදුජන පෙරමුණේ මන්ත්‍රීවරයකු විධියට ඉන්න එක්සත් ජාතික පක්ෂයේ හිටපු ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයකු වන සුසන්ත පුංචිනිලමේ මැතිතුමායි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ගරු සභාවේ ඉන්න නිසා මම කියනවා, ඔබතුමා ප්‍රකාශ කළ සමහර කරුණු සාවද්‍ය බව. ඒ ගැන මම කනගාටු වනවා. ගරු අග්‍රාමාත්‍යතුමා 27 වැනි දා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ නිල සංචාරයක් කළේ වරාය බලන්න නොවෙයි. ඔබතුමා ඒ කරුණ කොහොම ඔප්පු කරනවාද කියලා මම දන්නේ නැහැ. එතුමා තඹලගමුව ප්‍රාදේශීය රෝහලේ අලුත් ගොඩනැඟිල්ල සඳහා මුල්ගල තැබීම, ස්වේච්ඡා ගුරුවරුන් විශාල පිරිසකට පත්වීම් ලබා දීම, අවතැන් වූ 600කට නිවාස හිමිකම් පත්‍ර ලබා දීම විතරක් නොවෙයි, කින්නියා - ඉලුප්පෛකුලම් මාර්ගය ජනතා අයිතියට පත් කිරීම වැනි සංවර්ධන ව්‍යාපෘති රැසක්- [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුසන්ත පුංචිනිලමේ මන්ත්‍රීතුමා.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
මම කිව්වේ නැහැ, අගමැතිතුමා වරාය විකුණන්න බලාගෙන ත්‍රිකුණාමලයට ගියා කියලා. ජනතාව එහෙම හිතනවා කියලායි මම කිව්වේ. එතුමාට පුළුවන් ඒක නිවැරදි කරන්න. "ගියේ ඒකටද" කියලායි මම ඇහුවේ. විකුණන්න ගියා කියලා මම කිව්වේ නැහැ.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
එහෙම ප්‍රකාශ කරන්න එපා. ඔබතුමා පින්තූර පෙන්වලා අගමැතිතුමා ත්‍රිකුණාමල වරාය විකුණන්න කටයුතු කරනවා කිව්වාම, ඊට පස්සේ එතුමා ත්‍රිකුණාමලයට ගියාම,- [බාධා කිරීමක්] හරි. වෙන්න පුළුවන්. නමුත්, ගරු සුසන්ත පුංචිනිලමේ මන්ත්‍රීතුමනි, ඔබතුමා මට වඩා ජ්‍යෙෂ්ඨයෙක්. එක්සත් ජාතික පක්ෂයේ ඉන්නකොට එතුමා තමුන්නාන්සේගේත් නායකයා. තමුන්නාන්සේ කාලයක් නියෝජ්‍ය ඇමතිවරයකු හැටියට, ඇමතිවරයකු හැටියට හිටපු කෙනෙක්. ඔබතුමා වෙන පක්ෂයකට ගිහිල්ලා අපේ නායකයාට සාවද්‍ය විධියට යම් යම් චෝදනා කිරීම ගැන මම කනගාටු වෙනවා. ඒ වාගේ බාල තත්ත්වයට පත් වෙන්න එපා. මේ ආණ්ඩුව මෙච්චර කාලයක් විකුණපු ඒවා මොනවාද කියලා කියන්නකෝ. මේ ආණ්ඩුව බලයට ඇවිල්ලා දැන් අවුරුදු හතරහමාරක් වෙනවා. මට කියන්න, විකුණපු දේවල් මොනවාද කියලා? ඔබතුමන්ලාගේ ආණ්ඩුව විකුණපු දේවල් ගැන කියන්න මට ඕනෑ තරම් කාරණා තිබෙනවා. ලජ්ජා නැතුව ඔබතුමන්ලා අද මෙහෙම කථා කරනවා. ඔබතුමන්ලා වරාය ගැන කථා කළා. Tri-forces මූලස්ථානය තිබුණු ඉඩම ෂැංග්‍රි-ලා හෝටලයට විකුණුවේ කවුද? හදවත වාගේ තිබුණු ගාලු මුවදොර ඉඩම බණ්ඩාරනායක පිළිමයත් එක්ක තමුන්නාන්සේලා විකුණලා තිබෙනවා. ලජ්ජයි. අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමූලඝාතනය කරලා ලජ්ජා නැතුව බණ්ඩාරනායක පිළිමයත් එක්ක ෂැංග්‍රි-ලා එකට විකුණලා තිබෙනවා. ෂැංග්‍රි-ලා හෝටලයෙන් බහිනකොට, නැත්නම් එතැනින් යන වෙලාවට සංචාරකයන් අහනවාලු, මේ ඉන්නේ චීනයේ හිටපු නායකයෙක්ද කියලා. ඒ තරම් ලජ්ජා නැති වැඩ කරපු ආණ්ඩුවක් එදා තිබුණේ. අද ලජ්ජා නැතුව මේවා කථා කරනවා. ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා මෙතැන නැහැ. ඒ වාගේම මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා තල් අත්තට බොරළු ගහනවා වාගේ කථා කරගෙන ගියා. තවමත් කථා කරන්නේ මාවනැල්ල ගැන. මාවනැල්ල සිද්ධියට සම්බන්ධ එක්කෙනෙක්වත් දැන් එළියේ නැහැ. බුදු පිළිම කඩපු ඒ ඔක්කෝම අය අත් අඩංගුවේ ඉන්නේ. මේ වෙනකොට 108දෙනෙක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. මේ වෙනකොට ඒ අයට විරුද්ධව නඩු පවරන්න අවශ්‍ය කටයුතු කරලා තිබෙන්නේ. ඒවා තව කාටවත් කරන්න තියන්නේ නැහැ. සති 6ක් තුළ ගරු අග්‍රාමාත්‍යතුමාගේ නායකත්වයෙන් මාවනැල්ලේ තත්ත්වය සම්පූර්ණයෙන්ම ස්ථාවර කරන්න පුළුවන්කම ලැබුණා. ජනාධිපතිතුමාත් ඒකට සහයෝගය දුන්නා. ජනාධිපතිතුමා හිටියත් නැතත්, එදා සිද්ධිය වුණු වෙලාවේ ඉඳලා,-

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
කලබල වෙන්න එපා. ඔබතුමා point of Order එකක් ගෙනෙනවා නම් කියන්න. මට බාධා කරන්න එපා. ඔබතුමා හිටපු ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක්නේ.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
නැහැ, නැහැ. මම බාධා කරන්නේ නැහැ. මට පොඩි පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි.

මම ඔබතුමාගෙන් අහන්නේ මේකයි. පහුවෙලා අත්අඩංගුවට ගත්ත එක ඇත්ත. මුලදී ඒ තත්ත්වය වළක්වා ගන්න බැරි වුණේ ඇයි කියලා පොඩ්ඩක් කියන්න බැරිද?

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
වළක්වාගන්න බැරි වුණු කාරණා කිව්වොත්, කාගේ කාගේත් කිල්ලෝටවල තිබෙන හුණු ගැන කියන්න වෙනවා. ඒක මතක තබා ගන්න. මේවාට විපක්ෂයත් වග කියන්න ඕනෑ. [බාධා කිරීම්] ඇයි, මහින්ද රාජපක්ෂ මැතිතුමා කියනවානේ එතුමාගේ ආරක්ෂකයින්ටත් ඒ තොරතුරු ලැබුණා කියලා. අපේ ආරක්ෂකයන්ට නම් ඒ ආරංචිය ලැබිලා නැහැ. ශිරන්ති රාජපක්ෂ මැතිනිය එදා කොච්චිකඩේ පල්ලියට ගියේ නැහැ. මම දන්නේ නැහැ, ඒකට හේතුව මොකක්ද කියලා. කලින් දැනගෙන තිබුණා නම්, මේ රටේ මොන මිනිහාද නොකියන්නේ? [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කරුණාකරලා මට බාධා කරන්න එපා කියන්න. ඔබතුමිය මට වේලාව දෙන්න, මෙතුමන්ලාට උත්තර දෙන්න. පට්ටපල් බොරු කියනකොට අපටත් අමාරුවක් තිබෙනවා. ඒකයි අපි කථා කරන්නේ. අපි මේ කටයුතු වෙන කාටවත් කරන්න තියන්නේ නැහැ. මම රුවන් විජේවර්ධන මැතිතුමාගේ ළඟට ගිහිල්ලා කථා කළා. මාත් අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය අධීක්ෂණය කරන - monitor කරන- පුංචි මන්ත්‍රීවරයෙක්. මෙන්න මේ වාගේ ඒවාට තමයි අපි ත්‍රිපුද්ගල මහාධිකරණය ගෙනාවේ. මේ ආණ්ඩුවේ ඉදිරි කාලය තුළ -ආණ්ඩුවේ කාලය අවසන් වෙන්න කලින්- ත්‍රිපුද්ගල අධිකරණයට ගෙන්වලා ඒ අයගේ නඩු දිනපතා අහනවා. සහරාන්ගේ කණ්ඩායමේ තවත් කට්ටිය ඉතුරු වෙලා ඉන්නවා නම්, -කිහිප දෙනෙක් ඝාතනයට ලක් වුණා, කිහිප දෙනෙක් බෝම්බ ප්‍රහාරවලට අහුවෙලා මැරුණා- ඒ අය ගෙනැල්ලා දිනපතා නඩු අහලා ඉදිරි මාස කිහිපය තුළ ඔවුන්ට දෙන්න පුළුවන් ඉහළම දඬුවම දෙන්න අපි පසු බට වෙන්නේ නැහැයි කියන පණිවුඩය අපි ලබා දෙනවා. අපි ඒ වැඩ අත ගැවේ නැහැ.

බලන්න, එදා සංචාරක ව්‍යාපාරයට මරු පහරක් වැදුණා. තමුන්නාන්සේලා ඉඩම් දීලා හදපු ෂැංග්‍රි-හෝටලයේ බෝම්බ පිපිරුණා. ඒ වාගේම කිංග්ස්බරි හෝටලයේ, සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ බෝම්බ පිපිරුණා. තව පොඩ්ඩෙන් ටාජ් සමුද්‍රා හෝටලයේත් බෝම්බයක් පිපිරෙනවා. හැබැයි මම සතුටු වෙනවා, අද වන විට ඒ සියලු හෝටල්වල එදිනෙදා කටයුතු ක්‍රියාත්මක කිරීම ගැන. අපි-තමුන්නාන්සේලා දන්නවා, මේ වන විට ලෝකයේ විවිධ රටවල්, විශේෂයෙන්ම චීනය, ඉන්දියාව, නවසීලන්තය, ඒ වාගේම වෙනත් රටවල්, ඒ එක්කම ඊයේ වන විට ඇමෙරිකා එක්සත් ජනපදය කියා තිබෙනවා, ලංකාව අනාරක්ෂිත නැති, සංචාරය සඳහා ඉතාම හොඳ රටක් බවට පත් වෙමින් තිබෙනවා කියලා. හෙට අනිද්දා වෙනකොට ජර්මන් ෆෙඩරල් ජනරජය පවා ඒ විධියට කියාවි.

මේ විධියට මේ අයට ඒවා කරන්න පුළුවන් වුණාද? මේ අයට මේවා කරන්න බැරි වුණා, අවුරුදු ගණනාවක් තිස්සේ බලයේ ඉඳලාත්. එදා අප මත්ස්‍ය තහනමට ලක් වුණා; GSP Plus සහනය අපට නැති වුණා. මේ රටේ මහින්ද රාජපක්ෂ මැතිතුමා විදුලි පුටුවේ තියනවා කියලා කතා කරපු ලෝකයේ රටවල් ශ්‍රී ලංකාව "කළු තිතක්" කියා හැඳින්වූවා. නමුත්, අපි බලයට ඇවිල්ලා අවුරුද්දක් එකහමාරක් ඇතුළත කීර්ති නාමයක් ඇති ලෝකයේ රටවල් පිළිගන්නා තත්ත්වයට අපේ රට පත් වුණා. අපට තිබෙනවා එවැනි පුළුවන්කමක්. එක්සත් ජාතික පක්ෂයේ නායකයන්ට, පෙරමුණේ නායකයන්ට තිබෙනවා, ඒ වාගේ ගැම්මක්. මේ රට සංවර්ධනය කරන්න විශාල කැප කිරීමක් කරපු පියවරුන්ගේ පුතුන් තමයි එක්සත් ජාතික පක්ෂයේ ඉන්නේ. ඒ නිසා අපට මේ රට සංවර්ධනය කරන්න හයියක්, කොන්දක්, වැඩ පිළිවෙළක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද මෙතුමන්ලා කතා කරනවා, මේ රටේ ආර්ථිකය ගැන. චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ කාලය තුළ සෘණ ආර්ථිකයක් තිබුණේ. 2001 වර්ෂයේ ගරු අගමැතිතුමා බලයට එන කොට රටේ සෘණ ආර්ථිකයක් තිබුණේ. අද විපක්ෂයේ සිටින මන්ත්‍රීවරුන් ඇමතිවරුන් හැටියට ඒ කාලයේ සිටියා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අවසන් කරලා ඒ අය අද පොහොට්ටුව ලකුණ පක්ෂයට -ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට- ගිහිල්ලා. ඒ ගැන හරිම කනගාටුයි. හෙට අනිද්දා වන කොට පොදු පෙරමුණේ නායකයන් වන්න ඉන්න මිනිසුන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියන මිනී පෙට්ටියට යකඩ ඇණ ගහලා වසා දමලා ඇවිත් තමයි අද ලජ්ජා නැතිව කතා කරන්නේ. මේ රටේ තිබුණ ඒ උත්තරීතර පක්ෂය නැති කරලා ඒ තුළින් මේ රට තවදුරටත් අගාධයට ඇද දමන්න එතුමන්ලා බලනවා. නමුත්, වෙනත් රටවල් දිහා බලන්න. අපි දන්නවා, දෙවන ලෝක යුද්ධය වෙලාවේ බෝම්බ පිපිරුණාම එංගලන්තයේ අගමැතිවරයාට-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන් වෙනවා.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
සමා වෙන්න. තවත් විනාඩියක කාලයක් දෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමාගේ-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒ කාලයත් දුන්නා.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ඒ කාලයත් දුන්නාද? එහෙම නම් මට තවත් මිනිත්තුවක් දෙන්න, කතාව අවසන් කරන්න. මා ඔබතුමියගෙන් කාරුණිකව ඒ ඉල්ලීම කරනවා. එදා එංගලන්තයේ පාර්ලිමේන්තුව වෙනත් තැනකට - Church House එකට - ගෙන ගිහිල්ලා පාර්ලිමේන්තු

රැස්වීම් පවත්වන කොට විපක්ෂයේ අයත් අත ඔසවා සහයෝගය දුන්නා. නමුත්, අද අපේ රටේ විපක්ෂය බලාගෙන ඉන්නේ මොකටද? මේ ආණ්ඩුව කොයි වෙලාවේ ද ගෙදර යවන්නේ කියන එක ගැනයි බලාගෙන ඉන්නේ. ඒ සඳහා නොයෙක් උප්පරවැට්ටි යෙදුවා; ලේක්හවුස් වට රවුමට ආවා. ඒ අය කිව්වේ, "අපි දවස් දෙකක් ඉඳලා හෝ රනිල් වික්‍රමසිංහ ගෙදර යවන්න, ආණ්ඩුව ගෙදර යවන්න කටයුතු කරනවා" කියලායි. නමුත් බැරි වුණා. කරපු නොයෙක් දේවලින් ඒක කරන්න බැරි වුණා. අවසානයේදී ISIS කාරයන් එල්ල කරපු බෝම්බ ප්‍රහාරය අල්ලාගෙන, ඒකේ එල්ලිලා, ඒකෙන් ආණ්ඩුව ගන්න හදනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කතාව අවසන් කරන්න.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ලේ තවරා, මළ කඳන් උඩින්, මිනී පෙට්ටි උඩින් ආණ්ඩු ගන්න ලැහැස්ති වෙනවා නම් එක්සත් ජාතික පක්ෂය හැටියට අපි ඒ සඳහා මුහුණ දෙන්න සූදානම් කියන පණිවුඩය ලබා දෙමින්, එයත් මතක තියා ගන්න කියලා ප්‍රකාශ කරමින් අද දවසේ තවත් මසකින් දීර්ඝ කරන හදිසි නීතිය ඊළඟ මාසය වන කොට ඉවත් කරන්න පුළුවන් තත්ත්වයක් මේ රටේ නිර්මාණය කරන්න ගරු රුවන් විජේවර්ධන මැතිතුමාට, ගරු අගමැතිතුමාට පුළුවන්කමක් ලැබේවි කියා විශ්වාස කරමින්, ඒ සඳහා ආශිර්වාද කරමින් මගේ කතාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා.6.14]

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳ යෝජනාව විවාදයට අරගෙන ඡන්දය විමසන අවස්ථාවේදීවත් අගමැතිතුමා මේ සභාවට ඒවි කියා අපි බලාපොරොත්තු වෙනවා. මොකද, රටේ අගමැතිවරයා හැටියට එතුමාගේ වගකීමක්, මේ යෝජනාවට පක්ෂව ඡන්දය දෙන එක. හැබැයි, අපට දැනගන්න ලැබී තිබෙන්නේ මේ විවාදය 27වන දාට යොදා ගත්තාට පසුව එතුමා සංචාරයක් යොදාගෙන ඇති බවයි. එතුමා මොනවා හෝ විවෘත කරන්න යනවා ලු; ඇමෙරිකානු යුද නැව බලන්න යනවා ලු; ත්‍රිකුණාමලය වරාය බලන්න යනවා ලු. ඒවා බලන්න යනවාට වඩා එතුමාට කරන්න තිබුණේ අද මේ යෝජනාවට ඡන්දය දෙන්න එන එකයි. ආණ්ඩු පක්ෂයේ කණ්ඩායම වත් සිතුවේ නැහැ අද මේ රැස්වීම පවත්වාගෙන යන්න පුළුවන් වේවි කියලා. අප නොහිටින්න අද මේ යෝජනාව සම්මත කරගන්න වෙන්නේත් නැහැ.

කැඩුණු පාරක් හදලා විවෘත කරනවා වාගේ 1976 වර්ෂයෙන් පස්සේ තව සති දෙකකින් විතර මේ රටේ එල්ලුම් ගහ ක්‍රියාත්මක වෙනවා. මම හිතනවා, බන්ධනාගාර අමාත්‍යාංශයේ පුංචි අධීක්ෂණ මන්ත්‍රීතුමා එය විවෘත කරන්න යාවි කියලා, අර මොකක්ද එක - lever එක- පහත් කරන්න වත් යාවි කියලා. අවුරුදු 46කට විතර පසුව නේ ඒක කරන්නේ.

මේ රටේ ඒ ත්‍රස්තවාදි ප්‍රහාරය වැළැක්වීම අපට කරන්න තිබුණු වැඩක් කියලා දැන් කියනවා. මේ දවස්වල ඒ තත්ත්වය පාලනය කළාම කියනවා, "ඒක අගමැතිතුමායි කළේ" කියලා. ගහන කොට කියනවා, වගකීම තවත් කෙනෙකුගේයි කියලා. හැබැයි, ආණ්ඩුව කියන්නේ, ජනාධිපතිතුමා, අගමැතිතුමා, ඇමති මණ්ඩලය සහ තමුන්නාන්සේලා කියන ඔක්කෝමයි. ඒ වගකීම තමුන්නාන්සේලා බාර ගන්න ඕනෑ. එහෙම නොකර තමුන්නාන්සේලා මෙහි වගකීම හැම දාම එක් එක්කෙනාගේ පිට පටවනවා.

අද වන කොට වීසා නැතිව මේ රටේ 6,782ක් ඉන්නවාය කියනවා. වෙනත් රටක පිරිසක් වීසා නැතිව ඉන්නවා නම්-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please!

මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

*අනතුරුව ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) துஸிதா விஜேமான்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. (DR.) (MRS.) THUSITHA WIJEMANNA *left the Chair, and* THE HON. SPEAKER *took the Chair.*

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
ගරු කථානායකතුමනි, වෙනත් රටක පිරිසක් වීසා නැතිව අපේ රටේ ඉන්නවා නම් ඒ අය පිටුවහල් කරන එක මේ රජයේ වගකීම. ISIS සටන්කාමීන් ලෝකයේ ගොඩක් රටවල ඉන්න නිසා, මේ පිරිස අතරත් ඔවුන් ඉන්නවාද කියලා අපි දන්නවාද? ඒ නිසා අපි ඉල්ලා සිටිනවා, වීසා නැතිව ඉන්න පිරිස ඉක්මනින් පිටුවහල් කරන්න රජය මැදිහත් වෙන්න ඕනෑය කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තවත් විනාඩි තුනක් තිබෙනවා.

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

ඒ කාර්යය දැන් ඉක්මන් කරන්න ඕනෑ. දැන් ඒකට,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මට වැරදීමක් වුණා. ඔබතුමාට තව මිනිත්තුවක කාලයක් පමණයි තිබෙන්නේ. මට කනගාටුයි.

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
"දිවයින" පත්තරයේ පළ කරලා තිබෙනවා, "කොටි උපදේශිකා ඇඩෙලා බාලසිංහම් බ්‍රිතාන්‍යයේ සුවිසල් මැදුරක"

[ගරු ජානක වක්කුඹුර මහතා]

කියලා. මේ අය ගෙන්වා ගන්න ආණ්ඩුව කිසිම කටයුත්තක් කරන්නේ නැහැ. මේ හදිසි නීතිය උපයෝගි කරගෙන වැඩ වර්ජන වාගේ යම් යම් ඒවා මර්දනය කරන්න ආණ්ඩුව කටයුතු කරනවා. නමුත් ඒවාට වඩා මේ ප්‍රශ්නය විසඳන්න කටයුතු කරන්න ඕනෑ කියලා අපි කියනවා. හමුදාපතිතුමාම කියනවා, මේ ප්‍රශ්නය ඉක්මනින් විසඳන්න පුළුවන් දෙයක් නොවයි කියලා. ආණ්ඩුව කියනවා, මේ ප්‍රශ්නය විසඳනවාමයි කියලා. ආරක්ෂක අංශය කියන දේ පිළිගෙන ඒ කටයුතු ඉදිරියට කරන්න ඕනෑ නිසා තමයි අපි හදිසි නීතියට පක්ෂව ඡන්දය දෙන්නේ. එහෙම නැත්නම් විපක්ෂයේ අපි මේ හදිසි නීතිය ඉස්සරහට ගෙන යන්න තමුන්නාන්සේලාට ඡන්දය දෙන්නේ නැහැ. හැබැයි, මේකට මුවා වෙලා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
ගරු කථානායකතුමනි, මට තව විනාඩියක් දෙන්න.

අපේ මහනායක ස්වාමීන් වහන්සේට විරුද්ධව කරන ඒ කටයුත්ත ආණ්ඩුව මැදිහත් වෙලා හෝ නවත්වන්න ඕනෑ. හදිසි නීතියට මුවා වෙලා තමයි මේවා කරන්නේ. අස්ගිරි පාර්ශ්වයේ මහානායක හාමුදුරුවෝ ආණ්ඩුව විවේචනය කරපු නිසා තමයි මේ ප්‍රශ්නය ඇති වුණේ. අපි ආණ්ඩුවට කියනවා, මේ රටේ මහනායක හාමුදුරු කෙනෙක් කැඳවන එක නතර කරන්න ඕනෑ කියලා. ඕනෑම කෙනෙකුට තමන්ගේ අදහසක් ප්‍රකාශ කරන්න අයිතියක් තිබෙන්න ඕනෑ. ඒ අයිතියට ඉඩ දෙන්නය කියා ඉල්ලමින්, ගරු කථානායකතුමනි, ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු තුෂාර ඉඳුනිල් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා.6.18]

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
බොහොම ස්තුතියි ගරු කථානායකතුමනි.

හදිසි නීතිය දීර්ඝ කිරීම සඳහා සංවාදයක් යන මේ අවස්ථාවේදී කරපු කථා මම අහගෙන හිටියා. ඒවා බොහොම කැතයි. ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා කියනවා, අපේ අගමැතිතුමා ත්‍රිකුණාමලයේ ගියාලු, තල්මසුන් බලන්න ගියාලු, මෝරු බලන්න ගියාලු, නැව් බලන්න ගියාලු. එවැනි මහ බාල ගණයේ නුගත් කථාවක් කිරීම ගැන මම කනගාටුවට පත් වෙනවා. ඊට මෙහා පැත්තේ, රත්නපුරයේ රංජිත් සොයිසා කියලා මන්ත්‍රීතුමෙකුත් ඉන්නවා. රත්නපුරයේ ඒ දෙන්නාම මෙවැනි බාල ගණයේ කථා කීම පිළිබඳ මම කනගාටු වෙනවා. වැදගත් විවාදයක් තිබෙන වෙලාවේ,-

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
අගමැතිතුමා ගියා.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
අගමැතිතුමාට නැව් බලන්න යන්න වෙලාවක් නැහැ.

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
ගියා. ගිය නිසා නේ කියන්නේ.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
එහෙම ගියා නම්, ජනමාධ්‍යවලින් ඒවා වාර්තා කරයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කථාව කරගෙන යන්න.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු මන්ත්‍රීතුමා, බාල ගණයේ දෙකයි පණහේ සංවාදවලට එන්න එපා. මම හිතුවේ අඩුම තරමින් තමුන්නාන්සේ O/ Levelවත් පාස් පුද්ගලයකු හැටියටයි. මොනවාද, මේ කථා කරන්නේ?

දැන් කියනවා, ඇඩෙලා බාලසිංහම් එංගලන්තයේ ලොකු හෝටලයක ඉන්නවා ලු. මේ රජය ඒ ඇඩෙලා බාලසිංහම් ගෙන්වා ගන්නේ නැති ලු. ඇඩෙලා බාලසිංහම් ගෙන්වා ගන්න එක නොවෙයි කාරණය. අපි දැක්කා නේ කුමරන් පද්මනාදන් ගෙන්වා ගෙන ඔබතුමන්ලාගේ රජය කරපු නාඩගම්. දෙමළ ඩයස්පෝරාවේ සල්ලි ටික සුද්ද කර ගන්න කුමරන් පද්මනාදන් ගෙන්වා ගත්ත හැටි අපි දැක්කා. ඒ රත්තරන් ටිකට විදින්න කුමරන් පද්මනාදන් මෙහේට ගෙන්වලා මෙහේදී දුන්න රජ සැප අපි දැක්කානේ. කේපීලා ගෙන්වලා ඒ ගොල්ලන්ට රජසැප දුන්න තමුන්නාන්සේලා තමයි අපට චෝදනා කරන්නේ, "ඇඩෙලා බාලසිංහම් එහේ ඉන්නවා, ඇඩෙලා බාලසිංහම් මේ රටට ගෙන්වන්නේ නැහැ. ඒ නිසා අපි තරහයි" කියලා. ඒක තමයි මේ කියන්නේ. ඒ නිසා කරුණාකරලා තමන්ගේ කිල්ලෝටවල හුණු තියා ගෙන මෝඩ කථා කියන්න එපා කියන එක මම විශේෂයෙන් කියනවා. [බාධා කිරීමක්] ඔව්. ඔව්. කට පියාගෙන ඉන්න. වාඩි වෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ. කථාව අවසාන කරන්න.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ මේකයි. අනුන්ගේ පවු අපේ කරේ තියා ගෙන අපි බැණුම් අහනවා. දැන් විශේෂ කාරක සභාව පවත්වාගෙන යනවා. මේ විශේෂ කාරක සභාවට සාමාජිකයන් පත් කරන්නේ සිරිකොතෙන් කියලා සමහරු කියනවා. නැහැ.

විශේෂ කාරක සභාවක් අවශ්‍යයි කියන යෝජනාව ගෙනාවේ විපක්ෂයෙන්. ඒ අයගේ යෝජනාවක් අනුව තමයි පාර්ලිමේන්තු

ක්‍රියාදාමය තුළ දැන් මේ විශේෂ කාරක සභාව ක්‍රියාත්මක වෙන්නේ. පාර්ලිමේන්තුව වැදගත් සභාවක් පත් කරනකොට, කුඩැල්ලා මෙට්ටේ තියන්න බැහැ කිව්වා වාගේ මේ කුඩැල්ලෝ ඒ මෙට්ටෙට එන්නේ නැතිව, පැනලා පැත්තකට යනවා. මේ කුඩැල්ලන්ට ඒකට එන්න බැරි වුණාට අපට කරන්න දෙයක් නැහැ. ඒ විශේෂ කාරක සභාවට අපි විවිධ නිලධාරීන් ගෙන්වනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු කථානායකතුමනි, ඒ හරහා දවස ගණනේ, රෙදි ගැලව්ලා, අමුඩ කැඩිලා, අන්තිමට ඇඳගෙන ඉන්න ජංගියත් ගැළවෙනකොට මේ කුඩැල්ලන්ට ඉවසාගෙන ඉන්න බැහැ. ගැරඬින්ට භූමිතෙල් ගෑවා වාගේ. බැඳුම්කර සිද්ධියට අදාළව අර කම්වූ මේ කම්වූ දමලා, කොමිෂන් දමලා අපේ හිටපු ඇමතිවරු හා අගමැතිතුමා පවා ගෙන්වා ප්‍රශ්න කරන්න, විභාග කරන්න, මාධ්‍ය ඉදිරියේ නිරුත්තර කරන්න, මාධ්‍ය ඉදිරියේ රෙදි ගලවන්න තමුන්නාන්සේලාට හොඳයි. නමුත් මේ විශේෂ කාරක සභාවට අදාළ අය ගෙන්වලා ප්‍රශ්න කරනකොට නරකයි.

කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි ගරු කථානායකතුමනි.

[අ.භා.6.22]

**ගරු රුවන් විජේවර්ධන මහතා (ජනමාධ්‍ය කැබිනට් නොවන අමාත්‍යතුමා සහ ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ருவன் விஜயவர்தன - வெகுசன ஊடக அமைச்சரவை அந்தஸ்தற்ற அமைச்சர் மற்றும் பாதுகாப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Ruwan Wijewardene - Non Cabinet Minister of Mass Media and State Minister of Defence)
ගරු කථානායකතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ප්‍රථමයෙන්ම පාස්කු ඉරු දින ප්‍රහාරයෙන් ඝාතනයට ලක් වූ සහ තුවාල ලැබූ සියලුදෙනාට මගේ ශෝකය සහ කනගාටුව අනේක වාරයක් ප්‍රකාශ කරනවා. ඇත්තෙන්ම මම ඒ කනගාටුව ප්‍රකාශ කරන්නේ අමාත්‍යවරයකු හැටියටවත්, මහජන නියෝජිතයකු හැටියටවත් නොවෙයි. මේ රටේ පුරවැසියකු හැටියට තමයි මම ඒ කනගාටුව ප්‍රකාශය කරන්නේ. මොකද, ඒ වේදනාව අදටත් අපට දැනෙන නිසා.

ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ සියලුදෙනාත්, සමස්තයක් හැටියට මේ රටේ ජනතාවත් දන්නවා ඇයි අපි මේ හදිසි නීතිය ගෙනාවේ කියලා. පාස්කු ඉරු දින ප්‍රහාරයෙන් පස්සේ මේ රට ආපහු යථා තත්ත්වයට ගෙනෙන්නට ඉතා ඉක්මනින් හදිසි නීතිය ගෙනෙන්නට අපි රජය හැටියට තීරණයක් ගත්තා. ගරු කථානායකතුමනි, පාස්කු ඉරු දින ප්‍රහාරයට සම්බන්ධ වුණු සහරාන්ගේ කණ්ඩායමට සහාය දුන් අනෙක් සියලුදෙනාම අත්අඩංගුවට ගන්නට ත්‍රිවිධ හමුදාවත්, පොලීසියත්, විශේෂයෙන් ත්‍රස්ත විමර්ශන කණ්ඩායමත්, CID එකත් දායකත්වය දැක්වූවා. ඒ සියලු පරීක්ෂණ පැවැත්වූවේ CID එකෙන්. ඒ සියලුදෙනා එකතු වෙලා සුමාන දෙකක් යන්න කලින් සහරාන්ගේ කණ්ඩායමේ සියයට 80ක් විතර අත්අඩංගුවට ගත්තා. ඉන් පස්සේ, ඉතාම කෙටි කාලයක් තුළ අවශ්‍ය තොරතුරු ලබාගෙන ඒකට සම්බන්ධ වුණු අනෙක් අයත් අත්අඩංගුවට අරගෙන තිබෙනවා.

ගරු කථානායකතුමනි, අප්‍රේල් 21වැනි එක ප්‍රහාරයත් සමඟ හදිසි නීති රෙගුලාසි යටතේ අත්අඩංගුවට ගෙන රැඳවුම් නියෝග මත රඳවා ගනිමින් විමර්ශන කටයුතු කළ සැකකරුවන් සංඛ්‍යාව 28යි. එයින් සැකකරුවන් තුන්දෙනෙක් තවදුරටත් රඳවාගෙන තිබෙනවා. ඒ වාගේම, දැනට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් මේ ප්‍රහාරයට සම්බන්ධ කාන්තාවන් නවදෙනෙකු ඇතුළු සැකකරුවන් 105දෙනෙක්, 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ අත්අඩංගුවට ගෙන, රැඳවුම් නියෝග මත රඳවා ගනිමින් වැඩිදුර විමර්ශන කරගෙන යනවා.

ගරු කථානායකතුමනි, මේ විමර්ශන කරන්න අපේ ආරක්ෂක කණ්ඩායමට පිටරටිනුත් සහයෝගය ලැබුණා. මේ අවස්ථාවේ ඒ අයටත් ස්තුතිය පළ කරන්න ඕනෑ. මේ දවස්වල ඇමෙරිකා එක්සත් ජනපදය "බිල්ලෙක්" ලෙස පෙන්වමින් තිබෙන බව මම දන්නවා. නමුත් ඒ ගොල්ලන්ද අපට FBI team එකක් එවලා තිබුණා. ඒ වාගේම, එංගලන්තයෙන් ත්‍රස්ත විමර්ශන කටයුතු කරන පොලිස් නිලධාරීන් කණ්ඩායමක් එවලා තිබුණා; ජපානයෙන් එවලා තිබුණා. ඕස්ට්‍රේලියාවෙන් තවත් කණ්ඩායමක් ඇවිල්ලා හිටියා. ඒ වාගේම, United Arab Emiratesවලිනුත් කණ්ඩායමක් එවලා තිබුණා. ඒ සියලුදෙනා අපි කරන පරීක්ෂණවලට, විමර්ශනවලට සහයෝගය ලබා දුන්නා. මේ අවස්ථාවේ ඒ ගොල්ලන්ටත් අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, අපි දැන් මේ සහරාන්ගේ කණ්ඩායම මුළුමනින්ම අල්ලාගෙනයි ඉන්නේ කියන එක ඉතා පැහැදිලිව කියන්න ඕනෑ. මොකද, සහරාන්ගෙන් පසුව සිටින නායකයා හැටියට අපි බොහෝදුරට හිතාගෙන හිටියේ ඔහුගේ සහෝදරයා වන රිල්වාන්. මම හිතන විධියට ඔහුත් බෝම්බ ප්‍රහාරයකින් ජීවිතක්ෂයට පත් වුණා. ඒ වාගේම නවුෆර් කියන පුද්ගලයාත් ඔය කණ්ඩායමේ නායකත්වය දරන්නට හිටපු පුද්ගලයෙක්. ඔහු දඹුල්ලේදී අත් අඩංගුවට ගත්තා. ඒ කියන්නේ ඒ ගොල්ලන්ගේ නායකත්වය ගන්න හිටපු කණ්ඩායම දැන් නැතිවෙලා තිබෙන්නේ. රිල්වාන් නැති වුණා, නවුෆර් CID එකෙන් අත් අඩංගුවට අරගෙන තිබෙනවා. ඒ වාගේම අද ප්‍රශ්නයක් මතු කළා, ඒ බෝම්බ හදපු කට්ටිය කවුද, ඒ කට්ටිය තවමත් ඉන්නවා නේද කියලා. ඒ බෝම්බ හදපු තුන්දෙනාගෙන් රිල්වාන් කියන කෙනා එක් කෙනෙක්. ඔහු ඒ බෝම්බ හදන්නට විස්තර අරගෙන ගොඩක් වැඩ කළ පුද්ගලයෙක්. අනෙක් එක්කෙනා තමයි මොහොමඩ් හස්තුන් කියන පුද්ගලයා. ඔහුත් මේ බෝම්බ ප්‍රහාරයෙන් මිය ගියා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, අපි දැන් අවසන් කරන්නට ඕනෑ, එහෙම නැත්නම් වැඩ කටයුතු අවසන් වෙනතුරු සභාවේ කටයුතු කරගෙන යාමට කාලය දීර්ඝ කර ගත යුතුයි. ඒ සඳහා සභාවේ අවසර ඉල්ලනවා, සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු රුවන් විජේවර්ධන මහතා**
(மாண்புமிகு ருவன் விஜயவர்தன)
(The Hon. Ruwan Wijewardene)
ඒ බෝම්බ හදපු දෙනෙනාත් මේ ප්‍රහාරවලින් නැති වුණා. ඒ ගැන සැකයක් තියන්නට අවශ්‍ය නැහැ. දැන් මේ මුළු කණ්ඩායමම වාගේ අහුවෙලායි තිබෙන්නේ ගරු කථානායකතුමනි. එහෙම නම් ප්‍රශ්නයක් මතු කරන්නට පුළුවන්,

[ගරු රුවන් විජේවර්ධන මහතා]

අපි හදිසි නීතියේ කාලය තවත් දීර්ඝ කරන්නේ ඇයි කියලා. මේ කණ්ඩායම හසු වුණාට අපි තවත් විමර්ශන කටයුතු කරගෙන යනවා. මේ ළඟදීත් අපි සහරාන්ගේ සමීපතම පුද්ගලයකු අත්අඩංගුවට ගත්තා. ඒ කණ්ඩායමට මුදලින්, වාහන ලබා දීමෙන් හෝ කුමන හෝ ආකාරයකට සහයෝගය ලබා දුන් පිරිස් සිටිනවා නම් පුළුවන් තරම් ඉක්මනින් අපි ඒ ගොල්ලන්ව අත්අඩංගුවට ගන්නවා. පසුගිය ආරක්ෂක කමිටුවේදී ඉල්ලීමක් කළා, තවත් මාසයකින් මේ හදිසි නීතියේ කාලය දික් කර ගැනීමට ඉඩ දෙන්න කියලා. එම නිසා අපි හිතුවා ඒක කරන්නට අවශ්‍යයි කියලා. අපි බලාපොරොත්තු වෙන්නේ නැහැ, මේක තවදුරටත් ගෙන යන්නට. තවත් මාසයකින් පසුව අපට හදිසි නීතිය ඉවත් කරන්නට පුළුවන්වෙයි කියලා අපි විශ්වාස කරනවා.

ඇත්තෙන්ම මෙහි තවත් කටයුත්තක් තිබෙනවා, ගරු කථානායකතුමනි. අපි දන්නවා, පාස්කු ඉරිදා සිදු වුණු ප්‍රහාරයෙන් පසුව රටේ ජනතාව අතරත් යම්කිසි බියක් තිබෙන බව, මේ වාගේ තවත් ප්‍රහාර ඇති වෙයිද කියලා. එම නිසා අපි ත්‍රිවිධ හමුදාව පාසල් ආරක්ෂා කරන්නට, පන්සල් ආරක්ෂා කරන්නට සහ පූජනීය ස්ථාන ආරක්ෂා කරන්නට යොමු කරලා තිබෙනවා. ඒ වාගේම තානාපති කාර්යාල ආරක්ෂා කරන්නට ත්‍රිවිධ හමුදාව යොදවලා තිබෙනවා. මේ හදිසි නීතිය ඉවත් කළොත් මේ සියලුදෙනාම අපට ආපහු barracksවලට යවන්නට සිද්ධ වෙනවා. එම නිසා රටේ ජනතාවගේ බිය පහ වෙනතුරු සහ තානාපතිවරුන්ගේ බිය සැක පහ වෙනතුරු තවත් මාසයකින් හදිසි නීතියේ කාලය දීර්ඝ කළොත් හොඳයි කියන එකයි අපි හිතන්නේ.

ගරු කථානායකතුමනි, ඒ වාගේම ජාතික ආරක්ෂාව ගැන බොහෝ මන්ත්‍රීවරුන් දොස් කිව්වා. නමුත් එදා ඉඳන්ම අපේ අගමැතිතුමාත්, අපිත් රජයක් හැටියට වගකීම භාර ගත්තා. මේ සිද්ධියේදී අඩු පාඩු වුණා. ඒ වාගේම ආරක්ෂාව පැත්තෙනුත් රජයක් හැටියට අපි වගකීම භාර ගත්තා. එසේ වගකීම භාර ගත්තත්, ඇත්තෙන්ම අපි මෙවැනි ප්‍රහාරයක් සිදු වෙන බව දැනගෙන සිටියේ නැහැයි කියන එක පැහැදිලිවම කියන්නට ඕනෑ, ගරු කථානායකතුමනි. මම ඒක වගකීමෙන් කියන්නේ. ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා විධියට මමවත් ඒක ගැන දැනුවත්වෙලා සිටියේ නැහැ. ඒ වාගේම මේ සභාවේ ඉන්න ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් දැනගෙන හිටියා කියලාත් මම හිතන්නේ නැහැ. අපි දැනුවත්වෙලා සිටියා නම් මේ සිද්ධිය නවත්වන්නට යම්කිසි විධියකට ක්‍රියාමාර්ගයක් ගන්නට තිබුණා. නමුත්, ඒක සිදු වුණා. ඇත්තටම අපි ඒක ගැන කනගාටු වෙනවා. දැන් කළ යුත්තේ අපේ ජාතික ආරක්ෂාව තර කරගෙන එවැනි සිද්ධියක් නැවත ඇති නොවෙන්නට වැඩ කිටයුතු කිරීමයි. අපේ හමුදාපතිතුමා කිව්ව එක හරි. සියයට 100ක්ම අපට කියන්නට බැහැ, තවත් මේ වාගේ ප්‍රහාරයක් සිද්ධ වෙයිද නැද්ද කියලා. මොකද, එල්ටීටීඊ සංවිධානය වාගේ නොවෙයි මේ පුද්ගලයන්. මේ ප්‍රශ්නය ආගමත් එක්ක තිබෙන අන්තවාදයක්. පිට රටවල සිටින lone wolf කෙනෙකු වාගේ, ඒ කියන්නේ අන්තවාදී අදහස් තිබෙන තනි පුද්ගලයකුට ඇවිල්ලා කුමක් හෝ අපරාධයක් කරන්නට පුළුවන්. එංගලන්තයේ, බෙල්ජියමේ සහ යුරෝපයේ රටවල් ගණනාවක අපි එවැනි තත්ත්වයන් දැකලා තිබෙනවා.

මේ වාගේ සිද්ධි ඒ රටවලත් ඇති වුණා. පංගුවක් වේලාවට මේ රටේත් එක පුද්ගලයෙකුට ඒ වාගේ දෙයක් කරගන්න පුළුවන් වෙයි. ඒ නිසා අපට සියයට සියයක් කියන්න බැහැ, මෙවැනි දෙයක් කවදාවත් ආපසු වෙන්නේ නැහැ කියලා. නමුත් කණ්ඩායමක් වශයෙන් නම් අනිවාර්යයෙන්ම සහරාන්ගේ කණ්ඩායම අපේ ආරක්ෂක අංශ මඟින් කඩාකප්පල් කර තිබෙනවා. ආපසු සහරාන්ගේ කණ්ඩායමකට ඉදිරිපත් වෙන්න අමාරුයි.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම අපේ සුසන්ත පුංචිනිලමේ මන්ත්‍රීතුමා මතු කළ ප්‍රශ්නයකට මේ අවස්ථාවේ දී පිළිතුරු ලබා දෙන්නට මා බලාපොරොත්තු වෙනවා. එතුමා ඇසුවා, අපි ත්‍රිකුණාමලයේ අක්කර ගණනක් ඇමෙරිකාවට දෙනවාද කියලා, මෙහාට ඇවිත් ඒ ගොල්ලන්ගේ කඳවුරක් පවත්වන්නට. ගරු කථානායකතුමනි, ඇමෙරිකාවට නොවෙයි වෙන කිසිම රටකට මේ රටට ඇවිල්ලා කඳවුරු පවත්වන්නට අපි කිසිසේත්ම ඉඩ දෙන්නේ නැහැ කියන එක පැහැදිලිව කියන්නට ඕනෑ. අපට ඒක කරන්න බැහැ. ඇත්තෙන්ම මේ රටට වෙනත් රටකින් ඇවිල්ලා කඳවුරක් බඳින්න ඉඩ දෙන්න අවශ්‍යතාවක් නැහැ. මම හිතන විධියට ඇමෙරිකාවේ අපේ තානාපතිතුමියත් පැහැදිලිව කියා තිබෙනවා, ඒක කරන්නේ නැහැ කියලා. ඒක කරන්න අවශ්‍යතාවක් නැහැ. කොහොම වෙතත්, මම හිතන විධියට ත්‍රිකුණාමල වරායට ඇමෙරිකාවෙන් USS Anchorage කියන නැව තමයි ඇවිල්ලා තිබුණේ. ඒ විධියට මීට අවුරුදු දෙක-තුනකට ඉස්සෙල්ලා ඕස්ට්‍රේලියාවෙන් නැවක් ඇවිල්ලා තිබුණා. ඒ විධියට විවිධ රටවල්වලින් නැව් එනවා. ඒ වාගේම හම්බන්තොට වරායටත් ජපානෙන් ආවා; චීනෙන් ආවා; එක එක රටවලින් ආවා. කොළඹ වරායටත් එහෙම ආවා. මම හිතන විධියට ත්‍රිකුණාමල වරායට ආපු USS Anchorage එකට වඩා විශාල Nimitz කියන aircraft carrier එකක් කොළඹ වරායට ආවා. ඒක ඇතුළේ දහස් ගණනක් සිටියා, - [බාධා කිරීමක්] ඔව්. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
**(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)**
(The Hon. Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා පිළිතුරු දෙන්න කැමැතියිද?

**ගරු රුවන් විජේවර්ධන මහතා**
**(மாண்புமிகு ருவன் விஜயவர்தன)**
(The Hon. Ruwan Wijewardene)
කැමැතියි.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
**(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)**
(The Hon. Susantha Punchinilame)
ගරු කථානායකතුමනි, එම නැව ගැන මට තොරතුරු දුන්නේ කවුද කියලා මට කියන්න බැහැ. එම නැව, නාවික හමුදාවත් එක්ක exercise එකක් කළාට කමක් නැහැ. අපේ නාවික හමුදාව දැනුවත් වෙන්න, ඒක වෙන්න ඕනෑ. හැබැයි, ඒ නැවට අපේ මුහුදු සීමාවේ ගිලී තිබෙන දේවල් පිළිබඳව විමර්ශනයක් කරන්න අවශ්‍යතාවක් නැහැ, ගරු රාජ්‍ය ඇමතිතුමනි. එසේ කළ නිසා තමයි, සැකයක් මතු වුණේ. එම සැකය දුරු කරගන්නයි මෙහෙම අහන්නේ. මොකද, ඒ දිස්ත්‍රික්කයේ සියයට 77ක් ඉන්නේ දමිළ සහ මුස්ලිම් ජනතාව. අපි, සිංහල අය සියයට 23යි ඉන්නේ. මම මේ ගැන ඇසුවේ, මාත් ඒ පැත්තේ සිටින පුද්ගලයකු හැටියටයි.

**ගරු රුවන් විජේවර්ධන මහතා**
**(மாண்புமிகு ருவன் விஜயவர்தன)**
(The Hon. Ruwan Wijewardene)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ හිතේ යම්කිසි සැකයක් ඇති බව මට තේරෙනවා. නමුත් ඇත්තෙන්ම අපට එවැනි ගිවිසුමක් නැහැ. ඒ විධියට ත්‍රිකුණාමලයේ අක්කර සිය ගණනක් ඇමෙරිකාවට දීලා ඒ ගොල්ලන්ගේ කඳවුරු බඳින ගිවිසුමකට අපි ගිහිල්ලා නැහැ. ඒක කරන්නේත් නැහැ. නමුත් මේ විධියට විටින් විට පිට රටවල නාවික හමුදාවලින් එනවා. ඊට පසුව අපේ නාවික හමුදාවත් එක්ක එක්කාසු වෙලා එක එක exercises කරනවා. ඒක

හැම අවුරුද්දේම වෙනවා. ගරු කථානායකතුමනි, USS Anchorage එකේත් helicopters ආදි විවිධාකාර ඒවා තිබෙනවා. ඒක සාමාන්‍ය දෙයක්. කොළඹ වරායට USS Nimitz කියන නැව ආවා, ගරු කථානායකතුමනි. මම හිතන විදියට ඒකේ මීටත් වඩා - මේ USS Anchorage එකටත් වඩා - ප්‍රහාරක යානා 40ක්ද, 50ක්ද තිබුණා. ඊට අමතරව ඇමෙරිකානු නාවික හමුදාවේ නිලධාරින් 1,000කටත් වඩා ඒක ඇතුළේ සිටියා. ඒ වාගේ නැව් විටින් විට එනවා, ගරු කථානායකතුමනි. විශේෂයෙන්ම ගරු සුසන්ත පුංචිනිලමේ මන්ත්‍රීතුමාගේ සැකය දුරු කරන්නයි මම ඒ ගැන කිව්වේ. අපට කිසිසේත්ම ඒ ගොල්ලන් එක්ක එවැනි කඳවුරක් මෙහේ බැඳීම සඳහා ගිවිසුමකට යන්න අවශ්‍යතාවක් නැහැ.

මේ දවස් ටිකේ SOFA ගිවිසුම ගැනත් ගොඩක් කථා වුණා. [බාධා කිරීමක්] ඔව්. SOFA ගිවිසුම ගැනත් ගොඩක් කථා වුණා, ගරු කථානායකතුමනි. අපේ ආරක්ෂක අංශ විසින් අවුරුදු දෙකකටත් ඉස්සෙල්ලා චීනය සමඟ යම්කිසි ගිවිසුමක් අත්සන් කළා. එහිදී අපට කලින් චීනය ඒ ගොල්ලන්ගේ යෝජනා එව්වා. එසේ එව්වාම, අපි ඒවා බැලුවා. එසේ කිරීමට මාස තුන-හතරක්, සමහර වේලාවට මාස හයක්, හතක්, අටක් යනවා, ගරු කථානායකතුමනි.

අපිත් ඒක බලලා, අපට අවශ්‍ය විදියට වෙනස්කම් කරනවා. යම්කිසි කාලයකදී යම් ගිවිසුමකට එනවා නම් එයි.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒක රහස් ගිවිසුමක් නොවෙයි නම්, ඒ විස්තර මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා පොඩි දැනුවත් කිරීමක් කළොත් හොඳයි නේද?

**ගරු රුවන් විජේවර්ධන මහතා**
(மாண்புமிகு ருவன் விஜயவர்தன)
(The Hon. Ruwan Wijewardene)

ඒක කරන්න පුළුවන්. අපේ ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ නැහැ. එතුමා ආවොත් අපට ඒක කරන්න පුළුවන්. ඒ ගැන කිසි ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ඒ ගිවිසුම අත්සන් කරන්න අපි කිසිසේත්ම ඉදිරිපත් වෙලා නැහැ. එහෙම ගිවිසුමක් අත්සන් කරලාත් නැහැ. මේ SOFA ගිවිසුම ගැන තවමත් සාකච්ඡා කරනවා පමණයි.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

එය අත්සන් කරලාත් නැහැ, අත්සන් කරන්න බලාපොරොත්තුවකුත් නැහැ කියලා ඔබතුමා වගකීමකින් ද කියන්නේ?

**ගරු රුවන් විජේවර්ධන මහතා**
(மாண்புமிகு ருவன் விஜயவர்தன)
(The Hon. Ruwan Wijewardene)

ඔව්, වගකීමෙන් කියන්නේ. අපි එය අත්සන් කරලාත් නැහැ, අත්සන් කරන්න බලාපොරොත්තු වන්නේත් නැහැ. කොහොම වුණත් ඉදිරියේදී යම්කිසි එකඟත්වයකට ආවොත්, ඒ ගිවිසුම අත්සන් කරයි. ඒක අපේ රජය කරයිද, ඊළඟ රජය කරයිද කියන්න දන්නේ නැහැ. ඒ සැකයත් දුරු කරන්න අවශ්‍යයි, ගරු කථානායකතුමනි. මොකද, මේ දවස්වල SOFA ගිවිසුම ගැන ගොඩක් කථා වන නිසා.

ගරු කථානායකතුමනි, පාස්කු ඉරිදා එල්ල වූ ප්‍රහාරයෙන් පසුව, ඒ සම්බන්ධ අපේ විමර්ශන වැඩ කටයුතු කර ගෙන යනකොට අපි දක්කා, මේ රටේ ජාතීන් අතර විශාල ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙන හැටි. සමහර කණ්ඩායම් සමස්ත මුස්ලිම් ජනතාවම ත්‍රස්තවාදීන් හැටියට හඳුන්වා දෙමින් වැඩ කටයුතු කළා. ඒ ගැන අපි කනගාටු වෙනවා. ඇත්තෙන්ම පාස්කු ඉරිදා එල්ල වූ ප්‍රහාරයෙන් පසුව, ඒ සම්බන්ධ විමර්ශන කටයුතු කරනකොට විශේෂයෙන්ම මේ National Thowheed Jamath එකට විරුද්ධව සාක්ෂි දෙන්නත්, තොරතුරු දෙන්නත්, ඒ වාගේම සහරාන්ගේ කණ්ඩායමට විරුද්ධව තොරතුරු දෙන්නත් වැඩි වශයෙන් ඉදිරිපත් වුණේ මුස්ලිම් ජනතාවයි. ඒ ගොල්ලන් තමයි ඇත්තෙන්ම අපේ ආරක්ෂක අංශවලට අවශ්‍ය ඒ විස්තර ටික දුන්නේ, "මේ ගොල්ලන් වහාම අත්අඩංගුවට ගන්න" කියලා.

ගරු කථානායකතුමනි, මේ වෙලාවේ මම තවත් විශේෂ කරුණක් කියන්න ඕනෑ. රිල්වාන්, සහරාන්ගේ තාත්තා ඇතුළු පවුලේ සියලුදෙනාම එක ගෙයක හැංගිලා ඉන්න කොට, ඔවුන් ඒ ගෙදර හැංගිලා ඉන්නවාය කියලා පොලීසියටත් දැනුම් දුන්නේ ඒ ප්‍රදේශයේ ජීවත් වූ මුස්ලිම් ජාතිකයෙක්. ඔහු තමයි පොලීසියට ගිහිල්ලා කිව්වේ, මේ වාගේ සැක කටයුතු කණ්ඩායමක් මේ ගෙදර හැංගිලා ඉන්නවා, එතැනට ගිහිල්ලා මොනවා හෝ කරන්න කියලා. ඒ අනුව එතැනට පොලීසිය ගියාම මේ අය පොලීසියට වෙඩි තැබුවා. හමුදාවත් එතැනට ගියා, අන්තිමට ඔවුන් බෝම්බ පුපුරවාගෙන මැරුණා. සමස්ත මුස්ලිම් ජනතාවම ත්‍රස්තවාදීන් නොවෙයි. ඇත්තෙන්ම හැම ජාතියකම අන්තවාදීන් ඉන්නවා, ගරු කථානායකතුමනි. මුස්ලිම් අය අතරත් අන්තවාදීන් ඉන්නවා; බෞද්ධයන් අතරත් ඉන්නවා; ක්‍රිස්තියානි අය අතරත් ඉන්නවා. අපි මේ රටේ සියලු ජාතීන් එකතු කර ගෙන මේ ගමන යන්න ඕනෑය කියලායි මම නම් හිතන්නේ. මොකද, ජාතීන් වශයෙන් බෙදිලා අපි එක එක් කෙනා සටන් කරන්න ගියොත්, අපේ ජාතික ආරක්ෂාවට විශාල ප්‍රශ්නයක් ඇතිවනවා. මේ අවස්ථාවේදී අපි සියලුදෙනාම ශ්‍රී ලාංකිකයන් වශයෙන් එකතු වෙලා, දැන් මතු වී තිබෙන ප්‍රශ්නයට විසඳුම් සෙවිය යුතුයි. විශේෂයෙන්ම මහජන නියෝජිතයන් හැටියට අපි පාර්ලිමේන්තුවේදී මේ ප්‍රශ්නයට යම්කිසි විසඳුමක් සොයා ගන්න නම්, අපි සියලුදෙනාම එකතු වන්න ඕනෑය කියන කාරණය මතක් කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

Sir, I call for a Division.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

The Resolution has already been passed.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

We have passed the Resolution. But, we can have your objections recorded. It has already been passed.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මෙතුමන්ලා හදිසි නීතියටත් විරුද්ධ වෙනවා නේ. උදේ ඉඳලා රට ගැන කථා කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Leader of the House, they were supporting you. Hon. Shritharan, I suppose that by the time you got up, we have already passed the Resolution. So, I will record the objections from the TNA. - [*Interruption.*]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඉස්සරහ පේළියේ ඉන්න අය හෙමිහිට කිව්වා එකහයි කියලා.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

***එකල්හි වේලාව අ.භා. 6.30 පසු කර තිබුණෙන් ගරු කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 6.41ට, 2019 ජූනි 21වන දින සභා සම්මතිය අනුව, 2019 ජූනි 28වන සිකුරාදා පූ.භා. 10.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 6.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளு மன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி, பி.ப.6.41க்கு, பாராளுமன்றம் அதனது 2019 யூன் 21ஆம் திகதிய தீர்மானத்துக்கிணங்க, 2019 யூன் 28, வெள்ளிக்கிழமை மு.ப.10.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*And it being past 6.30 p.m.,* THE HON. SPEAKER *adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 6.41 p.m until 10.30 a.m on Friday, 28th June, 2019 pursuant to the Resolution of Parliament of 21st June, 2019.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.